බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා : 6

විනයපිටකයෙහි

05 වන ග්‍රන්ථය

(1 කාණ්ඩය)

# පරිවාර පාළි

ලංකා බෞද්ධමණ්ඩලයේ ආරාධනායෙන්

පොල්ගහවෙල විද්‍යෝදය පරිවෙණාධිපති

කෙසෙල්වතුගොඩ ශ්‍රී රතනජෝත්‍යභිධාන

නායකස්ථවිරපාදයන් වහන්සේ විසින් කරනලද

සිංහල පරිවර්තනය

ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

විසින්

පාඨශෝධන පූර්වක වැ සංස්කරණය කරනලදි.

බු. ව. 2550

ක්‍රි. ව. 2006

Free Distribution www.aathaapi.org

Buddha Jayanti Tripitaka Series, Volume 6 (i)

The Fifth Book in the

**Vinaya-Pitaka**

**5**

# PARIVĀRA-PĀLI (I)

With the Sinhala translation by

**The Venerable**
**Keselvatugoda Ratanajoti Nāyaka Thero**

Revised and Edited by

**The Tripitaka Board**

Free Distribution www.aathaapi.org

නමෝ තස්ස භගවතෝ සබ්බධම්මේසු අප්පටිහතඤාණචාරස්ස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

භාග්‍යවත් වූ සියලු ධර්මයන්හි නොපැකිල ඥානචාර සහිත වූ දසබලධාරී වූ චතුර්වෛශාරදත්ව විශාරද වූ සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද මාගේ නමස්කාරය පිළිගනිත්වා !!!

## <u>බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා</u>
## <u>පරිගණක ගත කර නොමිළයේ බෙදාහැරීමේ</u>
## <u>මහා ධර්ම දානමය පුණ්‍යකර්මය</u>

**"අපාරුතා තේසං අමතස්ස ද්වාරා**
**යේ සෝතවන්තෝ පමුඤ්චන්තු සද්ධං"**

"කන් ඇත්තාහු සැදැහැ මුදත්වා
ඔවුනට අමා දොර විවෘත කරන ලදී"

අප භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම අනුසාසනය මෙහි ලා සිහි කිරීම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය පරිශීලනය කරන්නා වූ පින්වතුන්ගේ අභිවෘද්ධිය පිණිස ම වන බව අපගේ හැඟීම ය.

සැම කල්හි ඥාන සම්ප්‍රයුක්ත ව ක්‍රියා කරන්නා වූ සියලු සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ පලමු අනුශාසනය, බුද්ධ රත්නය කෙරෙහි ගෞරව කරන්නා වූ බුදුරජාණන් වහන්සේගේ සම්මා සම්බුදු බෝධිය අදහන්නා වූ කවර නම් පුද්ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත්ව සහිත වූ දශ බල සහිත වූ අනාවරණ ඥාන සහිත වූ සර්ඥ වූ මහා කාරුණිකයන් වහන්සේ පවා නිවන අවබෝධ කර ගැනීම පිණිස ධම්මානුධම්ම ප්‍රතිපදාව ආරම්භ කරන පුද්ගලයා තුල 'සද්ධා' නම් වූ ගුණය අත්‍යාවශ්‍ය ය යන්න අවධාරනය කරන සේක.

මෙම ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය සැක නොකළ යුතු ය. සැක කරමින් හදාරන ලෞකික ශිල්ප ශාස්ත්‍ර පවා පරිපූර්ණ ව නො පිහිටන බව සිහි ඇතිව බැලීමෙන් නුවණ ඇත්තාහට දැක ගත හැකි ය. පුරුෂයා ශ්‍රේෂ්ඨ බවට පමුනු වන්නා වූ සද්ධා ධනය සහිත ව ("සද්ධීධ විත්තං පුරිසස්ස සෙට්ඨං") මෙම ධර්ම රත්නය පරිශීලනය කරන්නාහට සද්ධා අංගයෙන් ලැබිය යුතු සියල්ල ලැබෙනු නො අනුමාන ය. එසේ ම සිහියෙන් ලැබිය යුතු කොටස ද වීර්යයෙන් ලැබිය යුතු කොටස ද සමාධියෙන් ලැබිය යුතු කොටස ද ප්‍රඥාවෙන් ලැබිය යුතු කොටස ද ලැබෙන පරිදි සද්ධා, සති, විරිය, සමාධි සහ ප්‍රඥා යන පංච ධර්මයන් තමා තුල ඇති කර ගෙන මහත් වූ ගෞරවය සහිත ව ධර්මාවබෝධය පිණිස ම යොමු වූ දැඩි අධිෂ්ඨානයෙන් මෙම ධර්ම පුස්තක පරිශීලනය කළ යුතු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර්ම ශ්‍රවනයෙන් මග ඵල ලැබුවෝ ම අධික ය. විමුක්තිය ලබන්නා වූ ක්‍රම වේදයන් පහක් විස්තර කරන්නා වූ අංගුත්තර පංචක නිපාතයෙහි 'විමුත්තායතන' සූත්‍රයෙහි නිවන ලබන ක්‍රම වේද සතරක් ම ධම්ම දේශණාමය සහ ධම්ම සවනමය පුණ්‍ය කර්ම ඇසුරින් සිදුවන බව පැහැදිලි කර ඇත. පස්වැනි ක්‍රම වේදය භාවනාමය පුණ්‍ය කර්මය ප්‍රගුණ කිරීමෙන් සාර්ථක වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතයන් වහන්සේගේ අනුශාසනය පිළිපදින්නා වූ අප්‍රමාදී ව ධම්මානුධම්ම ප්‍රතිපදාව වඩන්නා වූ සියලු සත්නට, ත්‍රෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශ්‍රය වේවා !

ආර්යයන් වහන්සේලා පහළවීමෙන් සිරිලක බැබලේවා !

බුද්ධ ශාසනය දියුණුවී චිරස්ථිතික වේවා !

ලෝ සත්නට සෙත් වේවා !

**"අමතං දදෝ ච සෝ හෝති, යෝ ධම්මමනුසාසති"**

( *යමෙක් ධර්මානුශාසනය කරන්නේ ද, හේ අමෘතය දෙන්නේ ය* )

මෙම ධර්ම දානමය පුණ්‍ය කර්මය
මෝහ තිමිර විධ්වංසනය කරන්නා වූ ලොවට උතුම් ආලෝකය වූ මහා කාරුණික වූ
සම්මාසම්බුදුරජාණන් වහන්සේගේ සර්වඥතා ඥානයට ද මහා කරුණා ගුණයට ද
පූජෝපහාරයක් ම වේවා !!!

කෙළලක්ෂයක් සක්වලයන්හි සියලු ආර්යයෝ ද සියලු සත්පුරුෂයෝ ද
අපගේ පුණ්‍ය කර්මය අනුමෝදන් වෙත්වා !!!

ශාසනාභිවෘද්ධිකාමී,
සමින්ද රණසිංහ.
2009.06.28

විනයපිටකෙ

# පරිවාරපාළි

(1 කාණ්ඩය)

විනයපිටකයෙහි

# පරිවාර පාළිය

(1)

**"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති, නො පටිච්ඡන්නො"**

**"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි, වැසුණේ නො මැ බබලයි".**

**(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - හරණ්ඩු වර්ගය, 9 සූත්‍රය.)**

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 16 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:16 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය... ... ... ... | ix |
| සංඥපනය ... ... ... ... | xi—xiv |
| ත්‍රිපිටක සම්පාදකමණ්ඩලය ... ... ... | xv |
| පාළි හෝඩිය – PALI ALPHABET ... ... ... | xvii |
| සඞ්කේත නිරූපණය – ABBREVIATIONS ... ... | xviii |
| විසය සූචි ... ... ... ... | xix—xxiv |
| පරිවාර පෙළ හා පරිවර්තනය ... ... ... ... | 2—383 |
| ගාථාදිපාද සූචි ... ... ... ... | 387—388 |
| සඤ්ඤානාමානුක්කමණිකා ... ... ... | 389—390 |
| විසෙසපදානුක්කමණිකා ... ... ... | 391—394 |
| ශුද්ධිපත්‍රය .... .... .... .... | 395 |


Free Distribution www.aathaapi.org

# සංස්කාරක නිවේදනය

මහාකාරුණික වූ තථාගත සම්මා සම්බුදුරදුන්ගේ ආඥාදෙශනා සඞ්ඛ්‍යාත විනයපිටකයට අයත් ග්‍රන්ථ පඤ්චකයෙහි පස්වැනි ග්‍රන්ථය වූ පරිවාරපාළිය බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි සවැනි ග්‍රන්ථය වශයෙන් සම්මත කරන ලද්දේය, එහෙත් අර්ථාවබෝධයට පහසු වන පරිදි නියත ස්ථානයෙහි ඡේද වෙන් කරමින් සිංහල පරිවර්තනය සමග මුද්‍රණය කරවීමේ දී සුවසේ පරිහරණ නො කළ හෙන සේ ග්‍රන්ථය ප්‍රමාණයෙන් විශාලත්වයට යන බව පෙනීගිය හෙයින් චූලවග්ගපාළිය සෙයින් මේ පරිවාරපාළිය ද කාණ්ඩ දෙකක් වශයෙන් ප්‍රකාශයට පමුණුවන බව සඳහන් කරම්හ. මෙසේ පරිවාරපාළියෙහි 'සමථභෙද'ය අවසාන කොට ඇති කොටස ප්‍රථම කාණ්ඩය ද, 'ඛන්ධකපුච්ඡා' යෙහි පටන් ඉතිරිය ද්විතීය කාණ්ඩය ද වන්නේ ය.

ලඞ්කාබෞද්ධමණ්ඩලයේ සමාරාධනය පරිදි පරිවාරපාළිය සිංහල භාෂායෙන් පරිවර්තන කළාහු පොල්ගහවෙල විද්‍යෝදය පරිවෙණාධිපති උපාධ්‍යායභූත කෙසෙල්වතුගොඩ රතනජෝත්‍යාභිධාන නායක මහාස්ථවිර පාදයන් වහන්සේ යැ. ඔබ පාළි සංස්කෘතාදි භාෂාශාස්ත්‍ර විෂයෙහි ද තථාගතප්‍රවිදිත වූ ධර්මවිනය දෙක්හි ද නිපුණ වූ ශික්ෂාකාමි බහුශ්‍රැත පඬිවරයාණ කෙනෙකි. පාඨශෝධන පූර්වක පරිවාරපාළි සිංහලපරිවර්තනය යථාකාලයෙහි ත්‍රිපිටකමණ්ඩලය වෙත පමුණුවන ලදුයේ විනය සිංහල පරිවර්තන ශෝධක අනුමණ්ඩලය විසින් සංස්කරණය කරනලද්දේ ද විය.

වර්තමාන ත්‍රිපිටක සම්පාදකමණ්ඩලයේ බහුශ්‍රැත මහතෙරවරුන් විසින් තව දුරටත් සංස්කරණය කොට අවශ්‍ය වූ ශබ්ද සූචි ආදිය ද යොදන ලද්දේය. අප ද ගේ මහත් පරිශ්‍රමයෙන් මෙහි පාඨශෝධනය හා සංස්කරණය නිමහම් කරනලදුයේ වෙයි. තවද පරිවාරපාළි සිංහල පරිවර්තනයෙහි වාක්‍යප්‍රයෝග හා අක්ෂර වින්‍යාසය පරිවර්තක නායක ස්වාමීන්ද්‍රයන් විසින් ආදෘත වූ සම්ප්‍රදාය නොපිරිහෙන සේ යොදා ඇත.

භික්ෂූන් වහන්සේගේ පරිපූර්ණ විනයඥානය සඳහා අවශ්‍යයෙන් ප්‍රගුණ කළ මනා විනයග්‍රන්ථය වූ පරිවාර පාළිය සුගම වූ සිංහල පරිවර්තනයෙන් යුක්ත කොට ප්‍රකාශයට පමුණුවාලීමෙන් ජනිත ධර්මදානමය කුශලහේතුයෙන් බෞද්ධමණ්ඩලයේ සුධීහු ද, සංස්කෘතික අධිකාරියෙහි සියලු පින්වත්හු ද, මෙහි ලා නන්අයුරින් සහාය වන හැම සත්පුරුෂයෝ ද ලොව් ලොවුතුරු සුව ලබත්වා'යි මෙත් සිතින් ආශංසන කරම්හ.

මේ වගට, ශාසනෝදයකාරී :

**ලබුගම ලඞ්කානන්ද ස්ථවිර**

ත්‍රිපිටක මණ්ඩලයේ ප්‍රධාන සම්පාදක.

# සංඥපනය

ප්‍රථම මහාසඞ්ගීතියෙහි ලා අනුබුද්ධ මහාකාශ්‍යපස්ථවිර ප්‍රමුඛ පන්සියක් මහරහතුන් වහන්සේ විනය ශාසනායුෂය යි ගෙන සඞ්ඝ සම්මුතියෙන් විනය පිටකය ආදියෙහි සඞ්ගායනා කළහ. විනය වූකලි විභඞ්ග ඛන්ධක පරිවාර යන භෙදයෙන් ත්‍රිවිධ වෙයි. එහි ආදිබ්‍රහ්ම-චරියක ශීලය ප්‍රකාශ කරන භික්‍ෂු භික්‍ෂුණීන්ගේ වශයෙන් ද්විවිධ වූ උභතො විභඞ්ගය පරිජි පචිති දෙපොත්හි සඞ්ගෘහීත වෙයි. යළි ආභිසමාචාරික ශීලය ප්‍රකාශ කරන සියලු ඛන්ධකවිනය මහවග චුළ-වග යන දෙපොත්හි ලා සඞ්ගෘහීත වෙයි. විභඞ්ග ඛන්ධකාගත විනය-සත්ථියාගේ විශිෂ්ටාවබොධය සඳහා වදාළ විනයධර්මන්‍යාය සඞ්ග්‍රහ කළ ග්‍රන්ථය පරිවාර නම් වේ.

**පරිවාර :**

“යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං” යි ආරම්භ කොට “සෙනාභතං” යනු අවසාන කොට ඇති පුච්ඡාපද සවිස්සක් දක්වා, යළි එක් එක් පුච්ඡාව විසඳමින් පඨම පාරාජික ශික්‍ෂාපදය විභාග කරන ලද්දේය. එනයින් මහාවිභඞ්ගයෙහි සියලු ශික්‍ෂාපද විභාග කොට තබන ලද පරිවාරපාළියෙහි පළමුවන වාරය ‘පඤ්ඤත්තිවාර’ නමුදු ‘කත්ථ පඤ්ඤත්තං’ යන පදය නිසා ‘කත්ථපඤ්ඤත්තිවාර’ නමුදු වෙයි. අනතුරුව “මෙථුනං ධම්මං පතිසෙවන්තො කති ආපත්තියො ආපජ්ජති” යනාදීන් ආපත්ති ප්‍රභෙද ඇති කතාපත්තිවාරය ද “මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති” යනාදීන් පැවැති චතුර්විධ විපත්ති දක්වන විපත්තිවාරය ද, “මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා” ආදි වසින් ඒ ඒ ව්‍යතික්‍රමය පිළිබඳ ඇවැත් සංග්‍රහ කොට දක්වන සඞ්ගහිතවාරය ද, “මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියො ඡන්නං ආපත්ති-සමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති” යනාදි සමුට්ඨානවිධි දක්වන සමුට්ඨානවාරය ද, “මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං අධිකරණානං කතමං අධිකරණං” ආදිවශයෙන් විභාගවන අධිකරණවාරය ද, “මෙථුනං ධම්මං පතිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති” යනාදීන් සමථභෙදය දක්වන සමථවාරය ද, “මෙථුනං ධම්මං පතිසෙවන්තො කති ආපත්තියො ආපජ්ජති” යනාදීන් ආපත්ති විපත්ති ආදිය එක්රැස් කොට පැවැසූ සමුච්චයවාරය දූයි මහාවාර අටක් දක්වා ඉක්බිති “මෙථුනං ධම්මං පතිසෙවනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තං” යනාදි නයින් ‘පච්චය’ පදය යොදා ප්‍රත්‍යයවශයෙන් පඤ්ඤත්තිවාරාදි අනෙකුදු වාර අටක් වදාරන ලද්දාහුය. මෙසේ මහාවිභඞ්ගයෙහි

සොළොස් වාර කෙනෙක් වෙත්. එයින් අනතුරුව භික්ඛුනී විභඞ්ග යෙහි ශික්ෂාපද තුන්සියසතර ගෙන පළමු පරිදි මැ පඤ්ඤත්තිවාරාදි වූ සොළොස් වාරයෙක් දුයි උභතොවිභඞ්ගයෙහි දෙතිස්වාර කෙනෙක් දක්වන ලද්දාහු වෙත්.

තවද පරිවාරපාළි ආදියෙහි භික්ඛුවිභඞ්ගාගත සොළොස් වාරය දක්වන හෙයින් පරිවාරපාළිය මුළුල්ල 'සොළසපරිවාර' යි ද කියනු ලැබේ. මේ කී යැ විමති විනොදනියෙහි : "යෙහි වාරෙහි ආදිභූතෙහි උපලක්ඛිතත්තා අයං සකලො පි පරිවාරො 'සොළස පරිවාරො'ති වොහරීයති" යි. පරිවාරපාළිය නොහඳුල ඇතැම් ආගමඥන නැති විවේචකයන් කියන පරිදි පරිවාරපාළිය මෙතැනින් අවසාන නොවන බව ද, ඉතිරිය පසුව කිසිවකු විසින් එකතුකළ පරිවාරයක් නොවන බව ද සැලකිය යුතුය

අනතුරුව එන සමුට්ඨානකථායෙහි පටන් සමථභෙදය අවසාන කොට ඇති පාළිප්‍රදෙශය ද උභතොවිභඞ්ගාගත උද්දෙසපරියාපන්න ශික්ෂාපදයන්ගේ හා අධිකරණසමථයන්ගේ විශිෂ්ටාවබොධය සඳහා දක්වන ලද්දේය. එහි විනයඥනය සඳහා ආපත්තිසමුට්ඨානවිධි අවශ්‍යයෙන් දතයුතුය. එහෙයින් ශික්ෂාපදයක් පාසා විසිරැ සිටි සමුට්ඨානභෙදය සංග්‍රහ කොට සමුට්ඨානසීස සඞ්ඛෙපය දක්වන ලද්දේය.

ඉක්බිති ආපත්ති ආදි ඒ ඒ කොටසෙහි කෞශල්‍ය ජනනය සඳහා "කති ආපත්තියො" ආදි නයින් මාතෘකා තබා, නිද්දෙස පටිනිද්දෙස විසින් විභාග කරන ලද්දේ වෙයි. එහි මාතිකා විභඞ්ග දෙක්හි එන ආපත්තිපුච්ඡා වශයෙන් "කති ආපත්තියො" යන පදයෙහි පටන් "කති සමථා" යනු අවසන් කොට ඇති මාතිකා පද තුදුසක් උද්දෙස කොට "පඤ්ච ආපත්තියො" යනාදීන් එහි නිද්දෙසය කියන ලදී. අනතුරුව "තත්ථ කතමා පඤ්ච ආපත්තියො" යි එක් එක් පදය පටිනිද්දෙස විසින් විභාග කරන ලද්දේය. එහිදු ආපත්ති ආපත්තික්ඛන්ධ විනීතවත්ථු යන මොහු දෙ දෙපරිද්දෙකින් විභාග කළ හෙයින් නිද්දෙස පටිනිද්දෙස වාරදෙකෙහි සතළොස් පද කෙනෙක් වෙති, මේ විනය පරිවාරය කතිපුච්ඡාවාර නම් වේ. අනතුරුව 'ආපත්තිසමුට්ඨාන'වාරය ආදි කොට එක්විසි වාරයෙහි උභතොවිභඞ්ගයෙහි ඇතුළුව සිටි ආපත්ති සමුට්ඨාන අධිකරණ සමථ යන මොවුන්ගේ ප්‍රභෙද ප්‍රකාශ කරන ලද්දේ යි.

මෙසේ උභතොවිභඞ්ගයෙහි විනය පරිවාර දක්වා තදනන්තරව දෙවිසි ඛන්ධකයෙහි බැසගෙන සිටි යම් යම් පදයෙකින් යම් යම් ඇවතක් පනවනලද නම්, ඒ දක්වනු සඳහා "උපසම්පදං පුච්ඡිස්සං සනිදානං සනිද්දෙසං" යි ඛන්ධකපුච්ඡා සංග්‍රහ කරනලද්දේය. අනතුරුව විනයසඞ්ඛ්‍යමයෙහි වදාරනලද එකක දුකාදි එකාදසකාන්ත වූ ධර්මයන් සංග්‍රහ කොට එකුත්තරනය දක්වන ලද්දේය. යළි දසඅත්ථවසය 'අත්ථ ධම්ම නිරුත්ති ඤාණ' වශයෙන් විභාග කොට අත්ථවසපකරණය දක්වනලද්දේ යි.



Free Distribution www.aathaapi.org

ගාථාසඞ්ගණික අධිකරණභේද ආදි විනය පරිවාරයන්ගේ ස්වරූපය ද පාළිඅනුසාරයෙන් විමසිය යුතු ය. චුදිත චෝදක සඞ්ගාමාවචර (අනුවිජ්ජක) ආදීන් විසින් පැවැතියයුතු ආකාරය ද ඒ ඒ ඛණ්ඩයෙහි මැනැවින් සඞ්ග්‍රහ කරන ලද්දේ වෙයි.

වග්ග තුදුසකින් යුත් උපාලිපඤ්චකය විනයඥනය සඳහා උපාලි තෙරණුවන් විසින් පුළුවුත්නාලද ඒ ඒ කරුණෙහිලා පඤ්චකවශයෙන් වදාරනලද වෙයි. විනයෙහි එන ග්‍රන්ථිස්ථාන හෙළි කරනු සඳහා උපාලි තෙරණුවන් විසින් ම සේදමෝචකගාථා ද වදාරන ලද වෙයි. අවසානයෙහි 'අපලෝකනකම්ම, ඤත්තිකම්ම, ඤත්තිදුතියකම්ම, ඤත්තිචතුත්ථකම්ම' යන චතුර්විධ කර්මයන්ගේ විභාග දක්වන කම්මවග්ගය, ශික්ෂාප්‍රඥප්තියෙහි ලා ලැබෙන දසඅත්ථවසය විභාග කොට දක්වන අත්ථවසවග්ගය, එසේ ම පාමොක් උදෙසීම් ආදිය පැනැවීමෙහි හෙතු දක්වන පඤ්ඤත්තිවග්ගය, එසේම පඤ්ඤත්ත අනුපඤ්ඤත්තාදිය දක්වන පඤ්ඤත්තවග්ගය, වත්ථු විපත්ති ආපත්ති නිදාන පුග්ගල ඛන්ධ සමුට්ඨාන අධිකරණ සමථ' යන නව වැදෑරුම් සංග්‍රහ දක්වන නවසඞ්ගහවග්ගය යන වග්ග පඤ්චකය වදාරන ලද්දේ ය. මෙසේ උභතෝවිභඞ්ග ඛන්ධක යන සියලු මැ විනයධර්මය පරිවෘත කොට පරිවාරපාළිය වදාරන ලද වේ.

**පරිවාර දේශනාව :**

මහාසඞ්ගීතිත්‍රයට නැඟීගිය පරිවාරපාළිය බුද්ධදේශනාවෙන් ද ශ්‍රාවකභාෂිතයෙන් ද පරිපූර්ණ යැ, එහි "යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං" යනාදි පුච්ඡා පද සඞ්ගීති අවස්ථායෙහි මහසුප් මහරහතුන් වහන්සේ විසින් පුළුවුත්නාලදුයේ විනයධරයන් කෙරෙහි අග්‍රතන් පත් උපාලි මහරහතුන් වහන්සේ විසින් ප්‍රභාග කරන ලද්දේය. "කති නු ඛො භන්තෙ ආනිසංසා කඨිනත්ථාරෙති? පඤ්චිමෙ උපාලි ආනිසංසා කඨිනත්ථාරෙ" යනාදිය උපාලි තෙරුන් විසින් පුළුවුත්නා ලදුවැ බුදුරදුන් වදාළ පරිදි මැ සඞ්ගීතියට නැඟී ඇත. ඒ ඒ තැන්හි උද්දානගාථා ප්‍රථමසඞ්ගීතියෙහි සඞ්ගීතිකාරකයන් විසින් තබන ලද යැ, "පුබ්බාචරියමග්ගඤ්ච" යනාදි නිගමනගාථා ද ඈදුරු පරපුර දක්වූ ගාථා ද සතරවැනි ග්‍රන්ථලේඛන සඞ්ගීතියෙහි දී මහරහතුන් විසින් තබන ලද වෙති. පරිවාර පාළියෙහි යම් මැ පාළිප්‍රදේශයෙක් උපාලි තෙරණුවන් විසින් වදාරනලද නම් එ ද සම්මාසම්බුදුන් වදාළ වචනයෙන් ම නගාගත්බව සැලැකිය යුතුය. ඒ එසේ මැය : මෙ කීහ, උත්තර තෙරණුවෝ අඞ්ගුත්තරයෙහි : "යං කිඤ්චි සුභාසිතං සබ්බං තං තස්ස භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස, තතො උපාදායුපාදාය මයං චඤ්ඤෙ ච භණාමා ති" යි 'යම් කිසි සුභාෂිතයෙක් වී නම්, ඒ හැම ඒ භගවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචන යැ, එයින් උකහාගෙන ඇපිදු අත්හුදු කියමහ' යි. එහෙයින් පරිවාරපාළියෙහි එන සියලු මැ විනයසද්ධර්මය බුද්ධභාෂිත වනබව සැලැකිය යුතුය.

**පරිවාරප්‍රශංසා :**

විනය පර්‍යාප්තිය යම්තාක් දවස් නිර්මලව පවතී නම්, ප්‍රතිපත්ති ප්‍රතිවේධ සද්ධර්මය එතෙක් දවස් පවත්නේ යැ, උභතෝවිභඞ්ග ඛන්ධක



Free Distribution www.aathaapi.org

මාතිකා සංඛ්‍යාත විනය පර්‍යාප්තිය හුයෙකින් බැඳුණු මල්දමක් සෙයින් පරිවාරයෙන් ගෙතී සිටුනේ ය. එහෙයින් දහම කැමැති ප්‍රියශීල මහණ පරිවාරය හදාරන්නේ මැනැවි. මේ වදාළහ, උපාලි මහතෙරණුවෝ :

"එවං තියඞ්ගී සද්ධම්මො විනයො යදි තිට්ඨති
උභතො ච විභඞ්ගානි ඛන්ධකා යා ච මාතිකා,

මාලා සුත්තගුණෙනෙව පරිවාරෙන ගන්ථිතා -පෙ-
තස්මා සික්ඛෙ පරිවාරං ධම්මකාමො සුපෙසලො" යි.

විනයටීකායෙහි ද : "විනයපරියත්ති පන කථං තිට්ඨති -පෙ- පරිවාරෙ ගන්ථිතා තිට්ඨති" යි විනය පර්‍යාප්තිය පරිවාරයෙහි ගෙතී සිටී' යයි කියන ලදී.

අලුවිහාරයෙහි දී සිදුකළ ලේඛන සඞ්ගීතියෙහි මුළුදුන් මහරහතුන් වහන්සේ පරිවාර නිගමනයෙහි ලා විනය පර්‍යාප්තිය පරිවාරයෙන් පරිමිතත හෙයින් පරිවාරය නොදත්තහුට ධම්මවිනිශ්චය නොකළහෙන බව පැමැසූහ. (පරිවාරං අජානන්තො කුතො ධම්මවිනිච්ඡයං.) විනය විෂයෙහි යමක්හට විමති උපදී නම් එ ද පරිවාරයෙන් සිඳී යෙයි. (යස්ස ජායති විමති පරිවාරෙන ඡිජ්ජති.) මෙසේ හෙයින් මහසෙන් මැද සක්විත්තකු සෙයින්, මුවකැලන් බැද සිහරදකු සෙයින් රත්නද ඔත් ගැමැසුණු හිරු සෙයින්, තුරුගණ මැද සඳු සෙයින්, බඹ පිරිස්හි මහබඹු සෙයින්, විනය සද්ධර්මය පරිවාරයෙන් හොබනේ යයි ද පැමැසූ හ.

පරිවාරලේඛනය :

විනයෙහි අගතන් පත් උපාලි මහරහතුන් වහන්සේ පටන් ලේඛන සඞ්ගීතිය තෙක් ඇදුරුපරපුරෙන් වාචනාමාර්ගයෙන් මැ ගෙන ආ පරිවාරපාළිය ලේඛනගත කැරැවූවෝ දීප නම මහතෙර කෙනෙකි. උන්වහන්සේ මහාප්‍රාඥ වූහ, ශ්‍රුතධාරී වූහ, විනයපාළියෙහි විචක්ෂණ වූහ. (දීපනාමො මහාපඤ්ඤො සුතධාරී විචක්ඛණො) උන්වහන්සේ ඒ ඒ තැන පූර්වාචාර්‍යමාර්ගය ද සලකා බලා) හදාරණ ශිෂ්‍යයනට සුව එළවන පරිදි මධ්‍යම සජ්ඣායනාමාර්ගයෙන් ලියැවූහ. හැම තන්හි විස්තරමාර්ගය ද හැරපිහ. එතෙකුදුවත් බොහෝ පෙය්‍යාලයෙන් සංක්ෂිප්ත ද නො කළහ.

පරිවාරපාළිය බුද්ධකාලීන නොවූ පසුව රචනා කරන ලද්දකැයි කියති. පරිවාරය පිළිබඳ විමසීමක් නැතිව තැන්තැන්වලින් ගත්ගත් පදපාඨ දක්වමින් කරන නිසරු විවේචනයනට මහාවග්ග සංදෙපනය පිළිතුරු දෙන බව පවසම්හ.

ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ත්‍රිපිටකමණ්ඩලයේ, ප්‍රධානසම්පාදක

1977. 8. 10 මොල්ලිගොඩ
ධම්මවංශෝදය පිරිවෙන.



Free Distribution www.aathaapi.org

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක:**

මහරගම වචයවත්තපාර ශ්‍රී චන්ද්‍රශෙඛරාරාමාධිපති අග්ගමහා පණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි (භික්ෂු විශ්වවිද්‍යාලයෙහි) අධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, රාජකීය පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණ ලංකායෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ, ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය, ත්‍රිපිටක වාගීශ්වර, විමලකීර්ති ශ්‍රී රාජකීය පණ්ඩිත, ලබුගම ලංකානන්ද ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසංඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක:**

කිරුළපන පූර්වාරාම, නාරාහේන්පිට අභයාරාම යන විහාරද්වයාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දූල්ලේ සිරි පඤ්ඤාලෝක ශ්‍රී කල්‍යාණීසාමග්‍රීධර්ම මහාසංඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල, සුධර්මාරාමාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, වේඩරුවේ සිරි අනොමදස්සි බටහිර දිශායෙහි ප්‍රධාන සංඝනායක ස්ථවිරයන් වහන්සේ.

හිගුලේ - මාකඩවර විහාරාධිපති රාජකීය පණ්ඩිත, කරගමපිටිගොඩ සිරි සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශොකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරදන සිරි පඤ්ඤාලංකාර නායක ස්ථවිරයන් වහන්සේ

**ලේඛනාධිකාරී:**

කොළඹ, බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙර්ගමුවේ සිරි ධම්මපාල - කොළඹ පළාතේ ප්‍රධාන සංඝ නායක ස්ථවිරයන් වහන්සේ.



Free Distribution www.aathaapi.org

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS.

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ e | ඔ o |

### CONSONANTS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa | | | |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña | | | |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa | | | |
| ත ta | ථ tha | ද da | ධ dha | න na | | | |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma | | | |
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ gē | ගො gō |

### Conjunct-Consonants

| | | | |
|---|---|---|---|
| කක kka | ඤඤ ñña | ත්‍ර tra | මඵ mpha |
| කඛ kkha | ණ්හ ṇha | දද dda | මබ, ඹ mba |
| ක්‍ය kya | ඤච ñca | දධ ddha | මභ mbha |
| ක්‍රි kri | ඤඡ ñcha | ද්‍ර dra | මම mma |
| ක්ව kva | ඤජ, ඦ ñja | ද්ව, ද්ව dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤඣ ñjha | ධ්ව dhva | ය්‍ය yya |
| ඛ්ව khva | ටට ṭṭa | නත nta | ය්හ yha |
| ගග gga | ටඨ, ඨ ṭṭha | නථ ntha | ලල lla |
| ගඝ ggha | ඩඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞක ṅka | ඩඪ ḍḍha | නධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණණ ṇṇa | නන nna | ව්හ wha |
| ඞඛ ṅkha | ණට ṇṭa | න්හ nha | සස ssa |
| ඞග ṅga | ණඨ ṇṭha | පප ppa | සම sma |
| ඞඝ ṅgha | ණඩ, ඬ ṇḍa | පඵ ppha | ස්ව sva |
| චච cca | ණ්හ ṇha | බබ bba | හම hma |
| චඡ ccha | තත tta | බභ bbha | ව්හ vha |
| ජජ jja | තථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජඣ jjha | ත්ව tva | මප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු u | ූ ū | ෙ e | ො o |



2—B 8 17881 (7/75)

Free Distribution www.aathaapi.org

# සංකේත නිරූපනය

## ABBREVIATIONS

සිමු. 1 — සීහළක්ඛරමුද්දිත (පුරාණ) පරිවාරපාළි.

සිමු. 2 — සීහළක්ඛරමුද්දිත (හේවාවිතාරණ) පරිවාරපාළි.

පැ — පැල්මඩුල්ල පුරාණවිහාර තාලපණ්ණ පොත්ථක.

මජසං — මරම්මඡට්ඨසඞ්ගීතිසංසෝධිත පරිවාරපාළි.

සයා — සයාම - සායක්ඛරමුද්දිත පරිවාරපාළි.

PTS — PALI TEXT SOCIETY PARIVĀRA PĀLI.



Free Distribution www.aathaapi.org

# විසය සූචි

# පරිවාරපාළි

## මහාවිභඞ්ගො

### 1. කත්ථපඤ්ඤත්තිවාරො 2 - 111.


1, 1. පාරාජික කණ්ඩං 2 - 11
1, 2. සඞ්ඝාදිසෙස ,, 10 - 19
1, 3. අනියත ,, 20 - 25
1, 4. නිස්සග්ගිය ,, 24 - 41
1. කඨිනවග්ගො පඨමො 24
2. කොසියවග්ගො දුතියො 30
3. පත්තවග්ගො තතියො 34
1, 5. පාචිත්තිය කණ්ඩං 40 - 89
1. මුසාවාදවග්ගො පඨමො 40
2. භූතගාමවග්ගො දුතියො 46
3. ඔවාදවග්ගො තතියො 50
4. භොජනවග්ගො චතුත්ථො 56
5. අචෙලකවග්ගො පඤ්චමො 60
6. සුරාමෙරයවග්ගො ඡට්ඨො 66
7. සප්පාණකවග්ගො සත්තමො 70
8. සහධම්මිකවග්ගො අට්ඨමො 74
9. රාජවග්ගො නවමො 80
1, 6. පාටිදෙසනීය කණ්ඩං 88 - 91
1, 7 සෙඛියා ,, 92 - 109
1. පරිමණ්ඩලවග්ගො පඨමො 92
2. උජ්ජග්ඝිකවග්ගො දුතියො 96
3. ඛම්භකතවග්ගො තතියො 98
4. පිණ්ඩපාතවග්ගො චතුත්ථො 100
5. කබළවග්ගො පඤ්චමො 102
6. සුරුසුරුවග්ගො ඡට්ඨො 104
7. පාදුකාවග්ගො සත්තමො 106


මහාවිභඞ්ගෙ කත්ථපඤ්ඤත්තිවාරො නිට්ඨිතො.

### 2. කතාපත්තිවාරො 112 - 151.


2, 1. පාරාජික කණ්ඩං 112 - 113
2, 2. සඞ්ඝාදිසෙස ,, 114 - 117





Free Distribution www.aathaapi.org

2, 4. නිස්සග්ගිය කණ්ඩො 116 – 121
1. කඨිනවග්ගො පඨමො 116
2. කොසියවග්ගො දුතියො 118
3. පත්තවග්ගො තතියො 120

2, 5. පාචිත්තිය කණ්ඩො 122 – 139
1. මුසාවාදවග්ගො පඨමො 122
2. භූතගාමවග්ගො දුතියො 124
3. ඔවාදවග්ගො තතියො ,,
4. භොජනවග්ගො චතුත්ථො 126
5. අචෙලකවග්ගො පඤ්චමො 128
6. සුරාමෙරයවග්ගො ඡට්ඨො 130
7. සප්පාණකවග්ගො සත්තමො 132
8. සහධම්මිකවග්ගො අට්ඨමො 134
9. රාජවග්ගො නවමො 136

2, 6. පාටිදෙසනිය කණ්ඩො 138 – 141
2, 7. සෙඛියා ,, 140 – 151
1. පරිමණ්ඩලවග්ගො පඨමො 140
2 උජ්ජග්ඝිකවග්ගො දුතියො 140
3. ඛම්භකතවග්ගො තතියො 144
4. පිණ්ඩපාතවග්ගො චතුත්ථො ,,
5. කබලවග්ගො පඤ්චමො 146
6. සුරුසුරුවග්ගො ඡට්ඨො 148
7. පාදුකාවග්ගො සත්තමො ,,

3. විපත්තිවාරො 152 – 153

4. සඞ්ගහිතවාරො ,, ,,

5. සමුට්ඨානවාරො 154 – 155

6. අධිකරණවාරො ,, ,,

7. සමථවාරො 156 – 157

8. සමුච්චයවාරො 158 – 161

9. කත්ථපඤ්ඤත්තිවාරො 162 – 171

9, 1. පාරාජික කණ්ඩො 162 – 155
9, 2-7. සඞ්ඝාදිසෙස කණ්ඩාදයො 164 – 171



Free Distribution www.aathaapi.org

### 10. කථාපත්තිවාරො 172 - 177

10, 1. පාරාජික කණ්ඩං 172 - 173
10, 2-7. සඞ්ඝාදිසෙස කණ්ඩාදයො 174 - 177

### 11. විපත්තිවාරො 178 - 179

### 12. සඞ්ගහිතවාරො ,, ,,

### 13. සමුට්ඨානවාරො 180 - 181

### 11. අධිකරණවාරො ,, - ,,

### 15. සමථවාරො 182 - 183

### 16. සමුච්චයවාරො 184 - 187

නිට්ඨිතො ච මහාවිභඞ්ගො

## භික්ඛුනී විභඞ්ගො

### 1. කත්ථපඤ්ඤත්තිවාරො 188 - 243

1, 1. පාරාජික කණ්ඩං 188 - 195
1, 2. සඞ්ඝාදිසෙස ,, 196 - 201
1, 3. නිස්සග්ගිය ,, 200 - 205
1, 4. පාචිත්තිය ,, 204 - 239
1. ලසුණවග්ගො පඨමො 204
2. රත්තන්ධකාරවග්ගො දුතියො 208
3. නහානවග්ගො තතියො 212
4. තුවට්ටවග්ගො චතුත්ථො 214
5. චිත්තාගාරවග්ගො පඤ්චමො 218
6. ආරාමවග්ගො ඡට්ඨො 220
7. ගබ්භිනීවග්ගො සත්තමො 224
8. කුමාරිභූතවග්ගො අට්ඨමො 228
8. ඡත්තුපාහනවග්ගො නවමො 232

1, 5. පාටිදෙසනීය කණ්ඩං 240 - 243

### 2. කථාපත්තිවාරො 244 - 268

2, 1. පාරාජික කණ්ඩං 244 - 245
2, 2. සඞ්ඝාදිසෙස කණ්ඩං 244 - 247




Free Distribution www.aathaapi.org

2, 3. නිස්සග්ගිය කණ්ඩො 248 – 249
2, 4. පාචිත්තිය කණ්ඩො 250 – 266
1. ලසුණවග්ගො පඨමො 250
2. රත්තන්ධකාරවග්ගො දුතියො 252
3. නහානවග්ගො තතියො 254
4. තුවට්ටවග්ගො චතුත්ථො 254
5. චිත්තාගාරවග්ගො පඤ්චමො 256
6. ආරාමවග්ගො ඡට්ඨො 258
7. ගබ්භිනීවග්ගො සත්තමො 260
8. කුමාරිභූතවග්ගො අට්ඨමො 262
9. ඡත්තුපාහනවග්ගො නවමො 264

2, 5. පාටිදෙසනීය කණ්ඩො 266 – 269

3. විපත්තිවාරො 270 – 271

4. සඞ්ගහවාරො 270 – 271

5. සමුට්ඨානවාරො 272 275

6. අධිකරණවාරො 272 – 273

7. සමථවාරො 274 – 275

8. සමුච්චයවාරො 276 – 279

9. කත්ථපඤ්ඤත්තිවාරො 280 – 287

10. කතාපත්තිවාරො 288 – 293

10, 1. පාරාජික කණ්ඩො 288 – 289
10, 2. සඞ්ඝාදිසෙස කණ්ඩො 290 – 293

11. විපත්තිවාරො 294 – 295

12. සඞ්ගහවාරො 294 – 295

13. සමුට්ඨානවාරො 296 – 297

14. අධිකරණවාරො 296 – 297

15. සමථවාරං 298 – 299

16. සමුච්චයවාරං 300 – 303

භික්ඛුනීවිභඞ්ගං නිට්ඨිතං.



Free Distribution www.aathaapi.org

## සමුට්ඨාන සීස සඞ්ඛෙපො 304 - 315


| | | |
|---|---|---|
| සමුට්ඨානස්සුද්දානං | | 304 - 305 |
| තෙරසසමුට්ඨානං | | 304 - 305 |
| 1. පඨමපාරාජික සමුට්ඨානං | | 306 - 337 |
| 2. දුතිය පාරාජික | ,, | 306 - 307 |
| 3. සඤ්චරිත්ත | ,, | 308 - 309 |
| 4. සමනුභාසන | ,, | 308 - 309 |
| 5. කඨින | ,, | 310 - 311 |
| 6. එළකලොම | ,, | 310 - 311 |
| 7. පදසොධම්ම | ,, | 312 - 313 |
| 8. අද්ධාන | ,, | 312 - 313 |
| 9. ථෙය්‍යසත්ථ | ,, | 312 - 313 |
| 10. ධම්මදෙසනා | ,, | 312 - 313 |
| 11. භූතාරොචන | ,, | 314 - 315 |
| 12. චොරිවුට්ඨාපන | ,, | 314 - 315 |
| 13. අනනුඤ්ඤාත | ,, | 314 - 315 |


## අනන්තරපෙය්‍යාලො 316 - 345


| | |
|---|---|
| 1. කතිපුච්ඡාවාරො | 316 - 325 |
| 2. ඡ ආපත්තිසමුට්ඨානවාරො | 324 - 327 |
| 3. කතාපත්තිවාරො | 326 - 333 |


## ආපත්තිසමුට්ඨාන ගාථා 334 - 337


| | |
|---|---|
| 4. විපත්තිපච්චයවාරො | 336 - 341 |
| 5. අධිකරණපච්චයවාරො | 340 - 343 |


අනන්තරපෙය්‍යාලො නිට්ඨිතො

## සමථභෙදො 346 - 383


| | |
|---|---|
| 6. පරියායවාරො | 346 - 349 |
| 7. සාධාරණවාරො | 350 - 351 |
| 8. තබ්භාගියවාරො | 350 - 353 |
| 9. සමථා සමථස්ස සාධාරණවාරො | 352 - 353 |
| 10. සමථා සමථස්ස තබ්භාගියවාරො | 354 - 355 |
| 11. සමථසම්මුඛාවිනයවාරො | 354 - 357 |
| 12. විනයවාරො | 356 - 359 |





Free Distribution www.aathaapi.org

13. කුසලවාරො 358 – 359
14. යත්‍ථවාරො 360 – 363
15. සමථවාරො 362 – 365
16. සංසට්ඨවාරො 364 – 365
17. සම්මතිවාරො 364 – 369
18. සම්මති න සම්මතිවාරො 368 – 373
19. සමථාධිකරණවාරො 372 – 377
20. සමුට්ඨාපනවාරො 376 – 379
21. භජතිවාරො 380 – 383


සමථභෙදො නිට්ඨිතො.



Free Distribution www.aathaapi.org

විනයපිටකෙ

# පරිවාරපාළි

## මහාවිභඞ්ගො

3 ඕට 17881 (75/7)

Free Distribution www.aathaapi.org

විනයපිටකෙ

# පරිවාරපාළි

## මහාවිභඞ්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස**

## 1. කත්ථපඤ්ඤත්තිවාරො

### 1.1

### පාරාජිකකණ්ඩං

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං, කං ආරබ්භ, කිස්මිං වත්ථුස්මිං, අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති[1], අනුප්පන්නපඤ්ඤත්ති, සබ්බත්ථ පඤ්ඤත්ති, පදෙසපඤ්ඤත්ති, සාධාරණපඤ්ඤත්ති, අසාධාරණපඤ්ඤත්ති, එකතො පඤ්ඤත්ති, උභතො පඤ්ඤත්ති, පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං, කත්ථ පරියාපන්නං, කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති, චතුන්නං විපත්තීනං කතමා විපත්ති. සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධො, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මති, කො තත්ථ විනයො, කො තත්ථ අභිවිනයො, කිං තත්ථ පාතිමොක්ඛං, කිං තත්ථ අධිපාතිමොක්ඛං, කා විපත්ති, කා සම්පත්ති, කා පටිපත්ති, කති අත්ථවසෙ පටිච්ච භගවතා පඨමං පාරාජිකං පඤ්ඤත්තං, කෙ සික්ඛන්ති, කෙ සික්ඛිතසික්ඛා, කත්ථ ඨිතං, කෙ ධාරෙන්ති, කස්ස වචනං, කෙනාභතන්ති:

1 යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති: වෙසාලිය පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සුදින්නං කලන්දපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සුදින්නො කලන්දපුත්තො පුරාණදුතියිකාය මෙථුනං ධම්මං පටිසෙවි.[2] තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්තීති: එකා පඤ්ඤත්ති, ද්වෙ අනුපඤ්ඤත්තියො, අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති: සබ්බත්ථ පඤ්ඤත්ති.

---

1. අනුප්පඤ්ඤත්ති – ස්‍යා.
2. පතිසෙවි – පෑ.



Free Distribution www.aathaapi.org

## විනය පිටකයෙහි

# පරිවාර පාළිය

## මහාවිභඞ්ගය

**ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා.**

## 1. කත්ථපඤ්ඤත්තිවාරය

### 1.1

### පාරාජික කාණ්ඩය

ශික්ෂා පැණවීමෙහි කල් දන්නා වූ ශික්ෂා පැණවීමෙහි කරුණු දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් යම් පළමු පරිජි සිකපදයෙක් පණවන ලද නම් එය කොතන්හි පණවන ලද ද, කවරක්හු ඇරැබැ පණවන ලද ද, කිනම් වස්තුවෙක්හි පණවන ලද ද, එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුපපන්නපඤ්ඤත්ති ඇද්ද, සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද, සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති ද, එකතො පඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ද, පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොතන්හි පිහිටියේ ද, කොහි ඇතුළත් ද, කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද, සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙක් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙක් ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙක් වේ ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද, එහි විනය කවරේ ද, එහි අභිවිනය කවරේ ද, එහි ප්‍රාතිමොක්ෂය කිම, එහි අධිප්‍රාතිමොක්ෂය කිම, විපත්ති කවර, සම්පත්ති කවර, ප්‍රතිපත්ති කවර, කෙතෙක් කරුණු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් පළමු පරිජි සිකපදය පණවන ලද ද, කවුරු හික්මෙද්ද, කවුරු හික්මුණු සිඛ ඇති යෝ ද, කවුරුන් කෙරෙහි පිහිටියේ ද, කවුරු දරද් ද, කවරක්හුගේ වචනයෙක් ද, කවරක්හු විසින් ගෙන එන ලද යැ යත් :

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් යම් පළමු පරිජි සිකපදයෙක් පණවනලද යැ, එය කොතැන්හි පණවන ලද යැ යත් : විසල්පුරෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබැ පණවන ලද යැ යත් : සුදින්න කලන්ද පුත්‍රයා ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි යැ යත් : සුදින්න කලන්දපුත්‍ර පළමු තම භාර්‍යාව සමඟ මෙවුන්දම් සෙවී යැ, ඒ වස්තුවෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති දෙකෙකැ, අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යි.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : සාධාරණපඤ්ඤත්ති.

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : උභතො පඤ්ඤත්ති.

පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං, කත්ථ පරියාපන්නන්ති : නිදානොගධං නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : දුතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති : සීලවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති : පාරාජිකාපත්තික්ඛන්ධො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

චතුන්නං අධිකරණානං කතමං අධිකරණන්ති : ආපත්තාධිකරණං.

සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මතීති ද්වීහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච.

කො තත්ථ විනයො කො තත්ථ අභිවිනයොති : පඤ්ඤත්ති විනයො, විභත්ති අභිවිනයො.

කිං තත්ථ පාතිමොක්ඛං කිං තත්ථ අධිපාතිමොක්ඛන්ති : පඤ්ඤත්ති පාතිමොක්ඛං, විභත්ති අධිපාතිමොක්ඛං.

කා විපත්තීති : අසංවරො විපත්ති.

කා සම්පත්තීති : සංවරො සම්පත්ති.

කා පටිපත්තීති : න එවරූපං කරිස්සාමීති යාවජීවං ආපාණකොටිකං සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

කති අත්ථවසෙ පටිච්ච භගවතා පඨමං පාරාජිකං පඤ්ඤත්තන්ති : දස අත්ථවසෙ පටිච්ච භගවතා පඨමං පාරාජිකං පඤ්ඤත්තං : සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භීය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය.

කෙ සික්ඛන්තීති : සෙඛා[1] ච පුථුජ්ජනකල්‍යාණකා ච සික්ඛන්ති.

කෙ සික්ඛිතසික්ඛාති : අරහන්තො සික්ඛිතසික්ඛා.

කත්ථ ඨිතන්ති : සික්ඛා කාමෙසු ඨිතං.

කෙ ධාරෙන්තීති යෙසං වත්තන්ති තෙ ධාරෙන්ති.

කස්ස වචනන්ති : භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස.

1. සෙක්ඛා - මජසං.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති ද යත් : සාධාරණපඤ්ඤත්ති යි.

එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති යැ යත් : උභතොපඤ්ඤත්ති යි.

පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ යැ, කොහි ඇතුළත් යැ යත් : නිදනයෙහි පිහිටියේ යැ, නිදනයෙහි ඇතුළති.

කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ යැ යත් : දෙවන උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ.

සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙකැ යත් : සීලවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙකැ යත් : පාරාජිකාපත්තිස්කන්ධ යි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නගී යැ යත් : එක් සමුට්ඨානයෙකින් නගියි : කයින් ද සිතින් ද නගියි, වචනයෙන් නො නගී.

සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙකැ යත් : ආපත්තාධිකරණ යි.

සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ යැ යත් : සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් දැයි දෙ ශමථයෙන් සන්හිඳේ.

එහි විනය කවරේ යැ, එහි අභිවිනය කවරේ යැ යත් : පඤ්ඤත්තිය විනය යැ, පදභාජනය අභිවිනය යි.

එහි ප්‍රාතිමොක්ෂය කිමැ, එහි අධිප්‍රාතිමොක්ෂය කිම යැ යත් : පඤ්ඤත්තිය ප්‍රාතිමොක්ෂ යැ, පදභාජනය අධිප්‍රාතිමොක්ෂ යි.

විපත්ති කවර යත් : අසංවරය විපත්ති යි.

සම්පත්ති කවර යත් : සංවරය සම්පත්ති යි.

ප්‍රතිපත්ති කවර යත් : " දිවිහිම් කොට මෙබන්දක් නොකරමි " යි දිවිපමණින් සමාදන් වැ සිකපදයන්හි හික්මෙයි.

3. කෙතෙක් කරුණු පිණිස භගවත්හු විසින් පළමුපරිජිසිකපදය පණවන ලද යැ යත් : දස කරුණක් පිණිස භගවත්හු විසින් පළමුපරිජිසිකපදය පණවන ලද : සඞ්ඝයා ගේ මනාබව පිණිස යැ. සඞ්ඝයාගේ පහසුව පිණිස යැ, දුසිල් පුඟුලන් නිගැන්ම පිණිස යැ, ප්‍රියශීල භික්ෂූන්ගේ ඵාසුවිහරණය පිණිස යැ. දිට්ඨධම්මයෙහි වින්දයුතු දුක්ගැහැට වැළැක්වීම පිණිස යැ, පරලෙවහි වින්දයුතු දුක්ගැහැට නසනු පිණිස යැ, නො පහන් පුඟුලන්ගේ පැහැදීම පිණිස යැ, පහන් පුඟුලන් බෙහෙවින් පැහැදීම පිණිස යැ, තුන්සසුන්හි පැවැත්ම පිණිස යැ, විනයට අනුග්‍රහ පිණිස යි.

කවුරු හික්මෙති යත් : ශෛක්ෂයෝ ද කල්‍යාණ පෘථග්ජනයෝ ද හික්මෙත්.

කවුරු ශික්ෂිතශික්ෂා ඇතියෝ යැ යත් : රහත්හු ශික්ෂිත ශික්ෂා ඇතියෝ යි.

කවුරුන් කෙරෙහි පිහිටියේ යැ යත් : ශික්ෂාකාමීන් කෙරෙහි පිහිටියේ යැ.

කවුරු දරති යත් : යම් කෙනකුන්හට විනයපෙළ අටුවා වනපොත් ඇද් ද, ඔහු දරත්.

කවරක්හුගේ වචනයෙකැ යත් : භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ගේ වචන යි.

**කෙනාභතන්ති : පරම්පරාභතං.**[1]

1. උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා,
   මොග්ගලිපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිව්හයෙ.

2. තතො මහින්දො ඉට්ඨියො[2] උත්තියො චෙව සම්බලො[3]
   භද්දනාමො ච පණ්ඩිතො,
   එතෙ නාගා මහාපඤ්ඤා ජම්බුදීපා ඉධාගතා.

3. විනයං තෙ වාචයිංසු පිටකං තම්බපණ්ණියා,
   නිකායෙ පඤ්ච වාචෙසුං සත්ත චෙව පකරණෙ.

4. තතො අරිට්ඨො මෙධාවී තිස්සදත්තො ච පණ්ඩිතො
   විසාරදො කාළසුමනො ථෙරො ච දීඝනාමකො,
   දීඝසුමනො ච පණ්ඩිතො.

5. පුනදෙව[4] කාළසුමනො නාගත්ථෙරො ච බුද්ධරක්ඛිතො,
   තිස්සත්ථෙරො ච මෙධාවී දෙවත්ථෙරො ච පණ්ඩිතො.

6. පුනදෙව[4] සුමනො මෙධාවී විනයෙ ච විසාරදො,
   බහුස්සුතො චූළනාගො ගජොව දුප්පධංසියො.

7. ධම්මපාලිතනාමො ච රොහණො[5] සාධුපූජිතො,
   තස්ස සිස්සො මහාපඤ්ඤො ඛෙමනාමො තිපෙටකො,
   දීපෙ තාරකරාජාව පඤ්ඤාය අතිරොචථ.

8. උපතිස්සො ච මෙධාවී ඵුස්සදෙවො මහාකථී
   පුනදෙව සුමනො මෙධාවී පුප්ඵනාමො[6] බහුස්සුතො.

9. මහාකථී මහාසීවො[7] පිටකෙ සබ්බත්ථ කොවිදො,
   පුනදෙව උපාලි මෙධාවී විනයෙ ච විසාරදො.

10. මහානාගො මහාපඤ්ඤො සද්ධම්මවංසකොවිදො,
    පුනදෙව අභයො මෙධාවී පිටකෙ සබ්බත්ථ කොවිදො.

11. තිස්සත්ථෙරො ච මෙධාවී විනයෙ ච විසාරදො,
    තස්ස සිස්සො මහාපඤ්ඤො පුප්ඵනාමො බහුස්සුතො,
    සාසනං අනුරක්ඛන්තො ජම්බුදීපෙ පතිට්ඨිතො

12. චූළාභයො ච මෙධාවී විනයෙ ච විසාරදො,
    තිස්සත්ථෙරො ච මෙධාවී සද්ධම්මවංසකොවිදො.

13. ඵුස්සදෙවො ච[8] මෙධාවී විනයෙ ච විසාරදො,
    සීවත්ථෙරො ච[9] මෙධාවී විනයෙ සබ්බත්ථ කොවිදො.

14. එතෙ නාගා මහාපඤ්ඤා විනයඤ්ඤූ මග්ගකොවිදා,
    විනයං දීපෙ පකාසෙසුං පිටකං තම්බපණ්ණියාති.

---

1. පරම්පරාභටං - සයා.
2. ඉට්ටියො - සීමු.
3. සම්බලො තථා - මජසං.
4. පුනරෙව - පා. සයා
5. රොහණෙ - මජසං.
6. ඵුස්සනාමො - සීමු.
7. මහාසිවො - මජසං.
8. චූලදෙවො ච - සීමු.
9. සිවත්ථෙරො - මජසං.

කවරක්හු විසින් ගෙන එන ලද යැ යත් : පරපුරෙන් ගෙන එන ලදි.

1. උපාලි ස්ථවිර යැ, දසක ස්ථවිර යැ, සොණක ස්ථවිර යැ, එසේ ම සිග්ගව ස්ථවිර යැ, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිර පස්වැනිකොට ඇති මේ තෙරවරු දඹදිවැ විනයධර පරපුරෙහි වෙත්.

2. ඉක්බිති මහින්ද යැ, ඉට්ඨිය යැ, උත්තිය යැ, සම්බල යැ, පණ්ඩිත වූ භද්දනාම යැ යන මහපැනැති මේ රහත්හු දඹදිවින් මෙහි වැඩියහ.

3. ඔහු හෙළදිව්හි විනයපිටකය හැදැරවූහ. සහිපස ද ප්‍රකරණ සත ද හැදැරවූහ

4. ඉක්බිති ප්‍රාඥ වූ අරිට්ඨ යැ, පණ්ඩිත වූ තිස්සදත්ත යැ, විශාරද වූ කාළසුමන යැ. දීඝනාමස්ථවිර යැ, පණ්ඩිත වූ දීඝසුමන යැ.

5. වැළිදු කාළසුමන යැ, නාගස්ථවිර යැ, බුද්ධරක්ඛිත යැ, නුවණැති තිස්ස ස්ථවිර යැ, පණ්ඩිත වූ දෙවස්ථවිර යැ.

6. නැවත ප්‍රාඥ වූ විනයෙහි විශාරද වූ සුමන ස්ථවිර යැ, අනභිභවනීය හස්තිරාජයකු බඳු වූ බහුශ්‍රැත චූළනාග ස්ථවිර යැ.

7. රෝහණවැසි සාධූන් විසින් පුදන ලද ධම්මපාල යන නම් ඇති තෙරණුවෝ යැ, ඔබගේ ශිෂ්‍ය මහා ප්‍රාඥ ත්‍රිපිටකධර ඛෙම නම් තෙරණුවෝ යැ, යන මොහු ප්‍රඥයෙන් හෙළදිව චන්ද්‍රයා මෙන් බැබළුණාහ.

8. නුවණැති උපතිස්ස තෙරණුවෝ යැ, මහා කථික පුස්සදේව තෙරණුවෝ යැ ඉක්බිති ප්‍රශස්ත නුවණැති සුමන තෙරණුවෝ යැ, (බහුශ්‍රැත පුප්ඵ නාම) පදුම නම් තෙරණුවෝ යැ. ත්‍රිපිටකයෙහි දක්ෂ වූ මහාකථී මහාසීව තෙරණුවෝ යැ,

9. වැළිදු ප්‍රශස්ත නුවණැති විනයෙහි විශාර ද වූ උපාලි තෙරණුවෝ යැ. ශාසන වංශය දැනීමෙහි දක්ෂ මහාප්‍රාඥ මහානාග තෙරණුවෝ යැ,

10. නැවත ද නුවණැති ත්‍රිපිටකයෙහි දක්ෂ අභය තෙරණුවෝ යැ. නුවණැති විනයෙහි දක්ෂ තිස්ස තෙරණුවෝ යැ.

11. ඔබ ගේ ශිෂ්‍ය (ලක්දිවින් ගොස්) සසුන් රකිමින් දඹදිව වැඩසිටි මහාප්‍රාඥ බහුශ්‍රැත පුප්ඵනාම (සුමන) නම් තෙරණුවෝ යැ.

12. නුවණැති විනයෙහි ද දක්ෂ චූලාභය තෙරණුවෝ යැ, ප්‍රාඥ ශාසනවංශයෙහි දක්ෂ තිස්ස තෙරණුවෝ යැ.

13. බුද්ධිමත් විනයෙහි ද විශාර ද පුස්සදේව තෙරණුවෝ යැ, නුවණැති විනයෙහි හැමතන්හි දක්ෂ සීව තෙරණුවෝ යැ.

14. මහාප්‍රාඥ, විනය දන්නා, මාර්ගඥානයෙහි දක්ෂ මේ ක්ෂීණාශ්‍රවයෝ විනය පිටකය හෙළදිවැ පැවැසූහ.

2. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දුතියං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ධනියං කුම්භකාරපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ධනියො කුම්භකාරපුත්තො රඤ්ඤො දාරූනි අදින්නානි[1] ආදියි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති –පෙ–.

3. තතියං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති –පෙ–.

4. චතුත්ථං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : වග්ගුමුදාතීරියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : වග්ගුමුදාතීරියා භික්ඛූ ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති –පෙ–.

චත්තාරො පරාජිකා නිට්ඨිතා.

තස්සුද්දානං :

මෙථුනාදින්නාදානඤ්ච මනුස්සවිග්ගහුත්තරි,
පාරාජිකානි චත්තාරි ඡෙජ්ජවත්ථු අසංසයාති.

---

1. අදින්නං – මජසං.

2. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කැරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් යම් දෙවනපරිජි සිකපදයෙක් පණවන ලද නම් එය කොතන්හි පණවන ලද යැ යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ යැ යත් : ධනිය කුම්භකාර පුත්‍රයා ඇරැබැ යැ.

කිනම් වස්තුවෙක්හි යැ යත් : ධනියකුම්භකාරපුත්‍ර රජහුගේ නුදුන් දැව ගත්තේය. ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නගී යැ යත් : තුන් සමුට්ඨානයෙකින් නගියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නගියි, වචනයෙන් නො නගී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගියි, කයින් නො නගී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගී. . . .

3. තෙවන පරිජිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : විසල්පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ යැ යත් : බොහෝ භික්ෂූන් ඇරැබැ යැ.

කිනම් වස්තුවෙක්හි යැ යත් : බොහෝ භික්ෂූහු ඔවුනොවුන් දිවියෙන් තොරකළහ ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි,

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නගී යැ යත් : තුන් සමුට්ඨානයකින් නගියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නගියි, වචනයෙන් නොනගී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගියි. කයින් නොනගී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගී. . . .

4. සිවුවන පරිජිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : විසල් පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ යැ යත් : වග්ගුමුදු ගංතෙර වැසි භික්ෂූන් ඇරැබැ යැ.

කිනම් වස්තුවෙක්හි යැ යත් : වග්ගුමුදු ගංතෙර වැසි භික්ෂූහු ඔවුනොවුන්ගේ ධ්‍යානාදී උතුරු මිනිස්දහම් පිළිබඳ ගුණ ගිහියන්ට කීහු. ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නගී යැ යත් : තුන් සමුට්ඨානයෙකින් නගියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නගියි, වචනයෙන් නො නගී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගියි, කයින් නො නගී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගී. . . .

සතරපරිජි නිමි.

එහි උද්දානය :

මෙවුන්දම හා අයිනාදන යැ, මිනිස්විකා යැ, උතුරු මිනිස්දම් යැ යන සතරපරිජි ඒකාන්තයෙන් ඡෙදාගාමී වස්තූහු වෙත්.

## 1.2

## සඞ්ඝාදිසෙස කණ්ඩො

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තො, කං ආරබ්භ. කිස්මිං වත්ථුස්මිං, අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති, සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති, සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති, එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්ති, පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නං, කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති, චතුන්නං විපත්තීනං කතමා විපත්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධො, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මති, කො තත්ථ විනයො, කො තත්ථ අභිවිනයො. කිං තත්ථ පාතිමොක්ඛං, කිං තත්ථ අධිපාතිමොක්ඛං, කා විපත්ති, කා සම්පත්ති, කා පටිපත්ති, කති අත්ථවසෙ පටිච්ච භගවතා උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො පඤ්ඤත්තො, කෙ සික්ඛන්ති, කෙ සික්ඛිතසික්ඛා, කත්ථ ඨිතං, කෙ ධාරෙන්ති, කස්ස වචනං, කෙනාභතන්ති:

1 යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සංඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං සෙය්‍යසකං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා සෙය්‍යසකො හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙසි, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති: එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති: සබ්බත්ථ පඤ්ඤත්ති

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති: අසාධාරණපඤ්ඤත්ති.

එකතො පඤ්ඤත්ති උභතොපඤ්ඤත්තීති: එකතො පඤ්ඤත්ති.

පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති: නිදානොගධං නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති: තතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති.

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති: සීලවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති: සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති: එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

## 1.2

## සඞ්ඝාදිසෙස කාණ්ඩය

සිකපද පැණවීමෙහි කල් දන්නා වූ (සිකපද පැණවීමෙහි කරුණු) දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ යම් සඟවෙසෙසෙක් පණවනලද ද එය කොතන්හි පණවන ලද ද කවරක්හු ඇරබැ (පණවන ලද) ද කිනම් වස්තුවෙක්හි (පණවන ලද) ද එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති සාධාරණ පඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ඇද්ද පස් වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ ද කොහි ඇතුළත් ද කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්ති යෙක් ද සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙක් ද සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙක් ද සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද එහි විනය කවරේ ද එහි අභිවිනය කවරේ ද එහි ප්‍රාතිමොක්ෂය කිම එහි අධිප්‍රාතිමොක්ෂය කිම විපත්ති කවර යැ සම්පත්ති කවරයැ ප්‍රතිපත්ති කවරයැ කෙතෙක් කරුණු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස පණවන ලද ද, කවුරු හික්මෙද්ද කවුරු හික්මුණු සිඛ ඇතියෝ ද කොහි පිහිටියේ ද කවුරු දරද්ද කවරක්හුගේ වචනයෙක් ද කවරක්හු විසින් ගෙන එන ලද ද යත් :

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවනලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබැ (පණවන ලද) ද යත් : ආයුෂ්මත් සෙය්‍යසක මහණහු ඇරබ ය.

කිනම් වස්තුවෙක්හි ද යත් : ආයුෂ්මත් සෙය්‍යසක මහණ අතින් උපක්‍රම කොට සුකුරු මිදී ය, ඒ වස්තුවෙහි ය .

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙක අනුපඤ්ඤත්ති එකෙක අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යි.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති ද යත් : අසාධාරණපඤ්ඤත්ති යැ.

එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ද යත් : එකතොපඤ්ඤත්ති යි.

පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ ද කොහි ඇතුළත් ද යත් : නිදානයෙහි පිහිටියේ ය නිදානයෙහි ඇතුළත් යැ.

කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද යත් : තෙවන උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ.

සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙක් ද යත් : සීලවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙක් ද යත් : සඞ්ඝාදිශෙෂාපත්තිස්කන්ධ යි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : එක් සමුට්ඨානයෙකින් නඟීයි : කයින් ද සිතින් ද නඟීයි වචනයෙන් නොනඟී.

චතුන්නං අධිකරණානං කතමං අධිකරණන්ති: ආපත්තාධිකරණං.

සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මතීති: ද්වීහි සමථෙහි සම්මති: සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච.

කො තත්ථ විනයො කො තත්ථ අභිවිනයොති: පඤ්ඤත්ති විනයො, විභත්ති අභිවිනයො.

කිං තත්ථ පාතිමොක්ඛං කිං තත්ථ අධිපාතිමොක්ඛන්ති: පඤ්ඤත්ති පාතිමොක්ඛං විභත්ති අධිපාතිමොක්ඛං.

කා විපත්තීති: අසංවරො විපත්ති.

කා සම්පත්තීති: සංවරො සම්පත්ති.

කා පටිපත්තීති: න එවරූපං කරිස්සාමීති යාවජීවං ආපාණකොටිකං සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

කති අත්ථවසෙ පටිච්ච භගවතා උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො පඤ්ඤත්තොති: දස අත්ථවසෙ පටිච්ච භගවතා උපක්කමිත්වා අසුචිං මොචෙන්තස්ස සඞ්ඝාදිසෙසො පඤ්ඤත්තො: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භිය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය.

කෙ සික්ඛන්තීති: සෙඛා ච පුථුජ්ජනකල්‍යාණකා ච සික්ඛන්ති.

කෙ සික්ඛිතසික්ඛාති අරහන්තො සික්ඛිතසික්ඛා.

කත්ථ ඨිතන්ති: සික්ඛාකාමෙසු ඨිතං.

කෙ ධාරෙන්තීති: යෙසං වත්තන්ති තෙ ධාරෙන්ති.

කස්ස වචනන්ති: භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස.

කෙනාභතන්ති: පරම්පරාභතං. උපාලි දාසකො චෙව -පෙ- තම්බපණ්ණියාති.

2. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො -පෙ-.

සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයක් ද යත් : ආපත්තා ධිකරණ යි.

සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : සම්මුඛා විනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් දැයි දෙ ශමථයෙන් සන්හිඳේ.

එහි විනය කවරේ ද, එහි අභිවිනය කවරේ ද යත් : පඤ්ඤත්ති විනය යැ, පදභාජනය අභිවිනය යි.

එහි ප්‍රාතිමොක්ෂය කිම, එහි අධිප්‍රාතිමොක්ෂය කිම යත් : පඤ්ඤත්ති ප්‍රාතිමොක්ෂ යැ, පදභාජනය අධිප්‍රාතිමොක්ෂ යි.

විපත්ති කවර යත් : අසංවරය විපත්ති යි.

සම්පත්ති කවර යත් : සංවරය සම්පත්ති යි.

ප්‍රතිපත්ති කවර යත් : " දිවිහිමි කොට මෙබන්දක් නොකරන්නෙමි " යි දිවිපමණින් සමාදන් වැ සිකපදයන්හි හික්මෙයි.

කෙතෙක් කරුණු පිණිස භගවත්හු විසින් උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස පණවන ලදයැ යත් : දස කරුණක් පිණිස භගවත්හු විසින් උපක්‍රම කොට සුකුරු මුදන්නහු පිළිබඳ සඟවෙසෙස පණවන ලදි. සඞ්ඝයා ගේ මනාබව පිණිස යැ, සඞ්ඝයාගේ පහසුව පිණිස යැ, දුසිල් පුඟුලන් නිගැන්ම පිණිස යැ, ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස යැ, දිටුදැමියෙහි වින්දයුතු දුක්ගැහැට වැළැක්වීම පිණිස යැ. පරලෙව්හි වින්දයුතු දුක්ගැහැට නැසීම පිණිස යැ, නො පහන් වූවන් ගේ පැහැදීම පිණිස යැ, පහන් වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස යැ, සුන්සසුන්හි පැවැත්ම පිණිස යැ. විනයට අනුග්‍රහ පිණිස යි.

කවුරු හික්මෙද්ද යත් : ශෛක්ෂයෝ ද කල්‍යාණ පෘථග්ජනයෝ ද හික්මෙත්.

කවුරු හික්මුණු සිඛ ඇත්තෝ ද යත් : රහත්හු හික්මුණු සිඛ ඇතියෝ යි.

කොහි පිහිටියේ ද යත් : ශික්ෂාකාමීන් කෙරෙහි පිහිටියේ යි.

කවුරු දරද්ද යත් : යම් කෙනකුන්ට විනය පෙළ අටුවා වන පොත් ද, ඔහු දරත්.

කවරුන්ගේ වචනයෙක් ද යත් : භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ ගේ වචනයි.

කවරක්හු විසින් ගෙන එනලද යැ යත් : පරපුරෙන් ගෙන එන ලදි. උපාලි ස්ථවිරය, දයක ස්ථවිරය, . . . තාම්‍රපර්ණී නම් වූ හෙළදිවැ පැවසුහ.

2. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් මිනිස් මාගමක හා කාසසභයට පැමිණෙන්නහු පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබැ (පණවන ලද) යැ යත් : ආයුෂ්මත් උදායි මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : ආයුෂ්මත් උදායි මහණ මාගමක හා කාසසභයට පැමිණියේ ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි. වචනයෙන් නො නඟී. . . .

3. මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

4. මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: අයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං අභාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

5. සඤ්චරිත්තං සමාපජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී සඤ්චරිත්තං සමාපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති න වාචතො න චිත්තතො, සියා වාචතො සමුට්ඨාති න කායතො න චිත්තතො, සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

6. සඤ්ඤාචිකාය කුටිං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: ආළවියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආළවකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආළවකා භික්ඛූ සඤ්ඤාචිකාය කුටියො කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්ති සමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. මිනිස්මාගමකට (වසමහ පසමහ පිළිබඳ) තුළුල් තෙපුල් කියන්නහු පිළිබඳ සඟාදිසෙස කොතන්හි පණවන ලදයැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ (පණවන ලද) යැ යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ මාගමකට තුළුල් තෙපුල් කීයැ ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසි විටෙක කයින් ද සිතින් ද නඟියි වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

4. මිනිස් මාගමක සමීපයෙහි තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙ අනුසස් කියන්නහු පිළිබඳ සඟාදිසෙස කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ යැ යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරැබයැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ මාගමක සමීපයෙහි තමහට මෙවුන්දමින් මෙහෙකිරීමෙ අනුසස් කීයැ ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයකින් නඟියි : කිසි විටෙක කයින් ද සිතින් ද නඟියි වචනයෙන නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින ද නඟියි. කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

5. (ස්ත්‍රී පුරුෂයන්ගේ කෙලෙස් පිළිබඳ හසුන් ගෙන යනු එනු කරණ) සසුරුකු සඟ වෙසෙස කොතැන්හි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ යැ යත් : ආයුෂ්මත් උදයී තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ ස්ත්‍රීපුරුෂයන්ගේ කෙලෙස් පිළිබඳ හසුන් ගෙන යනුඑනුවට පැමිණියේ යැ ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයින් නඟියි : කිසිවිටෙක කයින් නඟියි වචනයෙන් නො නඟියි සිතින් නො නඟී. කිසිවිටෙක වචනයෙන් නඟියි කයින් නො නඟියි සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

6. තමා ඉල්වාගත් උපකරණයෙන් කිළියක් කරවන්නහු පිළිබඳ සඟ වෙසෙස කොතන්හි පණවන ලද යැ යත් : අළව්පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැ යැ යත් : අළව්පුරවැසි භික්ෂූන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : අළව්පුරවැසි භික්ෂූහු තමන් ඉල්වාගත් උපකරණයෙන් කුටි කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතරෙහි සමුට්ඨාන සයින් නඟියි. . . .

7. මහල්ලකං විහාරං කාරාපෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: කොසම්බියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා ඡන්නො විහාරවත්ථුං සොධෙන්තො අඤ්ඤතරං චෙතියරුක්ඛං ඡෙදාපෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: රාජගහෙ පඤ්ඤත්තො.

කං ආරබ්භාති: මෙත්තියභූම්මජකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: මෙත්තියභූම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

9. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: රාජගහෙ පඤ්ඤත්තො.

කං ආරබ්භාති: මෙත්තියභූම්මජකෙ[1] භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: මෙත්තියභූම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: රාජගහෙ පඤ්ඤත්තො.

කං ආරබ්භාති: දෙවදත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: දෙවදත්තො සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

11. භෙදකානුවත්තකානං[2] භික්ඛූනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තානං සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: රාජගහෙ පඤ්ඤත්තො.

---

1. භූමජකෙ - මජසං.
2. භෙදානුවත්තකානං - මජසං.

Free Distribution www.aathaapi.org

7. කරවා දෙන හිමියකු ඇති මහත් විහාරයක් කරවන්නහු පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලද යැ යත් : කොසඹෑ නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරබයැ යත් : ආයුෂ්මත් ඡන්න තෙරුන් ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න මහණ ගෙබිම හෙළි කරනුයේ එක්තරා සැරුකක් සිඳ වියැ, ඒ වස්තුයෙහි ය.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයින් නඟියි. . . .

8. අමූලක වූ පරිජිඇවතින් මහණක්හට චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලද යැ යත් : රජගහ නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරබැයැ යත් : මෙත්තිය භුම්මජක භික්ෂූන් ඇරබැ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රහට අමූලක පරිජි ඇවතින් චොදනා කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟී. . . .

9. අන්‍යභාගීය (අන් කොටස් ඇති) අධිකරණයක්හුගේ කිසියම් (ජාත්‍යාදී) දෙශ ලෙශ මාත්‍රයක් ගෙන මහණක්හට පරිජිඇවතින් චොදනා කරන්නහු පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලද යැ යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරබැ යැ යත් : මෙත්තිය භුම්මජක භික්ෂූන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රහට අඤ්ඤභාගීය අධිකරණයක්හුගේ කිසියම් දෙශලෙශ මාත්‍රයක් ගෙන පරිජි ඇවතින් චොදනා කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

10. තුන්යළ තාක් සමනුභාසනකම් කරණකල්හි (දෘෂ්ටිය) නොහරින සඞසභෙදක මහණ පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලදයැ යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරබැයැ යත් : දෙවදත් මහණහු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : දෙවදත්ත මහණ සමගි සඞසයා බිඳුවීම පිණිස උත්සාහ කෙළේ ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

11. තුන්යළ තාක් සමනුභාසනකම් කරණ කල්හි (දෘෂ්ටිය) නොහරින භෙදනුවත්තක භික්ෂූන් පිළිබඳ සඟවෙසෙස කොතන්හි පණවන ලදයැ යත් : රජගහනුවර දී පණවන ලදී.

4—ඕම 17881 (7/75)

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ දෙවදත්තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා අහෙසුං වග්ගවාදකා තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

12. දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: කොසම්බියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං අකාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

13. කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා භික්ඛූ ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

තෙරස සඞ්ඝාදිසෙසා නිට්ඨිතා.

---

තස්සුද්දානං:

විසට්ඨි[1] කායසංසග්ගං - දුට්ඨුල්ලං අත්තකාමතං,[2]
සඤ්චරිත්තං කුටී චෙව - විහාරෙ ච අමූලකං.
කඤ්චි දෙසඤ්ච භෙදෙ ච - තස්සෙව[3] අනුවත්තකා,
දුබ්බචං කුලදූසඤ්ච - සඞ්ඝාදිසෙසා තෙරසාති.

---

1. විස්සට්ඨි - මජසං, සිමු 2.
2. අත්තකාමඤ්ච - මජසං, සිමු 1, 2.
3. තථෙව - සිමු 1, 2.

කවරක්හු ඇරබැ යැ යත් : බොහෝ භික්ෂූන් ඇරබැ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : ව්‍යග්‍රවාදී බොහෝ භික්ෂූහු සඞ්ඝභෙදය කිරීමට වෑයම් කරන දෙව්දත් මහණහට අනුවර්තකයෝ වූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නගියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

12. තුන්යල තෙක් සමනුභාසනකම් කරණ කල්හි (දෘෂ්ටිය) නො හරින දුර්වච මහණහු පිළිබඳ සඟාවශෙසස කොතන්හි පණවන ලද යැ යත් : කොසඹෑනුවර දී පණවන ලදී.

කවරක්හු අරබැ යැ යත් : ආයුෂ්මත් ඡන්න තෙරුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න තෙරහු භික්ෂූන් විසින් සකාරණයෙන් කියනු ලබන්නාහු තමා නො කියයුත්තහු කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නගියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

13. තුන්යල තාක් සමනුභාසනකම් කරණකල්හි (දෘෂ්ටිය) නොහරින කුලදූෂක මහණහු පිළිබඳ සඟවශෙසස කොතන්හි පණවන ලදයැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබැයැ යත් : අස්සජි පුනබ්බසුක භික්ෂූන් ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : අස්සජි පුනබ්බසුක භික්ෂූහු සඞ්ඝයා විසින් සහරමින් නෙරණකම් කරණ ලද්දහු කාරක භික්ෂූන් ඡන්දගාමිත්වයෙන් ද්වෙෂගාමිත්වයෙන් මෝහගාමිත්වයෙන් භයගාමිත්වයෙන් යුක්ත කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නගියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

තෙළෙස් සඟවෙසෙස් නිමි.

එහි උද්දානය :

සුකුරුම්දීම ද කායසංසර්ගය ද දුට්ඨුල්ලය ද අත්තකාමපාරිචරිය ද සඤ්චරිත්තය ද කුටිකාරාපනය ද මහල්ලක විහාරය ද අමූලකය ද කිඤ්චිදෙසය ද සඞ්ඝභෙදය ද සඞ්ඝභෙදානුවත්තකය ද දුබ්බචය ද කුලදූසනය ද යන සඟවෙසෙස් තෙළෙස වී.

## 1.3

## අනියතකණ්ඩා

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමො අනියතො කත්ථ පඤ්ඤත්තො -පෙ- කෙනාභතන්ති.

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පඨමො අනියතො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති : ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලංකම්මනියෙ නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති : සබ්බත්ථ පඤ්ඤත්ති.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : අසාධාරණපඤ්ඤත්ති.

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : එකතො පඤ්ඤත්ති.

පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති : නිදානොගධං නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : චතුත්ථෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති.

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති : සියා සීලවිපත්ති, සියා ආචාරවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති : සියා පාරාජිකාපත්තික්ඛන්ධො, සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, සියා පාචිත්තියාපත්තික්ඛන්ධො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

චතුන්නං අධිකරණානං කතමං අධිකරණන්ති : ආපත්තාධිකරණං.

සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මතීති : තීහි සමථෙහි සම්මති : සියා සම්මුඛාවිනයෙන ච සියා පටිඤ්ඤාතකරණෙන ච සියා තිණවත්ථාරකෙන ච.

කො තත්ථ විනයො කො තත්ථ අභිවිනයොති : පඤ්ඤත්ති විනයො, විභත්ති අභිවිනයො.

කිං තත්ථ පාතිමොක්ඛං කිං තත්ථ අධිපාතිමොක්ඛන්ති : පඤ්ඤත්ති පාතිමොක්ඛං, විභත්ති අධිපාතිමොක්ඛං.

කා විපත්තීති : අසංවරො විපත්ති.

# 1.3
## අනියත කාණ්ඩය

සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් පළමුවන අනියත සිකපදය කොතැන්හි පණවන ලද ද, . . . කවරක්හු විසින් ගෙන එන ලද ද යත් :

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් පළමුවන අනියත සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබැ යැ යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ හුදෙකලා වූයේ රහසිගත වූයේ හුදෙකලා වූ මාගමක හා මෛථුනසෙවනයට යොග්‍ය වූ පිළිසත් අස්නෙකැ හිඳ, ඒ වස්තුයෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යැ.

සාධාරණ පඤ්ඤත්ති අසාධාරණ පඤ්ඤත්ති ද යත් : අසාධාරණ පඤ්ඤත්ති යි.

එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ද යත් : එකතොපඤ්ඤත්ති යි.

පස්වැදෑරුම් පාමොක් උදෙසීම අතුරෙහි කොහි පිහිටියේ ද, කොහි ඇතුළද් ද යත් : නිදානයෙහි පිහිටියේ යැ. නිදානයෙහි ඇතුළති.

කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද යත් : සතරවන උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ.

සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙක් ද යත් : කිසිවිටෙක සීල විපත්ති යැ. කිසිවිටෙක ආචාරවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙක් ද යත් : කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධ යැ, කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධ යැ, කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධ යි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි. වචනයෙන් නො නඟී.

සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙක් ද යත් : ආපත්තාධි කරණ යැ. සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : තුන් ශමථයෙන් සන්හිඳෙයි : කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් ද සන්හිඳේ.

එහි විනය කවරේ ද, එහි අභිවිනය කවරේ ද යත් : පඤ්ඤත්තිය විනය යැ, පදභාජනය අභිවිනය යි.

එහි ප්‍රාතිමොක්ෂය කිම, එහි අධිප්‍රාතිමොක්ෂය කිමයැ යත් : පඤ්ඤත්තිය ප්‍රාති මොක්ෂයැ. පදභාජනය අධිප්‍රාතිමොක්ෂ යි.

විපත්ති කවර යත් : අසංවරය විපත්ති යි.

කා සම්පත්තීති : සංවරෙ සම්පත්ති.

කා පටිපත්තීති : න එවරූපං කරිස්සාමීති යාවජීවං ආපාණකොටිකං සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

කති අත්ථවසෙ පටිච්ච භගවතා පඨමො අනියතො පඤ්ඤත්තොති : දස අත්ථවසෙ පටිච්ච භගවතා පඨමො අනියතො පඤ්ඤත්තො : සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භීයොභාවාය සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය.

කෙ සික්ඛන්තීති : සෙඛා ච පුථුජ්ජනකල්‍යාණකා ච සික්ඛන්ති.

කෙ සික්ඛිතසික්ඛාති : අරහන්තො සික්ඛිතසික්ඛා.

කත්ථ ඨිතන්ති : සික්ඛාකාමෙසු ඨිතං.

කෙ ධාරෙන්තීති : යෙසං වත්තන්ති තෙ ධාරෙන්ති.

කස්ස වචනන්ති : භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස.

කෙනාභතන්ති : පරම්පරාභතං, උපාලි දාසකො -පෙ- තම්බපණ්ණියාති.

2. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන දුතියො අනියතො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති : ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උදායි මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති. අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති : සබ්බත්ථ පඤ්ඤත්ති.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : අසාධාරණපඤ්ඤත්ති

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : එකතො පඤ්ඤත්ති,

පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති : නිදානොගධං නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : චතුත්ථෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති.

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති : සියා සීලවිපත්ති, සියා ආචාරවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති : සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, සියා පාචිත්තියාපත්තික්ඛන්ධො.

Free Distribution www.aathaapi.org

සම්පත්ති කවර යත් : සංවරය සම්පත්ති යි.

ප්‍රතිපත්ති කවර යත් : " දිවිහිමි කොට මෙබන්දක් නො කරන්නෙමි " යි දිවි පමණින් සමාදන් වැ සිකපදයන්හි හික්මෙයි.

කෙතෙක් කරුණු පිණිස භගවත්හු විසින් පළමු වන අනියතසිකපදය පණවන ලදයැ යත් : දස කරුණක් පිණිස භගවත්හු විසින් පළමුවන අනියත සිකපදය පණවන ලදි. සඞ්ඝයාගේ මනා බව පිණිස යැ, සඞ්ඝයාගේ පහසුව පිණිස යැ, දුසිල් පුඟුලන් නිගැන්ම පිණිස යැ, ප්‍රියශීල භික්ෂූන්ගේ පහසු විහරණය පිණිස යැ, දිටුදැමියෙහි වින්ද යුතු දුක්ගැහැට වැළැක්ම පිණිස යැ, පරලෙවහි වින්ද යුතු දුක්ගැහැට නැසීම පිණිස යැ, නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස යැ, පහන්වූවන් ගේ වැඩියක් පැහැදීම පිණිස යැ, සුන්සසුන්හි පැවැත්ම පිණිස යැ, විනයට අනුග්‍රහ පිණිස යි.

කවුරු හික්මෙද් ද යත් : ශෛක්ෂයෝ ද කල්‍යාණපෘථග්ජනයෝ ද හික්මෙත්.

කවුරු හික්මුණු සිඛ ඇතියෝ ද යත් : රහත්හු හික්මුණු සිඛ ඇතියෝ යි.

කවුරුන් කෙරෙහි පිහිටියේ ද යත් : ශික්ෂාකාමීන් කෙරෙහි පිහිටියේ යි.

කවුරු දරද්ද යත් : යම් කෙනකුන්ට විනය පෙළ අටුවා වනපොත් ද, ඔහු දරත්. කවුරුන්ගේ වචනයෙක් ද යත් : භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචන යි.

කවුරුන් විසින් ගෙන එන ලද ද යත් : පරපුරෙන් ගෙන එන ලදි.

උපාලිස්ථවිරය, දාසකස්ථවිරය, . . . තාම්‍රපර්ණී නම් වූ හෙළදිවැ පැවසූහ.

2. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් දෙවැනි අනියත සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබැ යැ යත් : ආයුෂ්මත් උදායී මහණහු ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි යැ යත් : ආයුෂ්මත් උදායී මහණ එකලා වූයේ රහසිගත වූයේ එකලා වූ මාගමක හා හිඳ, ඒ වස්තුයෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙකැ. අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යැ.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති ද යත් : අසාධාරණපඤ්ඤත්ති යි.

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්ති ද යත් : එකතො පඤ්ඤත්ති යි.

පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ ද, කොහි ඇතුළත් ද යත් : නිදානයෙහි පිහිටියේ යැ, නිදානයෙහි ඇතුළත්.

කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද යත් : සතරවන උද්දෙසයෙන් උදෙසීමට පැමිණෙයි.

සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙකැ යත් : කිසිවිටෙක සීල විපත්ති යැ. කිසිවිටෙක ආචාරවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙක් ද යත් : කිසිවිටෙක සඞ්ඝාදිශෙෂාපත්තිස්කන්ධ යැ, කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධ යි.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.

චතුන්නං අධිකරණානං කතමං අධිකරණන්ති : ආපත්තාධිකරණං.

සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මතීති : තීහි සමථෙහි සම්මති : සියා සම්මුඛාවිනයෙන ච, සියා පටිඤ්ඤාතකරණෙන ච, සියා තිණවත්ථාරකෙන ච -පෙ-

ද්වෙ අනියතා නිට්ඨිතා.

---

තස්සුද්දානං :

අලං කම්මනියඤ්චෙව - තථෙව ච න හෙව ඛො,
අනියතා සුපඤ්ඤත්තා - බුද්ධසෙට්ඨෙන තාදිනාති.

## 1.4

## නිස්සග්ගියකණ්ඩො

### 4.1

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අතිරෙකචීවරං දසාහං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකචීවරං දසාහාතික්කන්තං ධාරෙසුං,[1] තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

2. එකරත්තං තිචීවරෙන විප්පවසන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ භික්ඛූනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

---

1. අතිරෙක චීවරං ධාරෙසුං - මජසං.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟී, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී.

සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙක් ද යත් : ආපත්තාධිකරණ යි.

සත්වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ යැ යත් : කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් ද සන්හිඳේ. . . .

දෙ අනියත සිකපද නිමි.

---

එහි උද්දානය :

අලංකම්මනිය ද එසේ ම නො මැ අලංකම්මනිය ද යන දෙ අනියත සිකපදයෝ තාදී ගුණැති බුද්ධශ්‍රෙෂ්ඨයන් වහන්සේ විසින් මොනවට පණවන ලදහ.

# 1.4

## නිස්සග්ගියකාණ්ඩය

### 4.1

1. සිකපද පැණවීමෙහි කල් දන්නාවූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් අතිරේකචීවරය දසදිනක් ඉක්ම වන්නහු පිළිබඳ නිසග්ගිපචිත්තිය කොතන්හි පණවනලද යැ යත් : විසල්පුරයෙහි දී පණවනලදී.

කවරක්හු ඇරැබැයැ යත් : සවග්ගමහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : සවග්ගමහණහු දසදිනක් ඉක්ම ගිය අතිරේක චීවරයක් දරුහ, ඒ වස්තුයෙහි ය.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නඟියි : කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

2. එක් රැයක් තුන් සිවුරෙන් වෙන්ව වසන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබැයැ යත් : බොහෝ භික්ෂූන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂුහු (සහළ) සිවුර භික්ෂූන් ඇතැ තබා හඳනය හා උතුරුසඟ සිවුරෙන් යුතුව දනවූ සැරිසැරීමට ගියාහු ය. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නඟියි : කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී, කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

3. අකාලචීවරං පටිග්ගහෙත්වා මාසං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ අකාලචීවරං පටිග්ගහෙත්වා මාසං අතික්කාමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

4. අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

5 අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගහෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො අඤ්ඤාතකං සෙට්ඨිපුත්තං චීවරං විඤ්ඤාපෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

7. අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා තතුත්තරිං[1] චීවරං විඤ්ඤාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

---

1. තතුත්තරි - මජසං.

3. අකාලචීවරයක් පිළිගෙන මසක් ඉක්මවන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු අකාල චීවරයක් පිළිගෙන (නො ඉටා නො විකපා) මසක් ඉක්මවූහ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නඟියි : කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

4. නො නෑ මෙහෙණක ලවා පැරණි සිවුරක් දොවවන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කො තන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් උදායි මහණහු ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදායි මහණ නො නෑ මෙහෙණක ලවා පැරණි සිවුරක් දොවාපියැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

5. නො නෑ මෙහෙණක අතින් සිවුරක් පිළිගන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් උදායි මහණහු ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදායි මහණ නොනෑ මෙහෙණක අතින් සිවුරක් පිළිගත්තේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

6. නො නෑ ගැහැවියකුගෙන් හෝ ගැහැවිනියකගෙන් හෝ සිවුරක් ඉල්වාගන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහි පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර නො නෑ සිටු දරුවකුගෙන් සිවුරක් ඉල්වියැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

7. නො නෑ ගැහැවියකුගෙන් හෝ ගැහැවිනියකගෙන් හෝ එක් හඳනයකට උතුරුසඟ සිවුරකට වැඩි සිවුරක් ඉල්වාගන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබැ යැ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ න මත්තං ජානිත්වා බහුං චීවරං විඤ්ඤාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. පුබ්බෙ අප්පවාරිතස්ස අඤ්ඤාතකං ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකං ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

9. පුබ්බෙ අප්පවාරිතස්ස අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

10. අතිරේකතික්ඛත්තුං චොදනාය අතිරේකඡක්ඛත්තුං ඨානෙන චීවරං අභිනිප්ඵාදෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො උපාසකෙන අජ්ජණ්හො[1]. භන්තෙ ආගමෙහී ති වුච්චමානො නාගමෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

කඨිනවග්ගො පඨමො.

---

1. {අජ්ජුණ්හො - සිමු 1, 2
{අජ්ජණ්හො - මජසං.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු පමණ නො දත බොහෝ සිවුරු ඉල්වූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

8. පෙර නො පැවරූ නො නෑ ගැහැවියකු වෙත එළඹ සිවුරක් කිරීමෙහි අධික විධාන යට පැමිණෙන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙර නො පවරණ ලදුයේ නො නෑ ගැහැවියකු වෙත එළඹ සිවුරක් කිරීමෙහි අධික විධානයට පැමිණියේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

9. පෙර නො පැවරූ නො නෑ ගැහැවියන් වෙත එළඹ සිවුරක් කිරීමෙහි අධික විධානයට පැමිණෙන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතෙන්හි පණවන ලදයැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙර නො පවරණ ලදුයේ නො නෑ ගැහැවියන් වෙත එළඹ සිවුරක් කිරීමෙහි අධික විධානයට පැමිණියේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

10. අයිරා තෙවරක් චෝදනා කිරීමෙන් ද අයිරා සවරක් එළඹ සිටීමෙන් ද සිවුරක් උපදවා ගන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර උවසුවකු විසින් " ස්වාමිනි, අද එකදවසක් ඉවසා වදළ මැනැවැ " යි කියනු ලබන්නේ නො ඉවසී යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

පළමුවන කඨින වර්ග යි.

---

## 4.2

1. කොසියමිස්සකං සන්ථතං කාරාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: ආළවියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ කොසියකාරකෙ උපසඞ්කමිත්වා එවමාහංසු: 'බහූ ආවුසො කොසකාරකෙ පචථ, අම්හාකම්පි දස්සථ, මයම්පි ඉච්ඡාම කොසියමිස්සකං සන්ථතං කාතු'න්ති, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

2. සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

3. අනාදියිත්වා තුලං ඔදාතානං තුලං ගොචරියානං නවං සන්ථතං කාරාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ ථොකඤ්ඤෙව ඔදාතානං අන්තෙ[1] ආදියිත්වා තථෙව සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. අනුවස්සං සන්ථතං කාරාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ අනුවස්සං සන්ථතං කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

---

1. ඔදාතං අන්තෙ - මජසං.
ඔදාතානං අන්තෙ අන්තෙ - සිමු 1.

## 4.2

1. තිහිරිහු මුසුකළ ඇතිරියක් කරවන්නාහු පිළිබඳ නිසගිපචිත්ති සික්ඛාපදය කොතන්හි පණවන ලද යැ යත් : අළව්පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු තිහිරිවායන් වෙත එළඹ මෙසේ කීහ : " ඇවත්නි, බොහෝ තිහිරි පණුවන් පිසවු, අපට ද දෙවු, අපිදු තිහිරිහු මුසුකළ ඇතිරියක් කරන්නට කැමැත්තම්හ " යි, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

2. හුදු කළු එළුලොමින් ඇතිරියක් කරවන්නාහු පිළිබඳ නිසගිපචිත්ති සික්ඛාපදය කොතන්හි පණවන ලද යැ යත් : විසල්පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : සවග මහණහු හුදු කළු එළුලොමින් ඇතිරියක් කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

3. හෙළ එළුලොම් සතරින් කොටසක් ද කිඹුල්වන් එළුලොම් සතරින් කොටසක් ද නො ගෙන අළුත් ඇතිරියක් කරවන්නාහු පිළිබඳ නිසගිපචිත්ති සික්ඛාපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කිනම් වස්තුයෙක් හි ද යත් : සවග මහණහු මදක් හෙළ එළුලොම් ද එසේ ම මදක් හුදු කළු එළුලොම් ද කෙළවරැ ගන්වා එළුලොමින් ඇතිරියක් කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

4. හවුරුදු පතා ඇතිරියක් කරවන්නාහු පිළිබඳ නිසගිපචිත්ති සික්ඛාපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු හවුරුදු පතා ඇතිරි කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

5. අනාදියිත්වා පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ සන්ථතානි උජ්ඣිත්වා ආරඤ්ඤිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං පංසුකූලිකඞ්ගං සමාදියිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. එළකලොමානි පටිග්ගහෙත්වා තියොජනං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරො භික්ඛු එළකලොමානි පටිග්ගහෙත්වා තියොජනං අතික්කාමෙසි. තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. සියා කායතො සමුට්ඨාති න වාචතො න චිත්තතො, සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

7. අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අඤ්ඤාතිකාහි භික්ඛුනීහි එළකලොමානි ධොවාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. රූපියං පටිග්ගණ්හන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො රූපියං පටිග්ගහෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

9. නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

5. පැරැණි ඇතිරිය පසෙකින් සුගත්වියතක් පමණ (කඩක්) නො ගෙන අළුත් නිසදුන් ඇතිරියක් කරවන්නහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හිද යත් : බොහෝ භික්ෂූහු ඇතිරි හැරපියා ආරණ්‍යකාඞ්ගය පිණ්ඩපාතිකාඞ්ගය පාංශුකූලිකාඞ්ගය සමාදන් වූහ, ඒ වස්තුයෙහි යැ.
පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

6. එළුලොම් පිළිගෙන තුන් යොදුනක් ඉක්ම යන්නහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් එළුලොම් පිළිගෙන තුන් යොදුනක් ඉක්ම ගියේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

7. නො නෑ මෙහෙණක ලවා එළුලොම් දොවවන්නහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : ශාක්‍යජනපදයෙහිදි පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු නො නෑ මෙහෙණින් ලවා එළුලොම් දෙවවාලූහ, ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

8. රන් රිදී මසුකහවණු පිළිගන්නහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද ද යත් : රජගහනුවර දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර රන්රිදී මසුකහවණු පිළිගත්තේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

9. නන්වැදැරුම් රන්රිදීමසුකහවණු ගනුදෙනුවට පැමිණෙන්නහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

5—ඞ 8 17881 (7/75)

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ නානප්පකාරකං රූපිය-සංවොහාරං සමාපජ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පරිබ්බාජකෙන සද්ධිං කයවික්කයං සමාපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

කොසියවග්ගො දුතියො.

---

4·3

1. අතිරෙකපත්තං දසාහං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකපත්තං ධාරෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

2. ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතා-පෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අප්පමත්තකෙනපි භින්නෙන අප්පමත්තකෙනපි ඛණ්ඩෙන විලිඛිතමත්තෙනපි බහූ පත්තෙ විඤ්ඤා-පෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු නන්වැදෑරුම් රත්රිදීමසුකහවඹු ගනු දෙනුවට පැමිණියාහු ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

වැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

10. නන්වැදෑරුම් සිවුරු ඈ කැපබඩු ගනුදෙනුවට පැමිණෙන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනාද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පිරිවැජියකු සමග ගනුදෙනුවට පැමිණියේ ය ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

ඝවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

දෙවන කෝසියවර්ග යි.

---

4.3

1. නො ඉටු නො විකැපූ අතිරේක පාත්‍රයක් දස දිනක් ඉක්මවා දරන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු (නො ඉටු නො විකැපූ) අතිරේක පාත්‍රයක් දරුහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ. අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නඟියි : කිසි විටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

2. උනු පස්බාන පාත්‍රයෙකින් යුතු වැ මුත් අනෙක් අළුත් පාත්‍රයක් විනවා ගන්නාහු පිළිබඳ නිසගිපචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : ශාක්‍යජනපදයෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මදක් බුන් පමණකිනිදු මදක් කැඩුණු පමණකිනුදු ඉරි ගැසුනු පමණකිනිදු බොහෝ පාත්‍රයන් විනවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

3. භෙසජ්ජානි පටිග්ගහෙත්වා සත්තාහං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ භෙසජ්ජානි පටිග්ගහෙත්වා සත්තාහං අතික්කාමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : කඨිනකෙ -පෙ-

4. අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ වස්සිකසාටිකචීවරං පරියෙසන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ වස්සිකසාටිකචීවරං පරියෙසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

5. භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතෙන අනත්තමනෙන අච්ඡින්දන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. බෙහෙත් පිළිගෙන සත් දිනක් ඉක්ම වන්නහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු බෙහෙත් පිළිගෙන සත් දිනක් ඉක්ම වූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නගියි : කඨින සමුට්ඨානයෙහි යැ. . . .

4. ගිම්හේ සිවු මසින් අයිරා (අතිරෙක) මසක් ඉතිරි වැ ඇති කල්හි වැසිසළු සිවුරක් සොයන්නහු පිළිබඳ නිසග්ගිපචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ගිම්හේ සිවු මසින් අයිරා මසක් ඉතිරි වැ ඇති කල්හි වැසිසළු සිවුරක් සෙවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සිවුවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නගියි : . . .

5. මහණක්හට තමා ම සිවුරක් දී කිපි නොසියමන් (නො සතුටු) වැ පැහැර ගන්නහු පිළිබඳ නිසග්ගිපචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මහණක්හට තෙමේ සිවුරක් දී කිපියේ නොසියමන් වූයේ පැහැර ගත්තේ ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නගියි : . . .

6. තමා ම හූ විනවා ගෙන පෙහෙරන් ලවා සිවුරක් වියවනනහු පිළිබඳ නිසග්ගිපචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : රජගහ නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු තුමූ ම හූ විනවා ගෙන පෙහෙරන් ලවා සිවුරක් වියවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නගියි : . . .

7. පුබ්බෙ අප්පවාරිතස්ස අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිකස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: කඨිනකෙ -පෙ-

9. තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: කඨිනකෙ -පෙ-

10. ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙන්තස්ස නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

පත්තවග්ගො තතියො.

Free Distribution www.aathaapi.org

7. පෙර නො පැවැරූ නො නෑ ගැහැවියක්හුගේ පෙහෙරත් වෙත එළඹ සිවුරු පිළියෙහි අධික විධානයට පැමිණෙන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යෑ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබයෑ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙර නො පවරණ ලද්දේ නො නෑ නො පැවරූ ගැහැවියකු ගේ පෙහෙරත් වෙත එළඹ සිවුරු පිළියෙහි අධික විධානයට පැමිණියේ ය, ඒ වස්තුයෙහි යෑ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී.

8. ඉක්මන් සිවුරක් පිළිගෙන (නො ඉටා නො විකපා) චීවරකාලසමය ඉක්මවන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යෑ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යෑ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු ඉක්මන් සිවුරක් පිළිගෙන චීවරකාලසමය ඉක්මවූහ, ඒ වස්තුයෙහි යෑ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨින සමුට්ඨානයෙහි යෑ. . . .

9. තුන් සිවුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගමෙහි තබා අයිරා සරයක් ඒ සිවුරෙන් වෙන් වැ වසන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යෑ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යෑ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු තුන් සිවුර අතුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගමැ තබා අයිරා සරයක් වෙන් වෑ විසූහ, ඒ වස්තුයෙහි යෑ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකකින් නඟියි : කඨින සමුට්ඨානයෙහි යෑ. . . .

10. පිරිනමනලද සඟසතු ලාභය දැන දැන තමහට නතුකරන්නාහු පිළිබඳ නිසගිපචිති සිකපදය කොතන්හි පණවන ලද යෑ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යෑ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු පිරිනමන ලද සඟසතු ලාභය දැන දැන තමහට නතුකරවූහ, ඒ වස්තුයෙහි යෑ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

තෙවන පත්ත වර්ග යි.

තස්සුද්දානං :-

දසෙකරත්ති මාසො ච - ධොවනඤ්ච පටිග්ගහො,
අඤ්ඤාතකඤ්ච[1] උද්දිස්ස - උභින්නං දූතකෙන ච.

කොසියා සුද්ධ ද්වෙභාගා - ඡබ්බස්සානි නිසීදනං,
ද්වෙ ච ලොමානි උග්ගණ්හෙ - උභො නානප්පකාරකා,

ද්වෙ ච පත්තානි භෙසජ්ජං - වස්සිකා දානපඤ්චමං,
සාමං වායාපනච්චෙකො - සාසඞ්කං සඞ්ඝිකෙන චාති.

තිංසනිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා.

---

## 1·5

## පාචිත්තියකණ්ඩො

### 5·1

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන සම්පජානමුසාවාදෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : හත්ථකං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා හත්ථකො සක්‍යපුත්තො තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානි පටිජානිත්වා අවජානි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

2. ඔමසවාදෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩන්තා පෙසලෙ භික්ඛූ ඔමසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

---

1. අඤ්ඤාතකං තඤ්ච - මජසං.

එහි උද්දානය :

අතිරෙකචීවරය ද, එකරත්තය ද, අකාලචීවරයද . පුරාණචීවරධොවනයද, අඤ්ඤාතක පටිග්ගහණය ද, අඤ්ඤාතකවිඤ්ඤත්තිය ද, උද්දිස්සය ද, අප්පවාරිත දෙක ද, අතිරෙක තික්ඛත්තුචොදනා ද,

මිස්සකය ද, සුද්ධකය ද, තුලය ද, අනුවස්සකය ද, පුරාණසන්ථතය ද, එළක ලොමනීහරණය ද, එළකලොමධොවනය ද, රූපිය ද, රූපියසංවොහාරය කයවික්කය යන දෙසික ද,

අතිරෙකපත්ත ඌනපඤ්චබන්ධන යන දෙසික ද, භෙසජ්ජය ද, (වස්සික) සාටකය ද, පස්වැනි අච්ඡින්දනය ද, තන්තවාය දෙසික ද, අච්චෙක චීවරය ද, ඡාරත්ත විප්පවාසය ද අත්තපරිණාමනය ද යනු තිස යි.

**තිස් නිසග්ගිපචිති නිමි.**

---

## 1.5

## පාචිත්තියකාණ්ඩය

### 5.1

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් දන දන බොරු කීමෙහි පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : හත්ථක ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් හත්ථක ශාක්‍යපුත්‍ර තීර්ථකයන් සමග සාකච්ඡා කරණුයේ වළහා පිළිණ කෙළේ යැ, පිළිණ කොට වැළහී යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

2. (ජාත්‍යාදියෙන්) ගටා බිණීමෙහි පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ප්‍රියශීල භික්ෂූන් සමග ඩබර කරන්නාහු ප්‍රියශීල භික්ෂූන් ගටා බිණුහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

3. භික්ඛුපෙසුඤ්ඤෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං පෙසුඤ්ඤං උපසංහරිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ උපාසකෙ පදසො ධම්මං වාචෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා වාචතො සමුට්ඨාති, න කායතො න චිත්තතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො -පෙ-.

5. අනුපසම්පන්නෙන උත්තරිං ද්විරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : ආළවියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

6. මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං අනුරුද්ධං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා අනුරුද්ධො මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

---

1. භණ්ඩනතා - මජසං.

3. මහණුන් බිදුවන පෙහෙසුන් බස්හි පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විවාදයට බැසගත් භික්ෂූන් අතර ප්‍රියභාවය සුන් කරණ පෙහෙසුන් බස් එළවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

4. අනුපසපනක්හු සමග පද වශයෙන් ධර්මය කියන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු උවසුවන් හා පද වශයෙන් ධර්මය කීහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක වචනයෙන් නඟියි, කයින් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. . . .

5. අනුපසපනක්හු සමග දෙතුන් රැයකින් මත්තෙහි එකත්‍රශයනය කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : අළවිනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු අනුපසපනක්හු සමග එකත්‍රශයනය කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

6. මාගමක හා සමග එක් සෙනස්නෙහි ශයනය කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ මාගමක හා සමග එක් සෙනස්නෙහි ශයනය කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොම සමුට්ඨානයෙහි යැ. . . .

7. මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උදායී මාතුගාමස්ස ධම්මං දෙසෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, ද්වෙ අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- පදසොධම්මෙ.

8. අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං භූතං ආරොචෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : වග්ගුමුදාතීරියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : වග්ගුමුදාතීරියා භික්ඛූ ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා වාචතො සමුට්ඨාති න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො -පෙ-.

9. භික්ඛුස්ස දුට්ඨුල්ලාපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුස්ස දුට්ඨුල්ලාපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

10. පථවිං ඛණන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : ආළවියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආළවිකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආළවිකා භික්ඛූ පථවිං ඛණිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

මුසාවාදවග්ගො පඨමො.

7. මාගමකට සපස්වදනෙකින් මත්තෙහි දහම් දෙසන්නාහු පිළිබඳ පචිත්ති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ මාගමකට දහම් දෙසිය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති දෙකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : පදසො ධම්ම සමුට්ඨානයෙහි යැ. . . .

8. අනුපසම්පනක්හට විද්‍යමාන වූ උතුරුමිනිස්දහම් ආරොචනා කරන්නාහු පිළිබඳ පචිත්ති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : විසල් පුරයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : වග්ගුමුදතීරවාසි භික්ෂූන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : වග්ගුමුදතීරවාසි භික්ෂූහු ගිහියනට ඔවුනොවුන් පිළිබඳ උතුරුමිනිස් දහම්හි ගුණ වැණූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : කිසි විටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක වචනයෙන් නඟියි, කයින් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. . . .

9. මහණක්හු පිළිබඳ තුළුල් ඇවතක් අනුපසම්පනක්හට ආරොචනා කරන්නාහු පිළිබඳ පචිත්ති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මහණක්හු පිළිබඳ තුළුල් ඇවතක් අනුපසම්පනක්හට ආරොචනා කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි. . . .

10. පොළොව කණින්නාහු පිළිබඳ පචිත්ති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : අළව් නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : අළව්පුරවැසි මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : අළව්පුරවැසි මහණහු පොළොව කැණූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි . . .

පළමුවන මුසාවාද වර්ග යි.

---

5·2

1. භූතගාමපාතබ්‍යතාය පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: ආළවියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආළවිකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආළවිකා භික්ඛූ රුක්ඛං ඡින්දිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

2. අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති; කොසම්බියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා ඡන්නො සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙන අඤ්ඤං[1] පටිචරි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. උජ්ඣාපනකෙ ඛීයනකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: මෙත්තියභුම්මජකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ සඞ්ඝිකං සෙනාසනං අජ්ඣොකාසෙ සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

---

1. අඤ්ඤෙනඤ්ඤං - මජසං, ස්‍යා.

## 5.2

1. අමු ලිය රුක් තණ ආදි භූතසමූහය සිඳීමෙහි පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : අළවිපුරයෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරබ ද යත් : අළවිපුරවැසි මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : අළවිපුරවැසි මහණහු ගසක් සිඳලූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

2. අනෙකක් කීමෙහි ද (නිහඬවීමෙන්) වෙහෙසීමෙහි ද පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : කොසඹෑනුවර දී පණවන ලදි.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් ඡන්න මහණහු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න මහණ සඟමැද ඇවතින් චොදනා කරණු ලබනුයේ අනෙකෙකින් අනෙකක් වැසී යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

3. අවමන් කිරීමෙහි ද අයුණු කීමෙහි ද පචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : රජගහ නුවර දී පණවන ලදි.

කවරක්හු ඇරබ ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූන් ඇරබැ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රයනට භික්ෂූන් ලවා අවමන් කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

4. සඟසතු ඇඳක් හෝ පුටුවක් හෝ බිස්සක් හෝ බදවෙළුවක් හෝ එළිමහනෙහි අතුට නො නගා තබා නො පිළිවිසැ බැහැර යන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරබ ද යත් : බොහෝ මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු සඟසතු සෙනසුන් එළිමහනෙහි අතුට නො නඟා තබා නො පිළිවිසැ බැහැර ගියාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨින සමුට්ඨානයෙහි යැ. . . .

5. සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං,

කං ආරබ්භාති : සත්තරසවග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සත්තරසවග්ගියා භික්ඛූ සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

6. සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො -පෙ-

7. භික්ඛුං කුපිතෙන අනත්තමනෙන සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛුං සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8 සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං සහසා අභිනිසීදි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

5. සඟසතු වෙහෙරෙහි ශය්‍යාවක් අතුට නො නගා තබා නො පිළිවිස බැහැර යන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සතළොස්වග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සතළොස්වග මහණහු සඟසතු වෙහෙරෙහි ශය්‍යාවත් අතුට නො නගා තබා නො පිළිවිස බැහැර ගියාහු යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨින සමුට්ඨානයෙහි යැ. . . .

6. සඟසතු වෙහෙරෙහි දන දන පළමු එළඹ සිටි මහණහු හමුවට වැද ශයනය කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ස්ථවිර භික්ෂූන් හමුවට වැද ශයනය කළාහු යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

7. කිපි නොසතුටු සිතින් මහණක්හු සඟසතු වෙහෙරින් බැහැර කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමහණහු කිපියාහු නොසතුටු සිත් ඇත්තාහු භික්ෂූන් සඟසතු වෙහෙරින් බැහැර කළාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

8. සඟසතු වෙහෙරෙහි නො සෙවෙණි කළ කිළිය මතුයෙහි වල්හිස විද සිළුගත්වා කළ පා ඇති ඇඳෙකැ හෝ පුටුවෙකැ හෝ හිඳින්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් සඟසතු වෙහෙරෙහි නො සෙවෙණි කළ කිළිය මතුයෙහි වල්හිස විද සිළු ගත්වා කළ පා ඇති ඇඳෙකැ හුනුව හුන්නේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

6—88 17881 (7/78)

9. ද්වත්තිපරියායෙ අධිට්ඨහිත්වා තදුත්තරිං අධිට්ඨහන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : කොසම්බියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා ඡන්නො කතපරියොසිතං විහාරං පුනප්පුනං ඡාදාපෙසි, පුනප්පුනං ලිම්පාපෙසි. අතිභාරිකො විහාරො පරිපති, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : ආළවියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආළවිකෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආළවිකා භික්ඛූ ජානං සප්පාණකං උදකං තිණම්පි මත්තිකම්පි සිඤ්චිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

භූතගාමවග්ගො දුතියො.

---

5·3

1. අසම්මතෙන භික්ඛුනියො ඔවදන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අසම්මතා භික්ඛුනියො ඔවදිංසු, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති. අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා වාචතො සමුට්ඨාති න කායතො න චිත්තතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති න කායතො -පෙ-

2. අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං චුල්ලපන්ථකං[1] ආරබ්භ.

තස්මිං වත්ථුස්මින්ති : ආයස්මා චුල්ලපන්ථකො අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදි, තස්මිං වත්ථුස්මිං.

---

1. චූළපන්ථකං - ම ඡ සං.

9. දෙතුන් පරික්ෂෙපයක් විධාන කොට ඊට වැඩියක් විධාන කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : කොසැඹෑනුවර පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ඡන්න මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න මහණ කොට නිමවන ලද විහාරයක් පුනපුනා සෙවෙණි කරවිය, පුන පුනා අලෙව් කරවිය. ඉතා බර වූ විහාරය පතිත විය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නගී. . . .

10. පණුවන් සහිත දිය දන දන තණපත්හි හෝ මැටියෙහි හෝ ඉසින්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : අළව් නුවරැදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : අළව්පුරවැසි මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : අළව් පුරවැසි මහණහු පණුවන් සහිත දිය දන දන තණපත්හි ද මැටියෙහි ද ඉසියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නගියි : . . .

දෙවන භූතගාම වර්ග යි.

---

5.3

1. භික්ඛුනොවාදක සම්මුතිය නොලැබ මෙහෙණන්ට ඔවා දෙන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සම්මතය නො ලත් සවග මහණහු මෙහෙණන්ට ඔවා දුන්හ, ඒ වස්තුයෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්න පඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකැ, අනුප්පන්න පඤ්ඤත්ති එහි නැති.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි : කිසි විටෙක වචනයෙන් නගියි, කයින් නො නගියි, සිතින් නො නගී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගියි, කයින් නො නගී. . . .

2. හිරු අවරට ගියකල්හි මෙහෙණන්ට ඔවා දෙන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් චූල්ලපන්ථක ස්ථවිර හිරු අස්තයට ගිය කල්හි මෙහෙණන්ට ඔවා දුන්නේ යැ. ඒ වස්තුයෙහි යැ.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : පදසොධම්මෙ -පෙ-.

3. භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

4. ආමිසහෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති භණන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ආමිසහෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති භණිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : -පෙ-

5 අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං අදාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උදායී අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : පද සොධම්ම සමුට්ඨානයෙහි ය. . . .

3. මෙහෙණවරට එළඹි මෙහෙණින්ට ඔවා දෙන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : ශාක්‍යජනපදයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මෙහෙණවරට එළඹි මෙහෙණකට ඔවා දුන්හ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨින සමුට්ඨානයෙහි යැ. . . .

4. භික්ෂූන් ආමිස හෙතුයෙන් මෙහෙණින්ට ඔවා දෙතියි කියන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ආමිස හෙතුයෙන් භික්ෂූන් මෙහෙණින්ට ඔවා දෙතියි කීහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟියි : . . .

5. නො නෑ මෙහෙණක්හට සිවුරක් දෙන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : එක්තරා මහණක්හු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් නො නෑ මෙහෙණකට සිවුරක් දින, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

6. නො නෑ මෙහෙණක ලවා සිවුරක් ගෙත්තම් කරවන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ නො නෑ මෙහෙණක ලවා සිවුරක් ගෙත්තම් කරවී යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

7. භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති

ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

8 භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරූහන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකං නාවං අභිරූහිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති: -පෙ-

9. ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: දෙවදත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: දෙවදත්තො ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

10. භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

ඔවාදවග්ගො තතියො.

7. මෙහෙණක හා කතිකා කොට එක් අදන්මඟකට බට මහණහු පිළිබඳ පචිත්තිසික පදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මගණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මෙහෙණන් හා කතිකා කොට එක් අදන්මඟකට බැස්සාහු ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟියි : කිසිවිටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී . . .

8. මෙහෙණක හා කතිකා කොට එක් නැවකට නඟින්නහු පිළිබඳ පචිත්තිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මෙහෙණන් හා කතිකා කොට එක් නැවකට නැංගාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නගියි : . . .

9. දූන දූන මෙහෙණක විසින් නිපදවන ලද බොජුන් වළඳන්නහු පිළිබඳ පචිත්තිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : දෙව්දත් මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : දෙව්දත් මහණ දූන දූන මෙහෙණක විසින් නිපදවන ලද පිණ්ඩපාතය වැළඳී ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

10. එකලාවූයේ එකලා මෙහෙණක හා රහසිගත වැ හිඳින්නහු පිළිබඳ පචිත්තිසිකපදය කො තැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ එකලා වූයේ එකලා මෙහෙණක හා රහසිගත වැ හිනැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

තෙවන ඔවාදවර්ග යි.

5.4

1. තතුත්තරිං ආවසථපිණ්ඩං භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

2. ගණභොජනෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: දෙවදත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: දෙවදත්තො සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, සත්ත අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

3. පරම්පරභොජනෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤත්‍ර භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති. චතස්සො[1] අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

4. ද්වත්තිපත්තපූරෙ පූවෙ පටිග්ගහෙත්වා තතුත්තරිං පටිග්ගණ්හන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ න මත්තං ජානිත්වා පටිග්ගහෙසුං තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

1. තිස්සො - සයා.

5.4

1. ආවසථපිණ්ඩය එක් දිනකට වඩා වළඳන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ඡබ්බග්ගිය මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ඡබ්බග්ගිය මහණහු පුන පුනා වැස ආවසථපිණ්ඩය වැළඳුහ ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

2. ගණභොජනයෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : දෙව්දත්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : දෙව්දත් පිරිස් සහිතවැ කුලයන්හි විනව විනවා අනුභව කෙළේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති සතෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

3. පරම්පර භෝජනයෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : විසල් පුරැදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු පැවරූ තැන තබා අන්තැනෙකැ වැළඳුහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති සතරෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . කඨින සමුට්ඨානයෙහි යැ.

4. දෙතුන් පයක් පුරා පූ පිළිගෙන ඊට වඩා පිළිගන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු පමණ නො දැන පිළිගත්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

5. භුත්තාවිනා පවාරිතෙන අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ භුත්තාවිනො පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

6. භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන භොජනීයෙන අභිහට්ඨුං පවාරෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

7. විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සත්තරසවග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සත්තරසවග්ගියා භික්ඛූ විකාලෙ භොජනං භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

8. සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං බෙලට්ඨසීසං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා බෙලට්ඨසීසො සන්නිධිකාරකං භොජනං භුඤ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

5. වළඳා නිමවූ පැවරුවහු විසින් අයිරිත් නො කළ කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ වළඳන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : වළඳා නිමවූ පැවරු බොහෝ මහණහු, අන් තැනෙක්හි වැළඳුහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . කඨින සමුට්ඨානයෙහි යැ.

6. වළඳා නිමවූ පැවරූ මහණක්හු අයිරිත් නො කළ කෑ යුතු දෙයින් හෝ බුදියයුතු දෙයින් හෝ එළවා පවරන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් වළඳා නිමි පැවරූ මහණක්හු අයිරිත් නොකළ කෑයුතු දෙයින් බුදිය යුතු දෙයින් එළවා පැවරියැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

7. විකාලයෙහි කෑයුතු දෙයක් හෝ බුදියයුතු දෙයක් හෝ වළඳන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවරදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සතළොස්වග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සතළොස්වග මහණහු විකාලයෙහි බොජුන් වැළඳුහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

8. පිළිගෙණ රැයක් ඉක්මවූ කෑ යුතු හෝ බුදිය යුතු හෝ දෙයක් වළඳන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් බෙලට්ඨසීස තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් බෙලට්ඨසීස තෙරණුවෝ පිළිගෙණ රැයක් ඉක්ම වූ බොජුනක් වැළඳූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

9. පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. අදින්නං මුඛද්වාරං ආහාරං ආහරන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහාරෙසි,[1] තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

භොජනවග්ගො චතුත්ථො.

---

5.5

1. අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං ආනන්දං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා ආනන්දො අඤ්ඤතරිස්සා පරිබ්බාජිකාය එකං මඤ්ඤමානො ද්වෙ පූවෙ අදාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි[2] සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ- එළකලොමකෙ.

2. භික්ඛුං එහාවුසො 'ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා'ති තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්යොජෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුං 'එහාවුසො ගාමං පිණ්ඩාය පවිසිස්සාමා'ති තස්ස අදාපෙත්වා උය්‍යොජෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති පෙ-

---

1. ආහරි - මජසං.  2. තීහි - සිමු. 1, 2

9. පිණ්ඩී බොජුන් කමා පිණිස වීනවා බුදින්නහු පිළිබඳ පචිත්තියිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුවෙක්හි ද යත් : සවග මහණහු පිණ්ඩී බොජුන් තමන් පිණිස වීනවා වැළඳුහු. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟී. . . .

10. නො පිළිගත් යම් අහරක් පරගලා කරන්නහු පිළිබඳ පචිත්තියිකපදය කොතැන්හි පණවන ලද ද යත් : විසල් පුරැදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් නො පිළිගත් අහරක් වැළඳීයැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

සිවුවන භෝජන වර්ග යි.

---

## 5.5

1. නග්න තවුසකුට හෝ පරිබ්‍රාජකයකුට හෝ පරිබ්‍රාජිකාවකට හෝ කෑ යුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් හෝ සියතින් දෙන්නහු පිළිබඳ පචිත්තියිකපදය කො තැන්හි පණවන ලද ද යත් : විසල් පුරයෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ එක්තරා පිරිවැජියකට එකෙකියි හඟිමින් දෙ කැවුමක් දුන්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

2. මහණක්හට " ඇවත, එව ගමකට හෝ නියම් ගමකට හෝ පිඩු පිණිස පිවිසෙන්නෙමු " යි ඒ මහණහට (කිසි අහරක්) දෙවා හෝ නො දෙවා හෝ පිටත් කොට යවන්නහු පිළිබඳ පචිත්තියිකපදය කොතැන්හි පණවන ලදද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර " ඇවත, එව ගමට පිඩු පිණිස පිවිසෙන්නෙමූ" යි, (කැදවා ගෙණ) ඒ මහණහට කිසිවක් නො දෙවා නහා යැවිය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සැවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. ...

3. සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

4 මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

5. මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති,

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

6. නිමන්තිතෙන සභත්තෙන සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා[1] කුලෙසු චාරිත්තං ආපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති, ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තම්පි පච්ඡාභත්තම්පි කුලෙසු චාරිත්තං ආපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, චතස්සො අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-කඨිනකෙ.

---

1. පුරෙ භත්තං පච්ඡාභත්තං-මජසං.

3. මෙවුන්දම් රාගයෙන් යුත් පුමිතිරි දෙදෙනා ඇති යහන් ගෙහි ඇතුළට වැද හිඳිනහු පිළිබඳ පචිතිසිකපදය කො තැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර පුමිතිරි දෙදෙනා ඇති යහන් ගෙය තුළට වැද හිනැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි ; කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

4. මාගමක හා පහස්හි පිළිසන් අස්නෙක හිඳිනහු පිළිබඳ පචිතිසිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් ; ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මාගමක හා රහස්හි පිළිසන් අස්නෙක හුන්නේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

5. එකලා වූයේ එකලා වූ මාගමක හා හිඳිනහු පිළිබඳ පචිතිසිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහි දි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක් හි ද යත් : හුදෙකලා වූ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර හුදෙකලා මාගමක හා රහස්හි හින, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

6. ඇරයුම් ලද බත් ඇතියහු විසින් වැළත සිටි මහණක්හු නො විචාරා පෙර බත්හි හෝ පසු බත්හි හෝ කුලයන්හි හැසිරෙන මහණහු පිළිබඳ පචිතිසිකපදය කොතන්හි පණවන ලද ද යත් : රජගහනුවරදී පණවන ලදී.

කවරක් හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක් හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර ඇරයුම් ලද බත් ඇතියේ පෙර බත්හි ද පසු බත්හි ද කුලයන්හි හැසිරීමට පැමිණියේ යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති සතරෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : . , කඨින සමුට්ඨානයෙහි යැ.

7. තතුත්තරිං භෙසජ්ජං විඤ්ඤාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති, සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ මහානාමෙන සක්කෙන අජ්ජණ්හො භන්තෙ ආගමෙථාති වුච්චමානා නාගමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

8. උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යුත්තං සෙනං දස්සනාය අගමංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-එළකලොමකෙ.

9. අතිරෙකතිරත්තං සෙනාය වසන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකතිරත්තං සෙනාය වසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-එළකලොමකෙ.

10. උය්‍යොධිකං ගච්ඡන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යොධිකං අගමංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-එළකලොමකෙ.

අචෙලකවග්ගො පඤ්චමො.

7. එයින් (පවරණ ලද පමණින්) වැඩියක් බෙහෙත් විනවන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතන්හි පණවන ලද ද යත් : ශාක්‍ය ජනපදයෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මහානාම ශාක්‍යයන් විසින් "ස්වාමීනි, අද එකදවසක් පොරොත්තුවුව මැනැවැ" යි කියනු ලබන්නෝ පොරොත්තු නොවුහු. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නගී. . . .

8. සටනට නිකුත් සෙනඟ දක්මට යන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු සටනට නික්මුණු සෙනඟ දක්මට ගියාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

9. අයිරා තෙරැයක් සේනායෙහි වසන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු අයිරා තෙරැයක් සේනාවෙහි විසූහු. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

10. යුද බිමට යන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු යුදබිමට ගියාහු ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

පස්වන අචෙලක වර්ග යි.

7 ෂ ම 17881 (7/75)

5.6

1. සුරාමෙරයපානෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: කොසම්බියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං සාගතං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා සාගතො මජ්ජං පිවි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-

2 අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙසුං තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො -පෙ-.

3. උදකෙ හස්සධම්මෙ[1] පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සත්තරසවග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සත්තරසවග්ගියා භික්ඛූ අචිරවතියා නදියා උදකෙ කීළිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

4. අනාදරියෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: කොසම්බියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා ඡන්නො අනාදරියං අකාසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

5. භික්ඛුං භිංසාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

---

1. හසධම්මෙ - ම.ඡ.සං.

5.6

1. රහමෙර පීමෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : කොසැඹෑ නුවරදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් සාගත තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් සාගත තෙරණුවෝ මත්පැන් පානය කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟී, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

2. ගිරිති කැවීමෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ගිරිති කැවීමෙන් මහණක්හු සිනහ ගැන්වූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

3. දිය කෙළනා රිසියෙන් කිමීදෙන සැහැවියෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සතළොස්වග මහණුන් ඇරැබයැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සතළොස්වග මහණහු අචිරවතී නදියෙහි දිය කෙළි කළෝ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

4. අනාදර කිරීමෙහි පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : කොසඹෑ නුවරැදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ඡන්න මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න මහණ අනාදර කෙළේයැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟී. . . .

5. මහණක්හු බිය ගන්වන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං භිංසාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. ජොතිං සමාදහිත්වා විසිබ්බෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: භග්ගෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ ජොතිං සමාදහිත්වා විසිබ්බෙසුං තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, ද්වෙ අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

7. ඔරෙනද්ධමාසං නහායන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ රාජානම්පි පස්සිත්වා න මත්තං ජානිත්වා නහායිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, ඡ අනුපඤ්ඤත්තියො.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති: පදෙසපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමක.

8. අනාදියිත්වා තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ අත්තනො චීවරං න සඤ්ජානිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- එළකලොමකෙ.

9. භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං[1] පරිභුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුස්ස සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

---

1. අපච්චුද්ධාරණං - මජ්ඣං. 2. අපච්චුද්ධාරකං - සျා

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මහණක්හු බිය ගැන්වූහු, ඒ· වස්තු යෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නගී. . . .

6. ගිනි දල්වා තප්නාහු පිළිබඳ පච්චිත්තියපදය කො තැන්හි පණවන ලද ද යත් : භග්ගදනව්හිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු ගිනි දල්වා තැප්පාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති දෙකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

7. අඩමසෙකින් මොබ නහන්නහු පිළිබඳ පච්චිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවරදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු රජු ද දැක පමණ නො දැන නෑවාහු යැ' ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති සයෙකි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙස පඤ්ඤත්ති ද යත් : පදෙස පඤ්ඤත්ති යි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

8. තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරෙන් එක්තරා දුර්වර්ණ කිරීමක් නො ගෙණ (කප්බිඳු නො තබා) අළුත් සිවුරක් පරිභෝග කරන්නහු පිළිබඳ පච්චිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු තමන්ගේ සිවුරු නො හැඳින ගත්හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . එළකලොම සමුට්ඨානයෙහි යැ.

9. මහණක්හට හෝ මෙහෙණකට හෝ හික්මනුවකට හෝ හෙරණකුට හෝ හෙරණකට හෝ තෙමේ සිවුරක් දී නො පසුදුරා පරිභොග කරන්නහු පිළිබඳ පච්චිත්තියපදය කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මහණක්හට තෙමේ සිවුරක් දී නො පසුදුරා පරිභොග කෙළේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි . . . කඨින සමුට්ඨානයෙහි යැ.

10. භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං පත්තම්පි චීවරම්පි අපනිධෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

සුරාමෙරයවග්ගො ඡට්ඨො.

---

5.7

1. සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උදායිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උදායී සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

2. ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්ති සමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. මහණක්හු ගේ (ඉටත් පොහෝනා) පාත්‍රයක් හෝ (විකප්පත් පොහෝනා) සිවුරක් හෝ නිසීදනයක් හෝ හිදිගුලාවක් හෝ කාබහනක් හෝ සඟවන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු භික්ෂූන් ගේ පාත්‍රද සිවුරු ද සැඟවූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

සවන සුරාමෙරය වර්ගයි.

---

5.7

1. දන දන (තිරිසන්) සතක්හු දිවි ගළවන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් උදායී මහණහු ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදායී මහණ දන දන සතක්හු දිවි ගැළවියැ. ඒ වස්තුවෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

2. දන දන පණුවන් සහිත ජලය වළඳන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු දන දන පණුවන් සහිත ජලය පරිභෝග කළාහු යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

3. දන දන දැහැමින් සන්හිඳුවන ලද අධිකරණය නැවත විසදීම් පිණිස උගුළුවන්නහු පිළිබඳ පචිත්තියපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු දන දන දැහැමින් සන්හිඳුවන ලද අධිකරණය නැවත විසදීම් පිණිස ඉගිළවූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

4. භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරො භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

5. ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ ජානං ඌනවීසතිවස්සං උපසම්පාදෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

6. ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරො භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

7. මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරො භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

8. පාපිකාය දිට්ඨියා යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

4. මහණක්හුගේ තුළුල් (සඟවෙසෙස්) ඇවතක් දන දන සඟවන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් මහණක්හුගේ තුළුල් ඇවත් දන දන සැඟවී, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

5. පිළිසඳ පවන් උනුවිසිවස් පුඟුලක්හු දන දන උපසපන් කරන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහ නුවරදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු උනුවිසිවස් ඇති පුඟුලක්හු දන දන උපසපන් කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

6. දන දන සොර ගැල් සාත්තුවක් හා සමග කතිකා කොටගෙණ එක් අදන්මගකට පිළිපන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලදද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් දන දන සොර ගැල් සාත්තුවක් හා සමග කතිකා කොටගෙණ එක් අදන්මගකට පිළිපන්නේ යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

7. මාගමක හා කතිකා කොට ගෙණ එක් අදන්මගකට පිළිපන්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් මාගමක හා කතිකා කොට ගෙණ එක් අදන්මගකට පිළිපන්නේ යැ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟී. . . .

8. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි ලාමක දෘෂ්ටිය නො හරින්නාහු පිළිබඳ පචිත්තිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

තං ආරබ්භාති : අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො පාපිකං දිට්ඨිං[1] යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-.

9. ජානං තථාවාදිනා භික්ඛුනා[2] අකතානුධම්මෙන[3] තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

තං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථාවාදිනා අරිට්ඨෙන භික්ඛුනා අකතානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

10. ජානං තථානාසිතං සමණුද්දෙසං උපලාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

තං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථානාසිතං කණ්ටකං සමණුද්දෙසං උපලාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

සප්පාණකවග්ගො සත්තමො.

---

5.8

1. භික්ඛූහි සහධම්මිකං වුච්චමානො න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව නාඤ්ඤං භික්ඛුං වියත්තං[4] විනයධරං පරිපුච්ඡිස්සාමීති භණන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : කොසම්බියං පඤ්ඤත්තං.

තං ආරබ්භාති : ආයස්මන්තං ඡන්නං ආරබ්භ.

---

1. පාපිකාය දිට්ඨියා - සීමු 2 මජසං
2. (අරිට්ඨෙන) භික්ඛුනා - සීමු. 2
3. අකටානුධම්මෙන - මජසං.
4. බ්‍යත්තං, ම ජ සං.

Free Distribution www.aathaapi.org

කවරක්හු ඇරැබ ද යත් : පෙර ගිජ්ජලිහිණින් මැරූ කුලයෙහි උපන් අරිට්ඨ මහණහු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : පෙර ගිජ්ජලිහිණින් මැරූ කුලයෙහි උපන් අරිට්ඨ මහණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි ලාමක දෘෂ්ටිය නො හළේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

9. එසේ (මම බුදුරදුන් වදළ ධර්මය දනිමි) කියන නො කළ ඔසාරණ කම් ඇති දෘෂ්ටිය නො හළ මහණහු සමග දන දන ධර්මාමිෂසම්භොග කරන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු එසේ (මම බුදුරදුන් වදළ ධර්මය දනිමි) කියන නො කළ ඔසාරණ කම් ඇති ඒ දෘෂ්ටිය නො හළ අරිට්ඨ මහණහු සමග ධර්මාමිෂ සම්භොග කළාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

10. දන දන එසේ නෙරණ ලද හෙරණහට සඞ්ග්‍රහ කරන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු දන දන එසේ නෙරණ ලද කණ්ටක හෙරණහට සඞ්ග්‍රහ කළාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

සත්වන සප්පාණක වර්ග යි.

---

## 5.8

1. භික්ෂූන් විසින් බුද්ධප්‍රඥප්ත ශික්ෂාපද සහිත කොට කියනු ලබන්නේ " ඇවත්නි, මම ව්‍යක්ත වූ විනයධර වූ අන් මහණක්හු පිළිවිස්නා තාක් මෙල ශික්ෂාපදයෙහි නො හික්මෙන්නෙමි " යි කියන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : කොසඹෑ නුවරදි පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ඡන්න මහණහු ඇරැබ යැ.

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි, යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡිස්සාමීති භණි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

2. විනයං විවණ්ණෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ විනයං විවණ්ණෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

3. මොහනකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ මොහෙසුං. තස්මිං වත්ථුස්මිං

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

4. භික්ඛුස්ස කුපිතෙන අනත්තමනෙන පහාරං දෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූනං පහාරං අදංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො පෙ-

5. භික්ඛුස්ස කුපිතෙන අනත්තමනෙන තලසත්තිකං උග්ගිරන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූනං තලසත්තිකං උග්ගිරිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න මහණ භික්ෂූන් විසින් බුද්ධප්‍රඥප්ත ශික්ෂාපද සහිත කොට කියනු ලබන්නේ " ඇවැත, ව්‍යක්ත වූ විනයධර වූ අන් භික්ෂු නමක් යම්තාක් නො විචාරන්නෙම් ද, ඒ තාක් මම තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමි " යි කීයැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නැඟී : . . .

2. විනය නිහන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද, යත් : සවග මහණහු විනය ගැරහූ හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නැඟී. . . .

3. මුළා කරවීමෙහි පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මුළා කරවූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නැඟී. . . .

4. කුපිත වූ නො සතුටු සිතින් මහණක්හට පහර දෙන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු කිපියාහු නො සතුටු සිත් ඇත්තාහු භික්ෂූන්ට පහර දුන්හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නැඟියි : කයින් ද සිතින් ද නැඟියි, වචනයෙන් නො නැඟී. . . .

5. කුපිත වූ නො සතුටු සිතින් මහණක්හට අතුල් නගා දක්වන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු කිපියාහු නො සතුටු සිත් ඇත්තාහු භික්ෂූන්ට අතුල් නගා දැක්වූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නැඟියි : කයින් ද සිතින් ද නැඟියි, වචනයෙන් නො නැඟී. . . .

6. භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

7. භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහන්තස්ස[1] පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං සඤ්චිච්ච කුක්කුච්චං උපදහිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

9. ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

10. සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

---

1. උප්පාදෙන්තස්ස - ස්‍යා.

6. අමූලු සඟවෙසෙසින් මහණක්හට චෝදනා කරන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු අමූලු සඟවෙසෙසින් මහණක්හට චෝදනා කළහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟී. . . .

7. දන දන මහණක්හට කුකුස් උපදවන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු දන දන භික්ෂූන්ට කුකුස් උපදවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟී. . . .

8. හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විවාදධිකරණයට පැමිණි භික්ෂූන්ගේ බස් ඇසෙන තැනෙක සිටින්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විවාදධිකරණයට පැමිණි භික්ෂූන්ගේ බස් ඇසෙන තැන සිටියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

9. දැහැමි කර්මයන්ට ඡන්දය දී පසුව දෙස් කීමට පැමිණෙන්නහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු දැහැමි කර්මයන්ට ඡන්දය දී පසුව දෙස් කීහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නඟී. . . .

10. සඞ්ඝයා අතර විනිශ්චය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟී යන්නහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරෝ භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කාමි.[2] තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

11. සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

12. ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

සහධම්මිකවග්ගො අට්ඨමො.

---

## 5.9

1. පුබ්බෙ අප්පටිසංවිදිතෙන රඤ්ඤො අන්තෙපුරං පවිසන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං ආනන්දං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා ආනන්දො පුබ්බෙ අප්පටිසංවිදිතො රඤ්ඤො අන්තෙපුරං පාවිසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

2. රතනං උග්ගණ්හන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

---

2. පක්කාමි - මජසං.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් සඞ්ඝයා අතර විනිශ්චය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟී ගියේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නැඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟී. . . .

11. සමග සඞ්ඝයා විසින් මහණෙක්හට සිවුරක් දී පසුවැ දෙස් කීමට පැමිණෙන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු සමග සඞ්ඝයා විසින් මහණෙක්හට සිවුරක් දී පසුවැ දෙස් කීමට පැමිණියාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නැඟී. . . .

12. සඟනට පිරිනමන ලද සඟසතු ලාභය දන දන පුද්ගලයක්හට පිරිනමන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු සඟනට පිරිණමන ලද සඟසතු ලාභය දන දන පුද්ගලයක්හට පිරිණැමූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නැඟී. . . .

අටවැනි සහධම්මික වර්ග යි.

---

## 5.9

1. පළමු නො දන්වන ලදුව රජුගේ යහන්ගැබට පිවිසෙන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත්: සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ පළමු නො දන්වන ලදු වැ රජුගේ යහන්ගබට පිවිසියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නැඟියි . . . කඨින සමුට්ඨානයෙහි යැ.

2. රුවන් නගා ගන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත්: සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත්: එක්තරා මහණෙක්හු ඇරැබ යැ.

8—සිපි 17881 (7/76)

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු රතනං උග්ගණ්හෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, ද්වෙ අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

3. සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ විකාලෙ ගාමං පවිසිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, තිස්සො අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ- කඨිනකෙ.

4. අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ න මත්තං ජානිත්වා බහු සූචිඝරෙ විඤ්ඤාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

5. පමාණාතික්කන්තං මඤ්චං වා පීඨං වා කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා උපනන්දො සක්‍යපුත්තො උච්චෙ මඤ්චෙ සයි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

6. මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ මඤ්චම්පි පීඨම්පි[1] තූලොනද්ධං කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

---

1. මඤ්චං වා පීඨං වා - සීමු 2. මජසං.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් රත්නයක් නහා තැබී යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති දෙකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

3. වැළත සිටි මහණක්හු නො විචාරා නොකල්හි ගම් වදනාහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු නොකල්හි ගම් වැදුනාහු යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති තුනෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : . . . කඨින සමුට්ඨානයෙහි යැ.

4. ඇටමුවා හෝ දළමුවා හෝ අංමුවා හෝ හිදිගුලා කරවන්නාහු පිළිබඳ පචිති සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : ශාක්‍යජනපදයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු පමණ නො දන බොහෝ ඉදිකටුගුලා විනවා ගත්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

5. පමණ ඉක්මවූ ඇඳක් හෝ පුටුවක් හෝ කරවන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : උපනන්ද ශාක්‍යපුත්‍රයන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර උස් ඇඳෙක්හි ශයනය කෙළේ යැ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

6. ඇතුළත පුළුන් බැහු ඇඳක් හෝ පුටුවක් හෝ කරවන්නාහු පිළිබඳ පචිතිසිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ඇතුළත පුළුන් බැහු ඇඳ ද පුටු ද කරවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

7. පමාණාතික්කන්තං නිසීදනං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකානි නිසීදනානි ධාරෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

8 පමාණාතික්කන්තං කණ්ඩුපටිච්ඡාදිං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකායො කණ්ඩුපටිච්ඡාදියො ධාරෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

9. පමාණාතික්කන්තං වස්සිකසාටිකං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකායො වස්සිකසාටිකායො ධාරෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

10. සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙන්තස්ස පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ආයස්මන්තං නන්දං ආරබ්භ

කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා නන්දො සුගතචීවරප්පමාණං චීවරං ධාරෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

රාජවග්ගො නවමො.

---

දෙවනවුති පාචිත්තියං නිට්ඨිතං.

---

7. පමණ ඉක්ම වූ නිසදුන්සිවුරක් කරවන්නාහු පිළිබඳ පචිත්තියකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු පමණ ඉක්මවූ නිසදුන්සිවුරු දරූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. ...

8. පමණ ඉක්ම වූ කස්පිළිසනක් කරවන්නාහු පිළිබඳ පචිත්තියකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු පමණ ඉක්මවූ කස් පිළිසන් දරූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. ...

9. පමණ ඉක්ම වූ වැසිසළු කරවන්නාහු පිළිබඳ පචිත්තියකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : සවග මහණුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු පමණ ඉක්ම වූ වැසිසළු දරූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. ...

10. සුගත් සිවුර පමණට සිවුරක් කරවන්නාහු පිළිබඳ පචිත්තියකපදය කො තැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරබ ද යත් : ආයුෂ්මත් නන්ද තෙරුන් ඇරබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් නන්ද තෙරණුවෝ සුගත් සිවුර පමණ සිවුරක් දරූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. ...

නවවන රාජවර්ග යි.

---

දෙයානූ පචිත්තිහු නිමියහ.

තස්සුද්දානං :

1. මුසා ඔමස පෙසුඤ්ඤ - පදසො ද්වෙ නිපජ්ජනා,
දෙසනා රොචනා චෙව - දුට්ඨුල්ලාපත්ති භණනා.

2. භූතඤ්ඤවාද[1] උජ්ඣායී - මඤ්චො සෙය්‍යා ච වුච්චති,
පුබ්බනික්කඩ්ඪනාහච්ච[2] - ද්වාරං සප්පාණකෙන ච.

3. අසම්මතා අත්ථඞ්ගතෙ - උපස්සයාමිසෙන ච,
දදෙ සිබ්බෙ විධානෙන - නාවා භුඤ්ජෙය්‍ය එකතො.

4. පිණ්ඩං ගණං පරං පූවං - පවාරිතො පවාරිතං,
විකාලං සන්නිධි ඛීරං - දන්තපොණෙන තෙ දස.

5 අචෙලකා උය්‍යොබජ්ජ[3] - පටිච්ඡන්නං රහෙන ච,
නිමන්තිතො පච්චයෙහි - සෙනාවසදුය්‍යොධිකං.

6. සුරා අඞ්ගුලි හාසො ච - අනාදරියඤ්ච භිංසනා,
ජොති නහාන දුබ්බණ්ණා - නාමං අපතිධෙන ච.

---

1. භූතං අඤ්ඤය, මජසං. 2. පුබ්බෙ නික්කඩ්ඪනා -මජසං
3. අචෙලකානුපබජ්ජ - සි.

එහි උද්දානය :

1. 'සම්පජානමුසාවාද' පවිති යැ. 'ඔමසවාද' පවිති යැ, 'භික්ඛුපෙසුඤ්ඤ' පවිති යැ, 'පදසොධම්ම' පවිති යැ, (අනුපසම්පන්නකු හා ද මාගමක හා දූයි දෙදෙනා හා වෙන වෙන කරන නිපජ්ජනයෙන් වන) 'සහසෙය්‍ය' පවිති දෙක යැ, (මාගමකට සපස් බසෙකින් වැඩි දහමක් දෙසීමෙන් වන) 'දෙසනා' පවිති යැ, (අනුපසම්පන්නක්හට උතුරු මිනිස්දම් කීමෙන් වන) 'ආරොචනා' පවිති යැ, (අනුපසම්පන්නක්හට දුට්ඨුල්ලාපත්ති කීමෙන් වන) 'දුට්ඨුල්ලාපත්ති' පවිති යැ, (පොළෝ කැණීමෙන් වන) 'ඛණන' පවිති යැ.

2. (වෘක්ෂාදිය සිඳීමෙන් වන) 'භූතගාමපාතව්‍යතා' පවිති යැ, 'අඤ්ඤවාදක' පවිති යැ. 'උජ්ඣාපනක' පවිති යැ, (සඟසතු මඤ්චපීඨාදිය නො සඟවා තබා යාමෙන් වන) 'මඤ්චපීඨාදි' පවිති යැ, (සඟසතු යහන් නො හකුළුවා තබා යාමෙන් වන) 'සයන' පවිති යැ, (සඟසතු වෙහෙරකැ දී පූර්වොපගත තෙරමහණහු සටාගෙනැ ශයන කිරීමෙන් වන) 'පුබ්බානුපඛජ්ජන' පවිති යැ, (මහණකු සඟසතු වෙහෙරින් නෙරැ ලීමෙන් වන) ''නික්කඩ්ඪන' පවිති යැ, 'ආහච්චපාදක' පවිති යැ, (වෙහෙර බිඳවැටෙන සේ පුනපුනා පිරියම් කිරීමක් නිසා එන) 'ද්වාර' පවිති යැ, (සප්පාණක උදකාදි සෙවනයෙන් වන) සප්පාණක' පවිති යැ.

3. (අසම්මත වැ මෙහෙණනට ඔවදන් දෙන මහණහට වන) 'අසම්මත' පවිති යැ, (හිරු අස්තඞ්ගත වැ තිබියැ දී මෙහෙණනට ඔවදන් දෙන මහණහට වන) 'අත්ථඞ්ගත' පවිති යැ, 'භික්ඛුනූපස්සය' පවිති යැ, (ආමිස හේතුයෙන් මෙහෙණනට ඔවදන් දෙන මහණහට වන) 'ආමිස' පවිති යැ, (නො නෑ මෙහෙණකට සිවුරු දෙන මහණහට වන) 'දාන' පවිති යැ, (නො නෑ මෙහෙණ ලවා සිවුරු සිබ්බන කරවන මහණහට වන) 'සිබ්බන' පවිති යැ, (මෙහෙණක හා සංවිධාන කොටගෙනැ අදන්මඟ පිළිපන් මහණහට වන) 'සංවිධාන' පවිති යැ, (මෙහෙණක හා සංවිධාන කොට ගෙනැ එක් මැ නැවකට නඟින මහණහට වන) 'නාවාරුහන' පවිති යැ, (දනැ දනැ මෙහෙණක විසින් පරිපාචිත පිණ්ඩ පාතය වළඳන මහණහට වන) 'භුඤ්ජන' පවිති යැ, (මෙහෙණක හා එකලා වැ රහොගත වැ නිෂද්‍යා කරන මහණහට වන) ' එකතොනිසජ්ජා' පවිති යැ,

4. 'ආවසථපිණ්ඩ' පවිති යැ, 'ගණභොජන' පවිති යැ, 'පරම්පරභොජන' පවිති යැ, 'පූව' පවිති යැ, 'පවාරිත' පවිති යැ, (යළි '' භික්ඛුං භුත්තාවිං පවාරිතං '' යි නිර්දිෂ්ට) 'පවාරිත' පවිති යැ, 'විකාලභොජන' පවිති යැ, 'සන්නිධිකාරක' පවිති යැ, ('බීර' ශබ්ද යෙන් සඞ්ග්‍රහ කළ) 'පණීතභොජන' පවිති යැ, ('දන්තපොණෙන' යනුවෙන් නය වශයෙන් කියන) 'අදින්නමුඛද්වාර' පවිති යැ යන දසය ද,

5. ( ' අචෙලකස්ස වා . . . ඛාදනියං වා භොජනියං වා '' . . . යි නිර්දිෂ්ට) 'අචෙලක' පවිති යැ, ('' භික්ඛු . . . උය්‍යොජෙන්තස්ස '' . . . යි නිර්දිෂ්ට) 'උය්‍යොජන' පවිති යැ, ('' සභොජනෙ කුලෙ '' යනාදීන් නිර්දිෂ්ට) 'අනුපඛජ්ජනිසීදන' පවිති යැ, ('' මාතු ගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ '' යනාදීන් නිර්දිෂ්ට) 'පටිච්ඡන්න' පවිති යැ, ('' මාතු ගාමෙන සද්ධිං එකො එකාය රහො '' යනාදීන් නිර්දිෂ්ට) 'රහො නිසජ්ජා' පවිති යැ, ('' තතුත්තරිං භෙසජ්ජං '' . . . යනාදීන් නිර්දිෂ්ට) 'ග්ලානප්‍රත්‍යය' පිළිබඳ පවිති ය, ('' උය්‍යුත්තං සෙනං '' . . . යනාදීන් නිර්දිෂ්ට) සේනා' පවිති යැ, (සෙනායෙහි විසීම නිසා වදළ 'ආවසථ' පවිති යැ, 'උය්‍යොධික' පවිති යැ,

6. 'සුරා' පවිති යැ, 'අඞ්ගුලිපතොදක' පවිති යැ, 'හස්සධම්ම' පවිති යැ, 'අනාදරිය' පවිති යැ, 'හිංසන' පවිති යැ, 'ජොති' පවිති යැ, 'නහාන' පවිති යැ, 'දුබ්බණ්ණකරණ' පවිති යැ, (සාමං' යන නිපාතය ඇතුළත් වැ ඇතියෙන් එයින් සඞ්ග්‍රහ කළ) 'චීවරපරිභොග' පවිති යැ, 'අපනිධාන පවිති යැ,

7. සඤ්චිච්චුද්දක කම්මා ච - දුට්ඨුල්ලං ඌනවීසති,
ථෙය්‍ය ඉත්ථී අවදෙසං - සංවාසෙනාසිතෙන ච.

8. සහධම්මික විලෙඛා - මොහො පහාරෙනුග්ගිරෙ.
අමූලකඤ්ච සඤ්චිච්ච - සොස්සාමි ඛීයෙ පක්කමෙ.
සඞ්ඝෙන චීවරං දත්වා - පරිණාමෙය්‍ය පුග්ගලො.

9. රඤ්ඤඤ්ච රතනං සන්තං - සූචි මඤ්චො ච තූලකා
නිසීදනං කණ්ඩුච්ඡාදි - වස්සිකා සුගතෙන චාති.

---

තෙසං වග්ගානං උද්දානං :

මුසා භූතා ච ඔවාදෙ - භොජනාචෙලකෙන ච,
සුරා සප්පාණකා ධම්මො - රාජවග්ගෙන තෙ නවාති.

---

## 1.6
## පාටිදෙසනීයකණ්ඩො

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තස්ස පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරො භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ආමිසං පටිග්ගහෙසි, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.-පෙ-

7. ("සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙන්තස්ස" ... යනාදීන් නිර්දිෂ්ට) 'ප්‍රාණඝාත' පවිති යැ, ("ජානං සප්පාණකං උදකං"... යනාදීන් නිර්දිෂ්ට) උදකපරිභොග' පවිති යැ, ("ජානං යථා ධම්මං" ... යනාදීන් නිර්දිෂ්ට) 'පුනකම්ම' පවිති යැ, ("භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං ... යනාදීන් නිර්දිෂ්ට) 'දුට්ඨුල්ලාපත්ති' පවිති යැ, 'ඌනවීසති' පවිති යැ, ("ජානං ථෙය්‍යසත්ථෙන" ... යනාදීන් නිර්දිෂ්ට) 'එකද්ධානමග්ග පවිති යැ, ("මාතුගාමෙන සද්ධිං' ... යනාදීන් නිර්දිෂ්ට) 'එකද්ධානමග්ග' පවිති යැ, 'අවදෙය' පවිති යැ, 'සංවාස' පවිති යැ, 'නාසන' පවිති යැ,

8. ("භික්ඛූහි සහධම්මිකං ..." යනාදීන් නිර්දිෂ්ට) 'සහධම්මික' පවිති යැ, ('විනයං විවණ්ණෙන්තස්ස' යනාදීන් නිර්දිෂ්ට) 'විවණ්ණ' (විලෙඛ) පවිති යැ, 'මොහනක' පවිති යැ, 'පහාර' පවිති යැ, ("භික්ඛුස්ස ... තලසත්තිකං උග්ගිරන්තස්ස ..." යනාදීන් නිර්දිෂ්ට) 'උග්ගිරණ' පවිති යැ, 'අමූලක' පවිති යැ, ("භික්ඛුස්ස සඤ්චිච්ච ..." යනාදීන් නිර්දිෂ්ට) 'සඤ්චිච්ච' (—කුක්කුච්ච) පවිති යැ, (සොස්සාමී—) 'උපස්සුති, පවිති යැ, ඛීයනධම්ම' පවිති යැ, 'පක්කමන' පවිති යැ, ("සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා" ... " යනාදීන් නිර්දිෂ්ට) 'ඛීයන' පවිති යැ, 'පුග්ගලපරිණාමන' පවිති යැ,

9. 'රාජන්තෙපුර' පවිති යැ, 'රතන' පවිති යැ, ("සන්තං භික්ඛුං අනාපුච්ඡා ..." යනාදීන් නිර්දිෂ්ට) 'අනාපුච්ඡන' පවිති යැ, 'සුචිඝර' පවිති යැ, 'මඤ්ච' පවිති යැ, 'තූලොනද්ධ' පවිති යැ, 'නිසීදන' පවිති යැ, 'කණ්ඩුපටිච්ඡාදි' පවිති යැ, 'වස්සිකසාටිකා' පවිති යැ, 'සුගතචීවර' පවිති යැ යන පවිති ඇවත් දක්විත.

---

ඒ වර්ගයන් පිළිබඳ නාමාවලිය

මුසාවාද යැ, භූතගාම යැ, භික්ඛුනොවාද යැ, භොජන යැ. අචෙලක යැ, සුරාපාන යැ, සප්පාණක යැ, සහධම්මික යැ, රාජයැ යි වර්ග නවයෙකි.

---

## 1.6
## පාටිදෙසනීය කාණ්ඩය

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි. කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කෑයුතු දයක් හෝ බුදිය යුතු දයක් හෝ සියතින් පිළිගෙණ වළඳන්නහු පිළිබඳ පිළිදෙස්නී සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : එක්තරා මහණක්හු ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මහණෙක් ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් ආහාරයක් පිළිගත්තේ ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. ...

2. භික්ඛුනියා වොසාසන්තියා න නිවාරෙත්වා භුඤ්ජන්තස්ස පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනියො වොසාසන්තියො න නිවාරෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.-පෙ-

3. සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තස්ස පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ න මත්තං ජානිත්වා පටිග්ගහෙසුං තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති. ද්වෙ අනුපඤ්ඤත්තියො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.-පෙ-

4. ආරඤ්ඤකෙසු සෙනාසනෙසු පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තස්ස පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සක්කෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති:

සම්බහුලා භික්ඛූ ආරාමෙ චොරෙ පටිවසන්තෙ නාරොචෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති.-පෙ-

චත්තාරො පාටිදෙසනීයා නිට්ඨිතා.

---

තස්සුද්දානං:

අඤ්ඤාතිකාය වොසාසං - සෙඛාරඤ්ඤකෙන ච,
පාටිදෙසනීයා චත්තාරො - සම්බුද්ධෙන පකාසිතාති.

---

2. විධාන කරණ මෙහෙණක නො වළක්වා වළඳන්නාහු පිළිබඳ පිළිදෙස්නී සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : රජගහ නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු විධාන කරණ මෙහෙණන් නො වැළැක් වූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

3. සෙඛසම්මතය ලත් කුලයන්හි කෑ යුතු දෑයක් හෝ බීදිය යුතු දෑයක් හෝ සියතින් පිළිගෙණ වළඳන්නාහු පිළිබඳ පිළිදෙස්නී සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු පමණ නො දැන පිළිගත්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති දෙකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් නඟි යි, වචනයෙන් නො නඟි යි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී. . . .

4. වන සෙනසුන්හි පෙර නො දන්වන ලද කෑයුතු දෑයක් හෝ බීදිය යුතු දෑයක් හෝ අරම තුළැ සියතින් පිළිගෙණ වළඳන්නාහු පිළිබඳ පිළිදෙස්නී සිකපදය කොතැන්හි පණවන ලද ද යත් : ශාක්‍ය ජනපදයෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු අරම තුළැ වසන සොරුන් ගැණ නො දැන්වූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකැ, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසි විටෙක කයින් ද වචනයෙන් ද නඟි යි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

සිවු පිළිදෙස්නීහු නිමියහ.

---

එහි උද්දානය :

අඤ්ඤාතික යැ, වොසාසන්තී යැ, සෙඛසම්මත යැ, ආරඤ්ඤභොජන යැ යි සම්බුදු රදුන් විසින් පණවන ලද පාටිදෙසනීය සතරෙකි.

---

# 1.7

## සෙඛියා

### 7.1

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තෙන නිවාසෙන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙසුං, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

2. අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තෙන පාරුපන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා පාරුපිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

3. අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං-පෙ-ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

එකා පඤ්ඤත්ති.

එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො-පෙ-

4. අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං-පෙ-ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

එකා පඤ්ඤත්ති.

එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො-පෙ-

5. අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තෙන අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං-පෙ-ඡබ්බග්ගියා භික්ඛූ හත්ථම්පි පාදම්පි කීළාපෙන්තා අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං.-පෙ-

එකා පඤ්ඤත්ති.

## 1.7

## සේඛියා කාණ්ඩය

### 7.1

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් අනාදර පිණිස (නිසා) ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් හඳින්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ඉදිරිපසින් ද පසුපසින් ද එල්වමින් හැන්දහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

2. අනාදර පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් පොරවන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු ඉදිරිපසින් ද පසු පසින් ද එල්වමින් පෙරැවූහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී. . . .

3. අනාදර පිණිස කය විවරකොට ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු කය විවර කොට ඇතුළුගමැ ගියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී. . . .

4. අනාදර පිණිස කය විවර කොට ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු කය විවර කොට ඇතුළුගමැ හුන්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

5. අනාදර පිණිස අත හෝ පය හෝ කෙළවමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු අත ද පය ද කෙළව මින් ඇතුළුගමැ ගියාහු ය, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

6. අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තස්ස අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං පෙ-ඡබ්බග්ගියා භික්ඛූ හත්ථම්පි පාදම්පි කීළාපෙන්තා අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

7. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තෙන අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං-පෙ-ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

8. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තෙන අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං-පෙ-ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

9. අනාදරියං පටිච්ච උක්ඛිත්තකාය අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති, ඡබ්බග්ගියා භික්ඛූ උක්ඛිත්තකාය අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

10. අනාදරියං පටිච්ච උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

පරිමණ්ඩලවග්ගො පඨමො.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී. . . .

6. අනදර පිණිස අත හෝ පය හෝ කෙළවමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඨය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු අත ද පය ද කෙළවමින් ඇතුළුගමැ හුන්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

7. අනදර පිණිස ඒ ඒ තැනැ බලමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඨය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු තැනැ තැනැ බලමින් ඇතුළුගමැ ගියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී.

8. අනදර පිණිස ඒ ඒ තැනැ බලමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඨය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු තැනැ තැනැ බලමින් ඇතුළුගමැ හුන්හ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී.

9. අනදර පිණිස එක් පසෙකින් හෝ දෙපසින් හෝ නඟා ගත් සිවුරෙන් යුතු වැ ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඨය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු නඟා ගත් සිවුරෙන් යුතු වැ ඇතුළුගමැ ගියහ, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී.

10. අනදර පිණිස එක් පසෙකින් හෝ දෙපසින් හෝ නඟා ගත් සිවුරෙන් යුතු වැ ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඨය කොතැන්හි පණවන ලද ද යත් : . . . සවග මහණහු නඟා ගත් සිවුරෙන් යුතු වැ ඇතුළුගමැ හුන්හ. ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

පළමුවන පරිමණ්ඩල වර්ග යි.

7.2

1. අනාදරියං පටිච්ච උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ මහාහසිතං හසන්තා අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

2. අනාදරියං පටිච්ච උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ මහාහසිතං හසන්තා අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-.

3. අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තෙන අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ උච්චාසද්දං මහාසද්දං කරොන්තා අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

4. අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තෙන අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ උච්චාසද්දං මහාසද්දං කරොන්තා අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

5. අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ කායප්පචාලකං අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ- එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

6. අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

7. අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ බාහුප්පචාලකං අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

8. අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

## 7.2

1. අනාදර පිණිස මහසිනාවෙන් යුතු වැ ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැත් නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මහසිනා සෙන්නාහු ඇතුළුගමැ ගියහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

2. අනාදර පිණිස මහසිනාවෙන් යුතු වැ අතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු මහසිනා සෙන්නාහු ඇතුළුගමැ හුන්හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

3. අනාදර පිණිස උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගමැ ගියහු, ඒ වස්තුයෙහි යැ. . . .

4. අනාදර පිණිස උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගමැ හුන්හු, ඒ වස්තුයෙහි යැ. . . .

5. අනාදර පිණිස කය සලමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු කය සලමින් ඇතුළුගමැ ගියහ, ඒ වස්තුයෙහි යැ. . . . එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

6. අනාදර පිණිස කය සලමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු කය සලමින් ඇතුළුගමැ හුන්හු, ඒ වස්තුයෙහි යැ. . . .

7. අනාදර පිණිස අත සලමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . : සවග මහණහු අත සලමින් ඇතුළුගමැ ගියහු, ඒ වස්තුයෙහි යැ. . . .

8. අනාදර පිණිස අත සලමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු අත සලමින් ඇතුළුගමැ හුන්හු, ඒ වස්තුයෙහි යැ. . . .

9—සිව 17881 (75/07)

9. අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ- ඡබ්බග්ගියා භික්ඛූ සීසප්පචාලකං අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

10. අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

## උජ්ජග්ඝිකවග්ගො දුතියො.

---

## 7.3

1. අනාදරියං පටිච්ච ඛම්භකතෙන අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ ඛම්භකතෙන අන්තරඝරෙ ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-.

2. අනාදරියං පටිච්ච ඛම්භකතෙන අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ-.

3. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතෙන අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ-.

4. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතෙන අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ-.

5. අනාදරියං පටිච්ච උක්කුටිකාය අන්තරඝරෙ ගච්ඡන්තස්ස දුක්කටං -පෙ-.

6. අනාදරියං පටිච්ච පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදන්තස්ස දුක්කටං -පෙ-.

අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං පටිග්ගණ්හන්තස්ස දුක්කටං -පෙ-.

9. අනාදර පිණිස හිස සලමින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . සවග මහණහු හිස සලමින් ඇතුළුගමැ ගියහු, ඒ වස්තුයෙහි යැ. . . .

10. අනාදර පිණිස හිස සලමින් ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැත් නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු හිස සලමින් ඇතුළුගමැ හුන්හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

දෙවන උජ්ජග්ඝික වර්ග යි.

---

## 7.3

1. අනාදර පිණිස උකුළෙහි තබන ලද අත් ඇති වැ ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය කො තැන්හි පණවන ලද ද යත් : සවැත් නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු උකුළෙහි තබන ලද අත් ඇති වැ ඇතුළුගමැ ගියහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟි යි. කයින් ද සිතින් ද නඟි යි, වචනයෙන් නො නඟී. . . .

2. අනාදර පිණිස උකුළෙහි තබන ලද අත් ඇති වැ ඇතුළු ගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස හිස වටා පෙරැවැ ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

4. අනාදර පිණිස හිස වටා පෙරැවැ ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

5. අනාදර පිණිස අක්පල්ලෙන් හෝ විලුඹින් ඇතුළුගමැ යන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

6. අනාදර පිණිස අකවටු ගත්වා ඇතුළුගමැ හිඳින්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

7. අනාදර පිණිස නො සකස් වැ පිඬු පිළිගන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

8. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තෙන පිණ්ඩපාතං පටිග්ගණ්හන්තස්ස දුක්කටං -පෙ-.

9. අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං පටිග්ගණ්හන්තස්ස දුක්කටං -පෙ-.

10. අනාදරියං පටිච්ච ථූපීකතං පිණ්ඩපාතං පටිග්ගණ්හන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අනාදරියං පටිච්ච ථූපීකතං පිණ්ඩපාතං පටිග්ගණ්හිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

ඛම්භකතවග්ගො තතියො.

---

## 7.4

1. අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛූ අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-

2. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තෙන පිණ්ඩපාතං භුඤ්ජන්තස්ස දුක්කටං පෙ-

3. අනාදරියං පටිච්ච තහං තහං ඔමසිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

4. අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං භුඤ්ජන්තස්ස දුක්කටං -පෙ-

5. අනාදරියං පටිච්ච ථූපකතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

6. අනාදරියං පටිච්ච සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙන්තස්ස දුක්කටං-පෙ-

7. අනාදරියං පටිච්ච සූපං වා බ්‍යඤ්ජනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තස්ස දුක්කටං පෙ-

8. අනාදර පිණිස තැනැ තැනැ බලමින් පිඩු පිළිගන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

9. අනාදර පිණිස සූපය ම බෙහෙවින් පිළිගන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

10. අනාදර පිණිස ථූප බඳු කොට පිඩු පිළිගන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැත් නුවර පණවන ලදී.

කවරක්හු ඇරැබැ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කවර වස්තුයෙක්හි ද යත්: සවග මහණහු අනාදර පිණිස මුදුන් කළ පිඩු පිළිගත්හු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

තුන්වන ඛම්භකතවර්ග යි.

---

## 7.4

1. අනාදර පිණිස නො සකස් වැ පිඩු වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි පණවන ලදි.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු අනාදර පිණිස නො සකස්වැ පිඩු වැළඳූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

2. අනාදර පිණිස තැනැ තැනැ බලමින් පිඩු වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස තැනැ තැනැ හනා පිඩු වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස සූපය ම බොහෝ කොට වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

5. අනාදර පිණිස බත මුදුනෙන් හනා පිඩු වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

6. අනාදර පිණිස සූපයක් හෝ ව්‍යඤ්ජනයක් හෝ බතින් වසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

7. අනාදර පිණිස සූපයක් හෝ බතක් හෝ නො ගිලන් වැ තමා පිණිස විනවා වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

8. අනාදරියං පටිච්ච උජ්ඣානසඤ්ඤිනා පරෙසං පත්තං ඔලොකෙන්තස්ස දුක්කටං-පෙ-

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො-පෙ-

9. අනාදරියං පටිච්ච මහන්තං කබලං කරොන්තස්ස දුක්කටං-පෙ-.

10. අනාදරියං පටිච්ච දීඝං ආලොපං කරොන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ අනාදරියං පටිච්ච දීඝං ආලොපං කරිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-.

පිණ්ඩපාතවග්ගො චතුත්ථො

---

## 7.5

1. අනාදරියං පටිච්ච අනාහටෙ කබලෙ මුඛද්වාරං විවරන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති, ඡබ්බග්ගියා භික්ඛූ අනාදරියං පටිච්ච අනාහටෙ කබලෙ මුඛද්වාරං විවරිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-

2. අනාදරියං පටිච්ච භුඤ්ජමානෙන සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපන්තස්ස දුක්කටං-පෙ-

3. අනාදරියං පටිච්ච සකබලෙන මුඛෙන බ්‍යාහරන්තස්ස දුක්කටං -පෙ-එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-.

Free Distribution www.aathaapi.org

පඤ්ඤත්ති එකෙකැ. අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කයින් ද සිතින් ද සමුට්ඨාන වෙයි, වචනයෙන් නො වෙයි. කයින් ද වචනයෙන් ද සිතින් ද සමුට්ඨාන වන්නේ යි.

8. අනාදර පිණිස අවඥ සිතින් අනුන්ගේ පාත්‍රය බලන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

9. අනාදර පිණිස මහත් කොට පිඩු කරන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

10. අනාදර පිණිස දිගු කොට පිඩු කරන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවත් නුවර පණවන ලදී.

කවරක්හු ඇරැබැ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු අනාදර පිණිස දිගුකොට පිඩු කළහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

සිවුවන පිණ්ඩපාත වර්ග යි.

---

## 7.5

1. අනාදර පිණිස පිඩු මුවට නො එළවූ සඳ මුව විවර කරන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සැවැත් නුවර පණවන ලදී.

කවරක්හු ඇරැබැ ද යත් : සවග මහණුන් ඇරැබැ යැ.

කවර වස්තුයෙක්හි ද යත් : සවග මහණහු අනාදර පිණිස පිඩු මුවට නො එළවූ සඳ මුව විවර කළහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

2. අනාදර පිණිස වළඳමින් හැම ඇඟිලි මියෙහි බහන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස පිඩු සහිත මුවින් බණන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

4. අනාදරියං පටිච්ච පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ- එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-.

5. අනාදරියං පටිච්ච කබලාවච්ඡෙදකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

6. අනාදරියං පටිච්ච අවගණ්ඩකාරකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

7. අනාදරියං පටිච්ච හත්ථනිද්ධුනකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

8. අනාදරියං පටිච්ච සිත්ථාවකාරකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

9. අනාදරයං පටිච්ච ජිව්හානිච්ඡාරකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

10. අනාදරියං පටිච්ච චපුචපුකාරකං භුඤ්ජන්තස්ස දුක්කටං-පෙ-

කබලවග්ගො පඤ්චමො.

---

## 7·6

1. අනාදරියං පටිච්ච සුරුසුරුකාරකං භුඤ්ජන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: කොසම්බියං පඤ්ඤත්තං.

තං ආරබ්භාති, සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ සුරුසුරුකාරකං ඛීරං පිවිංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

2. අනාදරියං පටිච්ච හත්ථනිල්ලෙහකං භුඤ්ජන්තස්ස දුක්කටං -පෙ-

3. අනාදරියං පටිච්ච පත්තනිල්ලෙහකං භුඤ්ජන්තස්ස දුක්කටං -පෙ-

4. අනාදරියං පටිච්ච ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජන්තස්ස දුක්කටං -පෙ-

5. අනාදරියං පටිච්ච සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගණ්හන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: භග්ගෙසු පඤ්ඤත්තං.

තං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙසුං, තස්මිං වත්ථුස්මිං -පෙ-

4. අනාදර පිණිස පිඩු මියෙහි දමාලා වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . . එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

5. අනාදර පිණිස පිඩු කඩ කඩ කොට වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

6. අනාදර පිණිස කොපුලැ පිඩු රැස් කොට කොට වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

7. අනාදර පිණිස අත් සල සලා වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

8. අනාදර පිණිස හුලු විසුරුවා වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

9. අනාදර පිණිස දිව තෙර තෙරා වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

10. අනාදර පිණිස චපු චපු යන හඬ නංවමින් වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

පස්වන කබළ වර්ග යි.

---

## 7.6

1. අනාදර පිණිස 'සුරු සුරු' යන හඬ නංවමින් වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : කොසඹෑ නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු 'සුරු සුරු' යන හඬ කෙරෙමින් කිරි පානය කළහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

2. අනාදර පිණිස අත ලෙවමින් වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස පාත්‍රය ලෙවැ ලෙවැ වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

4. අනාදර පිණිස තොල් ලෙවැ ලෙවැ වළඳන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

5. අනාදර පිණිස ඉඳුල් සහිත අතින් පැන්තලිය පිළිගන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : භග්ග දනවුහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු ඉඳුල් සහිත අතින් පැන්තලිය පිළිගත්හු, ඒ වස්තුයෙහි යැ. . . .

6. අනාදරියං පටිච්ච සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: භග්ගෙසු පඤ්ඤත්තං.

කං ආරබ්භාති: සම්බහුලෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛූ සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙසුං, තස්මිං වත්ථුස්මිං -පෙ-

7 අනාදරියං පටිච්ච ඡත්තපාණිස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ -පෙ-

එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො -පෙ-

8. අනාදරියං පටිච්ච දණ්ඩපාණිස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

9. අනාදරියං පටිච්ච සත්ථපාණිස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

10. අනාදරියං පටිච්ච ආවුධපාණිස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

සුරුසුරුවග්ගො ඡට්ඨො.

---

7·7

1. අනාදරියං පටිච්ච පාදුකාරූළ්හස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

2. අනාදරියං පටිච්ච උපාහනාරූළ්හස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

3. අනාදරියං පටිච්ච යානගතස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

4. අනාදරියං පටිච්ච සයනගතස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

5. අනාදරියං පටිච්ච පල්ලත්ථිකාය නිසින්නස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

6. අනාදරියං පටිච්ච වෙඨිතසීසස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

7. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතසීසස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

6. අනාදර පිණිස හුලු සහිත පාත්‍ර දෙවූ දිය ඇතුළුගෙහි දමන්නාහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : භග්ග දනවුහි දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : බොහෝ මහණුන් ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මහණහු හුලු සහිත පාත්‍ර දෙවූ දිය ඇතුළුගෙහි දැමූහු, ඒ වස්තුයෙහි යැ. . . .

7. අනාදර පිණිස සත් ගත් අත් ඇත්තහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය කො තැන්හි පණවන ලද ද යත් : සැවැත් නුවර දී පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ යැ.

පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. . . .

8. අනාදර පිණිස දඬුගත් අත් ඇත්තහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

9. අනාදර පිණිස (කඩු ආ) සැත්ගත් අත් ඇත්තහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

10. අනාදර පිණිස (දුනුහී ආ) අවිගත් අත් ඇත්තහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

සවන පුරුසුරු වර්ග යි.

---

## 7.7

1. අනාදර පිණිස මිරිවැඩි නැඟියහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

2. අනාදර පිණිස වහන් නැඟියහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

3. අනාදර පිණිස යානයෙහි හුන්නාහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

4. අනාදර පිණිස යහන්හි හුන්නාහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

5. අනාදර පිණිස (හස්තාදීන්) අකවටු අවුලුවා හුන්නාහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

6. අනාදර පිණිස (පිළි ආදියෙන්) හිස් වෙළුම් ඇතියහුට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

7. අනාදර පිණිස හිස වසා පෙරැවියහට දහම් දෙසන්නාහු පිළිබඳ දුකුළා සිඛය . . .

Free Distribution www.aathaapi.org

8. අනාදරියං පටිච්ච ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො[1] ච වාචතො ච චිත්තතො ච -පෙ-

9. අනාදරියං පටිච්ච නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

10. අනාදරියං පටිච්ච ඨිතෙන නිසින්නස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

11. අනාදරියං පටිච්ච පච්ඡතො ගච්ඡන්තෙන පුරතො ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

12. අනාදරියං පටිච්ච උප්පථෙන ගච්ඡන්තෙන පථෙන ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්තස්ස දුක්කටං -පෙ-

13. අනාදරියං පටිච්ච ඨිතෙන උච්චාරං වා පස්සාවං වා කරොන්තස්ස දුක්කටං -පෙ-

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො -පෙ-

14. අනාදරියං පටිච්ච හරිතෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස දුක්කටා -පෙ-

15. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි අකංසු, තස්මිං වත්ථුස්මිං.

එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති. න වාචතො -පෙ-

පාදුකාවග්ගො සත්තමො.

---

පඤ්චසත්තති සෙඛියා නිට්ඨිතා.

---

1. කායතො ච - සයා, නත්ථි.

Free Distribution www.aathaapi.org

8. අනාදර පිණිස බිමැ හිඳ ආසනයෙහි හුන්නහුට දහම් දෙසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි ; කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී , , .

9. අනාදර පිණිස මිටි අස්නෙක හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

10. අනාදර පිණිස සිටියහු විසින් හුන්නහුට දහම් දෙසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

11. අනාදර පිණිස පසුව ලා යන්නහු විසින් පෙරටු වැ යන්නහුට දහම් දෙසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

12. අනාදර පිණිස නොමඟ යන්නහු විසින් මඟ යන්නහුට දහම් දෙසන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

13. අනාදර පිණිස සිටීමෙන් (සිට ගෙණ) මල මූ කිස කරන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

14. අනාදර පිණිස නිල් (තණ ආදියෙහි) මල මූ කෙළ බහන්නහු පිළිබඳ දුකුළා සිඛය . . .

15. අනාදර පිණිස (පිරිබෝ) දියෙහි මල මූ කෙළ බහන්නහු පිළිබඳ දුකුළා සිඛය කොතැන්හි පණවන ලද ද යත් : සවැත් නුවර පණවන ලදී.

කවරක්හු ඇරැබ ද යත් : සවග මහණුන් ඇරැබ ය.

කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මහණහු (පිරිබෝ) දියෙහි මල ද මූ ද කෙළ ද බැහූහු, ඒ වස්තුයෙහි යැ.

පඤ්ඤත්ති එකෙකි. අනුපඤ්ඤත්ති එකෙකි,

සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

සත්වන පාදුකා වර්ග යි.

---

පන්සැත්තෑ සේඛියා නිමි.

තස්සුද්දානං :

1 පරිමණ්ඩලං පටිච්ඡන්නං-සුසංවුතොක්ඛිත්තචක්ඛු ච,
උක්ඛිත්තොජ්ජග්ඝිකා සද්දෙ-තයො චෙව පචාලනා.

2. ඛම්භඔගුණ්ඨිතා චෙව-කුටි පල්ලත්ථිකාය ච,
සක්කච්චං පත්තසඤ්ඤී ච-සමසූපං සමතිත්තිකං.

3. සක්කච්චං පත්තසඤ්ඤී ච-සපදානං සමසූපකං,
ථූපකතො පටිච්ඡන්නං-විඤ්ඤත්තුජ්ඣානසඤ්ඤිතා.[1]

4. න මහන්තං මණ්ඩලද්වාරං-සබ්බං හත්ථං න බ්‍යාහරෙ,
උක්ඛෙපො ඡෙදනා ගණ්ඩො-ධූනං සිත්ථාවකාරකං.

5. ජිව්හානිච්ඡාරකඤ්චෙව-චපුචපු සුරුසුරු,
හත්ථො පත්තො ච ඔට්ඨො ච-සාමිසං සිත්ථකෙන ච.

6. ඡත්තපාණිස්ස සද්ධම්මං-න දෙසෙන්ති තථාගතා,
එවමෙව දණ්ඩපාණිස්ස-සත්ථආවුධපාණිනං.

7. පාදුකොපාහනා චෙව-යානසෙය්‍යාගතස්ස ච,
පල්ලත්ථිකා නිසින්නස්ස-වෙඨිතොගුණ්ඨිතස්ස ච.

8. ඡමා නීචාසනෙ ඨානෙ-පච්ඡතො උප්පථෙන ච,
ඨිතකෙන න කාතබ්බං-හරිතෙ උදකම්හි චාති.

තෙසං වග්ගුද්දානං :

පරිමණ්ඩල උජ්ජග්ඝි-ඛම්භං පිණ්ඩං තථෙව ච,
කබලා සුරුසුරු චෙව-පාදුකෙන ච සත්තමාති.

මහාවිභඞ්ගෙ කත්ථපඤ්ඤත්තිවාරෝ නිට්ඨිතො.

---

1. සඤ්ඤිනා. ම ඡ සං.

එහි උද්දානය :

1. පරිමණ්ඩල යැ, සුපටිච්ඡන්න යැ, සුසංවුත යැ, ඔක්ඛිත්තචක්ඛු යැ, උක්ඛිත්ත කාය යැ, උජ්ජග්ඝිකාය යැ, අප්පසද්ද දෙක යැ පචාලන සිකපද තුණ යැ,

2. ඛම්භකත යැ, ඔගුණ්ඨිත යැ, උක්කුටික යැ, පල්ලත්ථික යැ, සක්කච්ච යැ, පත්තසඤ්ඤී යැ, සමසූපක යැ, සමතිත්තික යැ,

3. (දෙවන) සක්කච්ච යැ, (නැවත) පත්තසඤ්ඤී යැ, සපදාන යැ, (දෙවන) සමසූපක යැ, ථූපකත යැ, පටිච්ඡන්න යැ, විඤ්ඤත්ති යැ, උජ්ඣානසඤ්ඤී යැ.

4. නාතිමහන්ත යැ, පරිමණ්ඩල ආලොප යැ, මුඛද්වාර යැ, සබ්බහත්ථ යැ, සකබල බ්‍යාහර යැ, පිණ්ඩුක්ඛෙප යැ, කබලාවච්ඡේදක යැ, අවගණ්ඩකාරක යැ, හත්ථනිද්ධූනක යැ, සිත්ථාවකාරක යැ,

5. ජිව්හානිච්ඡාරක යැ, චපුචපු කාරක යැ, සුරුසුරු කාරක යැ, හත්ථනිල්ලෙහකයැ, පත්තනිල්ලෙහක යැ, ඔට්ඨනිල්ලෙහක යැ, සාමිසහත්ථ යැ, සසිත්ථක පත්ත ධොවන යැ,

6. ඡත්තපාණි යැ, දණ්ඩපාණි යැ, සත්ථපාණි යැ, ආයුධපාණි යැ,

7. පාදුකා යැ, උපාහන යැ, යානගත යැ, සයනගත යැ, පල්ලත්ථිකා යැ, වෙඨිතසීස යැ, ඔගුණ්ඨිතසීස යැ,

8. ඡමානිසීදන යැ, නිවාසන යැ, ඨිතක යැ, පච්ඡතො ගච්ඡන්ත යැ, උප්පථෙන ගච්ඡන්ත යැ, ඨිතක යැ, හරිත යැ, උදක යැ යි.

එහි වර්ගොද්දානය :

පරිමණ්ඩල යැ, උජ්ජග්ඝික යැ, ඛම්භකත යැ, පිණ්ඩපාත යැ, කබළ යැ, සුරුසුරු යැ, පාදුක යැ යි වර්ග සතෙකි.

මහා විභඞ්ගයෙහි කත්ථපඤ්ඤත්තිවාරය නිමියේ යි.

---

Free Distribution www.aathaapi.org

# 2. කතාපත්තිවාරො

## 2.1

### පාරාජිකකණ්ඩා

1. මෙථුනං ධම්මං පටිසෙවන්තො කති ආපත්තියො ආපජ්ජති :

මෙථුනං ධම්මං පටිසෙවන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : අක්ඛයිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, අපත්ති පාරාජිකස්ස. යෙභුය්‍යෙන ඛයිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති ථුල්ලච්චයස්ස. වට්ටකතෙ ච මුඛෙ අච්ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙති, ආපත්ති දුක්කටස්ස. මෙථුනං ධම්මං පටිසෙවන්තො ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

2 අදින්නං ආදියන්තො කති ආපත්තියො ආපජ්ජති :

අදින්නං ආදියන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : පඤ්චමාසකං වා අතිරෙක පඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති පාරාජිකස්ස. අතිරෙකමාසකං වා ඌනපඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. මාසකං වා ඌනමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති දුක්කටස්ස. අදින්නං ආදියන්තො ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

3. සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙන්තො කති ආපත්තියො ආපජ්ජති :

සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : මනුස්සං උද්දිස්ස ඔපාතං ඛණති 'පපතිත්වා මරිස්සතී'ති', ආපත්ති දුක්කටස්ස. පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස. මරති, ආපත්ති පාරාජිකස්ස. සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපෙන්තො ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති

4. අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපන්තො කති ආපත්තියො ආපජ්ජති :

අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආපත්ති පාරාජිකස්ස. 'යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහා'ති භණති, පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස. අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපන්තො ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

චත්තාරො පාරාජිකා නිට්ඨිතා.



Free Distribution www.aathaapi.org

# 2. කුතාපත්තිවාරය

## 2.1

## පාරාජික කාණ්ඩය

1. මෙවුන්දම් සේවනය කරන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් :

මෙවුන්දම් සේවනය කරන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : ක්ෂය නොවූ නිමිත්තෙහි මෙවුන්දම් සෙවනය කෙරේ නම් පරිජි ඇවැත් වෙයි. බෙහෙවින් ක්ෂය වූ නිමිත්තෙහි මෙවුන්දම් සේවනය කෙරේ නම් ථුලසි ඇවැත් වෙයි. විවර කළ මුඛයෙහි නො පහස්නා අඩගජාතය ප්‍රවේශ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. මෙවුන්දම් සේවනය කරන මහණ මේ තුන් ඇවතට පැමිණේ.

2. නො දුන් දය (සොර සිතින්) ගන්නා මහණ කෙතෙක් ඇවතට පැමිණේ ද යත් :

නො දුන් දෙය (සොර සිතින්) ගන්නා හේතුයෙන් තුන් ඇවතකට පැමිණෙයි : මසු පසක් හෝ අයිරාපස් මස්සක් හෝ අගනා නොදුන් දයක් සොරසිතින් ගනී නම් පරිජි ඇවැත් වෙයි, අයිරා මස්සක් හෝ උනු පස් මස්සක් හෝ අගනා නො දුන් දයක් සොර සිතින් ගනී නම් ථුලසි ඇවැත් වෙයි, මස්සක් හෝ උනු මස්සක් හෝ අගනා නො දුන් දයක් සොර සිතින් ගනී නම් දුකුළා ඇවැත් වෙ. නො දුන් දය ගන්නා මහණ මේ තුන් ඇවැතට පැමිණේ.

3. දන දන මිනිස් සතක්හු දිවි ගලවන මහණ කෙතෙක් ඇවතට පැමිණේ ද යත් :

දන දන මිනිස් සතක්හු දිවි ගළවන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : " (මෙහි) වැටී මැරේව " යි මිනිස් සතක්හු උදෙසා වළක් කණී නම් දුකුළා ඇවැත් වෙයි, එහි වැටුණු කල ඔහුට දුක් වෙදනා උපදී නම් ථුලසි ඇවැත් වෙයි, මැරේ නම් පරිජි ඇවැත් වෙ. දන දන මිනිස් සතක්හු දිවි ගළවන මහණ මේ තුන් ඇවැතට පැමිණේ.

4. (තමා කෙරෙහි) අවිද්‍යමාන වූ (ධ්‍යානාදී) උතුරු මිනිස්ධම් තමා තුළ ඇතැයි පවසන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් :

අවිද්‍යමාන වූ උතුරු මිනිස්ධම් ඇතැයි පවසන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : ලාමක පැතුම් ඇත්තේ (එබඳු) ආශාවෙන් මඩනා ලද්දේ (තමා කෙරෙහි නැති) උතුරු මිනිස්ධම් (ඇතැයි) පවසා නම් පරිජි ඇවැත් වෙයි. " යමෙක් තොපගේ වෙහෙරෙහි වෙසේ ද ඒ මහණ රහත් යැ " යි දනුමැතියක්හට පවසා නම් ථුලසි ඇවැත් වෙයි, දනුම නැතියක්හට පවසා නම් දුකුළා ඇවැත් වෙ. අවිද්‍යමාන වූ උතුරු මිනිස්ධම් (ඇතැයි) පවසන මහණ මේ තුන් ඇවතට පැමිණේ.

සතර පරිජි නිමි.



10—ඕඕ 17881 (7/76)

Free Distribution www.aathaapi.org

## 2.2

## සඞ්ඝාදිසෙසකණ්ඩො

1. උපක්කමිත්වා අසුචිං මොචෙන්තො කති ආපත්තියො ආපජ්ජති :[1]

උපක්කමිත්වා අසුචිං මොචෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. චෙතෙති උපක්කමති න මුච්චති, ආපත්ති ථුල්ලච්චයස්ස. පයොගෙ දුක්කටං.

2. මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : කායෙන කායං ආමසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. කායෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස.

3. මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. වච්චමග්ගං පස්සාවමග්ගං ඨපෙත්වා අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති, අවණ්ණම්පි භණති, ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධං ආදිස්ස වණ්ණම්පි භණති, අවණ්ණම්පි භණති, ආපත්ති දුක්කටස්ස.

4. අත්තකාමපාරිචරියාය වණ්ණං භාසන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පණ්ඩකස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති ථුල්ලච්චයස්ස. තිරච්ඡානගතස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති දුක්කටස්ස.

5. සඤ්චරිත්තං සමාපජ්ජන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : පටිග්ගණ්හාති වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පටිග්ගණ්හාති වීමංසති න පච්චාහරති, ආපත්ති ථුල්ලච්චයස්ස. පටිග්ගණ්හාති න වීමංසති න පච්චාහරති, ආපත්ති දුක්කටස්ස.

6. සඤ්ඤාචිකාය කුටිං කාරාපෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : කාරාපෙති, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

7. මහල්ලකං විහාරං කාරාපෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : කාරාපෙති, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

8. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති : අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

---

1. "උපක්කමිත්වා -පෙ- ආපජ්ජති" ම. ඡ. සං. න දිස්සති.

# 2.2

## සඞඝාදිසෙස කාණ්ඩය

1. උපක්‍රම කොට සුකුරු මුදන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් :

උපක්‍රම කොට සුකුරු මුදන මහණ තුන් ඇවතකට පැමිණෙයි : සිතා ද උපක්‍රම කෙරේ ද සුකුරු මිදේ ද සඟවෙසෙස් ඇවැත් වෙයි, සිතා ද උපක්‍රම කෙරේ ද නො මිදේ ද ථුල්ලැසි ඇවැත් වෙයි. පියෝ හි දුකුළා ඇවැත් වේ.

2. මාගමක හා කායසඟයට පැමිණෙන මහණ තුන් ඇවැතකට පැමිණෙයි ; කයින් කය පහරී ද සඟවෙසෙස් ඇවැත් වෙයි, කයින් කය පිළිබඳ දෑයක් ආමර්ශ කෙරේ ද ථුල්ලැසි ඇවැත් වෙයි, කය පිළිබඳ දෑයෙකින් කය පිළිබඳ දෑයක් ආමර්ශ කෙරේ ද දුකුළා ඇවැත් වේ.

3. මාගමකට තුළුල් තෙපුල් කියන මහණ තුන් ඇවතකට පැමිණෙයි : වසමඟ පසමඟ අරමුණු කොට ගුණත් කියා ද අගුණත් කියා ද සඟ වෙසෙස් ඇවැත් වෙයි, වසමග පසමග තබා අකු ඇටයෙන් යට දණ මඩලින් මතු කය අරමුණු කොට ගුණත් කියා ද අගුණත් කියා ද ථුල්ලැසි ඇවැත් වෙයි, කය පිළිබඳ දෑයක් අරමුණු කොට ගුණත් කියා ද අගුණත් කියා ද දුකුළා ඇවැත් වේ.

4. තමහට මෙවුන්දම්න් මෙහෙකිරීම පිළිබඳ ගුණ කියන මහණ තුන් ඇවතකට පැමිණෙයි : මාගමක හමුවෙහි තමහට මෙවුන්දම්න් මෙහෙ කිරීම පිළිබඳ ගුණ කියා ද සඟවෙසෙස් ඇවැත් වෙයි, පණ්ඩකයක්හු හමුවෙහි තමහට මෙවුන්දම්න් මෙහෙකිරීම පිළිබඳ ගුණ කියා ද ථුල්ලැසි ඇවැත් වෙයි, තිරිසන්ගියක්හු හමුවෙහි තමහට මෙවුන්දම්න් මෙහෙ කිරීම පිළිබඳ ගුණ කියා ද දුකුළා ඇවැත් වේ.

5. මාගමුන් හා පිරිමින් අතර (හසුන් ගෙණ යනු එනු විසින්) සඤ්චරිත්තයට පැමිණෙන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : (හසුන්) පිළිගණී නම් විමසා නම් පෙරළා ගෙණ ඒ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, පිළිගණී නම් විමසා නම් පෙරළා නො ගෙණේ නම් ථුල්ලැසි ඇවත් වෙයි, පිළිගණී නම් නො විමසා නම් පෙරළා නො ගෙණේ නම් දුකුළා ඇවැත් වේ. . . .

6. තමා ඉල්ලා ගත් උපකරණයෙන් කුටියක් කරවන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : කරවා ද පියෝහි දුකුළා ඇවැත් වෙයි, එක් මැටි පිඬෙකින් නො නිමී කල්හි ථුල්ලැසි ඇවත් වෙයි, ඒ පිඩ ද තැබූ කල්හි සඟ වෙසෙස් ඇවැත් වේ.

7. (කරවා දෙන හිමියන් ඇති) මහත් විහාරයක් කරවන මහණ තුන් ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා ඇවැත් වෙයි, එක් පිඬෙකින්, නො නිමී කල්හි ථුල්ලැසි ඇවැත් වෙයි, එ පිඩ ද තැබූ කල්හි සඟවෙසෙස් ඇවැත් වේ.

8. මහණක්හට අමූලක වූ පරිජි ඇවැතින් චෝදනා කරණ මහණ තුන් ඇවැතකට පැමිණෙයි : අවසර නො ගෙණ සස්නෙන් නෙරණ අදහස් ඇති ව කියා නම් සඟ වෙසෙස් ඇවැත සමග දුකුළා ඇවැත වෙයි, අවසර ගෙණ ආක්‍රොශ කිරීමේ අදහස් ඇති ව කියා නම් ගටා බිණීම පිළිබඳ (ඔමසවාද) පචිති ඇවැත් වේ.

9. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති: අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති. ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස, ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

10 සඞ්ඝභෙදකො භික්ඛු යාවතතියං සමනුභාසියමානො[1] නප්පටිනිස්සජ්ජන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචා පරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

11. භෙදකානුවත්තකා භික්ඛු යාවතතියං සමනුභාසියමානා නප්පටිනිස්සජ්ජන්තා තිස්සො ආපත්තියො ආපජ්ජන්ති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

12. දුබ්බචො භික්ඛු යාවතතියං සමනුභාසියමානො නප්පටිනිස්සජ්ජන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

13. කුලදූසකො භික්ඛු යාවතතියං සමනුභාසියමානො නප්පටිනිස්සජ්ජන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

තෙරස සඞ්ඝාදිසෙසා නිට්ඨිතා.

---

## 2·4

## නිස්සග්ගිය කණ්ඩො

### 4·1

1. අතිරෙකචීවරං දසාහං අතික්කාමෙන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

2. එකරත්තං තිචීවරෙන විප්පවසන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

3. අකාලචීවරං පටිග්ගහෙත්වා මාසං අතික්කාමෙන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

4. අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ධොවාපෙති, පයොගෙ දුක්කටං, ධොවාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

5. අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගණ්හාති, පයොගෙ දුක්කටං. ගහිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

---

1. සමනුභාසියමානා - ස්‍යා, සමනුභාසනාය - සී. මු.

9. අනාභාග වූ අධිකරණයක්හුගේ කිසියම් ලේශ මාත්‍රයක් ගෙණ උපසපනක්හට පරිජි ඇවතින් චෝදනා කරණ මහණ තුන් ඇවැතකට පැමිණෙයි : අවසර නො ගෙණ සස්තෙන් තෙරණ අදහස් ඇති ව කියා නම් සඟ වෙසෙස සමග දුකුළා ඇවැත් වෙයි, අවසර ගෙණ ආක්‍රොශ කරණ අදහස් ඇති ව කියා නම් ගවා බිණීම පිළිබඳ පචිති ඇවැත් වේ.

10. තුන් යළ තෙක් සමනුභාසනාකම් කරණු ලබන සඞසභේදක මහණ ඒ වරද නො හරතේ නම් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි, කම්මවාචා දෙකෙකින් ථුල්ලැසි දෙකෙක් වෙයි, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

11. තුන් යළ තෙක් සමනුභාසනාකම් කරණු ලබන භේදානුවත්තක මහණහු ඒ වරද නො හරනාහු නම් තුන් ඇවැතකට පැමිණෙති : ඤත්තියෙහි දුකුළා වෙයි, කම්වදන් දෙකෙකින් ථුල්ලැසි දෙකෙක් වෙයි, කම් වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

12. තුන් යළ තෙක් සමනුභාසනාකම් කරණු ලබන නො කීකරු මහණ ඒ වරද නො හරතේ නම් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි, කම් වදන් දෙකෙකින් ථුල්ලැසි දෙකෙක් වෙයි, කම් වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

13. තුන් යළ තෙක් සමනුභාසනාකම් කරණු ලබන කුලදූසක මහණ ඒ වරද නො හරතේ නම් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි. කම් වදන් දෙකෙකින් ථුල්ලැසි දෙකෙක් වෙයි, කම්වදන් පිරියතැ සඟ වෙසෙස් ඇවැත් වේ.

තෙළෙස් සඟවෙසෙස් නිමි.

---

# 2.4

## නිස්සග්ගිය කාණ්ඩය

### 4.1

1. (නො ඉවු නො විකැපූ) අතිරෙක චීවරයක් දස දිනක් ඉක්මවන මහණ එක් නිසගි පචිති ඇවතකට පැමිණේ.

2. එක් රැයක් තුන් සිවුරෙන් වෙන් වැ වසන මහණ එක් නිසගි පචිති ඇවැතකට පැමිණේ.

3. අයල් සිවුරක් පිළිගෙණ මසක් ඉක්මවන මහණ එක් නිසගිපචිති ඇවැතකට පැමිණේ.

4. නො නෑ මෙහෙණක ලවා පැරැණි සිවුරක් ධොවන කර වන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ධොවන කරවා නම් පියෝහි දුකුළා වෙයි, ධොවන කරවා නිමි කල්හි නිසගි පචිති වේ.

5. නො නෑ මෙහෙණක අතින් සිවුරක් පිළිගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණී නම් පියෝහි දුකුළා වෙයි, ගත් කල්හි නිසගි පචිති වේ.

6. අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං, විඤ්ඤාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

7. අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා තතුත්තරිං චීවරං විඤ්ඤාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං, විඤ්ඤාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

8. පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකං ගහපතිකං උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විකප්පං ආපජ්ජති පයොගෙ දුක්කටං. විකප්පං ආපන්නෙ නිස්සග්ගියං පාචිත්තියං.

9 පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකෙ ගහපතිකෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විකප්පං ආපජ්ජති පයොගෙ දුක්කටං, විකප්පං ආපන්නෙ නිස්සග්ගියං පාචිත්තියං.

10. අතිරෙකතික්ඛත්තුං චොදනාය අතිරෙකඡක්ඛත්තුං ඨානෙන චීවරං අභිනිප්ඵාදෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අභිනිප්ඵාදෙති පයොගෙ දුක්කටං, අභිනිප්ඵාදිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

කඨිනවග්ගො පඨමො.

---

## 4.2

1. කොසියමිස්සකං සන්ථතං කාරපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරපෙති පයොගෙ දුක්කටං, කාරපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

2. සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

3. අනාදියිත්වා තුලං ඔදාතානං තුලං ගොචරියානං නවං සන්ථතං කාරපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරපෙති පයොගෙ දුක්කටං, කාරපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

4. අනුවස්සං සන්ථතං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරපෙති පයොගෙ දුක්කටං, කාරපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

5. අනාදියිත්වා පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

6 එළකලොමානි පටිග්ගහෙත්වා තියොජනං අතික්කාමෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පඨමං පාදං තියොජනං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති නිස්සග්ගියං පාචිත්තියං.

7. අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ධොවාපෙති පයොගෙ දුක්කටං, ධොවාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

6. නො නෑ ගැහැවියකුගෙන් හෝ ගැහැවිනියකගෙන් හෝ සිවුරක් ඉල්ලා ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවා ගත්කල්හි නිසඟි පචිති වේ.

7. නො නෑ ගැහැවියකුගෙන් හෝ ගැහැවිනියකගෙන් හෝ ඉන් වැඩි සිවුරක් විනවා ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවා ගත් කල්හි නිසඟි පචිති වේ.

8. පෙරැ නො පවරණ ලද මහණ නො නෑ ගැහැවියකු වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණෙන්නේ දෙ ඇවතකට පැමිණෙයි : අධික විධානයට පැමිණේ නම් පියෝහි දුකුළා වෙයි, අධික විධානයට පැමිණි කල්හි නිසඟි පචිති වේ.

9. පෙරැ නො පවරණ ලද මහණ නො නෑ ගැහැවියන් වෙත එළඹ සිවුරෙහි අධික විධානයට පැමිණෙන්නේ දෙ ඇවැතකට පැමිණෙයි : අධික විධානයට පැමිණේ නම් පියෝහි දුකුළා වෙයි, අධික විධානයට පැමිණි කල්හි නිසඟි පචිති වේ.

10. තෙවරකින් වැඩි චෝදනාවෙන් ද සවරකින් වැඩි උදෙසා සිටීමෙන් ද සිවුරක් නිපදවා ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : නිපදවා නම් පියෝහි දුකුළා වෙයි, නිපදවා ගත් කල්හි නිසඟි පචිති වේ.

පළමුවන කඨින වර්ග යි.

---

## 4.2

1. තිහිරි හූ මුසු ඇතිරියක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, කරවූ කල්හි නිසඟිපචිති වේ.

2. සුදු කළු එළුලොමින් ඇතිරියක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, කරවූ කල්හි නිසඟි පචිති වේ.

3. හෙල එළුලොම කොටසක් ද කිඹුල්වන් එළුලොම කොටසක් ද නො ගෙණ අලුත් ඇතිරියක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, කරවූ කල්හි නිසඟි පචිති වේ.

4. වසක් පාසා ඇතිරියක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, කරවූ කල්හි නිසඟි පචිති වේ.

5. පැරැණි ඇතිරියක අවටින් සුගත් වියතක් පමණ කැන් නොගෙණ අලුත් නිසදුන් ඇතිරියක් කරවන මහණ දෙඇවැතකට පැමිණෙයි : කරවානම් පියෝහි දුකුළා වෙයි, කරවූ කල්හි නිසඟි පචිති වේ.

6. එළුලොම් පිළිගෙණ තුන් යොදුනක් ඉක්මවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පළමු පිය තුන්යොදුන ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවන පිය ඉක්මවා නම් නිසඟි පචිති වේ.

7. නො නෑ මෙහෙණක ලවා එළුලොම් ධෝවන කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ධෝවන කරවා නම් පියෝහි දුකුළා වෙයි. දෙවූ කල්හි නිසඟිපචිති වේ.

8. රූපියං පටිග්ගණ්හන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගණ්හාති පයොගෙ දුක්කටං, ගහිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

9. නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: සමාපජ්ජති පයොගෙ දුක්කටං, සමාපන්නෙ නිස්සග්ගියං පාචිත්තියං,

10. නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: සමාපජ්ජති පයොගෙ දුක්කටං, සමාපන්නෙ නිස්සග්ගියං පාචිත්තියං.

කොසියවග්ගො දුතියො.

---

4·3

1. අතිරෙකපත්තං දසාහං අතික්කාමෙන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

8. ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: චෙතාපෙති පයොගෙ දුක්කටං, චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

3 භෙසජ්ජානි පටිග්ගහෙත්වා සත්තාහං අතික්කාමෙන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

4 අතිරෙකමාසෙ සෙසෙ ගිම්හානෙ වස්සිකසාටිකචීවරං පරියෙසන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පරියෙසති පයොගෙ දුක්කටං. පරියිට්ඨෙ නිස්සග්ගියං පාචිත්තියං.

5. භික්ඛුස්ස සාමං චීවරං දත්වා කුපිතො අනත්තමනො අච්ඡින්දන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අච්ඡින්දති පයොගෙ දුක්කටං, අච්ඡින්නෙ නිස්සග්ගියං පාචිත්තියං.

6. සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: වායාපෙති පයොගෙ දුක්කටං, වායාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

7. පුබ්බෙ අප්පවාරිතො අඤ්ඤාතකස්ස ගහපතිස්ස තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විකප්පං ආපජ්ජති පයොගෙ දුක්කටං, විකප්පං ආපන්නෙ නිස්සග්ගියං පාචිත්තියං.

8. අච්චෙකචීවරං පටිග්ගහෙත්වා චීවරකාලසමයං අතික්කාමෙන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

9. තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපිත්වා අතිරෙකඡාරත්තං විප්පවසන්තො එකං ආපත්තිං ආපජ්ජති නිස්සග්ගියං පාචිත්තියං.

10. ජානං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පරිණාමෙති පයොගෙ දුක්කටං, පරිණාමිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

පත්තවග්ගො තතියො.

---

තිංස නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා.

8. රන් රිදී මසු කහවණු පිළිගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණී නම් පියෝ්හි දුකුළා වෙයි, ගත් කල්හි නිසඟිපචිති වේ.

9. නන් වැදැරුම් කැපවතින් මිළ මුදල් පෙරළි කොට ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පෙරළි කෙරේ නම් පියෝ්හි දුකුළා වෙයි, පෙරළි කළ කල්හි නිසඟි පචිති වේ.

10. නන් වදැරුම් ගණු දෙනු කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණු දෙනු කෙරේ නම් පියෝ්හි දුකුළා වෙයි, ගණු දෙනු කළ කල්හි නිසඟි පචිති වේ.

දෙවන කෝසිය වර්ග යි.

---

4.3

1. (නො ඉටු නො විකැප්) අතිරේක පාත්‍රයක් දසදිනක් ඉක්මවන මහණ එක් නිසඟි පචිති ඇවැතකට පැමිණේ.

2. උනුපස්බාන් පාත්‍රයකින් යුත් මහණ අනික් අළුත් පාත්‍රයක් විනවා ගන්නේ නම් දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝ්හි දුකුළා වෙයි, විනවා ගත් කල්හි නිසඟි පචිති වේ.

3. බෙහෙත් පිළිගෙණ සත් දිනක් ඉක්මවන මහණ එක් නිසඟි පචිති ඇවැතකට පැමිණේ.

4. අතිරේක මාසයක් ශේෂ ව සිටි ගිම්හානයෙහි වැසිසළු සිවුර සොයන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : සොයා නම් පියෝ්හි දුකුළා වෙයි, සොයා නිමි කල්හි නිසඟි පචිති වේ.

5. මහණක්හට තෙමේ ම සිවුරක් දී කිපියේ නො සතුටුසිත් ඇත්තේ අසිද ගන්නා මහණ දෙ ඇවතකට පැමිණෙයි : අසිද ගණී නම් පියෝ්හි දුකුළා වෙයි, අසිද ගත් කල්හි නිසඟි පචිති වේ.

6. තෙමේ හූ විනවා පෙහෙරුන් ලවා සිවුරක් වියවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : වියවා නම් පියෝ්හි දුකුළා වෙයි, වියවූ කල්හි නිසඟි පචිති වේ.

7. පෙහෙරුන් වෙත එළඹ නො නැ ගැහැවියකුගේ සිවුරෙහි අධික විධානයට පැමිණෙන පෙර නො පවරණ ලද මහණ දෙ ඇවැතකට පැමිණෙයි : අධික විධානයට පැමිණේ නම් පියෝ්හි දුකුළා වෙයි, අධික විධානයට පැමිණී කල්හි නිසඟි පචිති වේ.

8. ඉක්මන් සිවුරක් පිළිගෙණ චීවරකාලසමය ඉක්මවන මහණ එක් නිසඟි පචිති ඇවැතකට පැමිණේ.

9. තුන් සිවුරු අතුරෙන් එක්තරා සිවුරක් ඇතුළුගමැ තබා අයිරා සරයක් ඉන් වෙන් වැ වසන මහණ එක් නිසඟි පචිති ඇවැතකට පැමිණේ.

10. සඟනට පිරිණමන ලද සඟසතු චීවරාදී ලාභයක් දන දන තමහට නතුකර ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පිරිණමවා නම් පියෝ්හි දුකුළා වෙයි, පිරිණැමවූ කල්හි නිසඟි පචිති වේ.

තෙ වන පත්තවර්ග යි.

---

තිස් නිසඟි පචිති නිමි.

## 2.5

## පාචිත්තිය කණ්ඩො

### 5.1

1. සම්පජානමුසාවාදං භාසන්තො කති ආපත්තියො ආපජ්ජති, සම්පජානමුසාවාදං භාසන්තො පඤ්ච ආපත්තියො ආපජ්ජති : පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. 'යො තෙ විහාරෙ වසති' සො භික්ඛු අරහා'ති භණති, පටිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. නපටිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස. සම්පජානමුසාවාදෙ පාචිත්තියං, සම්පජානමුසාවාදං භාසන්තො ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

2. ඔමසන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : උපසම්පන්නං ඔමසති ආපත්ති පාචිත්තියස්ස, අනුපසම්පන්නං ඔමසති ආපත්ති දුක්කටස්ස.

3. පෙසුඤ්ඤං උපසංහරන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති පාචිත්තියස්ස, අනුපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති දුක්කටස්ස.

4. අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : වාචෙති පයොගෙ දුක්කටං, පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස.

5. අනුපසම්පන්නෙන උත්තරිං ද්විරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : නිපජ්ජති පයොගෙ දුක්කටං, නිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

6. මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : නිපජ්ජති පයොගෙ දුක්කටං, නිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

7. මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : දෙසෙති. පයොගෙ දුක්කටං, පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස.

8 අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං භූතං ආරොචෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ආරොචෙති. පයොගෙ දුක්කටං, ආරොචිතෙ ආපත්ති පාචිත්තියස්ස.

9. භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ආරොචෙති පයොගෙ දුක්කටං, ආරොචිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. පඨවිං ඛණන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ඛණති පයොගෙ දුක්කටං, පහාරෙ පහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

මුසාවාදවග්ගො පඨමො.

# 2.5
## පාචිත්තිය කාණ්ඩය
### 5.1

1. දන දන මුසවා කියන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : දන දන මුසවා කියන මහණ පස් ඇවැතකට පැමිණෙයි : ලාමක අදහස් ඇති වැ එයින් මඩනා ලදු වැ තමා කෙරෙහි අවිද්‍යමාන වූ, නො වූ උතුරු මිනිස්දම් තමා වෙත ඇතැයි ප්‍රකාශ කෙරේ නම් පරිජි ඇවැත් වෙයි, මුල් නැති පරිජි ඇවැතකින් මහණක්හට චෝදනා කෙරේ නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි, " යම් මහණෙක් තොපගේ විහාරයෙහි වෙසේ ද, " ඒ මහණ රහත්ය" යි දනුමැතියක්හට කියා නම් ථුලැසි ඇවැත් වෙයි, නො දනුමැතියක්හට කියා නම් දුකුළා ඇවැත් වෙයි. දන දන මුසවා කීමෙහි පචිති ඇවැත් වේ. දන දන මුසවා කියන මහණ මේ පස් ඇවැතට පැමිණේ.

2. (ජාත්‍යාදියෙන්) ගටා බණින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : උපසපනක්හට ගටා බෙණේ නම් පචිති ඇවැත් වෙයි, අනුපසපනක්හට ගටා බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

3. පෙහෙසුන් බස් එළවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : උපසපනක්හට පෙහෙසුන් බස් එළවා නම් පචිති ඇවැත් වෙයි, අනුපසපනක්හට පෙහෙසුන්බස් එළවා නම් දුකුළා ඇවැත් වේ.

4. අනුපසපනක්හට පදසොධම් කියන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කියවා නම් පියෝහි දුකුළා වෙයි, පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වේ.

5. අනුපසපනක්හු හා දෙතුන් රැයකින් මත්තෙහි එක් සෙනස්නෙහි හොවින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හොවි නම් පියෝහි දුකුළා වෙයි, හොත්කල්හි පචිති ඇවැත් වේ.

6. මාගමක හා එක් සෙනස්නෙහි හොවින මහණ දෙ ඇවැතකට පැමිණෙයි. හොවි නම් පියෝහි දුකුළා වෙයි. හොත් කල්හි පචිති ඇවැත් වේ.

7. මාගමක්හට සපස් පෙදෙකින් මත්තෙහි දහම් දෙසන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : දෙසා නම් පියෝහි දුකුළා වෙයි, පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වේ.

8. අනුපසපනක්හට තමා තුළ ඇති උතුරු මිනිස්දම් ආරොචන කරණ මහණ තෙමේ දෙ ඇවැතකට පැමිණෙයි : ආරොචන කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, ආරොචන කළ කල්හි පචිති ඇවැත් වේ.

9. මහණක්හුගේ තුළුල් ඇවැතක් අනුපසපනක්හට ආරොචන කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ආරොචන කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, ආරොචන කළ කල්හි පචිති ඇවැත් වේ.

10. පොළොව කණින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කණි නම් පියෝහි දුකුළා වෙයි, පහරෙහි පහරෙහි පචිති ඇවැත් වේ.

පළමුවන මුසාවාද වර්ග යි.

## 5.2

1. භූතගාමං පාතෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පාතෙති පයොගෙ දුක්කටං, පහාරෙ පහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

2. අඤ්ඤෙනඤ්ඤං පටිචරන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අනාරොපිතෙ අඤ්ඤවාදකෙ අඤ්ඤෙනඤ්ඤං පටිචරති ආපත්ති දුක්කටස්ස, ආරොපිතෙ අඤ්ඤවාදකෙ අඤ්ඤෙනඤ්ඤං පටිචරති ආපත්ති පාචිත්තියස්ස.

3. භික්ඛුං උජ්ඣාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: උජ්ඣාපෙති පයොගෙ දුක්කටං, උජ්ඣාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

4. සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පඨමං පාදං ලෙඩ්ඩුපාතං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

5. සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා අනුද්ධරිත්වා අනාපුච්ඡා පක්කමන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පඨමං පාදං පරික්ඛෙපං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

6. සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිපජ්ජති පයොගෙ දුක්කටං, නිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

7. භික්ඛුං කුපිතො අනත්තමනො සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නික්කඩ්ඪති පයොගෙ දුක්කටං, නික්කඩ්ඪිතෙ ආපත්ති පාචිත්තියස්ස.

8. සඞ්ඝිකෙ විහාරෙ උපරිවෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අභිනිසීදති පයොගෙ දුක්කටං, අභිනිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

9. ද්වත්තිපරියායෙ අධිට්ඨහිත්වා තතුත්තරිං[1] අධිට්ඨහන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අධිට්ඨාති පයොගෙ දුක්කටං, අධිට්ඨිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: සිඤ්චති පයොගෙ දුක්කටං, සිඤ්චිතෙ ආපත්ති පාචිත්තියස්ස.

භූතගාමවග්ගො දුතියො.

---

## 5.3

1. අසම්මතො භික්ඛුනියො ඔවදන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඔවදති පයොගෙ දුක්කටං, ඔවදිතෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. තතුත්තරි – මජසං.

## 5.2

1. රුක්ලිය කලකුරුවන මහණ දෙඇවැතකට පැමිණෙයි : කලකුරුවා නම් පියෝහි දුකුළා වෙයි, පහරෙහි පහරෙහි පචිති ඇවැත් වේ.

2. අන්‍යවචනයකින් අන්‍යවචනයක් වසන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : අන්‍යවාදක කර්මය ආරෝපණය නො කළ කල්හි අනෙකකින් අනෙකක් වසා නම් දුකුළා වෙයි, අන්‍යවාදක කර්මය ආරෝපණය කළ කල්හි අනෙකකින් අනෙකක් වසා නම් පචිත් ඇවැත් වේ.

3. මහණක්හු හෙළා දක්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හෙළා දක්නේ නම් පියෝහි දුකුළා වෙයි, හෙළා දුටු කල්හි පචිති ඇවැත් වේ.

4. සඟසතු ඇඳක් හෝ පුටුවක් හෝ බිස්සක් හෝ බදවෙළුමක් හෝ එලිමහනෙහි අතුට නඟා නො තබා නො පිළිවිස බැහැර යන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පළමු පිය කැටක් හෙළන තැන ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

5. සඟසතු වෙහෙරෙහි අස්නක් අතුට නඟා නො තබා නො පිළිවිස බැහැර යන මහණ දෙඇවැතකට පැමිණෙයි : පළමු පිය පිරිවෙන් ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

6. සඟසතු වෙහෙරෙහි දැන දැන පළමු එළඹී මහණක්හු වෙතට එළඹ ශයනය කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හොවී නම් පියෝහි දුකුළා වෙයි, හොත් කල්හි පචිති ඇවැත් වේ.

7. කිපියේ නොසියමන් වැ සඟසතු වෙහෙරින් මහණක්හු නෙරපන සිත් ඇති මහණ දෙ ඇවැතකට පැමිණෙයි : නෙරපා නම් පියෝහි දුකුළා වෙයි, නෙරපූ කල්හි පචිති ඇවැත් වේ.

8. සඟසතු වෙහෙරෙහි අහස් කිළියෙහි වියල් වීද සිළු ගත්වා කළ පා ඇති ඇඳක හෝ පුටුවක හෝ හිඳින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හිඳිනම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

9. පිරිවෙන් සෙවෙනි දෙකක් තුණක් විධාන කොට ඉන් වැඩියක් විධාන කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : විධාන කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, විධාන කළ කල්හි පචිති ඇවැත් වේ.

10. දැන දැන පණුවන් සහිත දිය තණට හෝ මැටියට හෝ ඉසින මහණ දෙ ඇවැත කට පැමිණෙයි : ඉසී නම් පියෝහි දුකුළා වෙයි, ඉසි කල්හි පචිති ඇවැත් වේ.

දෙවන භූතගාම වර්ග යි.

---

## 5.3

1. මෙහෙණන්හට ඔවා දෙන සම්මතය නො ලද මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ඔවා දේ නම් දුකුළා වෙයි, ඔවා දුන් කල්හි පචිති ඇවැත් වේ.

2. අත්ථඞ්ගතෙ සුරියෙ භික්ඛුනියො ඔවදන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඔවදති පයොගෙ දුක්කටං, ඔවදිතෙ ආපත්ති පාචිත්තියස්ස.

3. භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඔවදති පයොගෙ දුක්කටං, ඔවදිතෙ ආපත්ති පාචිත්තියස්ස.

4. ආමිසහෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති භණන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භණති පයොගෙ දුක්කටං, භණිතෙ ආපත්ති පාචිත්තියස්ස.

5. අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: දෙති පයොගෙ දුක්කටං, දින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

6. අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: සිබ්බති පයොගෙ දුක්කටං; ආරපථෙ ආරපථෙ ආපත්ති පාචිත්තියස්ස.

7. භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පටිපජ්ජති පයොගෙ දුක්කටං, පටිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

8. භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරූහන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අභිරූහති පයොගෙ දුක්කටං, අභිරූළ්හෙ ආපත්ති පාචිත්තියස්ස.

9. ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

10. භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිසීදති පයොගෙ දුක්කටං, නිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

ඔවාදවග්ගො තතියො.

---

## 5.4

1. තතුත්තරිං[1] ආවසථපිණ්ඩං භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

2. ගණභොජනං භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. තතුත්තරි - මජසං.

2. හිර අවරට ගියකල්හි මෙහෙණන්හට ඔවාදෙන මහණ දෙ ඇවතකට පැමිණෙයි : ඔවා දේ නම් පියෝ්හි දුකුළා වෙයි, ඔවා දුන් කල්හි පචිති ඇවැත් වේ.

3. මෙහෙණවරට එළඹ මෙහෙණන්හට ඔවා දෙන මහණ දෙ ඇවතකට පැමිණෙයි : ඔවා දේ නම් පියෝ්හි දුකුළා වෙයි, ඔවා දුන් කල්හි පචිති ඇවැත් වේ.

4. " භික්ෂූහු ආමිෂ හේතු කොට මෙහෙණන්හට ඔවා දෙති " යි කියන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කියා නම් පියෝ්හි දුකුළා වෙයි, කී කල්හි පචිති ඇවැත් වේ.

5. නො නෑ මෙහෙණකට සිවුරක් දෙන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : දේ නම් පියෝ්හි දුකුළා වෙයි, දුන් කල්හි පචිති ඇවැත් වේ.

6. නො නෑ මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගෙත්තම් කෙරේ නම් පියෝ්හි දුකුළා වෙයි, හිදියෙහි හිදියෙහි පචිති ඇවැත් වේ.

7. මෙහෙණක හා ගිවිස ගෙණ එක් අදන් මඟකට පිළිපන් මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පිළිපදී නම් පියෝ්හි දුකුළා වෙයි, පිළිපන් කල්හි පචිති ඇවැත් වේ.

8. මෙහෙණක හා ගිවිස ගෙණ එක් නැවකට නඟින මහණ දෙ ඇවතකට පැමිණෙයි : නඟී නම් පියෝ්හි දුකුළා වෙයි, නැඟි කල්හි පචිති ඇවැත් වේ.

9. මෙහෙණක නිපද වූ අහරක් දැන දැන වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " බුදින්නෙමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

10. එකලා මෙහෙණක හා රහස්හි හිදීම කරණ එකලා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හිදී නම් පියෝ්හි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

තෙවන ඔවාද වර්ග යි.

---

## 5.4

1. එයට (දිනකට) වඩා මගී ආදීන් සඳහා සකස් කළ ආවසථ පිණ්ඩය වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " බුදින්නෙමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

2 ගණ බොජුන් වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " බුදින්නෙමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

3. පරම්පරභොජනං භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

4. ද්වත්තිපත්තපූරෙ පූවෙ පටිග්ගහෙත්වා තතුත්තරිං පටිග්ගණ්හන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගණ්හාති පයොගෙ දුක්කටං, ගහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

5. භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති[1] පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

6. භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: තස්ස වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, භොජනපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

7. විකාලෙ ඛාදනීයං වා භොජනීයා වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

8 සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

9. පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

10 අදින්නං මුඛද්වාරං ආහාරං ආහරන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

භොජනවග්ගො චතුත්ථො.

---

5·5

1. අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: දෙති පයොගෙ දුක්කටං, දින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

2. භික්ඛුං 'එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා'ති, තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: උය්‍යොජෙති පයොගෙ දුක්කටං, උය්‍යොජිතෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. භුඤ්ජිස්සාමීති - මජසං.

3. පරම්පරභොජනය වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : "බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

4. දෙතුන් පයක් පුරා පූ පිළිගෙණ ඊට වඩා පිළිගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පිළිගණී නම් පියෝහි දුකුළා වෙයි, පිළිගත් කල්හි පචිති ඇවැත් වේ.

5. වළඳා නිමවූ පැවරූ මහණ අයිරිත් නො කළ කෑ යුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ වළඳන්නේ නම් දෙ ඇවැතකට පැමිණෙයි : "කන්නෙමි" යි "බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

6. වළඳා නිමවූ පැවරූ මහණක්හු අයිරිත් නො කළ කැයුතු දයින් හෝ බිදිය යුතු දයින් හෝ එළවා පවරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ඔහුගේ වචනයෙන් "කන්නෙමි, බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, බොජුන් පිරියතැ පචිති ඇවැත් වේ.

7. විකාලයෙහි කෑ යුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ වළඳන මහණ දෙ ඇවැත කට පැමිණෙයි : "කන්නෙමි" "බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

8. පිළිගෙණ එකරැයකුදු තබන ලද කෑ යුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : "කන්නෙමි, බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

9. පිණී බොජුන් තමා පිණිස විනවා වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි. "බුදින්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

10. නුදුන් අහරක් මුවදොරට එළවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : "බුදින් නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

සිවුවැනි භෝජන වර්ග යි.

---

## 5.5

1. නග්න. තවුසකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට හෝ කෑ යුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ සියතින් දෙන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : දේ නම් පියෝහි දුකුළා වෙයි, දුන් කල්හි පචිති ඇවැත් වේ.

2. මහණක්හට "ඇවත, එනු මැනව, ගමකට හෝ නියම්ගමකට හෝ පිඩු පිණිස පිවිසෙන්නෙමු" කියා ඒ මහණහට (යම් කිසි අහරක්) දෙවා හෝ නො දෙවා හෝ නහා යවන මහණ දෙ ඇවතකට පැමිණෙයි : නහා යවා නම් පියෝහි දුකුළා වෙයි, නහා යැවූ කල්හි පචිති ඇවැත් වේ.

11—සී817881 (7/75)

3. සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිසීදති පයොගෙ දුක්කටං. නිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

4. මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිසීදති පයොගෙ දුක්කටං, නිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

5. මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිසීදති පයොගෙ දුක්කටං, නිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

6. නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං වා පච්ඡාභත්තං වා සන්තං භික්ඛුං අනාපුච්ඡා කුලෙසු චාරිත්තං[1] ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පඨමං පාදං උපචාරං[2] අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති, ආපත්ති පාචිත්තියස්ස.

7. තතුත්තරිං භෙසජ්ජං විඤ්ඤාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං, විඤ්ඤාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

8. උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගච්ඡති ආපත්ති දුක්කටස්ස, යත්ථ ඨිතො පස්සති ආපත්ති පාචිත්තියස්ස.

9 අතිරෙකතිරත්තං සෙනාය වසන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: වසති පයොගෙ දුක්කටං, වසිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. උය්‍යොධිකං ගච්ඡන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගච්ඡති ආපත්ති දුක්කටස්ස, යත්ථ ඨිතො පස්සති ආපත්ති පාචිත්තියස්ස.

අචෙලකවග්ගො පඤ්චමො.

---

## 5.6

1. මජ්ජං පිවන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පිවිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

2. භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: හාසෙති පයොගෙ දුක්කටං, හාසිතෙ[3] ආපත්ති පාචිත්තියස්ස.

3. උදකෙ කීළන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: හෙට්ඨා ගොප්ඵකෙ උදකෙ කීළති ආපත්ති දුක්කටස්ස, උපරි ගොප්ඵකෙ කීළති ආපත්ති පාචිත්තියස්ස.

---

1. පුරෙභත්තං පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං - ම ඡ.සං.
2. උච්චාරං - මජසං.
3. සමනුභාසියමානො. ස්‍යා.

Free Distribution www.aathaapi.org

3. මෛථුන්දම්රායෙන් යුත් පුම්තිරි දෙදෙනෙකුන් ඇති යහන් ගෙයි වැදහිඳින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හිඳී නම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

4. මාගමක හා රහස්හි පිළිසත් අස්නෙකැ හිඳිනා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හිඳී නම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

5. එකලා වූයේ එකලා වූ මාගමක හා රහස්හි හිඳිනා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : හිඳී නම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

6. නිමන්ත්‍රණ ලද බත් ඇති වැ පෙරවරු හෝ පස්වරු හෝ අරමවැසි මහණක්හු නො පිළිවිසැ කුලයන්හි හැසිරීමට පැමිණෙන මහණ දෙ ඇවතකට පැමිණෙයි : පළමු පිය උපචාර ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

7. එයට (පවරණ ලද පමණට) වඩා බෙහෙත් විනවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවූ කල්හි පචිති ඇවැත් වේ.

8. සටනට නිකුත් (සිවුරඟ) සෙනඟ දක්මට යන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : යේ නම් දුකුළා ඇවැත් වෙයි, යම් තැනෙක සිටියේ දකී නම් පචිති ඇවැත් වේ.

9. අයිරා තෙරයක් සේනාවෙහි වසන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : වෙසේ නම් පියෝහි දුකුළා වෙයි, විසූ කල්හි පචිති ඇවැත් වේ.

10. යුදබිමට යන මහණ දෙ ඇවතකට පැමිණෙයි : යේ නම් දුකුළා ඇවැත් වෙයි, යම් තැනෙක සිටියේ දකී නම් පචිති ඇවැත් වේ.

පස්වැනි අචේලක වර්ග යි.

---

## 5.6

1. රහමෙර බොන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " බොන්නෙමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

2. ගිරිනි කැවීමෙන් මහණක්හු සිනහ ගන්වන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : සිනා ගන්වා නම් පියෝහි දුකුළා වෙයි, සිනා ගැන්වූ කල්හි පචිති ඇවැත් වේ.

3. දිය කෙළනා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගොප් ඇටයෙන් යට ජලයෙහි ක්‍රීඩා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ගොප් ඇටයෙන් මතු ජලයෙහි ක්‍රීඩා කෙරේ නම් පචිති ඇවැත් වේ.

4 අනාදරියං කරොන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : කරොති පයොගෙ දුක්කටං, කතෙ ආපත්ති පාචිත්තියස්ස.

5. භික්ඛුං භිංසාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : භිංසාපෙති පයොගෙ දුක්කටං, භිංසාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

6. ජොතිං සමාදහිත්වා විසිබ්බෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : සමාදහති පයොගෙ දුක්කටං, සමාදහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

7. ඔරෙනද්ධමාසං නහායන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : නහායති පයොගෙ දුක්කටං, නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

8. අනාදියිත්වා තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පරිභුඤ්ජති පයොගෙ දුක්කටං, පරිභුත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

9. භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං[1] පරිභුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පරිභුඤ්ජති පයොගෙ දුක්කටං, පරිභුත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

10. භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : අපනිධෙති පයොගෙ දුක්කටං, අපනිධෙ[2] ආපත්ති පාචිත්තියස්ස.

සුරාමෙරයවග්ගො ඡට්ඨො.

---

## 5.7

1. සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙන්තො කති ආපත්තියො ආපජ්ජති : සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙන්තො චතස්සො ආපත්තියො ආපජ්ජති : අනොදිස්ස ඔපාතං ඛණති 'යො කොචි පපතිත්වා මරිස්සතී'ති ආපත්ති දුක්කටස්ස. මනුස්සො තස්මිං පපතිත්වා මරති, ආපත්ති පාරාජිකස්ස. යක්ඛො වා පෙතො වා තිරච්ඡානගතමනුස්සවිග්ගහො වා තස්මිං පපතිත්වා මරති, ආපත්ති ථුල්ලච්චයස්ස. තිරච්ඡානගතො තස්මිං පපතිත්වා මරති, ආපත්ති පාචිත්තියස්ස. සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙන්තො ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

2. ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පරිභුඤ්ජති පයොගෙ දුක්කටං, පරිභුත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

3. ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : උක්කොටෙති පයොගෙ දුක්කටං, උක්කොටිතෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. අපච්චුද්ධාරණං - මජසං. 2. අපනිහිතෙ - මජසං.

Free Distribution www.aathaapi.org

4. (සිකපදයෙන් ඔවාදෙන පුඟුලාට හෝ දහමට) අනාදර කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : අනාදර කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, අනාදර කළ කල්හි පචිති ඇවැත් වේ.

5. මහණක්හු බියගන්වන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : බිය ගන්වා නම් පියෝහි දුකුළා වෙයි, බිය ගැන්වූ කල්හි පචිති ඇවැත් වේ.

6. ගිනි දල්වා තප්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : දල්වා නම් පියෝහි දුකුළා වෙයි, දල්වූ කල්හි පචිති ඇවැත් වේ.

7. අඩමසෙකින් මොබ ස්නාන කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ස්නාන කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, ස්නාන අවසන්හි පචිති ඇවැත් වේ.

8. තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරින් එක්තරා දුර්වර්ණ කිරීමක් නො ගෙණ නව සිවුරක් පරිභෝග කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පරිභෝග කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, පරිභෝග කළ කල්හි පචිති ඇවැත් වේ.

9. මහණක්හට හෝ මෙහෙණකට හෝ හික්මෙණුවකට හෝ හෙරණකුට හෝ හෙරණියකට හෝ තෙමේ සිවුරක් දී නො පසුදුරුවා වළඳ කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : වළඳ කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, වළඳ කළ කල්හි පචිති ඇවැත් වේ.

10. මහණක්හුගේ පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ හිදිගුලාවක් හෝ කාබානක් හෝ සඟවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : සඟවා නම් පියෝහි දුකුළා වෙයි, සැඟවූ කල්හි පචිති ඇවැත් වේ.

සවැනි සුරාමෙරය වර්ග යි.

---

## 5.7

1. දන දන සතක්හු දිවියෙන් තොරකරණ මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : දන දන සතක්හු දිවියෙන් තොරකරණ මහණ සිවු ඇවැතකට පැමිණෙයි : "එකකු නො උදෙසා යම් මැ එකෙක් වැටී මැරෙත්තේ මැනැවැ" යයි වළක් කණී නම් දුකුළා ඇවැත්වෙයි, මිනිසෙක් එහි වැටී මැරේ නම් පරිපි ඇවැත් වෙයි, යකෙක් හෝ ප්‍රෙතයෙක් හෝ තිරිසන් ගිය මිනිස් සිරුරු ඇත්තෙක් හෝ එහි වැටී මැරේ නම් ථුලැසි ඇවැත් වෙයි, තිරිසන් ගතයෙක් එහි වැටී මැරේ නම් පචිති ඇවැත් වේ. දන දන සතක්හු දිවියෙන් තොරකරණ මහණ මේ සිවු ඇවැතට පැමිණේ.

2. දන දන පණුවන් සහිත පැන් වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : වළඳා නම් පියෝහි දුකුළා වෙයි, වැළඳූ කල්හි පචිති ඇවැත් වේ.

3. දැහැමින් සන්සිඳුවන ලද අධිකරණයක් දන දන නැවැත විනිස පිණිස උගුළුවන (මතු කරණ) මහණ දෙ ඇවැතකට පැමිණෙයි : උගුළුවා නම් පියෝහි දුකුළා වෙයි, ඉගුළු කල්හි පචිති ඇවැත් වේ.

4. භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙන්තො එකං ආපත්තිං ආපජ්ජති: පාචිත්තියං.

5. ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: උපසම්පාදෙති පයොගෙ දුක්කටං, උපසම්පාදිතෙ ආපත්ති පාචිත්තියස්ස.

6. ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පටිපජ්ජති පයොගෙ දුක්කටං, පටිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

7. මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පටිපජ්ජති පයොගෙ දුක්කටං, පටිපන්නෙ ආපත්ති පාචිත්තියස්ස.

8. පාපිකාය දිට්ඨියා යාවතතියං සමනුභාසියමානො[1] නප්පටිනිස්සජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, කම්මවාචාපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

9. ජානං තථාවාදිනා භික්ඛුනා අකතානුධම්මෙන[2] තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: සම්භුඤ්ජති පයොගෙ දුක්කටං, සම්භුත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

10. ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: උපලාපෙති පයොගෙ දුක්කටං, උපලාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

සප්පාණකවග්ගො සත්තමො.

---

## 5·8

1. භික්ඛූහි සහධම්මිකං වුච්චමානො 'න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි, යාව න අඤ්ඤං භික්ඛුං වියත්තං විනයධරං පටිපුච්ඡිස්සාමී'ති භණන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භණති පයොගෙ දුක්කටං, භණිතෙ ආපත්ති පාචිත්තියස්ස.

2. විනයං විවණ්ණෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: විවණ්ණෙති පයොගෙ දුක්කටං, විවණ්ණිතෙ ආපත්ති පාචිත්තියස්ස.

3. මොහෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: අනාරොපිතෙ මොහෙ මොහෙති ආපත්ති දුක්කටස්ස, ආරොපිතෙ මොහෙ මොහෙති ආපත්ති පාචිත්තියස්ස.

4. භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: පහරති පයොගෙ දුක්කටං, පහරිතෙ[3] ආපත්ති පාචිත්තියස්ස.

---

1. සමනුභාසනාය - ම.ඡ.සං.
2. අකටානුධම්මෙන - ම.ඡ.සං.
3. පහතෙ - ම.ඡ.සං.

4. මහණක්හුගේ තුළුල් ඇවැතක් දැන දැන සඟවන මහණ එක් ඇවැතකට පැමිණෙයි : පචිති ඇවත යි.

5. දැන දැන උනුවිසිවස් ඇති පුඟුලක්හු උපසපන් කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : උපසපන් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, උපසපන් කළ කල්හි පචිති ඇවැත් වේ.

6. දැන දැන සොරසත්වාමුළක් සමග ගිවිස ගෙණ එක් අදන් මඟකට පිළිපන් මහණ දෙ ඇවැතකට පැමිණෙයි : මඟට බසී නම් පියෝහි දුකුළා වෙයි, මඟට බට කල්හි පචිති ඇවැත් වේ.

7. මාගමක හා ගිවිස ගෙණ එක් අදන්මගකට පිළිපන් මහණ දෙ ඇවැතකට පැමිණෙයි : මඟට බසී නම් පියෝහි දුකුළා වෙයි, මඟට බට කල්හි පචිති ඇවැත් වේ.

8. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණු ලබන මහණ ලාමක දෘෂ්ටිය නො හරිනුයේ දෙ ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි. කම්වදන් පිරියතැ පචිති ඇවැත් වේ.

9. " අන්තරායකර " යයි බුදුරදුන් වදාළ දහම " අන්තරායකර නො වේ " යයි කියන, නො කළ ඔසාරණ කම් ඇති, ඒ දෘෂ්ටිය නො හළ මහණක්හු සමග දැන දැන ධර්මාමිෂ සම්භොග කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : සම්භොග කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, සම්භොග කළ කල්හි පචිති ඇවැත් වේ.

10. එසේ නෙරණ ලද හෙරණ දැන දැන ආමිෂයෙන් උපලාලන කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : සඞ්ග්‍රහ කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, සඞ්ග්‍රහ කළ කල්හි පචිති ඇවැත් වේ.

සත්වැනි සප්පාණක වර්ග යි.

---

## 5.8

1. භික්ෂූන් විසින් කරුණු සහිත වැ (සිකපදයෙන්) කියනු ලබන්නේ " ඇවැත ව්‍යක්ත විනයධර අන් මහණක්හු යම්තාක් නො විචාරම් ද ඒ තාක් මම මෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමි " යි කියන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : බෙණේ නම් පියෝහි දුකුළා වෙයි. කීනු කල්හි පචිති ඇවැත් වේ.

2. විනය සිකපදයනට අවමන් කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : අවමන් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි. අවමන් කළ කල්හි පචිති ඇවැත් වේ.

3. මුළා කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : මොහාරෝපණය නොකළ කල්හි මුළා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. මොහාරෝපණය කළ කල්හි මුළා කෙරේ නම් පචිති ඇවැත් වේ.

4. මහණ කිපියේ නො සියමන් ව මහණක්හට පහර දෙන්නේ දෙ ඇවැතකට පැමිණෙයි : පහර දේ නම් පියෝහි දුකුළා වෙයි. පහර දුන් කල්හි පචිති ඇවැත් වේ.

5. භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : උග්ගිරති පයොගෙ දුක්කටං, උග්ගිරිතෙ ආපත්ති පාචිත්තියස්ස.

6. භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : අනුද්ධංසෙති පයොගෙ දුක්කටං, අනුද්ධංසිතෙ ආපත්ති පාචිත්තියස්ස.

7. භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : උපදහති පයොගෙ දුක්කටං, උපදහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

8. භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : සොස්සාමීති ගච්ඡති ආපත්ති දුක්කටස්ස, යත්ථ ඨිතො සුණාති ආපත්ති පාචිත්තියස්ස.

9. ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ඛීයති පයොගෙ දුක්කටං, ඛීයිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පරිසාය හත්ථපාසං විජහන්තස්ස ආපත්ති දුක්කටස්ස, විජහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

11. සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ඛීයති පයොගෙ දුක්කටං, ඛීයිතෙ ආපත්ති පාචිත්තියස්ස.

12. ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පරිණාමෙති පයොගෙ දුක්කටං, පරිණාමිතෙ ආපත්ති පාචිත්තියස්ස.

සහධම්මිකවග්ගො අට්ඨමො.

---

## 5.9

1. පුබ්බෙ අප්පටිසංවිදිතො රඤ්ඤො අන්තෙපුරං පවිසන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පඨමං පාදං උම්මාරං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

2. රතනං උග්ගණ්හන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : ගණ්හාති පයොගෙ දුක්කටං, ගහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

3. සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : පඨමං පාදං පරික්ඛෙපං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස, දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

5. මහණ කිපියේ නො සියමත් ව මහණක්හට අතුල්තල නඟා දක්වන්නේ දෙ ඇවැතකට පැමිණෙයි : අතුල් තල නඟා දක්වා නම් පියෝහි දුකුළා වෙයි. නඟා දක්වූ කල්හි පචිති ඇවැත් වේ.

6. අමූලක සඟ වෙසෙසින් මහණක්හට චෝදනා කරණ මහණ දෙ ඇවැතකට පැමිණෙයි : චෝදනා කෙරේ නම් පියෝහි දුකුළා වෙයි. චෝදනා කළ කල්හි පචිති ඇවැත් වේ.

7. දැන දැන මහණක්හට කුකුස් උපදවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කුකුස් උපදවා නම් පියෝහි දුකුළා වෙයි. ඉපද වූ කල්හි පචිති ඇවැත් වේ.

8. උපන් ඩබර ඇති උපන් කලහ ඇති විවාදයට පැමිණි මහණුන් ගේ බස් ඇසෙන තැන සිටින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : "අසන්නෙමි" යි යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනක සිටියේ අසා නම් පචිති ඇවැත් වේ.

9. ධාර්මික කර්මයන්ට ඡන්දය දී පසුව ගුණ කැණ බණන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : දෙස් පහළ කෙරේ නම් පියෝහි දුකුළා වෙයි. දෙස් පහළ කළ කල්හි පචිති ඇවැත් වේ.

10. සඟ මැද විනිශ්චය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟී බැහැර යන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පිරිස්හි අත්පස හරනා හට දුකුළා ඇවැත් වෙයි. හළ කල්හි පචිති ඇවැත් වේ.

11. සමගි සඞසයා විසින් සිවුරක් දී පසුව දෙස් පහළ කරණුයේ දෙ ඇවැතකට පැමිණේ : දෙස් පහළ කෙරේ නම් පියෝහි දුකුළා වෙයි. දෙස් පහළ කළ කල්හි පචිති ඇවැත් වේ.

12. දැන දැන සඟසතු, සඟනට පිරිනැමූ වස්තුවක් පුද්ගලයක්හට පිරිනමන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පිරිනමා නම් පියෝහි දුකුළා වෙයි. පිරිනැමූ කල්හි පචිති ඇවැත් වේ.

අටවැනි සහධම්මික වර්ග යි.

---

## 5.9

1. පළමු නො දන්වන ලදු වැ රජුගේ ඇතොවුරට පිවිසෙන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පළමු පිය එළිපත ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි. දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

2. රුවනක් නඟා තබා දෙනු පිණිස ගන්නා මහණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණී නම් පියෝහි දුකුළා වෙයි. ගත්කල්හි පචිති ඇවැත් වේ.

3. දෙලොස් රියන් අත්පස සිටි මහණහු නො පිළිවිස විකාලයෙහි ගම වදින මහණ දෙ ඇවැතකට පැමිණෙයි : පළමු පිය පිරිකෙව ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි. දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

4 අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස

5. පමාණාතික්කන්තං මඤ්චං වා පීඨං වා කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

6. මඤ්චං වා, පීඨං වා තූලොනද්ධං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

7 පමාණාතික්කන්තං නිසීදනං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

8. පමාණාතික්කන්තං කණ්ඩුපටිච්ඡාදිං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

9. පමාණාතික්කන්තං වස්සිකසාටිකං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10, සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙන්තො කති ආපත්තියො ආපජ්ජති: සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං, කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස. සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙන්තො ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

රාජවග්ගො නවමො.

---

ද්වෙ නවුති පාචිත්තියං නිට්ඨිතං.

---

## 2·6
## පාටිදෙසනීයකණ්ඩො

1. අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො කති ආපත්තියො ආපජ්ජති: අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස. අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

4. ඇටමුවා හෝ දළමුවා හෝ අංමුවා හෝ හිදි ගුලාවක් කරවන මහණ දෙ ඇවැත කට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

5. පමණ ඉක්මවූ ඇඳක් හෝ පුටුවක් හෝ කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

6. පුළුන් එවූ ඇඳක් හෝ පුටුවක් හෝ කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

7. පමණ ඉක්මවූ නිසිදනයක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

8. පමණ ඉක්මවූ කණ්පිළිසනක් කරවන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

9. පමිණ ඉක්ම වූ වැසි සළුවක් කරවන මහණ දෙඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ.

10. සුගත්සිවුර පමණ සිවුරක් කරවන මහණ කොතෙක් ඇවැතට පැමිණේ ද යත් : සුගත්සිවුර පමණ සිවුරක් කරවන මහණ දෙඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි. කරවූ කල්හි පචිති ඇවැත් වේ. සුගත්සිවුර පමණ සිවුරක් කරවන මහණ මේ දෙ ඇවැතට පැමිණේ.

නව වැනි රාජවර්ග යි.

---

දෙ අනූ පචිති නිමි.

---

## 2.6

## පාටිදෙසනියකාණ්ඩය

1. ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ සියතින් පිළිගෙණ වළඳන මහණ කොතෙක් ඇවැතට පැමිණේ ද යත් : ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ සියතින් පිළිගෙණ වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " වළඳින්නෙමි " යි පිළිගණි නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පාටිදෙසනීය ඇවැත් වේ. ඇතුළු ගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ සියතින් පිළිගෙණ වළඳන මහණ මේ දෙ ඇවැතට පැමිණේ.

2. භික්ඛුනියා වොසාසන්තියා න නිවාරෙත්වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

3. සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

4 ආරඤ්ඤකෙසු සෙනාසනෙසු පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො කති ආපත්තියො ආපජ්ජති: ආරඤ්ඤකෙසු සෙනාසනෙසු පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස. ආරඤ්ඤකෙසු සෙනාසනෙසු පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තො ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

චතුත්ථං පාටිදෙසනීයං නිට්ඨිතං.

---

## 2.7

## සෙඛියා

### 7.1

1. අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො නිවාසෙන්තො කති ආපත්තියො ආපජ්ජති: අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො නිවාසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං. අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො නිවාසෙන්තො ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

2. අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො පාරුපන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං.

3 අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං.

4. අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං.

5. අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තො අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං.

6. අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තො අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං.

Free Distribution www.aathaapi.org

2. මෙහෙණක විධාන කරණ කල්හි ඇය නො වළක්වා වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " වළඳමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත්වෙයි. පරහලායෙහි පරහලායෙහි පාටිදේසනීය ඇවැත් වේ.

3. සේඛසම්මතය ලත් කුලයන්හි කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ සියතින් පිළිගෙණ වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " වළඳමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පාටිදෙසනීය ඇවැත් වේ.

4. වන සෙනසුන්හි පෙර නොදන්වනලදු වැ කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ අරම තුළ දී සියතින් පිළිගෙණ වළඳන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : වන සෙනසුන්හි පෙර නො දන්වන ලදු වැ කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ අරමතුළ දී සියතින් පිළිගෙණ වළඳන මහණ දෙ ඇවැතකට පැමිණෙයි : " වළඳමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පාටිදේසනීය ඇවැත් වේ. වන සෙනසුන්හි පෙර නො දන්වන ලදු වැ කැයුතු දෙයක් හෝ බිදියයුතු දෙයක් හෝ අරම තුළ දී සියතින් පිළිගෙණ වළඳන මහණ මේ දෙ ඇවැතට පැමිණේ.

සතර පාටිදේසනීය නිමි.

---

## 2.7

## සේඛියාකාණ්ඩය

### 7.1

1. අනාදර පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් හඳනා මහණ කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : අනාදර පිණිස ඉදිරිපසින් හෝ පසු පසින් හෝ එල්වමින් හඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවැතට යි. අනාදර පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් හදින මහණ මේ එක් ඇවැතට පැමිණේ.

2. අනාදර පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් පොරවන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස කය විවෘත කොට ඇතුළුගම වදින මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස කය විවෘත කොට ඇතුළුගම හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස අත හෝ පය හෝ කෙළවමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස අත හෝ පය හෝ කෙළවමින් ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවැතට යි.

7. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච උක්ඛිත්තකාය අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං

පරිමණ්ඩලවග්ගො පඨමො.

---

7.2

1. අනාදරියං පටිච්ච උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3 අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තො අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තො අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5. අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6 අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

7 අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8. අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

උජ්ජග්ඝිකවග්ගො දුතියො.

---

7. අනාදර පිණිස තැනැ තැනැ බලමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස තැනැ තැනැ බලමින් ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස (එක් පසෙකින් හෝ දෙපසින් හෝ) නඟනා ලද සිවුරු ඇති වැ ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස (එක් පසෙකින් හෝ දෙපසින් හෝ) නඟනා ලද සිවුරු ඇති වැ ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

පළමුවැනි පරිමණ්ඩල වර්ග යි.

---

## 7.2

1. අනාදර පිණිස මහසිනාවෙන් යුතු වැ ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස මහසිනාවෙන් යුතු වැ ඇතුළුගමැ හිඳිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවැතට යි.

4. අනාදර පිණිස උස්හඬ මහහඬ නඟමින් ඇතුළුගමැ හිඳිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස කය සලමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස කය සලමින් ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

7. අනාදර පිණිස බොඩ (උරහිස) සලමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස බොඩ සලමින් ඇතුළුගම හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස හිස සලමින් ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස හිස සලමින් ඇතුළුගමැ හිඳිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

දෙවැනි උජ්ජග්ඝික වර්ග යි.

---

## 7.3

1. අනාදරියං පටිච්ච ඛම්භකතො අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච ඛම්භකතො අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5 අනාදරියං පටිච්ච උක්කුටිකාය අන්තරඝරෙ ගච්ඡන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6. අනාදරියං පටිච්ච පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

7. අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං පටිග්ගණ්හන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8 අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො පිණ්ඩපාතං පටිග්ගණ්හන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං පටිග්ගණ්හන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච ථූපීකතං පිණ්ඩපාතං පටිග්ගණ්හන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

ඛම්භකතවග්ගො තතියො.

---

## 7.4

1. අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො පිණ්ඩපාතං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3. අනාදරියං පටිච්ච තහං තහං ඔමසිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5. අනාදරියං පටිච්ච ථූපකතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6. අනාදරියං පටිච්ච සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

## 7.3

1. අනාදර පිණිස උකුළෙහි තබනලද අත් ඇති වැ ඇතුළුගම වදිනා මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස උකුළෙහි තබනලද අත් ඇති වැ ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස හිස වසා පෙරවැ ඇතුළුගම වදිනා මහණ එක් ඇවතකට පැමිණෙයි: දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස හිස වසා පෙරවැ ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස අක් පත්ලෙන් හෝ විලුඹින් හෝ ඇතුළුගම වදිනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස අකවටු ගත්වා ඇතුළුගමැ හිඳුනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

7. අනාදර පිණිස නො සකස් වැ පිඩුවා පිළිගන්නා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස තැනැ තැනැ බලමින් පිඩු පිළිගන්නා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස සූපය ම බෙහෙවින් පිළිගන්නා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස මුදුන් කළ පිඩුවා පිළිගන්නා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

තෙවැනි ඛම්භකත වර්ග යි.

---

## 7.4

1. අනාදර පිණිස නො සකස් වැ පිඩුවා වළඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස තැනැ තැනැ බලමින් පිඩුවා වළඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස තැනැ තැනැ හනා පිඩුවා වළඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස සූපය ම බෙහෙවින් වළඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස බත මුදුනෙන් මැඩ පිඩුවා වළඳනා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස සූපය හෝ ව්‍යඤ්ජනය හෝ බතින් වසනා මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

12—ශ 8 17881 (7/76)

7. අනාදරියං පටිච්ච සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8. අනාදරියං පටිච්ච උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලො-කෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච මහන්තං කබලං කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං

10. අනාදරියං පටිච්ච දීඝං ආලොපං කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

පිණ්ඩපාතවග්ගො චතුත්ථො.

---

7.5

1. අනාදරියං පටිච්ච අනාහටෙ කබලෙ මුඛද්වාරං විවරන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3. අනාදරියං පටිච්ච සකබලෙන මුඛෙන බ්‍යාහරන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5. අනාදරියං පටිච්ච කබලාවච්ඡෙදකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6. අනාදරියං පටිච්ච අවගණ්ඩකාරකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

7. අනාදරියං පටිච්ච හත්ථනිද්ධූනකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8. අනාදරියං පටිච්ච සිත්ථාවකාරකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච ජිව්හානිච්ඡාරකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච චපුචපුකාරකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

කබලවග්ගො පඤ්චමො.

---

Free Distribution www.aathaapi.org

7. අනාදර පිණිස සූපය හෝ බත හෝ නො ගිලත් වැ තමා උදෙසා විනවා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස කිපිසිත් ඇති වැ අනුන්ගේ පාත්‍රය බලන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස (මොනර බිජුවට සා) මහත් කොට පිඩු කරණ මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස දිගු කොට පිඩු කරණ මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

සිවුවැනි පිණ්ඩපාත වර්ග යි.

---

## 7.5

1. අනාදර පිණිස පිඩු මුවදෙරට නො එළවූ කල්හි මුව විවර කරණ මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස අත හැම (ඇඟිලි) මියෙහි බහමින් වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස පිඩු සහිත මුවෙන් කථා කරණ මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස පිඩු මියෙහි නගනගා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස පිඩු කඩ කඩා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස කොපුලැ පිඩු රැස් කොට වළඳන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

7. අනාදර පිණිස අත සල සලා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස හුලු විසුරුවා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස දිව තෙර තෙරා වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස " චපු චපු " යන හඩ නගමින් වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

පස්වැනි කබල වර්ග යි.

---

## 7.6

1. අනාදරියං පටිච්ච සුරුසුරුකාරකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච හත්ථනිල්ලෙහකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3. අනාදරියං පටිච්ච පත්තනිල්ලෙහකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5. අනාදරියං පටිච්ච සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගණ්හන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6. අනාදරියං පටිච්ච සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

7. අනාදරියං පටිච්ච ඡත්තපාණිස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

8. අනාදරියං පටිච්ච දණ්ඩපාණිස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9 අනාදරියං පටිච්ච සත්ථපාණිස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච ආවුධපාණිස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

සුරුසුරුවග්ගො ඡට්ඨො.

---

## 7.7

1. අනාදරියං පටිච්ච පාදුකාරූළ්හස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

2. අනාදරියං පටිච්ච උපාහනාරූළ්හස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

3. අනාදරියං පටිච්ච යානගතස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

4. අනාදරියං පටිච්ච සයනගතස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

5. අනාදරියං පටිච්ච පල්ලත්ථිකාය නිසින්නස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

6. අනාදරියං පටිච්ච වෙඨිතසීසස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං

## 7.6

1. අනාදර පිණිස "සුරු සුරු" යන හඩ නගමින් වළඳන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස අත ලොවමින් වළඳන මහණ එක් ඇවැතකට පැමිණෙයි: දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස (එක් ඇඟිල්ලකිනුදු) පාත්‍රය ලොවමින් වළඳන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස තොල් ලොවමින් වළඳන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස ඉඳුල් සහිත අතින් පැන් මලාව පිළිගන්නා මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස හුලු සහිත පාත්‍ර දෙවී දිය ඇතුළුගමැ හෙළන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

7. අනාදර පිණිස සත්ගත් අත් ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස දඬුගත් අත් ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස කඩු ඇ සැත්ගත් අත් ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස (දුනු ඇ) අවි ගත් අත් ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

සවැනි සුරුසුරු වර්ග යි.

---

## 7.7

1. අනාදර පිණිස පය ලූ මිරිවැඩි ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

2. අනාදර පිණිස පය ලූ වහන් ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

3. අනාදර පිණිස යානයෙහි හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

4. අනාදර පිණිස යහන්හි හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

5. අනාදර පිණිස අකවටු අවුලුවා හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

6. අනාදර පිණිස වෙළන ලද හිස ඇත්තහුට දහම් දෙසන මහණ එක් ඇවතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

7. අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතසීසස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං

8. අනාදරියං පටිච්ච ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

9. අනාදරියං පටිච්ච නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

10. අනාදරියං පටිච්ච ඨිතො නිසින්නස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං

11. අනාදරියං පටිච්ච පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

12. අනාදරියං පටිච්ච උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

13. අනාදරියං පටිච්ච ඨිතො උච්චාරං වා පස්සාවං වා කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

14. අනාදරියං පටිච්ච හරිතෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං.

15. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො කති ආපත්තියො ආපජ්ජති : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : දුක්කටං. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

පාදුකාවග්ගො සත්තමො.

සෙඛියා නිට්ඨිතා.

---

කතාපත්තිවාරෙ නිට්ඨිතො දුතියො.

7. අනාදර පිණිස හිස වසා පෙරවියහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

8. අනාදර පිණිස බිමැ හිඳ අසුනෙහි හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

9. අනාදර පිණිස මිටි අස්නෙකැ හිඳ උස් අසුනෙකැ හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

10. අනාදර පිණිස නැඟී සිටිමින් හුන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

11. අනාදර පිණිස පසුව යමින් පෙරටුව යන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

12. අනාදර පිණිස නොමඟින් යමින් මඟින් යන්නහුට දහම් දෙසන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

13. අනාදර පිණිස සිටිමින් මල කිස හෝ මූ කිස හෝ කරණ මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

14. අනාදර පිණිස තෘණයෙන් නිල් වූ පෙදෙසෙහි මල කිස හෝ මූ කිස හෝ කරණ කෙළ හෝ හෙළන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි.

15. අනාදර පිණිස පරිභෝග ජලයෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන මහණ කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : අනාදර පිණිස පරිභොග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන මහණ එක් ඇවැතකට පැමිණෙයි : දුකුළා ඇවතට යි. අනාදර පිණිස පරිභොග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන මහණ මේ එක් ඇවතට පැමිණේ.

සත්වැනි පාදුකා වර්ග යි.

සේඛියා නිමි.

---

දෙවැනි කථාපත්තිවාරය නිමි.

---

## 3. විපත්තිවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති : මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති : සියා සීලවිපත්ති, සියා ආචාරවිපත්ති--පෙ--.

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති චතුන්නං විපත්තීනං කති විපත්තියො භජති : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජති : ආචාරවිපත්තිං.

**විපත්තිවාරෙ නිට්ඨිතො තතියො.**

---

## 4. සඞ්ගහිතවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං තීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන-පෙ-.

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති සත්තන්නං ආපත්තික්ඛන්ධානං එකෙන ආපත්තික්ඛන්ධෙන සඞ්ගහිතා : දුක්කටාපත්තික්ඛන්ධෙන.

**සඞ්ගහිතවාරෙ නිට්ඨිතො චතුත්ථො.**

---



Free Distribution www.aathaapi.org

# 3. විපත්තිවාරය

1. මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්ති භජනය කෙරේ ද යත් : මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සිවුවැදෑරුම් විපත්ති අතුරෙන් විපත් දෙකක් භජනය කෙරෙයි : ශීල විපත්ති ද විය හෙයි. ආචාර විපත්ති ද විය හේ. . . .

2. අනාදර පිණිස පරිභෝග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සිවුවැදෑරුම් විපත්ති අතුරෙන් කෙතෙක් විපත්ති භජනය කෙරේ ද යත් : අනාදර පිණිස පරිභොග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් එක් විපත්තියක් භජනය කෙරෙයි : ආචාර විපත්ති යි.

තෙවැනි විපත්තිවාරය නිමි.

---

# 4. සඞගහිතවාරය

1. මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලද ද යත් : මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සප්තාපත්ති ස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්ති ස්කන්ධයෙන් ද, කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි තුන් ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලදය. . . .

2. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවත සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලද ද යත් : අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් දුෂ්කෘතාපත්තිස්කන්ධ නම් වූ එක්ම ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලදී.

සිවුවන සඞගහිතවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

## 5. සමුට්ඨානවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො, ජන්නං ආපත්ති සමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති : මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො ජන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති[1] කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති ජන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති ජන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති : න වාචතො.

සමුට්ඨානවාරෙ නිට්ඨිතො පඤ්චමො.

---

## 6. අධිකරණවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං අධිකරණානං කතමං අධිකරණං : මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං-පෙ-.

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති චතුන්නං අධිකරණානං කතමං අධිකරණං : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං.

අධිකරණවාරෙ නිට්ඨිතො ඡට්ඨො.

---

1. සමුට්ඨන්ති - ම.ඡ.සං.



Free Distribution www.aathaapi.org

# 5. සමුට්ඨානවාරය

1. මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟිති, කයින් ද සිතින් ද නඟිති, වචනයෙන් නො නඟිත්. . . .

2. අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සැවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි. කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

පස්වන සමුට්ඨානවාරය නිමි.

---

# 6. අධිකරණවාරය

1. මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද යත් : මෙවුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත් සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. . . .

2. අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද යත් : අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි.

සවන අධිකරණවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

# 7. සමථවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති: මෙථුනං ධම්මං පටිසෙවන්තස්ස ආපත්තියො සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච-පෙ-.

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තස්ස ආපත්ති සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මති: සියා සම්මුඛාවිනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

සමථවාරො නිට්ඨිතො සත්තමො.

---



Free Distribution www.aathaapi.org

# 7. සමථවාරය

1. මෛථුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත්හු සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : මෛථුන්දම් සේවනය කරන්නහු පිළිබඳ ඇවැත්හු සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛා විනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්. . . .

2. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මු හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මු හෝ කෙළ හෝ හෙළන්නහු පිළිබඳ ඇවැත කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැ යි තුන් ශමථයෙන් සන්හිඳේ.

සත්වන සමථවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

# 8. සමුච්චයවාරො

1 මෙථුනං ධම්මං පටිසෙවන්තො කති ආපත්තියො ආපජ්ජති: මෙථුනං ධම්මං පටිසෙවන්තො තිස්සො ආපත්තියො ආපජ්ජති: අක්ඛයිතෙ[1] සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති පාරාජිකස්ස. යෙභුය්‍යෙන ඛයිතෙ[2] සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති ථුල්ලච්චයස්ස. වත්තකතෙ[3] මුඛෙ අච්ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙති, ආපත්ති දුක්කටස්ස. මෙථුනං ධම්මං පටිසෙවන්තො ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං තීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං; සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති. සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙ-න ච තිණවත්ථාරකෙන ච -පෙ-.

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො කති ආපත්තියො ආපජ්ජති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොන්තො ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

සා ආපත්ති චතුන්නං විපත්තීනං කති විපත්තියො භජති: සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: චතුන්නං අධිකර-ණානං කතමං අධිකරණං: සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මති: සා ආපත්ති චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජති:

---

1. අක්ඛායිතෙ - මජසං  2. ඛායිතෙ - මජසං
3. වට්ටකතෙ - මජසං



Free Distribution www.aathaapi.org

# 8. සමුච්චයවාරය

1. මෙවුන්දම් සේවනය කරණ මහණ කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : මෙවුන්දම් සේවනය කරණ මහණ තුන් ඇවැතකට පැමිණේ. ක්ෂය නොවූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සේවනය කෙරේ නම් පරිජි ඇවැත් වෙයි, බෙහෙවින් ක්ෂය වූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සේවනය කෙරේ නම් ථුලැසි ඇවැත් වෙයි, අභාළ මියෙහි රහසඟ නො පහරමින් පිවිස්වා නම් දුකුළා ඇවැත් වේ. මෙවුන්දම් සේවනය කරණ මහණ මේ තුන් ඇවැතට පැමිණේ.

ඒ ඇවැත් සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජේ ද යත් : සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද ද, සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් :

ඒ ඇවැත් සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසි විටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙයි. සත් වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්ති ස්කන්ධයෙන් ද කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි තුන් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද ය. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙ කින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. සිවු වැදෑරුම් අධිකරණ යන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද, තිණ වත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳේ. . . .

2. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූත්‍ර හෝ කෙළ හෝ හෙළන මහණ කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන මහණ එක් දුකුළා ඇවැතකට පැමිණේ. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ හෙළන මහණ එක් ඇවැතට පැමිණේ.

ඒ ඇවැත සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජේ ද, සත් වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද, සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද, සත් වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : ඒ ඇවැත සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් ආචාරවිපත්ති නම් වූ එක් ම විපත්තිය බෙජේ. සත් වැදෑරුම්



Free Distribution www.aathaapi.org

ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං එකෙන ආපත්තික්ඛන්ධෙන සඞ්ගහිතා, දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

**සමුච්චයවාරෙ නිට්ඨිතො අට්ඨමො.**

---

**ඉමෙ අට්ඨවාරා සජ්ඣායමග්ගෙන[1] ලිඛිතා.**

තස්සුද්දානං:

කත්ථ පඤ්ඤත්ති කති ච විපත්ති සඞ්ගහෙන ච,
සමුට්ඨානාධිකරණා සමථො සමුච්චයෙන චාති.

---

1. සජ්ඣාය මග්ගො - ම ඡ සං.

Free Distribution www.aathaapi.org

ආපත්තිස්කන්ධයන් අතුරෙන් දුෂ්කෘතාපත්තිස්කන්ධ නම් වූ එක්ම ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නැඟී. කයින් ද සිතින් ද නැඟියි, වචනයෙන් නො නැඟී. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත් වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳේ.

අටවැනි සමුච්චයවාරය නිමි.

---

මේ අෂ්ටවාරයෝ සජ්ඣායනාමාර්ගයෙන් ලියන ලදහ.

එහි උද්දානය :

කත්ථපඤ්ඤත්තිවාරය ද කතිපඤ්ඤත්තිවාරය ද විපත්තිවාරය ද සඞ්ග්‍රහවාරය ද සමුට්ඨාන අධිකරණ වාරයෝ ද සමථවාරය ද සමුච්චයවාරය දැයි වාර අටෙකි.

13 ඕපී 17881 (7/75)

# 9. කත්ථපඤ්ඤත්තිවාරො

## 9.1

## පාරාජිකකණ්ඩං

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තං, කං ආරබ්භ, කිස්මිං වත්ථුස්මිං -පෙ- කෙනාභතන්ති.

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සුදින්නං කලන්දපුත්තං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : සුදින්නො කලන්දපුත්තො පුරාණදුතියිකාය මෙථුනං ධම්මං පටිසෙවි, තස්මිං වත්ථුස්මිං. අත්ථි තත්ථ පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති, ද්වෙ අනුපඤ්ඤත්තියො. අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි. සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති : සබ්බත්ථ පඤ්ඤත්ති. සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : සාධාරණ සඤ්ඤත්ති. එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : උභතො පඤ්ඤත්ති. පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති නිදානොගධං : නිදානපරියාපන්නං කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : දුතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති. චතුන්නං විපත්තීනං කතමා විපත්තීති : සීලවිපත්ති. සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති : පාරාජිකාපත්තික්ඛන්ධො. ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. -පෙ- කෙනාභතන්ති : පරම්පරාභතං :

"උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා
මොග්ගලිපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිව්හයෙ -පෙ-
එතෙ නාගා මහාපඤ්ඤා විනයඤ්ඤූ මග්ගකොවිදා
විනයං දීපෙ පකාසෙසුං පිටකං තම්බපණ්ණියා" ති.

2. යං තෙන භගවතා -පෙ- අදින්නං ආදියනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : රාජගහෙ පඤ්ඤත්තං. කං ආරබ්භාති : ධනියං කුම්භකාරපුත්තං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ධනියො කුම්භකාරපුත්තො රඤ්ඤො දාරූනි අදින්නානි[1] ආදියි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

---

1. අදින්නං - මඡසං.



Free Distribution www.aathaapi.org

# 9. කත්‍ථපඤ්ඤත්තිවාරය

## 9.1

## පාරාජික කාණ්ඩය

1. මෙවුන්දම් සෙවුනා නිසා වන පරිජිය සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කොතැන්හි පණවන ලද ද ? කවරක්හු ඇරැබ ද ? කිනම් වස්තුයෙක්හි ද ? . . . කවරක්හු විසින් ගෙණ එන ලද ද ?

මෙවුන්දම් සෙවුනා නිසා වන පරිජිය සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කොතැන්හි පණවන ලද ද යත් : විසල් පුරයෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : සුදින්න නම් කලන්දපුත්‍රයා ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : සුදින්න කලන්ද පුත්‍ර තෙමේ පැරණි (ගිහි කල) අඹුව සමග මෙවුන්දම් සේවන කෙළේය, ඒ වස්තුයෙහි යැ. එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති දෙකෙකි. අනුප්පන්නපඤ්ඤත්ති එහි නැත. සබ්බත්ථ පඤ්ඤත්ති වේ ද, පදෙසපඤ්ඤත්ති වේ ද යත් : සබ්බත්ථ පඤ්ඤත්ති යැ. සාධාරණපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති වේ ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යැ. සාධාරණපඤ්ඤත්ති වේ ද අසාධාරණපඤ්ඤත්ති වේ ද යත් : සාධාරණපඤ්ඤත්ති යැ. එකතො පඤ්ඤත්ති වේ ද උභතොපඤ්ඤත්ති වේ ද යත් : උභතොපඤ්ඤත්ති යැ. පස්වැදැරුම් පාමොක් උදෙසීම් අතුරෙන් කොහි පිහිටියේ වේ ද, කොහි ඇතුළත් වේ ද යත් : නිදනුද්දෙසයෙහි පිහිටියේ ය, නිදනුද්දෙසයෙහි ඇතුළත් ය. කිනම් උද්දෙසයකින් උදෙසීමට පැමිණේ ද යත් : දෙවන උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ. සිවු වැදැරුම් විපත්තීන් අතුරෙන් කවර විපත්තියෙක් වේ ද යත් : ශීලවිපත්ති යි. සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කවර ආපත්තිස්කන්ධයෙක් වේ ද යත් : පාරාජිකාපත්තිස්කන්ධ යි. සවැදැරම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : එක් සමුට්ඨාන යෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . . කවරක්හු විසින් ගෙණ එන ලද ද යත් : පරපුරෙන් ගෙණඑන ලදී.

උපාලි ස්ථවිර යැ, දසක ස්ථවිර යැ, සොණක ස්ථවිර යැ එසේ ම සිග්ගව ස්ථවිර යැ, මොග්ගලිපුත්තතිස්ස ස්ථවිර පස්වනු කොට ඇති මේ තෙරවරු දඹදිව විනයධර පරපුරෙහි වෙති. . . . මහා ප්‍රාඥ, විනය දන්නා මාර්ගඥනයෙහි දක්ෂ මේ ක්ෂීණාශ්‍රවයෝ විනය පිටකය හෙළදිවැ පැවසූහු.

2. නුදුන් දෙය සොර සිතින් ගැණීම් හේතුවෙන් වන පරිජිය ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කොතැන්හි පණවන ලද ද යත් : රජගහනුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ධනිය කුම්භකාර පුත්‍රයා ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ධනිය කුම්භකාර පුත්‍ර තෙමේ රජහු සතු නුදුන් දැව ගත්තේ ය. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

3. සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ අඤ්ඤමඤ්ඤං ජීවිතා වොරොපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : වෙසාලියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : වග්ගුමුදාතීරියෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : වග්ගුමුදාතීරියා භික්ඛූ ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

චත්තාරො පාරාජිකා නිට්ඨිතා.

---

## 9.2

## සඞ්ඝාදිසෙසකණ්ඩාදයො

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උපක්කමිත්වා අසුචිං මොචනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තො : කං ආරබ්භ : කිස්මිං වත්ථුස්මිං -පෙ- කෙනාභතන්ති :

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උපක්කමිත්වා අසුචිං මොචනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : ආයස්මන්තං සෙය්‍යසකං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා සෙය්‍යසකො උපක්කමිත්වා අසුචිං මොචෙසි, තස්මිං වත්ථුස්මිං. අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති, අනුප්පන්න පඤ්ඤත්ති තස්මිං නත්ථි, සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති : සබ්බත්ථ පඤ්ඤත්ති, සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : අසාධාරණ පඤ්ඤත්ති, එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : එකතො පඤ්ඤත්ති. පඤ්චන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං, කත්ථ පරියාපන්නන්ති : නිදානොගධං, නිදානපරියාපන්නං. කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : තතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති. චතුන්නං විපත්තීනං කතමා විපත්තීති : සීලවිපත්ති. සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති : සඞ්ඝාදිසෙසා පත්තික්ඛන්ධො ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති : එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ- කෙනාභතන්ති : පරම්පරාභතං :

3. දූත දූත මිනිස් සිරුරක් දිවියෙන් තොර කිරීම හෙතුයෙන් වන පරිජිය කොතැන්හි පණවන ලදද යත් : විසල් පුරයෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ භික්ෂූහු ඔවුනොවුන් දිවියෙන් තොර කළාහු ය, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

4. තමා කෙරෙහි නැති තමා කෙරෙහි නොවූ (ධ්‍යානාදි) උතුරුමිනිස්දම් තමා කෙරෙහි ඇතැයි පැවැසීම හේතුවෙන් වන පරිජිය කො තැන්හි පණවන ලද ද යත් : විසල් පුරයෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : වග්ගුමුදු ගංතෙර වැසි භික්ෂූන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : වග්ගුමුදු ගංතෙර වැසි භික්ෂූහු ගිහියනට ඔවුනොවුන්ගේ උතුරුමිනිස්දම් පිළිබඳ ගුණ කීහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයෙකින් නඟියි. . . .

සතර පරිජි නිමි.

---

# 9.2

## සඞ්ඝාදිශෙෂ කාණ්ඩාදිය

1. උපක්‍රම කොට සුකුරු මිදීම හේතුවෙන් වන සඟවෙසෙස සිකපද පැණවීමෙහි කල් දන්නාවූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කොතැන්හි පණවන ලද ද ? කවරක්හු ඇරැබ ද ? කවර වස්තුවෙක්හි ද, . . . කවරක්හු විසින් ගෙණඑන ලද ද ?

උපක්‍රම කොට සුකුරු මිදීම හේතුවෙන් වන සඟවෙසෙස සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් සෙය්‍යසක මහණහු ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් සෙය්‍යසක මහණ උපක්‍රම කොට සුකුරු මිදී ය, ඒ වස්තුයෙහි යැ. එහි පඤ්ඤත්ති එකෙකි, අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති. සබ්බත්ථ පඤ්ඤත්ති වේ ද, පදෙසපඤ්ඤත්තිවේ ද යත් : සබ්බත්ථ පඤ්ඤත්ති යැ. සාධාරණපඤ්ඤත්ති වේ ද, අසාධාරණපඤ්ඤත්ති වේ ද යත් : අසාධාරණපඤ්ඤත්ති යැ. එකතොපඤ්ඤත්ති වේ ද, උභතොපඤ්ඤත්ති වේ ද යත් : එකතොපඤ්ඤත්ති යැ. පස්වැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙන් කොහි පිහිටියේ ද කොහි ඇතුළත්වේ ද යත් : නිදානුද්දෙසයෙහි පිහිටියේ යැ, නිදානුද්දෙසයෙහි ඇතුළත් යැ. කවර උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද යත් : තෙ වැනි උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ. සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කවර විපත්තියෙක් වේ ද යත් : ශීලවිපත්ති යැ, සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කවර ආපත්තිස්කන්ධයෙක් වේ ද යත් : සඞ්ඝාදිශෙෂාපත්තිස්කන්ධ යි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : එක් සමුට්ඨාන යෙකින් නඟියි: කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . . කවරක්හු විසින් ගෙණ එන ලද ද යත් : පරපුරෙන් ගෙණ එන ලදී.

උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා,
මොග්ගලිපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිව්හයෙ-පෙ-
එතෙ නාගා මහාපඤ්ඤා විනයඤ්ඤූ මග්ගකොවිදා,
විනයං දීපෙ පකාසෙසුං පිටකං තම්බපණ්ණියාති

2. මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො-පෙ-

3. මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

4. මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං අභාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

5. සඤ්චරිත්තං සමාපජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ආයස්මන්තං උදායිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ආයස්මා උදායී සඤ්චරිත්තං සමාපජ්ජි, තස්මිං වත්ථුස්මිං එකා පඤ්ඤත්ති එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. සියා වාචතො සමුට්ඨාති, න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

6. සඤ්ඤාචිකාය කුටිං කාරාපනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: ආළවියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ආළවකෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ආළවකා භික්ඛූ සඤ්ඤාචිකාය කුටියො කාරාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

උපාලි ස්ථවිර යැ දසක ස්ථවිර යැ සොණක ස්ථවිර යැ එසේ ම සිග්ගව ස්ථවිර යැ මොග්ගලිපුත්ත ස්ථවිර පස්වනු කොට ඇති මේ තෙරවරු දඹදිව විනයධර පරපුරෙහි වෙති. . . . මහාප්‍රාඥ වූ විනය දන්නා මාර්ගඥනයෙහි දක්ෂ වූ මේ ක්ෂීණාශ්‍රවයෝ හෙළ දිවැ විනයපිටකය පැවසූහු.

2. මාගමක හා කාසසහයට සමවැදීම් හේතුයෙන් වන සඝවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී තෙරුන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී තෙරහු මාගමක හා කායසංසර්ගයට පැමිණියහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

3. මාගමකට තුළුල් තෙපුල් බිණීම් හේතුවෙන් වන සඝවෙසෙස කොතැන්හි පණවන ලදද යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී තෙරුන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී තෙරහු මාගමකට තුළුල් තෙපුල් බිණුහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසි විටෙක කයින් ද වචනයෙන් ද සිතින ද නඟී. . . .

4. මාගමක හමුවෙහි තමහට මෙවුන්දමින් මෙහෙකිරීම පිළිබඳ ගුණ වැණීම් හේතු යෙන් වන සඝවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී මහණහු ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී මහණ මාගමක හමුවෙහි තමහට මෙවුන්දමින් මෙහෙකිරීම පිළිබඳ ගුණ වැණී යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් තුන් සමුට්ඨානයෙකින් නඟී. . . .

5. (ස්ත්‍රී පුරුෂයන් ගේ කෙලෙස් පිළිබඳ හසුන් ගෙණ යනු එනුවට) හැසිරීම් හේතුයෙන් වන සඝවෙසෙස කොතන්හි පණවන ලද ද යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් උදයී තෙරුන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් උදයී තෙරහු ස්ත්‍රී පුරුෂයන් ගේ කෙලෙස් පිළිබඳ හසුන් ගෙණ යන ' සංචරිත්තයට ' පැමිණියහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් සමුට්ඨාන සයෙන් නඟියි : කිසි විටෙක කයින් නඟියි, වචනයෙන් ද සිතින් ද නො නඟී. කිසිවිටෙක වචනයෙන් නඟියි, කයින් ද සිතින් ද නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

6. තමා ඉල්වා ගත් උපකරණයෙන් කිළියක් කරවීම් හේතුවෙන් වන සඝවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : අළව් නුවරැදී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : අළව්පුර වැසි භික්ෂූන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : අළව් පුරවැසි භික්ෂූහු තමන් ඉල්වා ගත් උපකරණයෙන් කුටි කරවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම්ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී : . . .

7. මහල්ලකං විහාරකං කාරාපනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : කොසම්බියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : ආයස්මන්තං ඡන්නං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා ඡන්නො විහාරවත්ථුං සොධෙන්තො අඤ්ඤතරං චෙතියරුක්ඛං ඡෙදාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

8. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : රාජගහෙ පඤ්ඤත්තො. කං ආරබ්භාති : මෙත්තියභූම්මජකෙ භික්ඛූ ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති : මෙත්තියභූම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති, ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

9. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : රාජගහෙ පඤ්ඤත්තො. කං ආරබ්භාති : මෙත්තියභූම්මජකෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : මෙත්තිය භූම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තා උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති-සමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

10. සඞ්ඝභෙදකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : රාජගහෙ පඤ්ඤත්තො. කං ආරබ්භාති : දෙවදත්තං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : දෙවදත්තො සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

11. භෙදකානුවත්තකානං භික්ඛූනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : රාජගහෙ පඤ්ඤත්තො. කං ආරබ්භාති : සම්බහුලෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛූ දෙවදත්තස්ස සඞ්ඝභෙදාය පරක්කමන්තස්ස අනුවත්තකා අහෙසුං වග්ගවාදකා, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

12. දුබ්බචස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : කොසම්බියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : ආයස්මන්තං ඡන්නං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ආයස්මා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති : කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

7. (කරවා දෙන හිමියකු ඇති) මහත් විහාරයක් කරවීම හේතුයෙන් වන සඟ වෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : කොසඹෑ නුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ඡන්න තෙරුන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න තෙරහු විහාර වාස්තුවක් (ගෙබිම) පෙළිකරන්නාහු එක්තරා පිදියයුතු රුකක් සිඳවූහ, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන යන් අතුරෙහි සමුට්ඨාන සයෙන් නඟී. . . .

8. අමූලක වූ පරිජි ඇවතින් මහණක්හට චෝදනා කිරීම හේතුයෙන් වන සඟ වෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : රජගහ නුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙක්හි ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍රහට අමූලක පරිජි ඇවතින් චොදනා කළාහු ය, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි තුන් සමුට්ඨානයෙකින් නඟී. . . .

9. අන්‍යභාගීය (අන් කොටස් ඇති) අධිකරණයක්හුගේ කිසියම් (ජාත්‍යාදි) ලෙශ මාත්‍රයක් ගෙණ මහණක්හට පරිජි ඇවතින් චෝදනා කිරීම හේතුවෙන් වන සඟ වෙසෙස කොතන්හි පණවන ලද ද යත් : රජගහ නුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රහට අන්‍යභාගීය අධිකරණයක්හු ගේ කිසියම් ලෙශ මාත්‍රයක් ගෙණ පරිජි ඇවතින් චෝදනා කළාහු ය, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් තුන් සමුට්ඨාන යෙකින් නඟී. . . .

10. සඞ්ඝභේදක භික්ෂුහට තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි දෘෂ්ටිය නො හැරීම හේතුයෙන් වන සඟවෙසෙස කො තැන්හි පණවන ලද ද යත් : රජගහ නුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : දෙව්දත් මහණහු ඇරැබ ය. කිනම් වස්තු යෙක්හි ද යත් : දෙව්දත් මහණ සමගසඞ්ඝයා බිඳවීම පිණිස උත්සාහ කෙළේ ය. ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

11. භේදකානුවත්තක භික්ෂූන්ට තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි දෘෂ්ටිය නො හැරීම හේතුයෙන් වන සඟවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : රජගහ නුවර දී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත් : බොහෝ භික්ෂූන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : වර්ගවාදී වූ බොහෝ භික්ෂූහු සඞ්ඝභෙදය පිණිස වෑයම් කරණ දෙව්දත්හට අනුවර්තක වූහ. ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

12. දුර්වච මහණහට තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි දෘෂ්ටිය නො හැරීම හේතුයෙන් වන සඟවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : කොසඹෑ නුවර දී පණවන ලදී. කවරක් හු ඇරැබ ද යත් : ආයුෂ්මත් ඡන්න තෙරුන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : ආයුෂ්මත් ඡන්න තෙරහු භික්ෂූන් විසින් සකාරණයෙන් කියනු ලබන්නාහු තමා නො කියයුත්තක්හු කළහ. ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

13. කුලදූසකස්ස භික්ඛුනො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: අස්සජිපුනබ්බසුකෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අස්සජිපුනබ්බසුකා භික්ඛූ සඞ්ඝෙන පබ්බාජනීයකම්මකතා භික්ඛූ ඡන්දගාමිතා දොසගාමිතා මොහගාමිතා භයගාමිතා පාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

14. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා දුක්කටං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියෙ භික්ඛූ ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛූ උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි අකංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති, එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො -පෙ-

කත්ථපඤ්ඤත්තිවාරො නිට්ඨිතො පඨමො.

Free Distribution www.aathaapi.org

13. කුලදූෂක භික්ෂුහට තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (එය) නො හැරීම් හෙතුයෙන් වන සඝභෙසෙස කො තැන්හි පණවන ලද ද යත්: සැවැතෙහිදී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත්: අස්සජි–පුනබ්බසුක භික්ෂූන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත්: අස්සජි–පුනබ්බසුක භික්ෂූහු සඞ්ඝයා විසින් පබ්බාජනීය කර්මය කරණ ලද්දහු කාරක භික්ෂූන් ඡන්දගාමිත්වයෙන් ද්වෙෂගාමිත්වයෙන් මොහගාමිත්ව යෙන් භයගාමිත්වයෙන් යුක්ත කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි: කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

14. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ පහකිරීම් හෙතුයෙන් වන දුකුළා සිබ කො තැන්හි පණවන ලද ද යත්: සැවැතෙහිදී පණවන ලදී. කවරක්හු ඇරැබ ද යත්: සවග මහණුන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත්: සවග මහණහු පිරිබෝ දියෙහි මල ද මූ ද කෙළ ද එවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, අනුපඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨාන යෙකින් නඟියි: කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. . . .

**පළමුවන කත්ථපඤ්ඤත්තිවාරය නිමි.**

---

# 10. කථාපත්තිවාරො

## 10.1

### පාරාජික කණ්ඩා

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: අක්ඛායිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති පාරාජිකස්ස. යෙභුය්‍යෙන ඛායිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති ථුල්ලච්චයස්ස. වට්ටකතෙ මුඛෙ අච්ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙති ආපත්ති දුක්කටස්ස. ජතුමට්ඨකෙ[1] පාචිත්තියං. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

2. අදින්නං ආදියනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අදින්නං ආදියනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: පඤ්චමාසකං වා අතිරෙකපඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති පාරාජිකස්ස. අතිරෙකමාසකං වා ඌනපඤ්චමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති ථුල්ලච්චයස්ස. මාසකං වා ඌනමාසකං වා අග්ඝනකං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියති, ආපත්ති දුක්කටස්ස. අදින්නං ආදියනපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

3. සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: මනුස්සං ඔදිස්ස ඔපාතං ඛණති පපතිත්වා මරිස්සතීති, ආපත්ති දුක්කටස්ස. පපතිතෙ දුක්ඛා වෙදනා උප්පජ්ජති, ආපත්ති ථුල්ලච්චයස්ස. මරති, ආපත්ති පාරාජිකස්ස. සඤ්චිච්ච මනුස්සවිග්ගහං ජීවිතා වොරොපනපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

4. අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආපත්ති පාරාජිකස්ස. 'යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහා'ති භණති, පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. නප්පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපනපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති

චත්තාරො පාරාජිකා නිට්ඨිතා.

---

1. ජතුමට්ඨකෙ - මජසං.



Free Distribution www.aathaapi.org

# 10. කථාපත්තිවාරය

## 10.1

## පාරාජික කාණ්ඩය

1. මෙවුන්දම් සෙවුනා හේතුවෙන් කෙතෙක් ඇවැතකට පැමිණේ ද යත් : මෙවුන් දම් සෙවුනා හේතුවෙන් සිවු ඇවැතකට පැමිණේ. ක්ෂය නො වූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සෙවුනේ නම් පරිජි ඇවැත් වෙයි. බෙහෙවින් ක්ෂය වූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සෙවුනේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි. අභාළ මියෙහි නො පහරමින් හඳන් පිවිස්වා නම් දුකුළා ඇවැත් වෙයි. ලතුයෙන් කළ නිමිත්තෙහි නම් පචිති ඇවැත් වේ. මෙවුන්දම් සෙවීම් හෙතුයෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

2. හිමියන් සතු නො දුන් දෙය සොර සිතින් ගැණීම් හේතුවෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : හිමියන් සතු නො දුන් දෙය සොර සිතින් ගැණීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ. පස් මස්සක් හෝ අයිරා පස් මස්සක් හෝ අගනා නො දුන් දෙය තෙනා ගණී නම් පරිජි ඇවැත් වෙයි. අයිරා මස්සක් හෝ උනු පස් මස්සක් හෝ අගනා නොදුන් දෙය තෙනා ගණී නම් ථුල්ලැසි ඇවැත් වෙයි. මස්සක් හෝ උනු මස්සක් හෝ අගනා නො දුන් දෙය තෙනා ගණී නම් දුකුළා ඇවැත් වේ. නො දුන් දෙය ගැණීම් හේතුයෙන් මේ තුන් ඇවැතට පැමිණේ.

3. දුන දුන මිනිස් සිරුර දිවියෙන් තොර කිරීම් හේතුයෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : දුන දුන මිනිස් සිරුර දිවියෙන් තොර කිරීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ. 'වැටී මැරෙන්නේ මැනැවැ' යි මිනිසකු උදෙසා වළක් කණී නම් දුකුළා ඇවැත් වෙයි. වැටුනු කල්හි දුක් වේදනා උපදී නම් ථුල්ලැසි ඇවැත් වෙයි. මැරේ නම් පරිජි ඇවැත් වේ. දුන දුන මිනිස් සිරුර දිවියෙන් තොර කිරීම් හේතුයෙන් මේ තුන් ඇවතට පැමිණේ.

4. තමා තුළ අවිද්‍යමාන වූ නැත්තා වූ උතුරු මිනිස් ධම් ඇතැයි ප්‍රකාශ කිරීම් හේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : අවිද්‍යමාන වූ නැත්තා වූ උතුරුමිනිස්ධම් ඇතැයි ප්‍රකාශ කිරීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ. ලාමක අදහස් ඇත්තේ ලාමක අදහසින් මඩනා ලද්දේ අවිද්‍යමාන වූ නැත්තා වූ උතුරු මිනිස් ධම් ඇතැයි ප්‍රකාශ කෙරේ නම් පරිජි ඇවැත් වෙයි. ඔබගේ විහාරයෙහි යම් මහණෙක් වෙසේ නම් ඒ මහණ රහත් " යැ යි දැනුමැතියක්හට බෙණේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, නො දැනුමැතියක්හට නම් දුකුළා ඇවැත් වේ. තමා තුළ අවිද්‍යමාන වූ නැත්තා වූ උතුරුමිනිස්ධම් ඇතැයි ප්‍රකාශ කිරීම් හෙතුයෙන් මේ තුන් ඇවැතට පැමිණේ.

**සතර පරිජි නිමි.**

---



Free Distribution www.aathaapi.org

## 10.2

### සඞ්ඝාදිසෙසකණ්ඩාදයො.

1. උපක්කමිත්වා අසුචිං මොචනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: උපක්කමිත්වා අසුචිං මොචනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: චෙතෙති උපක්කමති මුච්චති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. චෙතෙති උපක්කමති න මුච්චති, ආපත්ති ථුල්ලච්චයස්ස. පයොගෙ දුක්කටං. උපක්කමිත්වා අසුචිං මොචනපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති

2. කායසංසග්ගං සමාපජ්ජනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: කායසංසග්ගං සමාපජ්ජනපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ගහණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු කායෙන කායං ආමසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. කායෙන කායපටිබද්ධං ආමසති, අපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස. අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං. කායසංසග්ගං සමාපජ්ජනපච්චයා ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

3. මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: වච්චමග්ගං පස්සාවමග්ගං ආදිස්ස වණ්ණම්පි භණති අවණ්ණම්පි භණති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. වච්චමග්ගං පස්සාවමග්ගං ඨපෙත්වා අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ආදිස්ස වණ්ණම්පි භණති, අවණ්ණම්පි භණති, ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධං ආදිස්ස වණ්ණම්පි භණති, අවණ්ණම්පි භණති ආපත්ති දුක්කටස්ස.

4. අත්තකාමපාරිචරියාය වණ්ණං භාසනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපරිචරියාය වණ්ණං භාසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පණ්ඩකස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසති, ආපත්ති ථුල්ලච්චයස්ස. තිරච්ඡානගතස්ස සන්තිකෙ අත්තකාමපරිචරියාය වණ්ණං භාසති, ආපත්ති දුක්කටස්ස.

5. සඤ්චරිත්තං සමාපජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: පටිග්ගණ්හාති[1] වීමංසති පච්චාහරති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පටිග්ගණ්හාති වීමංසති න පච්චාහරති, ආපත්ති ථුල්ලච්චයස්ස. පටිග්ගණ්හාති, න වීමංසති, න පච්චාහරති, ආපත්ති දුක්කටස්ස.

6. සඤ්ඤාචිකාය කුටිං කාරාපනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: කාරාපෙති, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං[2] අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස

7. මහල්ලකං විහාරං කාරාපනපච්චයා තිස්සො ආපත්තියො, ආපජ්ජති: කාරාපෙති, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

8. භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස. ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස

---

1. පග්ගණ්හාති - මජසං.
2. එකපිණ්ඩෙ - සයා.

## 10.2

## සඞ්ඝාදිශේෂ කාණ්ඩාදිය

1. උපක්‍රම කොට සුකුරු මිදීම් හේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : උපක්‍රම කොට සුකුරු මිදීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : සිතා නම් උපක්‍රම කෙරේ නම් මුදු නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි, සිතා නම් උපක්‍රම කෙරේ නම් නො මුදු නම් ථුල්ලැසි ඇවැත් වෙයි, පියෝහි දුකුළා වේ. උපක්‍රම කොට සුකුරු මිදීම් හේතුයෙන් මේ තුන් ඇවැතට පැමිණේ.

2. කායසඟයට පැමිණීම් හේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : කාය සඟයට පැමිණීම් හේතුයෙන් පස් ඇවැතකට පැමිණෙයි: කායසඟරායෙන් තෙත් වූ මෙහෙණක් එම රාගයෙන් තෙත් වූ පිරිමි පුඟුලක්හු විසින් අකු ඇටයෙන් යට දණ මඩලින් උඩ ගැන්ම ඉවසා නම් පරිජී ඇවැත් වෙයි, මහණ (තමා ගේ) කයින් (මාගමක ගේ) කය ආමසී කෙරේ නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි, කයින් කය පිළිබැදියක් ආමසී කෙරේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, කය පිළිබැදියකින් කය පිළිබැදියක් ආමසී කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ගිරිති කැවීමෙහි පචිති ඇවැත් වේ. කායසඟයට පැමිණීම් හේතුයෙන් මේ පස් ඇවැතට පැමිණේ.

3. මාගමකට තුළුල් තෙපුල් කීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ. වසමඟ පසමඟ අරමුණු කොට ගුණ ද කියා නම් අගුණ ද කියා නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි, වසමඟ පසමඟ තබා අකු ඇටයෙන් යට දණ මඩලින් උඩ අරමුණු කොට ගුණ ද කියා නම් අගුණ ද කියා නම් ථුල්ලැසි ඇවැත් වෙයි, කය පිළිබැදියක් අරමුණු කොට ගුණ ද කියා නම් අගුණ ද කියා නම් දුකුළා ඇවැත් වේ.

4. තමහට මෙවුන්දම්න් මෙහෙකිරීම පිළිබඳ ගුණකීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි : මාගමක හමුවෙහි තමහට මෙවුන්දම්න් මෙහෙකිරීම පිළිබඳ ගුණ කියා නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, පණ්ඩකයකු හමුයෙහි තමහට මෙවුන්දම්න් මෙහෙ කිරීම පිළිබඳ ගුණ කියා නම් ථුල්ලැසි ඇවැත් වෙයි, තිරිසන්ගතයකු හමුවෙහි තමහට මෙවුන් දම්න් මෙහෙකිරීම පිළිබඳ ගුණ කියා නම් දුකුළා ඇවැත් වේ.

5. ස්ත්‍රී පුරුෂයන්ගේ කෙලෙස් පිළිබඳ හසුන් ගෙණ යන 'සංචරිත්ත' හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ : පිළිගණී නම් විමසා නම් පෙරළා ගෙණ ඒ නම් සඟ වෙසෙස් ඇවැත් වෙයි, පිළිගණී නම් විමසා නම් පෙරළා නොම ගෙණේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, පිළිගණී නම් නො විමසා නම් පෙරළා නොම ගෙණේ නම් දුකුළා ඇවැත් වේ.

6. තමා ඉල්වා ගත් උපකරණයෙන් කිළියක් කරවීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, එක් මැටි පිඩෙකින් නො නිමි කල්හි ථුල්ලැසි ඇවැත් වෙයි, එම මැටිපිඩ තැබූ කල්හි සඟවෙසෙස් ඇවැත් වේ.

7. (කරවා දෙන හිමියකු ඇති) මහත් වූ විහාරයක් කරවීම් හේතුවෙන් තුන් ඇවැත කට පැමිණෙයි : කරවා නම් පියෝහි දුකුළා වෙයි, එක් මැටි පිඩෙකින් නො නිමි කල්හි ථුල්ලැසි ඇවැත් වෙයි, එම මැටිපිඩ තැබූ කල්හි සඟවෙසෙස් ඇවැත් වේ.

8. අමුලුපරිජී ඇවතින් මහණක්හට චොදනා කිරීම් හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි : අවසර නො ගෙණ (භික්ෂුභාවයෙන්) චුත කරවනු කැමැති ව චොදනා කෙරේ නම් සඟවෙසෙස් සමග දුකුළා ඇවැත් වෙයි, අවසර ගෙණ ආක්‍රොශ කරණ අදහස් ඇති ව චොදනා කෙරේ නම් ඔමසවාද පචිති ඇවැත් වේ.

9. භික්ඛුං අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: අනොකාසං කාරාපෙත්වා චාවනාධිප්පායො වදෙති, ආපත්ති සඞ්ඝාදිසෙසෙන දුක්කටස්ස, ඔකාසං කාරාපෙත්වා අක්කොසාධිප්පායො වදෙති, ආපත්ති ඔමසවාදස්ස.

10. සඞ්ඝභෙදකො භික්ඛු යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස

11. භෙදකානුවත්තකා භික්ඛූ යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජන්ති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

12. දුබ්බචො භික්ඛු යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

13. කුලදූසකො භික්ඛු යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස -පෙ-

14. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

කතාපත්තිවාරො නිට්ඨිතො දුතියො.

Free Distribution www.aathaapi.org

9. අන්‍යභාගීය (අන් කොටස් ඇති) අධිකරණයක්හුගේ කිසියම් ලේශ මාත්‍රයක් ගෙණ මහණක්හට පරිජි ඇවතින් චෝදනා කිරීම් හේතුවෙන් තුන් ඇවැතකට පැමිණේ: අවසර නො ගෙණ (භික්ෂුභාවයෙන්) චුත කරවනු කැමැතිව චොදනා කෙරේ නම් සඟ වෙසෙස් සමග දුකුළා ඇවැත් වෙයි, අවසර ගෙණ අක්‍රොශ කරණ අදහස් ඇති ව චොදනා කෙරේ නම් ඔමසවාද පචිති ඇවැත් වේ.

10. සඞ්ඝභෙදක මහණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හැරීම් හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසි ඇවැත් වෙයි, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

11. භෙදකානුවත්තක මහණහු තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හැරීම් හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණෙති : ඤත්තියෙහි දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසි ඇවැත් වෙයි, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

12. නො කීකරු මහණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හැරීම් හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙහි දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසි ඇවැත් වෙයි, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ.

13. කුලදූෂක මහණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (එය) නො හැරීම් හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණේ. ඤත්තියෙහි දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසි ඇවැත් වෙයි, කම්වදන් පිරියතැ සඟවෙසෙස් ඇවැත් වේ. . . .

14. අනාදර පිණිස පරිභොග ජලයෙහි මල හෝ මූ හෝ කෙළ හෝ එවීම් හෙතු වෙන් කෙතෙක් ඇවැතුන්ට පැමිණේ ද යත් : අනාදර පිණිස පරිභොග ජලයෙහි මල හෝ මූ හෝ කෙළ හෝ එවීම් හෙතුවෙන් එක් දුකුළා ඇවැතකට පැමිණේ. අනාදර පිණිස පරිභොග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ එවීම් හෙතුවෙන් මේ එක් ඇවැතට පැමිණේ.

දෙවන කථාපත්තිවාරය නිමි.

---

14—සිපි 17881 (7/75)

Free Distribution www.aathaapi.org

# 11. විපත්තිවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති : මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති : සියා සීලවිපත්ති, සියා ආචාරවිපත්ති-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති චතුන්නං විපත්තීනං කති විපත්තියො භජති : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජති : ආචාරවිපත්තිං.

විපත්තිවාරෙ නිට්ඨිතො තතියො.

---

# 12. සඞ්ගහිතවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා : අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති සත්තන්නං ආපත්තික්ඛන්ධානං එකෙන ආපත්තික්ඛන්ධෙන සඞ්ගහිතා : දුක්කටාපත්තික්ඛන්ධෙන.

සඞ්ගහිතවාරෙ නිට්ඨිතො චතුත්ථො.

---



Free Distribution www.aathaapi.org

# 11. විපත්තිවාරය

1. මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් භජනය කෙරෙද්ද යත් : මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසි විටෙක ශීල විපත්තිය ද කිසි විටෙක ආචාර විපත්තිය දූයි විපත්තීන් දෙ දෙන භජනය කෙරෙත්. . . .

2. අනාදර පිණිස පරිභෝග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජේ ද යත් : අනාදර පිණිස පරිභෝග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙන් එක්ම ආචාර විපත්තිය බෙජේ.

තුන්වන විපත්තිවාරය නිමි.

---

# 12. සඞගහිතවාරය

1. මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙකින් සඞග්‍රහ කරණ ලද්දහු ද යත් : මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද, කිසි විටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද, කිසි විටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දූයි සතර ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලද්දහු ය. . . .

2. අනාදර පිණිස පරිභොග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙකින් සඞග්‍රහ කරණ ලද ද යක් : අනාදර පිණිස පරිභෝග දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හෙතුවෙන් වන ඇවැත සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් දුෂ්කෘතාපත්ති ස්කන්ධ නම් වූ එක් ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලදී.

සතරවන සඞගහිත වාරය නිමි.

---

# 13. සමුට්ඨානවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො.

සමුට්ඨානවාරෙ නිට්ඨිතො පඤ්චමො.

---

# 14. අධිකරණවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං

අධිකරණවාරෙ නිට්ඨිතො ඡට්ඨො.

---



Free Distribution www.aathaapi.org

# 13. සමුට්ඨානවාරය

1. මෛථුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිද් ද යත් : මෛථුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟිත්. කයින් ද සිතින් ද නඟිති, වචනයෙන් නො නඟිත්. . . .

2. අනාදර පිණිස පරිබෝ් දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : අනාදර පිණිස පරිබෝ් දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි · කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

පස්වන සමුට්ඨාන වාරය නිමි.

---

# 14. අධිකරණවාරය

1. මෛථුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක යත් : මෛථුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් අපත්තාධිකරණ යි. . . .

2. අනාදර පිණිස පරිබෝ් දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හෙතුවෙන් වන ඇවැත සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක යත් : අනාදර පිණිස පරිබෝ් දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි.

සවන අධිකරණ වාරය නිමි.

---

# 15. සමථවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මන්ති: මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච-පෙ-

2. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ආපත්ති සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

සමථවාරෙ නිට්ඨිතො සත්තමො.



Free Distribution www.aathaapi.org

# 15. සමථවාරය

1. මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සත්වැදෑරුම් සමථයන් අතුරෙන් කෙතෙක් සමථයෙන් සන්හිඳේ ද යත් : මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් වන ඇවැත්හු සත්වැදෑරුම් සමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් සමථයෙන් සන්හිඳෙත්. . . .

2. අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සත් වැදෑරුම් සමථයන් අතුරෙන් කෙතෙක් සමථයෙන් සන්හිඳේ ද යත් : අනාදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් වන ඇවැත සත් වැදෑරුම් සමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් සමථයෙන් සන්හිඳේ.

**සත්වන සමථවාරය නිමි.**

---



Free Distribution www.aathaapi.org

# 16. සමුච්චයවාරො

1. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: අක්ඛයිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති පාරාජිකස්ස. යෙභුය්‍යෙන ඛයිතෙ සරීරෙ මෙථුනං ධම්මං පටිසෙවති, ආපත්ති ථුල්ලච්චයස්ස. වට්ටකතෙ මුඛෙ අච්ඡුපන්තං අඞ්ගජාතං පවෙසෙති, ආපත්ති දුක්කටස්ස. ජතුමට්ඨකෙ පාචිත්තියං. මෙථුනං ධම්මං පටිසෙවනපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

2. තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්ති, සියා ආචාරවිපත්ති. සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච-පෙ-

3. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා එකං ආපත්තිං ආපජ්ජති: දුක්කටං. අනාදරියං පටිච්ච උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරණපච්චයා ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

4. සා ආපත්ති චතුන්නං විපත්තීනං කති විපත්තියො භජති: සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මති:



Free Distribution www.aathaapi.org

# 16. සමුච්චයවාරය

1. මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් ; මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් සිවු ඇවැතකට පැමිණෙයි : ක්ෂය නොවූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සේවනය කෙරේ නම් පරිජි ඇවැත් වෙයි, බෙහෙවින් ක්ෂය වූ සිරුරු නිමිත්තෙහි මෙවුන්දම් සේවනය කෙරේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, අභාළ මියෙහි හඳන් නො පහරමින් පිවිස්වා නම් දුකුළා ඇවැත් වෙයි, ලතුයෙන් කළ නිමිත්තෙහි පචිති ඇවැත් වෙ. මෙවුන්දම් සේවනය කිරීම් හේතුවෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

2. ඒ ඇවැත්හු සිවුවැදැරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් භජනය කෙරෙද් ද : සත් වැදැරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද්දහු ද, සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟිද්ද, සිවු වැදැරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද, සත් වැදැරුම් සමථයන් අතුරෙන් කෙතෙක් සමථයෙන් සන්හිඳෙද්ද යත් :

ඒ ඇවැත්හු සිවු වැදැරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත්තීන් දෙදෙන භජනය කෙරෙත්. සත් වැදැරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද, කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද, කිසි විටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි සතර ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද්දහු ය. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟිත් : කයින් ද සිතින් ද නඟිති, වචනයෙන් නො නඟිත්. සිවුවැදැරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදැරුම් සමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛා විනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් සමථයෙන් සන්හිඳෙත්.

3. අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : අනදර පිණිස පිරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් එක් දුකුළා ඇවැතකට පැමිණේ. අනදර පිණිස පරිබෝ දියෙහි මල හෝ මූ හෝ කෙළ හෝ ඕනා හේතුවෙන් මේ එක් ඇවතට පැමිණේ.

4. ඒ ඇවැත සිවුවැදැරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජේ ද, සප්තාපත්ති ස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද ද, සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද, සිවු වැදැරුම් අධිකරණයන් අතුරෙන් කවර අධිකරණයෙක් ද, සත් වැදැරුම් සමථයන් අතුරෙන් කෙතෙක් සමථයෙන් සන්හිඳේ ද යත් :



Free Distribution www.aathaapi.org

සා ආපත්ති චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජති: ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං එකෙන ආපත්තික්ඛන්ධෙන සඞ්ගහිතා: දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

සමුච්චයවාරෙ නිට්ඨිතො අට්ඨමො.

අට්ඨ පච්චයවාරා නිට්ඨිතා.

මහාවිභඞ්ගෙ සොළස මහාවාරා නිට්ඨිතා.

නිට්ඨිතො ච මහාවිභඞ්ගො.[1]

1. භික්ඛු විභඞ්ග මහාවාරෙ නිට්ඨිතො - මජසං.

ඒ ඇවැත සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙන් එක්ම ආචාරවිපත්තිය වෙයි. සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් දුෂ්කෘතාපත්ති ස්කන්ධ නම් වූ එක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදී. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් සමථයන් අතුරෙහි කිසි විටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් සමථයෙන් සන්හිඳේ.

අටවැනි සමුච්චයවාරය නිමි.

---

අෂ්ට ප්‍රත්‍යය වාරයෝ නිමියහ.

---

මහාවිභඞ්ගයෙහි සොළොස් මහාවාරයෝ නිමියහ.

---

## මහා විභඞ්ගය ද නිමියේ යි.

---

# භික්ඛුනීවිභඞ්ගො

## 1. කත්ථපඤ්ඤත්තිවාරො

### 1.1

### පාරාජිකකණ්ඩො

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන භික්ඛුනීනං පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං, කං ආරබ්භ, කිස්මිං වත්ථුස්මිං, අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්ති, සබ්බත්ථපඤ්ඤත්ති, පදෙසපඤ්ඤත්ති, සාධාරණපඤ්ඤත්ති, අසාධාරණපඤ්ඤත්ති, එකතොපඤ්ඤත්ති, උභතොපඤ්ඤත්ති, චතුන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං, කත්ථ පරියාපන්නං, කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති, චතුන්නං විපත්තීනං කතමා විපත්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධො, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මති, කො තත්ථ විනයො; කො තත්ථ අභිවිනයො, කිං තත්ථ පාතිමොක්ඛං කිං තත්ථ අධිපාතිමොක්ඛං, කා විපත්ති, කා සම්පත්ති, කා පටිපත්ති, කති අත්ථවසෙ පටිච්ච භගවතා භික්ඛුනීනං පඨමං පාරාජිකං පඤ්ඤත්තං, කා සික්ඛන්ති, කා සික්ඛිතසික්ඛා, කත්ථ ඨිතං, කා ධාරෙන්ති, කස්ස වචනං, කෙනාභතන්ති :

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන භික්ඛුනීනං පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං.

කං ආරබ්භාති : සුන්දරීනන්දං භික්ඛුනිං ආරබ්භ.

කිස්මිං වත්ථුස්මින්ති : සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියි, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති, අනුප්පන්නපඤ්ඤත්තීති : එකා පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි.

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති : සබ්බත්ථ පඤ්ඤත්ති.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්තීති : අසාධාරණපඤ්ඤත්ති.

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති : එකතො පඤ්ඤත්ති.

චතුන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති : නිදානොගධං, නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති : දුතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති.



Free Distribution www.aathaapi.org

# භික්ෂුණී විභඞ්ගය

## 1. කත්ථපඤ්ඤත්තිවාරය

### 1.1

### පාරාජික කාණ්ඩය

1. සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් මෙහෙණන් පිළිබඳ යම් පස්වැනි පරිජි සිකපදයෙක් පණවන ලද නම් එය කොතැන්හි පණවන ලද ද, කවරක ඇරැබ ද, කිනම් වස්තුයෙක්හි ද, එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති එකතො පඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ඇද්ද, සිවුවැදැරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ ද, කොහි ඇතුළත් ද, කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ ද, සිවුවැදැරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙක් වේ ද, සත් වැදැරුම් ආපත්ති ස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්ති ස්කන්ධයෙක් වේ ද, සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද, සිවු වැදැරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙක් වේ ද, සත් වැදැරුම් සමථයන් අතුරෙහි කෙතෙක් සමථයෙන් සන්හිදේ ද, එහි විනය කවරේ ද, එහි අභිවිනය කවරේ ද, එහි ප්‍රාතිමොක්ෂය කිම, එහි අධිප්‍රාතිමොක්ෂය කිම, විපත්ති කවර යැ, සම්පත්ති කවර යැ, ප්‍රතිපත්ති කවර යැ, කෙතෙක් කරුණු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් මෙහෙණන්හට පස්වන පරිජි සිකපදය පණවන ලද ද, කවුරු හික්මෙත් ද, කවුරු හික්මුනු සිඛඇතියෝ ද, කවුරුන් කෙරෙහි පිහිටියේ ද, කවුරු දරත් ද, කවුරුන්ගේ වචනයෙක් ද, කවුරුන් විසින් ගෙණඑන ලද ද යත් :

සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙහෙණන් පිළිබඳ යම් පස්වන පරිජි සිකපදයෙක් පණවන ලද නම් කොතැන්හි පණවන ලද යැ යත් : සැවැත් නුවර දී පණවන ලදී.

කවරක ඇරැබ ද යත් : සුන්දරිනන්දා භික්ෂුණිය ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි යැ යත් : කාමරාගයෙන් තෙත් වූ සුන්දරිනන්දා මෙහෙණ කාමරාගයෙන් තෙත් වූ මිනිස් පරිමියකුගේ කායසංසර්ගය ඉවසුවා ය. ඒ වස්තුයෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකකැ, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යැ.

සාධාරණ පඤ්ඤත්ති අසාධාරණ පඤ්ඤත්ති ද යත් : අසාධාරණ පඤ්ඤත්ති යැ.

එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ද යත් : එකතොපඤ්ඤත්ති යැ.

සිවුවැදැරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ යැ, කොහි ඇතුළත් යැ යත් : නිදනයෙහි පිහිටියේ යැ, නිදනයෙහි ඇතුළත් යැ.

කිනම් උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ යැ යත් : දෙවැනි උද්දෙසයෙන් උදෙසීමට පැමිණේ.



Free Distribution www.aathaapi.org

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති: සීලවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති: පාරාජිකාපත්තික්ඛන්ධො.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතිහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති: එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො.

චතුන්නං අධිකරණානං කතමං අධිකරණන්ති: ආපත්තාධිකරණං

සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මතීති: ද්වීහි සමථෙහි සම්මති, සම්මුඛා විනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච:

කො තත්ථ විනයො, කො තත්ථ අභිවිනයොති: පඤ්ඤත්ති විනයො, විභත්ති අභිවිනයො.

කිං තත්ථ පාතිමොක්ඛං, කිං තත්ථ අධිපාතිමොක්ඛන්ති: පඤ්ඤත්ති පාතිමොක්ඛං, විභත්ති අධිපාතිමොක්ඛං.

කා විපත්තීති: අසංවරෙ විපත්ති.

කා සම්පත්තීති: සංවරො සම්පත්ති.

කා පටිපත්තීති: න එවරූපං කරිස්සාමී'' ති යාවජීවං ආපාණකොටිකං සමාදාය සික්ඛති සික්ඛාපදෙසු.

කති අත්ථවසෙ පටිච්ච භගවතා භික්ඛුනීනං පඨමං පාරාජිකං පඤ්ඤත්තන්ති: දස අත්ථවසෙ පටිච්ච භගවතා භික්ඛුනීනං පඨමං පාරාජිකං පඤ්ඤත්තං: සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනීනං[1] භික්ඛුනීනං නිග්ගහාය, පෙසලානං භික්ඛුනීනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය, පසන්නානං භියොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය.

කා සික්ඛන්තීති: සෙක්ඛා ච, පුථුජ්ජනකල්‍යාණිකා ච සික්ඛන්ති

කා සික්ඛිතසික්ඛාති: අරහන්තා සික්ඛිතසික්ඛා.

කත්ථ ඨිතන්ති: සික්ඛාකාමාසු ඨිතං.

කා ධාරෙන්තීති: යාසං වත්තන්ති, තා ධාරෙන්ති.

කස්ස වචනන්ති: භගවතො වචනං අරහතො සම්මාසම්බුද්ධස්ස.

කෙනාභතන්ති පරම්පරාභතං.

1. උපාලි දාසකො චෙව සොණකො සිග්ගවො තථා,
මොග්ගලිපුත්තෙන පඤ්චමා එතෙ ජම්බුසිරිව්හයෙ.

2. තතො මහින්දො ඉට්ඨියො උත්තියො චෙව සම්බලො,[2]
භද්දනාමො ච පණ්ඩිතො,
එතෙ නාගා මහාපඤ්ඤා ජම්බුදීපා ඉධාගතා.

3 විනයං තෙ වාචයිංසු පිටකං තම්බපණ්ණියා,
නිකායෙ පඤ්ච වාචෙසුං සත්ත චෙව පකරණෙ.

---

1. දුම්මඞ්කූනං - මජසං.
2. සම්බලො තථා - මජසං.

සිවුවැදෑරුම විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙකැ යත් : ශීලවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙකැ යත් : පාරාජිකාපත්තිස්කන්ධ යි.

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී ද යත් : එක් සමුට්ඨානයෙකින් නඟියි : කයින් ද සිතින් ද නඟියි, වචනයෙන් නො නඟී.

සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙහි කිනම් අධිකරණයෙකැ යත් : ආපත්තාධිකරණ යි.

සත් වැදෑරුම් ශමථයන් අතුරෙහි කෙතෙක් ශමථයෙන් සන්හිඳේ යැ යත් : සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් දැයි දෙ ශමථයෙන් සන්හිඳේ.

එහි විනය කවරේ යැ, එහි අභිවිනය කවරේ යැ යත් : පඤ්ඤත්තිය විනය යැ, පදභාජනිය අභිවිනය යි.

එහි ප්‍රාතිමොක්ෂය කිමැ, එහි අධිප්‍රාතිමොක්ෂය කිම යැ යත් : ප්‍රඥප්තිය ප්‍රාතිමොක්ෂ යැ, පදභාජනිය අධිප්‍රාතිමොක්ෂ යි.

විපත් කවර යත් : අසංවරය විපත්ති යි.

සම්පත් කවර යත් : සංවරය සම්පත්ති යි.

ප්‍රතිපත් කවර යත් : " දිවිහිම් කොට මෙබන්දක් නො කරන්නෙමි " යි දිවිපමණින් සමාදන් වැ සිකපදයන්හි හික්මෙයි.

කෙතෙක් කරුණු පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් මෙහෙණන්හට පස්වන පරිජිසිකපදය පණවන ලද යැ යත් : දස කරුණක් පිණිස භාග්‍යවතුන් වහන්සේ විසින් මෙහෙණන්හට පස්වන පරිජි සිකපදය පණවන ලදී : සඞ්ඝයාගේ මනාබව පිණිස යැ, සඞ්ඝයාගේ පහසුව පිණිස යැ, දුසිල් මෙහෙණන්ගේ නිගැන්ම පිණිස යැ, ප්‍රියශීල භික්ෂුණීන්ගේ පහසු විහරණය පිණිස යැ. දිටුදැමියෙහි විදියයුතු දුක් ගැහැට වැළැකීම පිණිස යැ, පරලෙව්හි විදියයුතු දුක්ගැහැට නැසීම පිණිස යැ, නො පහන්වූවන්ගේ පැහැදීම පිණිස යැ, පහන්වූවන්ගේ වැඩියක් පැහැදීම පිණිස යැ, තුන් සසුන්හි පැවැත්ම පිණිස යැ. විනයට අනුග්‍රහ පිණිස යි.

කවුරු හික්මෙති යත් : ශෛක්ෂ භික්ෂුණීහු ද කල්‍යාණ පෘථග්ජන භික්ෂුණීහු ද හික්මෙත්.

කවුරු හික්මුණු සිට ඇතියෝ යැ යත් : රහත් මෙහෙණහු හික්මුණු සිටඇතියෝ යි.

කවුරුන් කෙරෙහි පිහිටියේ යැ යත් : ශික්ෂාකාමීන් කෙරෙහි පිහිටියේ යි.

කවුරු දරති යත් : යම් කෙනකුන්හට විනයපෙළ අටුවා වනපොත් ද ඔහු දරත්.

කවුරුන්ගේ වචනයෙකැ යත් : භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ වචන යි. කවුරුන් විසින් ගෙණ එන ලද යැ යත් : පරපුරෙන් ගෙණ එන ලදී.

1. උපාලි ස්ථවිර යැ දාසකස්ථවිර යැ සොණකස්ථවිර යැ එසේම සිග්ගව ස්ථවිර යැ මොග්ගලිපුත්තතිස්ස ස්ථවිර පස්වැනි කොට ඇති මේ තෙරවරු දඹදිවැ විනයධර පරපුරෙහි වෙත්.

2. ඉක්බිති මහින්ද යැ ඉට්ඨිය යැ උත්තිය යැ එසේ ම සම්බල යැ පණ්ඩිත වූ භද්ද නාම යැ මහපැණැති මේ රහත්හු දඹදිවින් මෙහි වැඩියහ.

3. ඔහු හෙළදිව්හි විනය පිටකය හැදෑරවූහ, සතිසස ද ප්‍රකරණ සත ද හැදෑරවූහු.

4. තතො අරිට්ඨො මෙධාවී තිස්සදත්තො ච පණ්ඩිතො
විසාරදො කාළසුමනො ථෙරො ච දිඝනාමකො
දීඝසුමනො ච පණ්ඩිතො

5. පුනදෙව කාළසුමනො නාගත්ථෙරො ච බුද්ධරක්ඛිතො,
තිස්සත්ථෙරො ච මෙධාවී දෙවත්ථෙරො ච පණ්ඩිතො.

6. පුනදෙව සුමනො මෙධාවී විනයෙ ච විසාරදො,
බහුස්සුතො චූළනාගො ගජොව දුප්පධංසියො.

7. ධම්මපාලිතනාමො ච රොහණෙ සාධු පූජිතො,
තස්ස සිස්සො මහාපඤ්ඤො ඛෙමනාමො තිපෙටකො,
දීපෙ තාරකරාජාව පඤ්ඤාය අතිරොචථ.

8. උපතිස්සො ච මෙධාවී ඵුස්සදෙවො මහාකථී,
පුනදෙව සුමනො මෙධාවී පුප්ඵනාමො[1] බහුස්සුතො.

9. මහාකථී මහාසිවො පිටකෙ සබ්බත්ථ කොවිදො,
පුනදෙව උපාලි මෙධාවී විනයෙ ච විසාරදො.

10. මහානාගො මහාපඤ්ඤො සද්ධම්මවංසකොවිදො,
පුනදෙව අභයො මෙධාවී පිටකෙ සබ්බත්ථ කොවිදො.

11. තිස්සත්ථෙරො ච මෙධාවී විනයෙ ච විසාරදො,
තස්ස සිස්සො මහාපඤ්ඤො පුප්ඵනාමො[2] බහුස්සුතො,
සාසනං අනුරක්ඛන්තො ජම්බුදීපෙ පතිට්ඨිතො.

12. චූළාභයො ච මෙධාවී විනයෙ ච විසාරදො,
තිස්සත්ථෙරො ච මෙධාවී සද්ධම්මවංසකොවිදො

13. ඵුස්සදෙවො ච[3] මෙධාවී විනයෙ ච විසාරදො,
සිවත්ථෙරො ච මෙධාවී විනයෙ සබ්බත්ථ කොවිදො.

14. එතෙ නාගා මහාපඤ්ඤා විනයඤ්ඤූ මග්ගකොවිදා,
විනයං දීපෙ පකාසෙසුං පිටකං තම්බපණ්ණියාති.

2. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන භික්ඛුනීනං ඡට්ඨං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං අජ්ඣාපන්නං භික්ඛුනිං නෙවත්තනා පටිචොදෙසි, න ගණස්ස ආරොචෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ-

3. භික්ඛුනීනං සත්තමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති; ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං අනුවත්ති, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති ධුරනික්ඛෙපෙ -පෙ-

---

1. ඵුස්සනාමො - සීමු.
2. ඵුස්සනාමො - සීමු.
3. මූලදෙවො ච - මජ්සං.

4. ඉක්බිති ප්‍රාඥ වූ අරිට්ඨයැ පණ්ඩිත වූ තිස්සදත්ත යැ විශාරද වූ කාළසුමන යැ දීඝනාමස්ථවිර යැ පණ්ඩිත වූ දීඝසුමන යැ,

5. වැළිදු කාළසුමන යැ නාගස්ථවිර යැ බුද්ධරක්ඛිත යැ නුවණැති තිස්ස ස්ථවිර යැ පණ්ඩිත දෙවස්ථවිර යැ,

6. නැවත ප්‍රාඥ වූ විනයෙහි විශාරදවූ සුමන ස්ථවිර යැ අනභිභවනීය හස්තිරාජයකු බඳු වූ බහුශ්‍රැත චූළනාග ස්ථවිර යැ.

7. සාධූන් විසින් පුදනලද රොහණ ධම්මපාලිත නම් ස්ථවිර යැ ඔබගේ ශිෂ්‍ය වූ හෙළදිවැ චන්ද්‍රයාමෙන් ප්‍රඥයෙන් උසස් වැ බැබළුණු මහාප්‍රාඥ ත්‍රිපිටකධර ඛෙම නම් ස්ථවිර යැ,

8. නුවණැති උපතිස්ස ස්ථවිර යැ මහාකථික වූ ඵුස්සදේව ස්ථවිර යැ ඉක්බිති නුවණැති සුමන ස්ථවිර යැ, බහුශ්‍රැත පුප්ඵ (පදුම) නම් ස්ථවිර යැ,

9. ත්‍රිපිටකයෙහි දක්ෂ වූ මහාකථික මහාසීව යැ වැළිදු ප්‍රශස්ත නුවණැති විනයෙහි විශාරද වූ උපාලි ස්ථවිර යැ,

10. ශාසනවංශය දැනීමෙහි දක්ෂ වූ මහාප්‍රාඥ වූ මහානාග ස්ථවිර යැ නැවත ද නුවණැති ත්‍රිපිටකයෙහි දක්ෂ වූ අභය ස්ථවිර ද,

11. නුවණැති විනයෙහි දක්ෂ වූ තිස්ස ස්ථවිර යැ ඔබගේ ශිෂ්‍ය (ලක්දිවින් ගොස්) සසුන් රකිමින් දඹදිවැ වැඩහුන් මහාප්‍රාඥ වූ බහුශ්‍රැත පුප්ඵ (සුමන) නම් ස්ථවිර යැ,

12. නුවණැති විනයෙහි ද දක්ෂ චූළාභය ස්ථවිර යැ ප්‍රාඥ වූ ශාසනවංශයෙහි දක්ෂ තිස්ස ස්ථවිර යැ,

13. බුද්ධිමත් විනයෙහි ද විශාරද චූළදේව ස්ථවිර යැ නුවණැති සියලු විනයෙහි දක්ෂ සිවස්ථවිරයැ,

14. මහාප්‍රාඥ වූ විනය දන්නා මාර්ගඥනයෙහි දක්ෂ මේ ක්ෂීණාස්‍රවයෝ විනය පිටකය හෙළදිවැ පැවසූහු.

2. සිකපද පැණවීමෙහි කල් දන්නාවූ සිකපද පැණවීමෙහි කරුණු දන්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මෙහෙණින් පිළිබඳ යම් සවැනි පරිජි සිකපදයෙක් පණවන ලද නම් එය කොතන්හි පණවන ලද යැ යත් : සැවැත්නුවර දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ දන දන පරිජි ඇවැතට පැමිණි මෙහෙණකට තොමෝ නොම චෝදනා කළා ය, මෙහෙණගණයාහට නො දන්වූ ය, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නහියි : කයින් ද වචනයෙන් ද සිතින් ද නහී. . . .

3. මෙහෙණින් පිළිබඳ සත්වැනි පරිජි සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ සමගසඞ්ඝයා විසින් උක්ෂෙපණීය කර්මයෙන් නෙරණ ලද පෙර ගිජුලිහිණින් මැරූ කුලයෙහි උපන් අරිට්ඨ භික්ෂුහට අනුවර්තක වූ ය, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි, සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නහියි. ධුරනික්ෂෙපයෙහි යැ. . . .

15—ඝ 8 17881 (75/7)

4. භික්ඛුනීනං අට්ඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො අට්ඨමං වත්ථුං පරිපූරෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති ධුරනික්ඛෙපෙ -පෙ-

අට්ඨ පාරාජිකා නිට්ඨිතා.

---

තස්සුද්දානං:

මෙථුනාදින්නාදානඤ්ච මනුස්සවිග්ගහුත්තරි,
කායසංසග්ගං ඡාදෙති උක්ඛිත්තා අට්ඨවත්ථුකා;
පඤ්ඤාපෙසි මහාවීරො ඡෙජ්ජවත්ථු අසංසයාති.

## 1.2

## සඞ්ඝාදිසෙස කණ්ඩො

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උස්සයවාදිකාය භික්ඛුනියා අට්ටං කරොන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තො -පෙ- කෙනාභතන්ති.

යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන උස්සයවාදිකාය භික්ඛුනියා අට්ටං කරොන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො.

කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ

කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී උස්සයවාදිකා විහරි, තස්මිං වත්ථුස්මිං.

අත්ථි තත්ථ පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්තීති: එකා පඤ්ඤත්ති, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති තස්මිං නත්ථි

සබ්බත්ථ පඤ්ඤත්ති පදෙසපඤ්ඤත්තීති: සබ්බත්ථ පඤ්ඤත්ති.

සාධාරණපඤ්ඤත්ති ආසාධාරණපඤ්ඤත්තීති: අසාධාරණපඤ්ඤත්ති.

එකතො පඤ්ඤත්ති උභතො පඤ්ඤත්තීති: එකතො පඤ්ඤත්ති.

චතුන්නං පාතිමොක්ඛුද්දෙසානං කත්ථොගධං කත්ථ පරියාපන්නන්ති: නිදානොගධං නිදානපරියාපන්නං.

කතමෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡතීති: තතියෙන උද්දෙසෙන උද්දෙසං ආගච්ඡති.

චතුන්නං විපත්තීනං කතමා විපත්තීති: සීලවිපත්ති.

සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතමො ආපත්තික්ඛන්ධොති: සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො.

4. මෙහෙණත් පිළිබඳ අටවැනි පරිජි සිකපදය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි යැ යත් : සවග මෙහෙණහු අටවැනි පරිජි වස්තුව පිරුවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

අට පරිජි නිමි.

එහි වස්තුනාමාවලිය :

මෙවුන්දම් පරිජි යැ, අයිනාදන් පරිජි යැ, මිනිස්විකා පරිජි යැ, උතුරුමිනිස්දම් පරිජි යැ, කාසසඟපරිජි යැ, වජ්ජපටිච්ඡාදික පරිජි යැ, උක්ඛිත්තානුවත්තක පරිජි යැ, අට්ඨවත්ථුක පරිජි යැ යි මේ අට නිසැකයෙන් ඡෙද්‍යවස්තු යැයි මහාවීර වූ මුනීන්ද්‍රයන් වහන්සේ පණවා වදළ සේකි.

## 1.2
## සඞඝාදිශේෂ කාණ්ඩය

1. සිකපද පැණවීමෙහි කල් දන්නාවූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මානක්‍රෝධෝත්සන්න වශයෙන් විවාද කරමින් අධිකරණයෙහි යෙදෙන මෙහෙණ පිළිබඳ යම් සඟවෙසෙසෙක් පණවන ලද නම් එය කොතැන්හි පණවන ලද යැ, කවරක ඇරැබ යැ, කිනම් වස්තුයෙකැ, . . . කවුරුන් විසින් ගෙණ එන ලද යැ යත් :

සිකපද පැණවීමෙහි කල් දන්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් මානක්‍රෝධෝත්සන්න වශයෙන් විවාද කරමින් අධිකරණයෙහි යෙදෙන මෙහෙණ පිළිබඳ යම් සඟවෙසෙසෙක් පණවන ලද නම් එය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී.

කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ.

කිනම් වස්තුයෙක්හි යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ මානක්‍රෝධෝත්සන්න වශයෙන් විවාද කරමින් අධිකරණයෙහි යෙදී වුසූ යැ, ඒ වස්තුයෙහි යැ.

එහි පඤ්ඤත්ති අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති ඇද්ද යත් : පඤ්ඤත්ති එකක, අනුපඤ්ඤත්ති අනුප්පන්නපඤ්ඤත්ති එහි නැති.

සබ්බත්ථපඤ්ඤත්ති පදෙසපඤ්ඤත්ති ද යත් : සබ්බත්ථපඤ්ඤත්ති යි.

සාධාරණපඤ්ඤත්ති අසාධාරණපඤ්ඤත්ති ද යත් : අසාධාරණපඤ්ඤත්ති යැ.

එකතොපඤ්ඤත්ති උභතොපඤ්ඤත්ති ද යත් : එකතොපඤ්ඤත්ති යි.

සිවුවැදෑරුම් පාමොක් උදෙසීම් අතුරෙහි කොහි පිහිටියේ යැ කොහි ඇතුළත් යැ යත් : නිදානයෙහි පිහිටියේ යැ, නිදානයෙහි ඇතුළත් යැ.

කිනම් උද්දේසයෙන් උදෙසීමට පැමිණේ යැ යත් : තෙවන උද්දේසයෙන් උදෙසීමට පැමිණේ.

සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙහි කිනම් විපත්තියෙකැ යත් : ශීලවිපත්ති යි.

සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙහි කිනම් ආපත්තිස්කන්ධයෙකැ යත් : සඞඝාදිශෙෂාපත්තිස්කන්ධ යි.

ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨාතීති: ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති -පෙ- කෙනාහතන්ති: පරම්පරාහතං.

උපාලි දාසකො චෙව-පෙ-පිටකං තම්බපණ්ණියාති.

2. චොරිං වුට්ඨාපෙන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී චොරිං වුට්ඨාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො· සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

3. එකාය ගාමන්තරං ගච්ඡන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී එකාව ගාමන්තරං ගච්ඡි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති තිස්සො අනුපඤ්ඤත්තියො. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: පඨමපාරාජිකෙ-පෙ-

4. සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථු සාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, ධුරනික්ඛෙපෙ-පෙ-

5. අවස්සුතාය භික්ඛුනියා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: සුන්දරීනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සුන්දරීනන්දා භික්ඛුනී අවස්සුතා අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ආමිසං පටිග්ගණ්හෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, පඨමපාරාජිකෙ-පෙ-

---

1. එකා - මජ්ඣං.

Free Distribution www.aathaapi.org

සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි කෙතෙක් සමුට්ඨානයෙන් නඟී යැ යත් : සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . . කවුරුන් විසින් ගෙණ එන ලද යැ යත් : පරපුරෙන් ගෙණ එන ලදී.

උපාලි ස්ථවිර යැ, දසක ස්ථවිර යැ, . . . විනය පිටකය තඹපැන් නම් වූ හෙළදිව්හි පැවසූහු.

2. සොරක උපසපන් කරවන්නිය පිළිබඳ සඟවෙසෙස කොතැන්හි දී පණවන ලද යැ යත් : සැවැත්නුවර දී පණවන ලදි. කවරක ඇරැබ ද යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ සොරක උපසපන් කරවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නඟියි, කයින් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

3. එකලා වැ අන් ගමකට යන මෙහෙණ පිළිබඳ සඟවෙසෙස කොතැන්හි දී පණවන ලදද යත් : සැවැත්නුවර දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් හුදෙකලා වූවා ම අන් ගමකට ගියා යැ, ඒ වස්තුයෙහි යැ, පඤ්ඤත්ති එකකැ. අනුපඤ්ඤත්ති තුණකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : පඨමපාරාජික සමුට්ඨානයෙන් නඟී. . . .

4. සමගසඟුන් විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් උඛෙවුනීකම් කරණ ලද මෙහෙණකට කාරකසඞ්ඝයා නො විචාරා එම කාරකගණයාගේ අදහස නො දැන ඔසාරණකම් කරන්නිය පිළිබඳ සඟවෙසෙස කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ සමගසඟුන් විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් උඛෙවුනීකම් කරණ ලද මෙහෙණක කාරකසඞ්ඝයා නො විචාරා එම කාරක ගණයාගේ අදහස නො දැන ඇතුළත් කරගත, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

5. මෙවුන්දම්රායෙන් තෙත් වූ මෙහෙණක විසින් මෙවුන්දම්රායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අතින් කැයුතු දෑයක් හෝ බිදියයුතු දෑයක් හෝ සියතින් පිළිගෙණ වළඳකරණ මෙහෙණ පිළිබඳ සඟවෙසෙස කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ, යත් : සුන්දරීනන්ද භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සුන්දරීනන්ද මෙහෙණ මෙවුන්දම්රායෙන් තෙත් වූවා මෙවුන්දම්රායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අතින් අහරක් පිළිගත, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : පඨමපාරාජිකසමුට්ඨානයෙහි යැ. . . .

6. "කිං තෙ අය්‍යෙ, එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා, යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ, යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා, තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා, භුඤ්ජ වා"ති උය්‍යොජෙන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරා භික්ඛුනී "කිං තෙ අය්‍යෙ, එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ, යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා. තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා, භුඤ්ජ වා"ති උය්‍යොජෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති ඡන්නං ආපත්ති සමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති පෙ-.

7. කුපිතාය අනත්තමනාය භික්ඛුනියා යාවතතියං සමනුභාසනාය නපටිනිස්සජන්තියා[1] සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : චණ්ඩකාළී භික්ඛුනී කුපිතා අනත්තමනා එවං අවච "බුද්ධං පච්චාචික්ඛාමි, ධම්මං පච්චාචික්ඛාමි, සඞ්ඝං පච්චාචික්ඛාමි, සික්ඛං පච්චාචික්ඛාමී"ති, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති ධුරනික්ඛෙපෙ -පෙ-.

8. කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතාය භික්ඛුනියා යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : චණ්ඩකාළී භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච "ඡන්දගාමිනියො ච භික්ඛුනියො දොසගාමිනියො ච භික්ඛුනියො මොහගාමිනියො ච භික්ඛුනියො භයගාමිනියො ච භික්ඛුනියො"ති, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, ධුරනික්ඛෙපෙ-පෙ-

9. සංසට්ඨානං භික්ඛුනීනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජන්තීනං සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛුනියො සංසට්ඨා විහරිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, ධුරනික්ඛෙපෙ -පෙ-

1. නප්පටිනිස්සජ්ජන්තියා - මජසං.

6. " ආයුෂ්මව, තෙලෙ පුරුෂපුද්ගල මෙවුන්දම්රායෙන් තෙත් වූයේ හෝ නො තෙත් වූයේ හෝ තිට කුමක් කරන්නේ ද, යම්හෙයකින් තෝ මෙවුන්දම්රායෙන් නොතෙත් වූයෙහි ද, එබැවින් ආයුෂ්මව, තෙලෙ පුරුෂපුද්ගල යම් කැයුතු දූයක් හෝ බිදියයුතු දූයක් හෝ තිට දේ ද, එය තෝ සියතින් පිළිගෙණ කව හෝ වළඳව හෝ " යි යොදවන මෙහෙණ පිළිබඳ සභවෙසෙස කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තු යෙකැ යත් : එක්තරා මෙහෙණක් " ආයුෂ්මව, " තෙලෙ පුරුෂපුද්ගල මෙවුන්දම්රායෙන් තෙත් වූයේ හෝ නො තෙත් වූයේ හෝ තිට කුමක් කරන්නේ ද, යම්හෙයකින් තෝ මෙවුන්දම්රායෙන් නො තෙත් වූයෙහි ද, එබැවින් ආයුෂ්මව, තෙලෙ පුරුෂ පුද්ගල යම් කැයුතු දූයක් හෝ බිදිය යුතු දූයක් හෝ තිට දේ නම් එය තෝ සියතින් පිළිගෙණ කව හෝ වළඳව හෝ "යි යෙදවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි. . . .

7. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හරිණ කිපියා වූ නොසියමන් වූ මෙහෙණ පිළිබඳ සභවෙසෙස කොතැන්හි පණවනලද යැ යත් : සැවැතෙහි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : චණ්ඩකාළි භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : චණ්ඩකාළි මෙහෙණ කිපියා නොසියමන් වූවා " බුදුන් ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙමි, ධර්මය ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙමි, සඞ්ඝයා ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙමි, ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යාන කෙරෙමි " යි මෙසේ කිවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි. ධුරනික්ෂෙපයෙහි යැ. . . .

8. (සිවු අධිකරණයන් අතුරෙන්) කිසියම් අධිකරණයෙක්හි පැරැද වූ තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හරිණ මෙහෙණක පිළිබඳ සභවෙසෙස කොතැන්හිදි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : චණ්ඩකාළි භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : චණ්ඩකාළි මෙහෙණ කිසියම් අධිකරණයෙක්හි පරදවන ලද්දී කිපියා නොසියමන් වූවා " භික්ෂුණීහු ඡන්ද යෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු ද්වෙෂයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු මෝහයෙනුදු අගතියට ගියාහු යැ, භික්ෂුණීහු භයෙනුදු අගතියට ගියාහු " යි මෙසේ කිවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

9. (නුසුදුසු කායවාක් ප්‍රයොගයෙන්) ගිහි මිනිසුන් හා එක් වූ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හරිණ මෙහෙණන් පිළිබඳ සභවෙසෙස කොතැන්හිදි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ, කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු ගිහි මිනිසුන් හා නුසුදුසු කායවාක් ප්‍රයෝගයෙන් එක්වැ විසූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

10. "සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ. මා තුම්හෙ නානා විහරථා"ති[1] උය්‍යොජෙන්තියා යාවතතියං සමනුභාසනාය නප්පටි-නිස්සජ්ජන්තියා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති : සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති : ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ථුල්ලනන්දා භික්ඛුනී "සංසට්ඨාව අය්‍යෙ තුම්හෙ විහරථ, මා තුම්හෙ නානා විහරථා"ති උය්‍යොජෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති; ධුරනික්ඛෙපෙ -පෙ-

දස සඞ්ඝාදිසෙසා නිට්ඨිතා.

---

තස්සුද්දානං :

උස්සය චොරී ගාමන්තරං[2] උක්ඛිත්තං බාදනෙන ච,
කිං තෙ කුපිතා කිස්මිචි[3] සංසට්ඨා ඤායතෙ දසාති.

---

## 1.3

## නිස්සග්ගියකණ්ඩා

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන පත්තසන්නිචයං කරොන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ඡබ්බග්ගියා භික්ඛුනියො පත්තසන්නිචයං අකංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති, කඨිනකෙ -පෙ-

2. අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ථුල්ලනන්දා භික්ඛුනී අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති, ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති, -පෙ-

---

1. විහරිත්ථාති - මජසං.
2. ගාමන්තං - මජසං
3. කිස්මිංචි - ම.ජ.සං.

10. "ආයර්‍යාවෙනි, තෙපි ගිහි මිනිසුන් හා එක්ව ම වසවු, තෙපි වෙන් ව නොවසවු" යි මෙහෙයවන්නාවූ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (ලබ්ධිය) නො හරිණ මෙහෙණ පිළිබඳ සඟවෙසෙස කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : චුල්ලනන්දා භික්ෂුණිය ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : චුල්ලනන්දා මෙහෙණ "ආයර්‍යාවෙනි, තෙපි ගිහියන් හා එක්ව ම වසවු, වෙන් ව නො වසවු" යි මෙහෙයවූවා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි, සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

දස සඟ වෙසෙස් නිමි.

---

එහි වස්තු නාමාවලිය :

උස්ස යැ චොරී යැ ගාමන්තර යැ ඛාදන ය සමගඋක්ඛිත්ත යැ කිංතෙ යැ කුපිතා යැ කිස්මිංචි යැ සංසට්ඨදෙක යැ යි දසසිඛය දන්නා ලැබෙ.

---

## 1.3

## නිසසග්ගිය කාණ්ඩය

1. සිකපද පැණවීමෙහි කල් දක්නා වූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් (ඉටන් පොහෝනා) පාත්‍රයක් නො ඉටා නො විකපා එක දවසකුදු තබා ගන්නා මෙහෙණ පිළිබඳ නිසගි පචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවගමෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සවගමෙහෙණහු (නො ඉටා නො විකපා) පාත්‍ර රැස් කොට තබාගත්හ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි, සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනක සමුට්ඨානයෙහි යැ. . . .

2. අකාලචීවරයක් කාලචීවරයැ යි ඉටා බෙදවන මෙහෙණ පිළිබඳ නිසගි පචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ අකාලචීවරය කාලචීවර යැයි ඉටා බෙදවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

3. මෙහෙණක හා සමග සිවුරක් පෙරැළි කොට ගෙණ (පසුව) අසිදගන්නා මෙහෙණ පිළිබඳ නිසගිපචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්ද මෙහෙණ මෙහෙණක හා සමග සිවුරක් පෙරැළි කොට ගෙණ (පසුව) අසිද ගත්තා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟී. . . .

4. අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති, -පෙ-

5. අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සම්බහුලා භික්ඛුනියො ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙසුං තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

7. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සම්බහුලා භික්ඛුනියො ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8 අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සම්බහුලා භික්ඛුනියො ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

9 අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : සම්බහුලා භික්ඛුනියො අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. අනෙකක් විනවා (එය තබා) අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසගි පචිතිය කොතැන්හි දී පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ තොමෝ අනෙකක් විනවා (එය තබා) අනෙකක් විනවූ යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨානසයෙන් ම නඟී. . . .

5. අනෙකක් දන්වා (එය තබා) අනෙකක් දන්වන මෙහෙණ පිළිබඳ නිසගි පචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ අනෙකක් දන්වා (එය තබා) අනෙකක් දන්වූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

6. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිතිය කොතැන්හි දී පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තු යෙකැ යත් : බොහෝ මෙහෙණහු අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් විනවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

7. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් තමන් ඉල්ලා ගත් දෙයින් අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිතිය කොතැන්හි දී පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් තමන් විසින් ඉල්ලා ගත් දෙයින් අනෙකක්හු විනවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨානසයෙන් ම නඟී. . . .

8. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තු යෙකැ යත් : බොහෝ මෙහෙණහු අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් විනවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

9. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් තමා ඉල්ලා ගත් දෙයින් අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිතිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් තමන් ඉල්ලා ගත් දෙයින් අනෙකක් විනවූහ, ඒ වස්තු යෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

10. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

11. අතිරෙකචතුක්කංසපරමං ගරුපාපුරණං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී රාජානං කම්බලං විඤ්ඤාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

12. අතිරෙකඅඩ්ඪතෙය්‍යකංසපරමං ලහුපාපුරණං චෙතාපෙන්තියා නිස්සග්ගියං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී රාජානං ඛොමං විඤ්ඤාපෙසි, තස්මිං වත්ථුස්මිං එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

ද්වාදස නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා

---

තස්සුද්දානං:

පත්තං අකාලං කාලඤ්ච පරිවත්තෙන ච විඤ්ඤාපෙ,
චෙතාපෙත්වා අඤ්ඤදත්ථි සඞ්ඝිකඤ්ච මහාජනිකං,
සඤ්ඤාචිකා පුග්ගලිකා චතුක්කංසඩ්ඪතෙය්‍යකාති.

---

## 1.4

## පාචිත්තිය කණ්ඩො

### 4.1

1. යං තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන ලසුණං ඛාදන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී න මත්තං ජානිත්වා බහුං ලසුණං හරාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති, එළකලොමකෙ -පෙ-

10. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් පුහුල්සතු පිරිකරින් තමා ඉල්ලා ගත් දැයින් අනෙකක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්ද මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් පුහුල්සතු පිරිකරින් තමා ඉල්ලා ගත් දැයින් අනෙකක් විනවූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

11. සොළොස් කහවණුවකට වඩා අගනා (ශීත කාලයෙහි පොරෝණා) ගරු පාපුරණයක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟි පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ කොසොල් රජුගෙන් පලසක් විනවූ යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

12. කහවණු දසයකට වඩා අගනා (උෂ්ණකාලයෙහි පොරෝණා) ලුහුපාපුරණයක් විනවන මෙහෙණ පිළිබඳ නිසඟිපචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ කොසොල් රජුගෙන් කොමුපිළියක් විනවූ යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

දෙළොස් නිසඟිපචිති නිමි.

එහි වස්තු නාමාවලිය

පාත්‍ර යැ, අකාල යැ, කාල යැ, පරිවර්තන යැ, විඤපන යැ, චෙතාපන යැ, අඤ්ඤ දත්තික යැ, සඞ්ඝික යැ, මහාජනික යැ, සංයාචිත යැ, පුග්ගලික යැ, චතුක්කංසපරම යැ, අඩ්ඪතෙය්‍ය කංසපරම යැයි සිකපද දෙළොසෙකි.

## 1.4
## පාචිත්තිය කාණ්ඩය

### 4.1

1. සිකපද පැණවීමෙහි කල් දන්නාවූ සිකපද පැණවීමෙහි කරුණු දක්නා වූ ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් ලුහුණු අනුභව කරණ මෙහෙණ පිළිබඳ යම් පචිති සිඛයෙක් පණවනලද නම් එය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ පමණ නො දන බොහෝ ලුහුණු ගෙන්වූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමක සමුට්ඨානයෙනි. . . .

2. සම්බාධෙ ලොමං සංහරාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො සම්බාධෙ ලොමං සංහරාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. තලඝාතකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ද්වෙ භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ද්වෙ භික්ඛුනියො තලඝාතකං අකංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති පඨමපාරාජිකෙ -පෙ-

4. ජතුමට්ඨකෙ පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී ජතුමට්ඨකං ආදියි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, පඨමපාරාජිකෙ -පෙ-

5. අතිරෙකද්වඞ්ගුලපබ්බපරමං උදකසුද්ධිකං ආදියන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සක්කෙසු පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී අතිගම්භීරං උදකසුද්ධිකං ආදියි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති, පඨම පාරාජිකෙ -පෙ-

6. භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන ච විධූපනෙන ච උපතිට්ඨි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ -පෙ-.

7. ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා[2] තිරොකුට්ටෙ වා තිරොපාකාරෙ වා ඡඩ්ඩෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී උච්චාරං තිරොකුට්ටෙ තිරොපාකාරෙ ඡඩ්ඩෙසි[1] තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

---

1. තිරොකුට්ටෙ ඡඩ්ඩෙසි - මජසං.

2. සම්බාධස්ථානයෙහි ලොම් බැහැර කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොහි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණහු සම්බාධස්ථානයෙහි ලොම් හැරවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟී. . . .

3. තලගැටීමෙහි පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : මෙහෙණ දෙනමක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : මෙහෙණ දෙනමක් තලගැටුම් කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි. පඨම පාරාජික සමුට්ඨානයෙනි. . . .

4. ජතුමට්ටකයෙහි සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් ලතුයෙන් කළ මටදඬුවක් රහසෙහි ලූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨාන යෙකින් නඟියි : පඨම පාරාජික සමුට්ඨානයෙනි. . . .

5. අයිරා ඇඟුල් පුරුකකට වඩා උදකශුද්ධිය ගන්නා මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : ශාක්‍ය දනවුහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් දියෙන් පස මඟ ඉතා ගැඹුරු කොට දෙවාපූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟී. පඨමපාරාජික සමුට්ඨානයෙනි . . .

6. වළඳන මහණක්හට පැනින් හෝ විජිනියෙන් හෝ උවටැන් කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් වළඳන මහණක්හට පැනින් ද විජිනියෙන් ද උවැටන් කරමින් සිටියා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමකසමුට්ඨාන යෙනි. . . .

7. අමු ධාන්‍ය විනවා වළඳන මෙහෙණ පිළිබඳ පචිති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබයැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු අමුධාන්‍ය විනවා වැළඳූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟී. . . .

8. මල හෝ මූ හෝ කෙළ හෝ කසළ හෝ ඉඳුල් හෝ බිත්තියෙන් පිටත හෝ පවුරෙන් පිටත හෝ දමන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් මල බිත්තියෙන් පිටත දැමූ යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

9. උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා[1] හරිතෙ ඡඩ්ඩෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි හරිතෙ ඡඩ්ඩෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

9. නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගච්ඡන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රජගහෙ පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො නච්චම්පි ගීතම්පි වාදිතම්පි දස්සනාය අගමංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-

ලසුණවග්ගො පඨමො.

---

4.2

1 රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකාය සන්තිට්ඨන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. ථෙය්‍යසත්ථකෙ-පෙ-

2. පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකාය සන්තිට්ඨන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි, සමුට්ඨාති. ථෙය්‍යසත්ථකෙ-පෙ-.

3. අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකාය සන්තිට්ඨන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. ථෙය්‍යසත්ථකෙ-පෙ-.

4. රථියා[2] වා බ්‍යූහෙ වා සිඞ්ඝාටකෙ වා පුරිසෙන සද්ධිං එකෙනෙකාය සන්තිට්ඨන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී රථියාපි බ්‍යූහෙපි සිඞ්ඝාටකෙපි පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. ථෙය්‍යසත්ථකෙ-පෙ-

---

1. උච්චාරම්පි පස්සාවම්පි සඞ්කාරම්පි විඝාසම්පි (ඉතිපි)
2. රථිකාය - මජ්ඣං.

9. නිල් තණබිමෙකැ මල හෝ මූ හෝ කෙළ හෝ කසළ හෝ ඉඳුල් හෝ දමන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු නිල් තණ බිමෙහි මල ද මූ ද කෙළ ද කසළ ද ඉඳුල් ද දමූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන ෂයෙන්ම නඟී. . . ,

10. නටනු හෝ ගයනු හෝ වයනු හෝ දක්නා පිණිස යන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : රජගහ නුවර දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණහු නැටුම් ද ගැයුම් ද වැයුම් ද දක්නා පිණිස ගියහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළක ලොමක සමුට්ඨානයෙනි. . . .

පළමුවන ලසුණ වර්ග යි

---

(4.2)

1. පහන් නැති රෑ අඳුරෙහි එකලා මිනිස් පිරිමියක්හු හා එකලාව වෙතැ සිටින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි යැ යත් : එක්තරා මෙහෙණක් කිසිදු එළියක් නැති රෑ අඳුරෙහි එකලා පිරිමියක්හු හා එකලා ව ළං වැ සිටියා ය. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : ථෙය්‍යසත්ථකයෙහි ය. . . .

2. පිළිසන් පියසෙක්හි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ ළං වැ සිටින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී: කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් පිළිසන් පියසෙක්හි එකලා පිරිමියක්හු හා එකලා වැ ළං වැ සිටියා ය. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : ථෙය්‍යසත්ථකයෙහි යැ. . . .

3. එළිමහනෙහි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ ළං වැ සිටින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් එළිමහනෙහි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ ළං වැ සිටියා ය. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි. ථෙය්‍යසත්ථකයෙහි යැ. . . .

4. වීථියෙහි හෝ විනිවිද නො ගිය කුඩා වීථියෙහි හෝ සතර මංසන්ධියෙහි හෝ එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ වෙතැ සිටින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ වීථියෙහි ද විනිවිද නොගිය වීථියෙහි ද සතරමං සන්ධියෙහි ද එකලා මිනිස් පිරිමියක්හු හා එකලා ව වෙතැ සිටියා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි. ථෙය්‍යසත් ථකයෙහි යැ. . . .

16—සිම 17881 (7/78)

Free Distribution www.aathaapi.org

5. පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමන්තියා පාචිත්තියං කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කාමි, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ-පෙ-

6. පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ නිසීදන්තියා පාචිත්තියං කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ නිසීදි, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ-පෙ-

7. විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්‍ථරිත්වා වා සන්‍ථරාපෙත්වා වා අභිනිසීදන්තියා පාචිත්තියං කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්‍ථරිත්වා අභිනිසීදිංසු, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ-පෙ-

8. දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙන්තියා පාචිත්තියං කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙසි, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

9. අත්තානං වා පරං වා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපන්තියා පාචිත්තියං, කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං කං ආරබ්භාති: චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: චණ්ඩකාළී භික්ඛුනී අත්තානම්පි පරම්පි නිරයෙනපි බ්‍රහ්මචරියෙනපි අභිසපි, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-

10. අත්තානං වධිත්වා වධිත්වා රොදන්තියා පාචිත්තියං කත්‍ථ පඤ්ඤත්තන්ති: සාවත්‍ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්‍ථුස්මින්ති: චණ්ඩකාළී භික්ඛුනී අත්තානං වධිත්වා වධිත්වා රොදි, තස්මිං වත්‍ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ-පෙ-

රත්තන්ධකාරවග්ගො දුතියො.

5. පෙරබත්හි කුලයන්ට එළඹ ආසනයෙහි හිඳ හිමියන් නො පිළිවිස බැහැර යන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් පෙරබත්හි කුලයන්ට එළඹ ආසනයෙහි හිඳ හිමියන් නො පිළිවිස බැහැර ගියා ය. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනකයෙහි යැ. . . .

6. පසුබත්හි කුලයන්ට එළඹැ හිමියන් නො පිළිවිස ආසනයෙහි හිඳින මෙහෙණ පිළිබඳ පචිත්ති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ පසුබත්හි කුලයන්ට එළඹ හිමියන් නො පිළිවිස ආසන යෙහි හිඳගතු. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨාන යන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨානයෙනි.

7. විකාලයෙහි කුලයන්ට එළඹ හිමියන් නො පිළිවිස ශය්‍යාවක් අතුරා හෝ අතුරුවා හෝ හිඳින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තු යෙකැ යත් : බොහෝ මෙහෙණහු විකාලයෙහි කුලයන්ට එළඹ හිමියන් නො පිළිවිස ශය්‍යාවක් අතුරා හුන්හ. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි. කඨිනසමුට්ඨාන යෙනි. . . .

8. නපුරු කොට ගැණීමෙන් නපුරු කොට දැරීමෙන් මෙරමාහට අවමන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් නපුරු කොට ගැණීමෙන් නපුරු කොට දැරීමෙන් මෙරමාහට අවමන් කරවූ. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨාන යන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි. . . .

9. තමාට හෝ අන් උපසපන් මෙහෙණකට හෝ නිරයෙන් හෝ බඹසරින් හෝ සාපකරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබයැ යත් : චණ්ඩකාළි මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තු යෙකැ යත් : චණ්ඩකාළි මෙහෙණ තමහට ද අන් උපසපන් මෙහෙණකට ද නිරයෙන් ද බඹසරින් ද සාප කළා ය. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි. . . .

10. තමහට පැහැර හඬන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : චණ්ඩකාළි මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : චණ්ඩකාළි මෙහෙණ තමහට පැහැර පැහැර හැඬූ. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

දෙවන රත්තන්ධකාර වර්ග යි

(4.3)

1. නග්ගාය නහායන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො නග්ගා නහායිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ -පෙ-

2. පමාණාතික්කන්තං උදකසාටිකං කාරාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො අප්පමාණිකායො උදකසාටිකායො කාරෙසුං. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

3. භික්ඛුනියා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා නෙව සිබ්බෙන්තියා න සිබ්බාපනාය උස්සුක්කං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා චීවරං විසිබ්බාපෙත්වා නෙව සිබ්බෙසි, න සිබ්බාපනාය උස්සුක්කං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-

4. පඤ්චාහිකං සඞ්ඝාටිචාරං අතික්කාමෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො භික්ඛුනීනං හත්ථෙ චීවරං නික්ඛිපිත්වා සන්තරුත්තරෙන ජනපදචාරිකං පක්කමිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ -පෙ-

5. චීවරසඞ්කමනීයං ධාරෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී අඤ්ඤතරාය භික්ඛුනියා චීවරං අනාපුච්ඡා පාරුපි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ -පෙ-

6. ගණස්ස චීවරලාභං අන්තරායං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ගණස්ස චීවරලාභං අන්තරායං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

7. ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

(4.3)

1. නග්න වැ නහන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණෙහු නග්න වැ ස්නානය කළහ. ඒ වස්තුයෙහි යැ පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙනි. . . .

2. පමණ ඉක්මවූ දියසළුව කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණෙහු පමණ ඉක්මවූ දියසළු දැරූහ. ඒ වස්තුයෙහි ය. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නඟී. . . .

3. මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හැර හෝ ගෙත්තම් හරවා හෝ නොම ගෙත්තම් කරණ ගෙත්තම් කිරීමට වැයම් නො කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ මෙහෙණකගේ සිවුරක් ගෙත්තම් හරවා තොමෝ නොම ගෙත්තම් කළා ය. ගෙත්තම් කරවීමට ද වැයම් නොකළා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙප යෙහි යැ. . . .

4. පස් දවසක් පිරිබෝ කිරීම් විසින් හෝ අවගැස්සීම් විසින් හෝ සිවුරු පෙරළීම ඉක්මවන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවනලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තු යෙකැ යත් : බොහෝ මෙහෙණහු අත් මෙහෙණන් අතැ සිවුරු තබා අඳනය හා පොරෝණයෙන් යුතු වැ දනවු සැරිසැරීමට ගියහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨානයෙහි යැ. . . .

5. පෙරළා දියයුතු සිවුර දරණ මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවනලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් එක්තරා මෙහෙණකගේ සිවුරක් නො පිළිවිස පෙරවූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම්ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි: කඨිනසමුට්ඨානයෙහි යැ. . . .

6. මෙහෙණගණයාගේ චීවරලාභයට අනතුරු කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ මෙහෙණගණයාගේ චීවරලාභයට අනතුරු කළා යැ. ඒ වස්තුයෙහි යැ පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

7. දැහැමි සිවුරු බෙදීම වළකන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ දැහැමි සිවුරු බෙදීමක් වැළැක්කු. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

8. අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සමණචීවරං දෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සමණචීවරං අදාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

9. දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

10 ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ධම්මිකං කඨිනුද්ධාරං පටිබාහි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

නහානවග්ගො තතියො.

---

(4.4)

1. ද්වින්නං භික්ඛුනීනං එකමඤ්චෙ තුවට්ටෙන්තීනං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති; සම්බහුලා භික්ඛුනියො ද්වෙ එකමඤ්චෙ තුවට්ටෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකො -පෙ-

2. ද්වින්නං භික්ඛුනීනං එකත්ථරණපාපුරණෙ තුවට්ටෙන්තීනං පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ද්වෙ එකත්ථරණපාපුරණෙ තුවට්ටෙසුං. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළක-ලොමකො -පෙ-

3. භික්ඛුනියා සඤ්චිච්ච අඵාසුං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා සඤ්චිච්ච අඵාසුං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

4. දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙන්තියා න උපට්ඨාපනාය උස්සුක්කං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං

8. ගිහියකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට හෝ සිවුරක් දෙන මෙහෙණ පිළිබඳ පචිති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත්. ථුල්ලනන්දා මෙහෙණ ගිහියකුට සිවුරක් දුන. ඒ වස්තුයෙහි යැ: පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සයෙන් ම නගියි . . .

9. දුර්වල වූ චීවරාසායෙන් චීවරකාලසමය ඉක්මවන මෙහෙණ පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ දුර්වල වූ චීවරාසායෙන් චීවරකාලසමය ඉක්මවූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නගියි : . . .

10. දැහැමි කෙළින් සිවුර ඉදිරීම වළකන මෙහෙණ පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ දැහැමි කෙළින් සිවුර ඉදිරීම වැළකූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නගියි : . . .

**තුන්වන නහාන වර්ග යි.**

---

## (4.4)

1. එක් හැඳෙහි හොවින මෙහෙණන් දෙනමක් පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු දෙනම දෙනම එක ඇඳෙහි ශයනය කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි : එළකලොම සමුට්ඨානයෙහි. . . .

2. එක් ම ඇතිරි පොරෝනා ඇති යහන්හි හෝනා මෙහෙණන් දෙනමක් පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු දෙනම දෙනම එක් ම ඇතිරි පොරෝනා ඇති යහන්හි ශයනය කළහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නගියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

3. දැන දැන මෙහෙණක්හට නො පහසුබව කරණ මෙහෙණ පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ මෙහෙණක්හට දැන දැන නො පහසුබව කළා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නගියි : . . .

4. ගිලන් වූ සද්ධිවිහාරිණියකට නො ම උවැටන් කරණ උවැටන් කරවීමට වෑයම් නො කරණ මෙහෙණ පිළිබඳ පචිතිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම්

වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී දුක්ඛිතං සහජීවිනිං නෙව උපට්ඨෙසි. න උපට්ඨාපනාය උස්සුක්කං අකාසි. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති, ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුර-නික්ඛෙපෙ-පෙ-

5. භික්ඛුනියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනාය නික්කඩ්ඪ-න්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනියා උපස්සයං දත්වා කුපිතා අනත්තමනා නික්කඩ්ඪි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති.

6. සංසට්ඨාය භික්ඛුනියා යාවතතියං සමනුභාසනාය නප්පටි-නිස්සජ්ජන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: චණ්ඩකාළී භික්ඛුනී සංසට්ඨා විහරි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුර-නික්ඛෙපෙ-පෙ-

7. අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකාය චාරිකං චරන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අන්තොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකායො චාරිකං චරිංසු, තස්මිං වත්ථුස්මි. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති-සමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-

8. තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකාය චාරිකං චරන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති සම්බහුලා භික්ඛුනියො තිරොරට්ඨෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ අසත්ථිකායො චාරිකං චරිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-

9. අන්තොවස්සං චාරිකං චරන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අන්තොවස්සං චාරිකං චරිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨා-නානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-

10. වස්සං වුත්ථාය[1] භික්ඛුනියා චාරිකං න පක්කමන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො වස්සං වුත්ථා චාරිකං න පක්කමිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. පඨමපාරාජිකෙ -පෙ-.

තුවට්ටවග්ගො චතුත්ථො.

---

1. වස්සං වුට්ඨාය - මජසං.

වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ගිලන් වූ සද්ධිවිහාරිණියකට නො ම උවැටන් කළා යැ, උවැටන් කරවීමට වැයම් ද නො කළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

5. මෙහෙණක්හට නිවහනක් දී කිපී නො සතුටු සිත් ඇතිවැ (ඇය) ඉන් බැහැර කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් ; ථුල්ලනන්දා මෙහෙණ මෙහෙණක්හට නිවහනක් දී කිපී නො සතුටුසිත් ඇත්තී (ඇය) ඉන් බැහැර කළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

6. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි නො හරිණ ගිහිසසඟ ඇති මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවනලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී : කවරක ඇරැබ යැ යත් : චණ්ඩකාළි මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : චණ්ඩකාළි මෙහෙණ ගිහිසසඟ ඇති වැ වුසූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

7. සැක සහිත යැයි දන්නා ලද ප්‍රතිභය සහිත වූ තමා වසන රටතුළ සත්වාවන් නැතිවැ හැසිරෙණ මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු සැක සහිත යයි දන්නා ලද ප්‍රතිභය සහිත වූ තමන් වසන රටතුළ සත්වාවන් නැති වැ හැසුරුණාහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොම සමුට්ඨානයෙහි යැ. . . .

8. සැක සහිත යැ යි දන්නාලද ප්‍රතිභය සහිත වූ අන්රටක සත්වාවන් නැතිවැ හැසිරෙණ මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු සැක සහිතයයි දන්නාලද ප්‍රතිභය සහිත වූ අන්රටෙක සත්වාවන් නැති ව හැසුරුණාහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොම සමුට්ඨානයෙහි යැ. . . .

9. වස්කාලය තුළ සැරිසරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : රජගහනුවර දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු වස්කාලය තුළ සැරිසැරූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

10. සැරිසැරීමට නො යන වුසූවස් ඇති මෙහෙණ පිළිබඳ පචිත්තිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : රජගහනුවර දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු වුසූවස් ඇති යාහු නො සැරිසැරූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන එකෙකින් නඟියි : පඨමපාරාජිකසමුට්ඨානයෙහි යැ. . . .

සිවුවන තුවට්ට වර්ග යි.

---

4.5

1. රාජාගාරං වා චිත්තාගාරං වා ආරාමං වා උය්‍යානං වා පොක්ඛරණිං වා දස්සනාය ගච්ඡන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති . ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො රාජාගාරම්පි චිත්තාගාරම්පි දස්සනාය අගමංසු. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති එළකලොමකෙ-පෙ-.

2. ආසන්දිං වා පල්ලඞ්කං වා පරිභුඤ්ජන්තියා පාචිත්තියං, කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ආසන්දිම්පි පල්ලඞ්කම්පි පරිභුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

3. සුත්තං කන්තන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො සුත්තං කන්තිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති එළකලොමකෙ-පෙ-.

4. ගිහිවෙය්‍යාවච්චං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ගිහිවෙය්‍යාවච්චං අකංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

5. භික්ඛුනීහි[1] 'එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී'ති වුච්චමානාය සාධූති පටිස්සුත්වා[2] නෙව උපසමෙන්තියා න උපසමාය උස්සුක්කං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී භික්ඛුනීහි 'එහය්‍යෙ ඉමං අධිකරණං වූපසමෙහී, ති වුච්චමානා සාධූති පටිස්සුත්වා නෙව උපසමෙසි, න උපසමාය උස්සුක්කං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ-පෙ-.

6. අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී අගාරිකස්ස සහත්ථා ඛාදනීයම්පි භොජනීයම්පි අදාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

---

1. භික්ඛුනියා - මජසං.
2. පටිස්සුණිත්වා - මජසං.

4.5

1. රජුගේ ක්‍රීඩාගාරයක් හෝ චිත්‍රාගාරයක් හෝ උපවනයක් හෝ ක්‍රීඩොද්‍යානයක් හෝ ක්‍රීඩා පුෂ්කරිණියක් හෝ දක්නට යන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මෙහෙණහු රජුගේ ක්‍රීඩාගාරය ද චිත්‍රාගාරය ද දැකීමට ගියහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨාන යෙහි යැ. . . .

2. දික්හඟලාපුටුවක් හෝ පාදයෙහි ව්‍යාලරූප නඟා කළ පලගක් හෝ පිරිබෝ කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තු යෙක්හි ද යත් : බොහෝ මෙහෙණෝ දික්හඟලා පුටුව ද පලඟ ද පිරිබෝ කළහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

3. හූ කටින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මෙහෙණහු හූ කැටූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

4. ගිහියනට මෙහෙවර කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු ගිහියනට මෙහෙවර කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

5. මෙහෙණන් විසින් "එව ආය්‍යාව, මේ අධිකරණය සන්හිඳුවන්නැ" යි කියනු ලබන කල්හි "මැනැවැ" යි ගිවිස නො ම සන්සිඳුවන සන්හිඳුවීමට වෑයම් නොකරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තු යෙකැ යත් : ථුල්ලනන්දා මෙහෙණ මෙහෙණන් විසින් "එව ආය්‍යාව, මේ අධිකරණය සන්හිඳුවන්නැ" යි කියනු ලබන්නී මැනැවැයි ගිවිස නො සන්හිඳවූ යැ සන්හිඳුවීමට වෑයම් ද නො කළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂේප යෙහි යැ. . . .

6. ගිහියකුට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට හෝ සියතින් කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ දෙන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ සියතින් ගිහියකුට කැයුතු දය ද බිදියයුතු දය ද දුන. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ.

7. ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ආවසථ-චීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජි. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ -පෙ-

8. ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමි. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ -පෙ-

9. තිරච්ඡානවිජ්ජං පරියාපුණන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං පරියාපුණිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති පදසොධම්මෙ -පෙ-

10. තිරච්ඡානවිජ්ජං වාචෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො තිරච්ඡානවිජ්ජං වාචෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති, පදසොධම්මෙ -පෙ-

චිත්තාගාරවග්ගො පඤ්චමො.

---

(4.6)

1. ජානං සභික්ඛුකං ආරාමං අනාපුච්ඡා පවිසන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අනාපුච්ඡා ආරාමං පවිසිංසු, තස්මිං වත්ථුස්මිං එකා පඤ්ඤත්ති. ද්වෙ අනුපඤ්ඤත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-.

2. භික්ඛුං අක්කොසන්තියා පරිභාසන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: වෙසාලියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආයස්මන්තං උපාලිං අක්කොසිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

3 චණ්ඩිකතාය ගණං පරිභාසන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී චණ්ඩිකතාය ගණං පරිභාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

7. අවස් සිවුරක් නො දී පිරිබෝ කරණ මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ අවස් සිවුරක් නො දී පිරිබෝ කළා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨාන යෙහි යැ. . . .

8. (දෙරකවුළු තැබූ) සෙනස්නක් (රක්නා පිණිස) නො දී සැරිසැරීමට යන මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ල නන්දා මෙහෙණ (දෙර කවුළු තැබූ) සෙනස්නක් (රක්නා පිණිස) නො දී සැරි සැරීමට ගියා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨාන යන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨානයෙහි යැ. . . .

9. තිරශ්චීනවිද්‍යාව පුහුණු කරණ මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමෙහෙණහු තිරශ්චීනවිද්‍යාව පුහුණු කළහු, ඒ වස්තුයෙහි යැ, පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : පදසොධම්මසමුට්ඨානයෙහි යැ. . . .

10. තිරශ්චීන විද්‍යාව හදරවන මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමෙහෙණහු (පරූපඝාතක) තිරශ්චීන විද්‍යාව හැදෑරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : පදසොධම්මසමුට්ඨානයෙහි යැ. . . .

පස්වන චිත්තාගාරවර්ග යි.

---

## 4.6

1. දන දන මහණුන් ඇති අරමකට නො පිළිවිස පිවිසෙන මෙහෙණ පිළිබඳ පචිත්ති සිය කොතැන්හි පණවනලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු නො පිළිවිස අරමකට පිවිසියහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති දෙකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

2. මහණක්හට ආක්‍රොශ කරණ අවමන් කරණ මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : විසල් පුරයෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමෙහෙණහු ආයුෂ්මත් උපාලි තෙරුන්ට අක්‍රොශ කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

3. සැඩ බැවින් යුතු වැ මෙහෙණ ගණයාහට අවමන් කරණ මෙහෙණ පිළිබඳ පචිත්තියිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ සැඩ බැවින් යුතු වැ මෙහෙණගණයාහට අවමන් කළා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

4. නිමන්තිතාය වා පවාරිතාය වා ඛාදනීයං වා භොජනීයං වා අඤ්ඤත්‍ර භුඤ්ජන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො භුත්තාවිනියො පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

6. කුලං මච්ඡරායන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී කුලං මච්ඡරායි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

6 අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති එළකලොමකෙ -පෙ-

7. වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි නපවාරෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො වස්සං වුත්ථා භික්ඛුනීසඞ්ඝෙ[1] නපවාරෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-

8. ඔවාදාය වා සංවාසාය වා න ගච්ඡන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සක්කෙසු පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවාදං න ගච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. පඨමපාරාජිකෙ -පෙ-

9. උපොසථම්පි න පුච්ඡන්තියා ඔවාදම්පි න යාචන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො උපොසථම්පි න පුච්ඡිංසු, ඔවාදම්පි න යාචිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-

---

1. භික්ඛුසඞ්ඝෙ - ම.ඡ.සං. 2. රුඛිතං - ම.ඡ.සං.

4. කැයුතු දැයක් හෝ බිදියයුතු දැයක් හෝ අකැප නිමන්ත්‍රණයෙන් නිමන්ත්‍රණය කරණ ලදුව හෝ පවරණ ලදුව හෝ අන් තැනෙක්හි වළඳන මෙහෙණ පිළිබඳ පචිත්ති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු වළඳා නිමියාහු පවරණ ලද්දාහු අන් තැනෙකැ වැළඳුහු. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟියි : . . .

5. කුලමසුරුබව කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මෙහෙණක් කුලමසුරුවූවා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

6. මහණුන් නැති ආවාසයෙහි වස් වසන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මහණුන් නැති ආවාසයෙහි වස් විසූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨාන යෙහි යැ. . . . .

7. උභතො සඞ්ඝයා කෙරෙහි දිට්ඨ සුත පරිසඞ්කිත යන කරුණු තුණින් නො පවරන්නා වූ වස් විසූ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු වස් විසූවාහු භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි නො පැවරූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

8. අවවාද අසනු පිණිස හෝ පොහෝ පවුරුණු විචාරණු පිණිස හෝ නො යන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : ශාක්‍ය දනවුහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමෙහෙණහු අවවාද අසන්නට නො ගියහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : පඨම පාරාජිකසමුට්ඨානයෙහි යැ. . . .

9. පෙහෙවස් දිනය නො විචාරන්නාවූ ද අවවාදය නො යදින්නා වූ ද මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහි දී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු පෙහෙවස් දිනය ද නො පිළිවිසියහ, අවවාදය ද නො යැදූහ, ඒ වස්තු යෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

10. පසාඛෙ ජාතං ගණ්ඩං වා රුහිතං වා අනපලොකෙත්වා සඞ්ඝං වා ගණං වා පුරිසෙන සද්ධිං එකෙනෙකාය භෙදාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී පසාඛෙ ජාතං ගණ්ඩං පුරිසෙන සද්ධිං එකෙනෙකා භෙදාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කඨිනකෙ -පෙ-.

### ආරාමවග්ගො ඡට්ඨො

---

(4·7)

1. ගබ්භිනිං වුට්ඨාපෙන්තියා පාචිත්තියං, කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ගබ්භිනිං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

2. පායන්තිං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පායන්තිං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

3 ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

4. ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සික්ඛමානං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

5. ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං, කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ඌනද්වාදසවස්සං ගිහිගතං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

10. යට්කය පෙදෙසෙහි හටගත් ගඩක් හෝ වණයක් හෝ මෙහෙණසඟහු හෝ මෙහෙණ ගණයා හෝ නො පිළිවිස එකලා පුරුෂයක්හු හා එකලා වැ බිඳුවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මෙහෙණක් යට්කය පෙදෙසෙහි හටගත් ගඩක් එකලා පුරුෂයක්හු හා එකලා වැ බිඳවූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨානයෙහි යැ.

සවන ආරාම වර්ග යි.

---

(4.7)

1. ගැබිනියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු ගැබිනියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

2. කිරි පොවන්නිය උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු කිරි පොවන්නිය උපසපන් කරවූහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

3. දෙවසක් සවැදැරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති සික්ඛමානාව උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු දෙවසක් සවැදැරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති හික්මනුව උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

4. මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද්ද වූ දෙවසක් සවැදැරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති සික්ඛමානාව උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද්දවූ දෙවසක් සවැදැරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති හික්මනුව උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

5. ගිහිගත පැමිණි නො පිරිපුන් දොළොස්වස් ඇතියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිතිසිධය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු ඌනදොළොස්වස් ඇති පුරිසන්තරගත වූවක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

17-සිප 17881 (7/75)

6. පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං, කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

7. පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සං ගිහිගතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-

8. සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගණ්හන්තියා න අනුග්ගණ්හාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා ද්වෙ වස්සානි නෙව අනුග්ගහෙසි, න අනුග්ගණ්හාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-

9. වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො වුට්ඨාපිතං පවත්තිනිං ද්වෙ වස්සානි නානුබන්ධිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. පඨමපාරාජිකෙ -පෙ-.

10. සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙන්තියා න වූපකාසාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති; සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති; ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව වූපකාසෙසි, න වූපකාසාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ -පෙ-.

ගබ්භිනිවග්ගො සත්තමො

Free Distribution www.aathaapi.org

6. දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති පුරිසන්තරගත පිරිපුන් දොළොස්වස් ඇතියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ, කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති පුරිසන්තරගත පිරිපුන් දොළොස්වස් ඇතියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

7. මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති පුරිසන්තරගත පිරිපුන් දොළොස්වස් ඇතියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති පුරිසන්තරගත පිරිපුන් දොළොස්වස් ඇතියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

8. සද්ධිවිහාරිණිය උපසපන් කරවා දෙවසක් (උද්දෙසදානාදීන්) සඞ්ග්‍රහ නො කරණ අනුන් ලවා සඞ්ග්‍රහ නො කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : චුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : චුල්ලනන්දා මෙහෙණ සද්ධිවිහාරිණියක උපසපන් කරවා දෙවසක් නො ම සඞ්ග්‍රහ කළා යැ. අනුන් ලවා ද සඞ්ග්‍රහ නො කරවූ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

9. තමා උපසපන් කරවූ උපාද්ධ්‍යාය භික්ෂුණියට දෙවසක් උවටැන් නො කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු තමන් උපසපන් කරවූ උපාද්ධ්‍යාය භික්ෂුණියට දෙවසක් උවටැන් නො කළාහුයැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : පඨමපාරාජිකසමුට්ඨාන යෙහි. . . .

10. සද්ධිවිහාරිණිය උපසපන් කරවා තමා කැඳවා ගෙණ නො යන කැඳවා ගෙණ යැමට අනෙකක්හට නියොග නො කරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : චුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : චුල්ලනන්දා මෙහෙණ සද්ධිවිහාරණිය උපසපන් කරවා නො ම කැඳවා ගෙණ ගියා යැ, කැඳවා ගෙණ යනු පිණිස අනුන්ට නියොග ද නො කළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

සත්වන ගබ්භිනී වර්ග යි.

4.8

1. ඌනවීසතිවස්සං කුමාරිභූතං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ඌනවීසතිවස්සං කුමාරිභූතං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

2. පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං වුට්ඨාපෙසුං. තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

3. පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පරිපුණ්ණවීසතිවස්සං කුමාරිභූතං ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඞ්ඝෙන අසම්මතං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

4. ඌනද්වාදසවස්සාය වුට්ඨාපෙන්තියා පාචිත්තියං, කත්ථපඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ඌනද්වාදසවස්සං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

5. පරිපුණ්ණද්වාදසවස්සාය සඞ්ඝෙන අසම්මතාය වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො පරිපුණ්ණද්වාදසවස්සා සඞ්ඝෙන අසම්මතා වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

6. 'අලං තාව තෙ අය්යෙ වුට්ඨාපිතෙනා'ති වුච්චමානාය සාධූති පටිස්සුණිත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: චණ්ඩකාළී භික්ඛුනී 'අලං තාව තෙ අය්යෙ වුට්ඨාපිතෙනා'ති වුච්චමානා සාධූති පටිස්සුණිත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

## 4.8

1. උනු විසිවස් ඇති කුමරියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු උනුවිසිවස් ඇති කුමරියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහියැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

2. දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති පිරිපුන් විසිවස් ඇති කුමරියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි නො හික්මුනු සිඛ ඇති පිරිපුන් විසිවස් ඇති කුමරියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

3. මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති පිරිපුන් විසිවස් ඇති කුමරියක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබයැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද දෙවසක් සවැදෑරුම් ධර්මයන්හි හික්මුනු සිඛ ඇති පිරිපුන් විසිවස් ඇති කුමරියක උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

4. උනුදොළොස්වස් ඇති වැ උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු උනුදොළොස්වස් ඇති වැ උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

5. මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණලදු වැ පිරිපුන් දොළොස්වස් ඇති වැ උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදී. කවරක ඇරැබයැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මෙහෙණ සඟුන් විසින් සම්මත නො කරණ ලද්දහු පිරිපුන් දොළොස්වස් ඇත්තාහු උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි. . . .

6. ආයඖාවනි, තොප විසින් උපසපන් කරවීමෙන් කම් නැතැයි කියනු ලබන්නී මැනැවැයි ගිවිස පසුව දොස් පහළ කරණ බවට පැමිණෙන මෙහෙණ පිළිබඳ පචිත්ති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : චණ්ඩකාළි මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : චණ්ඩකාළි මෙහෙණ '' ආයඖාවනි, තොප විසින් උපසපන් කරවීමෙන් කම් නැතැ '' යි කියනු ලබන්නී '' මැනැවැ ''යි ගිවිස පසුව දොස් පහළ කරණ බවට පැමිණියා යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

7. සික්ඛමානං 'සචෙ මෙ ත්වං අය්යෙ චීවරං දස්සසි, එවාහං තං වුට්ඨාපෙස්සාමී'ති වත්වා නෙව වුට්ඨාපෙන්තියා න වුට්ඨාපනාය උස්සුක්කං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං 'සචෙ මෙ ත්වං අය්යෙ චීවරං දස්සසි, එවාහං තං වුට්ඨාපෙස්සාමී'ති වත්වා නෙව වුට්ඨාපෙසි, න වුට්ඨාපනාය උස්සුක්කං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ-පෙ-.

8. සික්ඛමානං 'සචෙ මං ත්වං අය්යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි එවාහං තං වුට්ඨාපෙස්සාමී'ති වත්වා නෙව වුට්ඨාපෙන්තියා න වුට්ඨාපනාය උස්සුක්කං කරොන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී සික්ඛමානං 'සචෙ මං ත්වං අය්යෙ ද්වෙ වස්සානි අනුබන්ධිස්සසි, එවාහං තං වුට්ඨාපෙස්සාමී'ති වත්වා නෙව වුට්ඨාපෙසි, න වුට්ඨාපනාය උස්සුක්කං අකාසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති. ධුරනික්ඛෙපෙ-පෙ-.

9. පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිං සොකාවස්සං [1]සික්ඛමානං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී පුරිසසංසට්ඨං කුමාරකසංසට්ඨං චණ්ඩිකං සොකාවස්සං සික්ඛමානං වුට්ඨාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

10. මාතාපිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී මාතාපිතූහිපි සාමිකෙනපි අනනුඤ්ඤාතං සික්ඛමානං වුට්ඨාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති: සියා වාචතො, සමුට්ඨාති, න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-

11. පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: රාජගහෙ පඤ්ඤත්තං. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී පාරිවාසිකඡන්දදානෙන සික්ඛමානං වුට්ඨාපෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

---

1. සොකාවාසං ම.ඡ.සං.

7. සික්ඛමානාවකට " ආය්‍යාව, ඉදින් තෙපි මට සිවුරක් දෙන්නාහු නම් එ කල්හි මම තොප උපසපන් කරවන්නෙමි " යි කියා නො ම උපසපන් කරවන්නාවූ ද උප-සපන් කරවීමෙහි වෑයම් නො කරන්නාවූ ද මෙහෙණ පිළිබඳ පචිත්තිය කොහි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබයැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ සික්මනුවකට " ආය්‍යාව, ඉදින් තෙපි මට සිවුරක් දෙන්නහු නම් එ කල්හි මම තොප උපසපන් කරවන්නෙමි " කියා නො ම උපසපන් කරවූ, උපසපන් කරවීම පිණිස වෑයම් ද නො කළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨාන-යන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නැඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

8. " ආය්‍යාව, ඉදින් තෙපි දෙවසක් මා අනුවැ වැටෙහු නම් එකල්හි මම උපසපන් කරවන්නෙමි " යි සික්මනුවකට කියා නො ම උපසපන් කරවන්නාවූ ද උපසපන් කරවීමට වෑයම් නො කරවන්නාවූ ද මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ " ආය්‍යාව, ඉදින් තෙපි දෙවසක් මා අනුවැ වැටෙහු නම් එකල්හි මම තොප උපසපන් කරවන්නෙමි " යි සික්මනුවකට කියා නො ම උපසපන් කරවූ යැ, උපසපන් කරවීමට වෑයම් ද නොකළා යැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි එක් සමුට්ඨානයෙකින් නැඟියි : ධුරනික්ෂෙපයෙහි යැ, . . .

9. පිරිමින් හා එක්වූ කුමරුවන් හා එක්වූ සැඩ වූ ශෝක ඇති කරන්නාවූ සික්මනුවක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතැන්හි පණවන ලද යැ යත්:. සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ පිරිමින් හා එක්වූ කුමරුවන් හා එක්වූ සැඩවූ ශෝක ඇති කරන්නාවූ හික්මනුවක උපසපන් කරවූයැ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නැඟියි : . . .

10. මාපියන් විසින් හෝ හිමියා විසින් හෝ නො අනුදත් හික්මනුවක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිති සිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබයැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ මා පියන් විසින් ද හිමියා විසින් ද නො අනුදත් හික්මනුවක උපසපන් කරවූ යැ. ඒ වස්තුයෙහි යැ, පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නැඟියි : කිසිවිටෙක වචනයෙන් නැඟියි, කයින් නො නැඟියි, සිතින් නො නැඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නැඟියි, සිතින් නො නැඟී. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නැඟියි, කයින් නො නැඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නැඟී. . . .

11. පාරිවාසිකව ඡන්දය දීමෙන් හික්මනුවක උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිය කොතන්හි පණවන ලද යැ යත් : රජගහනුවරැදි පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : ථුල්ලනන්දා මෙහෙණ ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : ථුල්ලනන්දා මෙහෙණ පාරිවාසික ඡන්දය දීමෙන් හික්මනුවක උපසපන් කරවූ යැ, ඒ වස්තුයෙහියැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුනෙකින් නැඟියි : . . .

12. අනුවස්සං වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අනුවස්සං වුට්ඨාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

13. එකං වස්සං ද්වෙ වුට්ඨාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො එකං වස්සං ද්වෙ වුට්ඨාපෙසුං තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

කුමාරිභූතවග්ගො අට්ඨමො.

---

4.9

1. ඡත්තුපාහනං ධාරෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො ඡත්තුපාහනං ධාරෙසුං තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්ති සමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

2. යානෙන යායන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො යානෙන යායිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

3. සඞ්ඝාණිං ධාරෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: අඤ්ඤතරං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: අඤ්ඤතරා භික්ඛුනී සඞ්ඝාණිං ධාරෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති එළකලොමකෙ-පෙ-.

4. ඉත්ථාලඞ්කාරං ධාරෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො ඉත්ථාලඞ්කාරං ධාරෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

5. ගන්ධවණ්ණකෙන නහායන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො ගන්ධවණ්ණකෙන නහායිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

12. අවුරුද්දක් පාසා උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු අවුරුද්දක් පාසා උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

13. එක් වසකට දෙදෙනකුන් උපසපන් කරවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු එක් වසකට දෙදෙනකුන් උපසපන් කරවූහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන තුණෙකින් නඟියි : . . .

අටවැනි කුමාරිභූත වර්ග යි.

---

## 4.9

1. ඡත්‍ර හා වහන් දරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබයැ යත් : සවගමෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණහු ඡත්‍ර හා වහන් දරුහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකැ. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි. එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

2. යානයකින් යන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබයැ යත් : සවගමෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවගමෙහෙණහු යානයෙන් ගියහු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකැ අනුපඤ්ඤත්ති එකකි, සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

3. ඉණ පළඳනාවක් දරණ මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබයැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : එක්තරා මෙහෙණක් ඉණ පළඳනාවක් දරැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

4. ඉතිරි අබරණ පළඳින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවගමෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මෙහෙණහු ඉතිරි අබරණ දරුහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

5. ගන්ධ වර්ණ නහනුයෙන් නහන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ යැ යත් : සවග මෙහෙණන් ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණහු ගන්ධ වර්ණ නහනුයෙන් ස්නානය කළහ, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යැ. . . .

6. වාසිතකෙන පිඤ්ඤාකෙන නහායන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො වාසිතකෙන පිඤ්ඤාකෙන නහායිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති; එළකලොමකෙ-පෙ-.

7. භික්ඛුනියා උම්මද්දාපෙන්තියා පරිමද්දාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො භික්ඛුනියා උම්මද්දාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ පෙ-.

8. සික්ඛමානාය උම්මද්දාපෙන්තියා පරිමද්දාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො සික්ඛමානාය උම්මද්දාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ -පෙ.-

9. සාමණෙරියා උම්මද්දාපෙන්තියා පරිමද්දාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො සාමණෙරියා උම්මද්දාපෙසුං, පරිමද්දාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ-පෙ-.

10. ගිහිනියා උම්මද්දාපෙන්තියා පරිමද්දාපෙන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො ගිහිනියා, උම්මද්දාපෙසුං, පරිමද්දාපෙසුං, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. එළකලොමකෙ -පෙ-.

11. භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. කථිනකෙ-පෙ-.

12. අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති. පදසොධම්මෙ-පෙ-.

6. සුවඳ කවන ලද තලසුන්නෙන් නහන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : සවග මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙකැ යත් : සවග මෙහෙණහු සුවඳ කවන ලද තලසුන්නෙන් ස්නානය කළහ, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨාන යෙහි යෑ. . . .

7. මෙහෙණක ලවා ඇඟ උලවන පිරිමදවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු මෙහෙණක ලවා ඇඟ ඉලවූහ. පිරිමැද්දවූහු, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යෑ. . . .

8. සික්මනුවක ලවා ඇඟ උලවන පිරිමදවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණන් සික්මනුවක ලවා ඇඟ ඉලවූහ. පිරිමැද්දවූහ. ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යෑ. . .

9. සෙරණක ලවා ඇඟ උලවන පිරිමදවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙකැ යත් : බොහෝ මෙහෙණහු සෙරණක ලවා ඇඟ ඉලවූහ. පිරිමැද්දවූහු, ඒ වස්තුයෙහි යෑ. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොමසමුට්ඨානයෙහි යෑ. . . .

10. ගැහැණියක ලවා ඇඟ උලවන පිරිමදවන මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු ගැහැණියක ලවා ඇඟ ඉලවූහ. පිරිමැද්දවූහ, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : එළකලොම සමුට්ඨානයෙහි යෑ. . . .

11. මහණක්හු ඉදිරියෙහි නො පිළිවිස ආසනයෙහි හිදින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලදයෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු මහණක්හු ඉදිරියෙහි නො පිළිවිස ආසනයෙහි හුන්හ, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කඨිනසමුට්ඨානයෙහි යෑ. . . .

12. අවසර නො ලත් මහණක්හුගෙන් පැන පිළිවිසින මෙහෙණ පිළිබඳ පචිත්තිසිඛය කොතැන්හි පණවන ලද යෑ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යෑ යත් : බොහෝ මෙහෙණන් ඇරැබ යෑ. කිනම් වස්තුයෙක්හිද යත් : බොහෝ මෙහෙණහු අවසර නොලත් මහණක්හුගෙන් පැන පුළුවුත්හු, ඒ වස්තුයෙහි යෑ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : පදසොධම්මසමුට්ඨානයෙහි යෑ. . . .

13. අසඞ්කච්චිකාය ගාමං පවිසන්තියා පාචිත්තියං කත්ථ පඤ්ඤත්තන්ති : සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති : භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති : අඤ්ඤතරා භික්ඛුනී අසඞ්කච්චිකා ගාමං පාවිසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ද්වීහි සමුට්ඨානෙහි සමුට්ඨාති : සියා කායතො සමුට්ඨාති න වාචතො. චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති න වාචතො–

ඡත්තුපාහනවග්ගො නවමො.

නවවග්ගඛුද්දකං නිට්ඨිතං.

---

තස්සුද්දානං :

1. ලසුණං සංහරෙ ලොමං තලමට්ටඤ්ච සුද්ධිකං,
භුඤ්ජන්තාමකධඤ්ඤානං ද්වෙ විඝාසෙන දස්සනා.

2. අන්ධකාරෙ පටිච්ඡන්නෙ අජ්ඣොකාසෙ රථිකාය ච,
පුරෙ පච්ඡා, විකාලෙ ච දුග්ගහි නිරයෙ වධි.

3. නග්ගොදකා විසිබ්බෙත්වා පඤ්චාහිකං සඞ්කමනියං,
ගණවිභඞ්ගසමණං දුබ්බලං කඨිනෙන ච.

4. එකමඤ්චත්ථරණෙන සඤ්චිච්ච සහජීවිනිං,
දත්වා සංසට්ඨ අනෙනා ච තිරෙවස්සං න පක්කමෙ.

13. සංකච්චිකායෙන් තොරවැ ගමවදින මෙහෙණ පිළිබඳ පචිතිසික්ඛය කොතැන්හි පණවන ලද යැ යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ යැ යත් : එක්තරා මෙහෙණක ඇරැබ යැ. කිනම් වස්තුයෙකැ යත් : එක්තරා මෙහෙණක් තොමෝ කිසිලි පටින් තෙරවැ ගම වැදුනු, ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදැරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන දෙකෙකින් නඟියි : කිසිවිටෙක කයින් නඟියි, වචනයෙන් නො නඟියි, සිතින් නො නඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නයිඟි, වචනයෙන් නො නඟී. . . .

නවවන ඡත්තුපාහන වර්ග යි.

නවවර්ගයෙහි ක්ෂුද්‍රකයෝ නිමියහ.

---

වර්ගනවයෙහි පචිතිනාමාවලිය :

1. (ලසුන—වර්ගයෙහි :)

ලසුනඛාදන පචිති යැ, ලොමසංහරණ පචිති යැ, තලඝාතක පචිති යැ, ජතුමට්ටක පචිති යැ, උදකසුද්ධික පචිති යැ, භුඤ්ජන්ත (භික්ඛු) උපට්ඨාන පචිති යැ, ආමකධඤ්ඤ (විඤ්ඤපන) පචිති යැ, විඝාස ඡඩ්ඩන පචිති දෙක යැ, (නච්චාදි-) දස්සන පචිති යැ,

2. (රත්තන්ධකාර—වර්ගයෙහි :)

(රෑ අඳුරෙහි එකලා පුරුෂයකු හා එකලා වැ සිටුනා මෙහෙණට වදළ) රත්තන්ධකාර පචිති යැ, (පිළිසන් තන්හි පලසෙ සිටුනා මෙහෙණට වදළ) පටිච්ඡන්නොකාස පචිති යැ, (අජ්ඣොකාසයෙහි පලසෙ සිටුනියට වදළ) අජ්ඣොකාස පචිති යැ, රථිකා පචිති යැ, පුරෙභත්ත පචිති යැ, පච්ඡාභත්ත පචිති යැ, විකාල පචිති යැ, දුග්ගහිත පචිති යැ, (නිරයෙන් හවන) නිරය පචිති යැ, (තමා මැ වධ කැරගෙන හඬන මෙහෙණට වදළ) ආත්මහිංසා පචිති යැ.

3. (නහාන—වර්ගයෙහි :)

නග්න වැ නහන මෙහෙණට වදළ පචිති යැ, උදකසුදධික පචිති යැ, චීවරවිසිබ්බන පචිති යැ, පඤ්චාහිකසඞ්ඝාටිචාර පචිති යැ, චීවරසඞ්කමන පචිති යැ, (ගණයාහට චීවරලාභාන්තරාය නිසා වදළ) ගණ පචිති යැ, චීවරවිභඞ්ගපටිබාහන පචිති යැ, සමණචීවරදාන පචිති යැ, (දුර්වලචීවර ප්‍රත්‍යාසායෙන් චීවරකාලය ඉක්මවා යන මෙහෙණට වදළ) දුබ්බල ... පචිති යැ, කඨිනුද්ධාරපටිබාහන පචිති යැ.

4. තුවට්ට—වර්ගයෙහි :)

එකමඤ්චතුවට්ට පචිති යැ, එකත්ථරණතුවට්ට පචිති යැ, සඤ්චිච්ච අඵාසුකරණ පචිති යැ, සහජීවිනි පචිති යැ, උපස්සයනික්කඩ්ඪන පචිති යැ, සංසට්ඨ පචිති යැ. අන්තොරට්ඨ පචිති යැ, තිරොරට්ඨ පචිති යැ, අන්තොවස්ස පචිති යැ, (චාරිකා පිණිසැ නොවදනා මෙහෙණට වදළ) නපක්කමණ පචිති යැ.

5. රජා ආසන්දි සුත්තඤ්ච ගිහී වූපසමෙන ච,
දදෙ චීවරුවසථං පරියාපුණඤ්ච වාචයෙ.

6. ආරාමක්කොසචණ්ඩි ච භුඤ්ජෙය්‍ය කුලමච්ඡරී,
වාසො පවාරණොවාදා[1] ද්වෙ ධම්මා පසාඛෙන ච.

7. ගබ්භිනී[2] පායන්ති ඡ ධම්මෙ අසම්මතූනද්වාදස,
පරිපුණ්ණඤ්ච සඞ්ඝෙන සහවුට්ඨා ඡ පඤ්ච ච.

8. කුමාරී ද්වෙ ච සඞ්ඝෙන ද්වාදස සම්මතෙන ච,
අලං තවෙ ච ද්වෙ වස්සං සංසට්ඨා සාමිකෙන ච.

9. පාරිවාසිකානුවස්සං ද්වෙ වුට්ඨාපනෙන ච,
ඡත්ත යානෙන සඞ්ඝාණි ඉත්ථාලඞ්කාරවණ්ණකෙ.

10. පිඤ්ඤාක භික්ඛුනී චෙව සික්ඛා ච සාමණෙරිකා,
ගිහිනී භික්ඛුස්ස පුරතො අනොකාසමසඞ්කච්චිකාති.

---

තෙසං වග්ගානං උද්දානං:

ලසුණන්ධකාරනහානා තුවට්ට චිත්තාගාරකා,[3]
ආරාම[4] ගබ්භිනී චෙව කුමාරී ඡත්තුපාහනාති

---

1. වාසෙ පවාරණෙවාද. ම.ඡ.සං.
2. ගබ්භී ම.ඡ.සං.
3. චිත්තගාරකා. ම.ඡ.සං.
4. ආරම. ම.ඡ.සං.

Free Distribution www.aathaapi.org

5. (චිත්තාගාර—වර්ගයෙහි :)

රාජාගාරදස්සන පචිති යැ, ආසන්දිපරිභොග පචිති යැ, සුත්තකන්තන පචිති යැ, ගිහිවෙය්‍යාවච්ච පචිති යැ, (අධිකරණවූපසමයෙහිලා වදළ) වූපසමන පචිති යැ, (ගෙවැසි ආදීනට සියතින් ඛාද්‍යභොජ්‍ය දෙන්නියට වදළ) දාන පචිති යැ, ආවසථචීවර පචිති යැ, ආවසථ පචිති යැ, (තිරශ්චීනවිද්‍යා පුහුණු කරන්නියට වදළ) පරියාපුන පචිති යැ, (තිරශ්චීන විද්‍යා පිළිබඳ) වාචනා පචිති යැ,

6. (ආරාම—වර්ගයෙහි :)

ආරාම පචිති යැ, අක්කොස පචිති යැ, චණ්ඩීකතා පචිති යැ, භොජන පචිති යැ, කුල මච්ඡෙර පචිති යැ, වස්සාවාස පචිති යැ, පවාරණ ඕවාද පචිති යැ, (උපොසථ පවාරණ නොපුළුවුස්නා, ඕවා පිණිසැ නො යදනා මෙහෙණට වන) ධම්ම පචිති යැ, පසාඛ පචිති යැ.

7. (ගබ්භිනී—වර්ගයෙහි :)

ගබ්භිනීවුට්ඨාපන පචිති යැ, පායන්තිවුට්ඨාපන පචිති යැ, (ෂඩ්විධ ශික්ෂා ධර්මයෙහි අශික්ෂිත සික්ඛමානාව පිළිබඳ කොට ඇති) ඡධම්ම පචිති යැ, (සඞ්ඝ සම්මත නැති වැ ශික්ෂිත සම්මත නැති වැ ශික්ෂිත සික්ඛමානාවගේ වුට්ඨාපනය නිසා එන) අසම්මත පචිති යැ, ද්වාදසවස්ස පචිති යැ, පරිපුණ්ණ ද්වාදසවස්ස පචිති යැ, (සඞ්ඝසම්මත නැති වැ සික්ඛමානාවුට්ඨාපනනිසා එන) සඞ්ඝ ... පචිති යැ, සහජීවිනි වුට්ඨාපන පචිති යැ.

8. (කුමාරිභූත—වර්ගයෙහි :)

(උනුවිසිවස් පැවිදිකුමරියක පිළිබඳ) කුමාරි වුට්ඨාපන පචිති යැ, (දෙවන) කුමාරි වුට්ඨාපන පචිති ය ැයි දෙකෙකැ, (පිරිපුන් විසිවස් ඇති පැවිදිකුමරියක් සඞ්ඝ සම්මත නැතිවැ වුට්ඨාපන කෙළෙන් වදළ) වුට්ඨාපන පචිති යැ, (උනුදෙළොස්වස් ඇති පැවිදි කුමරියක පිළිබඳ වුට්ඨාපන පචිති යැ, (පිරිපුන් දෙළොස්වස් ඇති පැවිදි කුමරියක සඞ්ඝසම්මත නැති වැ වුට්ඨාපන කෙළෙන් වදළ) වුට්ඨාපන පචිති යැ, ('අලංතාව) නාදීන් 'අලං' ශබ්ද ප්‍රයොගය යෙදූණු) පචිති යැ, (සික්ඛමානං සචෙ' යනාදීන් 'සචෙ, නිපාත යෙදුණු) පචිති යැ ('දෙව වස්සානි යනු සඳහන් ලත්) පචිති යැ, ('පුරිසසංසට්ඨං' යයනාදීන් සංසට්ඨ ශබ්ද ප්‍රයොග ඇති) සික්ඛමානාවුට්ඨාපන පචිති යැ, ('මාතාපිතූහිවා සාමිකෙනවා' යනාදීන් වදළ) අනනුඤ්ඤාත සික්ඛමානාවුට්ඨාපන පචිති යැ, ('පාරිවාසික ඡන්දදාන' යෙන්) සික්ඛමානාවුට්ඨාපන පචිති යැ, අනුවස්සවුට්ඨාපන පචිති යැ, ('එකංවස්සං දෙව වුට්ඨාපෙන්ති' යි වදළ) වුට්ඨාපන පචිති යැ,

9—10. (ඡත්තුපාහන වර්ගයෙහි :)

ඡත්තුපාහන පචිති යැ, යාන පචිති යැ, සඞ්ඝාණි පචිති යැ, ඉත්ථාලඞ්කාර පචිති යැ, ගන්ධවණ්ණක පචිති යැ, වාසිතපිඤ්ඤාක පචිතිය හා (භික්ඛුනී) පරිමද්දපන පචිති යැ යන දෙක යැ (සික්ඛමානා) පරිමද්දපන පචිති යැ, (සමණෙරී) පරිමද්දපන පචිති යැ, (ගිහිනි) පරිමද්දපන පචිති යැ, (භික්ෂුහුගේ ඉදිරියෙහි ආපුච්ඡා නො කොට හිඳැගැන්මෙන් වන) නිසිදන පචිති යැ, (අවකාශ නොලැබැ භික්ෂු කෙනකුන් අතින් පැන පිළිවිසීමෙන් වන) පඤ්හපුච්ඡන පචිති යැ, අසඞ්කච්චික පචිති යැ යන ඇවැත්හු නව වර්ගයෙහි එන ඛුද්දකනාමාවලියෙහි ඇතුළත්හ.

ඒ වර්ගයන්ගේ නාමාවලිය :

ලසුන යැ අන්ධකාර යැ නහාන යැ තුවට්ට යැ චිත්තාගාර යැ ආරාම යැ ගබ්භිනී යැ කුමාරි යැ ඡත්තුපාහන යැයි වර්ග නවයෙකි.

## 1.5

## පාටිදෙසනීය කණ්ඩො

1. සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො සප්පිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති-පෙ-.

2. තෙලං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො තෙලං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-.

3. මධුං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ-පෙ-ඡබ්බග්ගියා භික්ඛුනියො මධුං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

4. ඵාණිතං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ-පෙ-ඡබ්බග්ගියා භික්ඛුනියො ඵාණිතං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං-පෙ-

5. මච්ඡං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ-පෙ-ඡබ්බග්ගියා භික්ඛුනියො මච්ඡං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

6. මංසං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ-පෙ-ඡබ්බග්ගියා භික්ඛුනියො මංසං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

7. ඛීරං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ-පෙ-ඡබ්බග්ගියා භික්ඛුනියො ඛීරං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං -පෙ-.

8. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තියා පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනු-

## 1.5

## පාටිදේසනීය කාණ්ඩය

1. ගිතෙල් විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදේසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ ගිතෙල් විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ, පඤ්ඤත්ති එකෙකි. අනුපඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරෙකින් නඟී. ...

2. තල තෙල් විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ තල තෙල් විනවා වැළඳූහ. ඒ වස්තුවෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

3. මී විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ මී විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

4. උක්සකුරු විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ උක් සකුරු විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනු පඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

5. දිය මස් විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ දියමස් විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

6. ගොඩමස් විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ ගොඩමස් විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

7. කිරි විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ කිරි විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. . . .

8. දීහි විනවා වළඳන මෙහෙණ පිළිබඳ පාටිදෙසනීය සිඛ කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහි පණවන ලදී. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක යත් : සවග මෙහෙණෝ දීහි විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම ආපත්ති

18– සිඕ 17881 (7/75)

Free Distribution www.aathaapi.org

පඤ්ඤත්ති ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති, සියා කායතො සමුට්ඨාති, න වාචතො. න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨාති, න චිත්තතො, සියා කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති-පෙ-.

අට්ඨ පාටිදෙසනීයා නිට්ඨිතා.

---

තස්සුද්දානං :

සප්පිං තෙලං මධුඤ්චෙව ඵාණිතං මච්ඡමෙව ච,
මංසං ඛීරං දධිඤ්චාපි විඤ්ඤාපෙත්වාන භික්ඛුනී,
පාටිදෙසනීයා අට්ඨ සම්බුද්ධෙන පකාසිතාති.[1]

යෙ සික්ඛාපදා භික්ඛුවිභඞ්ගෙ විත්ථාරිතා,
තෙ සංඛිත්තා[2] භික්ඛුනී විභඞ්ගෙ.

---

කත්ථ පඤ්ඤත්තිවාරො නිට්ඨිතො පඨමො.

---

1. සයං බුද්ධෙන දෙවතාති ම.ඡ.සං.
2. සංඛිපිතා—සිමු 1.2

Free Distribution www.aathaapi.org

සමුට්ඨානයන් අතුරෙහි සමුට්ඨාන සතරකින් නඟී. කිසිවිටෙක කයින් නඟී. වචනයෙන් නොනඟී. සිතින් නොනඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නඟී, සිතින් නොනඟී. කිසිවිටෙක කයින් ද සිතින් ද නඟී. වචනයෙන් නො නඟී. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. . . .

අට පිළිදෙස්නීහු නිමියහ.

---

එහි වස්තුනාමාවලිය :

සප්පි යෑ, තෙල යෑ, මධු යෑ, ඵාණිත යෑ, මච්ඡ යෑ, මංස යෑ, ඛීර යෑ, දධි යෑ, යි විචාවැ ගැනීමෙන් (නඟින) මෙහෙණ පිළිබඳ පිළිදෙස්නී අට සිඛයෝ සම්බුද්ධයන් වහන්සේ විසින් පවසන ලදහ.

භික්ඛු විභඞ්ගයෙහි යම් ශික්ෂාපද කෙනෙක් විස්තර කරණ ලද්දහු ද, ඒ ශික්ෂාපදයෝ භික්ඛුණී විභඞ්ගයෙහි සංක්ෂිප්තයහ.

---

පළමුවන කත්ථපඤ්ඤත්තිවාරය නිමියේ යි.

# 2. කතාපත්තිවාරො

## 2.1

### පාරාජික කණ්ඩො

1. අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියන්තී කති ආපත්තියො ආපජ්ජති: අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති: අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ගහණං සාදියති ආපත්ති පාරාජිකස්ස. උබ්භක්ඛකං අධොජාණුමණ්ඩලං ගහණං සාදියති ආපත්ති ථුල්ලච්චයස්ස, කායපටිබද්ධගහණං සාදියති, ආපත්ති දුක්කටස්ස. අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස කායසංසග්ගං සාදියන්තී ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

2. වජ්ජපටිච්ඡාදිකා භික්ඛුනී වජ්ජං පටිච්ඡාදෙන්තී කති ආපත්තියො ආපජ්ජති: වජ්ජපටිච්ඡාදිකා භික්ඛුනී වජ්ජං පටිච්ඡාදෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති: ජානං පාරාජිකං ධම්මං පටිච්ඡාදෙති ආපත්ති පාරාජිකස්ස, වෙමතිකා පටිච්ඡාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. ආචාරවිපත්තිං පටිච්ඡාදෙති, ආපත්ති දුක්කටස්ස. වජ්ජපටිච්ඡාදිකා භික්ඛුනී වජ්ජං පටිච්ඡාදෙන්තී ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති

3. උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී කති ආපත්තියො ආපජ්ජති: උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං. කම්මවාචාපරියොසානෙ ආපත්ති පාරාජිකස්ස. උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

4. අට්ඨමං වත්ථුං පරිපූරෙන්තී කති ආපත්තියො ආපජ්ජති: අට්ඨමං වත්ථුං පරපූරෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති: "පුරිසෙන ඉත්ථන්නාමං ගහනං ආගච්ඡා''ති වුත්තා ගච්ඡති. ආපත්ති දුක්කටස්ස. පුරිසස්ස හත්ථපාසං ඔක්කන්තමත්තෙ ආපත්ති ථුල්ලච්චයස්ස. අට්ඨමං වත්ථුං පරිපූරෙති ආපත්ති පාරාජිකස්ස. අට්ඨමං වත්ථුං පරිපූරෙන්තී ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

පාරාජිකා නිට්ඨිතා.

---

## 2.2

### සඞ්ඝාදිසෙස කණ්ඩො

1. උස්සයවාදිකා භික්ඛුනී අට්ටං කරෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති: එකස්ස ආරොචෙති, ආපත්ති දුක්කටස්ස. දුතියස්ස ආරොචෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. අට්ටපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

---

1. ඉත්ථන්නාමං ඔකාසං ම.ඡ.සං. ඉත්ථන්නාමං ගබ්භ. ස්‍යා,



Free Distribution www.aathaapi.org

# 2. කථාපත්තිවාරය

## 2.1

## පාරාජික කාණ්ඩය

1. කා සසභරායෙන් තෙත් වූ මෙහෙණ කා සසභරායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ කා සසභය ඉවසන්නී කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : කාසසභරායෙන් තෙත් වූ මෙහෙණ කා සසභරායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හු ගේ කා සසභයඉවසන්නී තුන් ඇවැතකට පැමිණෙයි : අකු ඇටයෙන් යට දණ මඩලින් උඩ ගැණීම ඉවසා නම් පරිජි ඇවැත් වෙයි, අකු ඇටයෙන් උඩ දණ මඩලෙන් යට ගැණීම ඉවසා නම් ථුලැසි ඇවැත් වෙයි, කය පිළිබැඳියක් ගැණීම ඉවසා නම් දුකුළා ඇවැත් වෙ. කාසසභරායෙන් තෙත් වූ මෙහෙණ කා සසභරායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ කා සසභය ඉවසන්නී මෙ තුන් ඇවැතට පැමිණේ.

2. වරද වසන මෙහෙණ වරද වසන්නී කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : වරද වසන මෙහෙණ වරද වසන්නී තුන් ඇවැතකට පැමිණෙයි : දන දන පරිජි ඇවැත වසා නම් පරිජි ඇවැත් වෙයි, විමති ඇතියා වසා නම් ථුලැසි ඇවැත් වෙයි, ආචාරවිපත්තිය වසා නම් දුකුළා ඇවැත් වෙ. වරද වසන මෙහෙණ වරද වසන්නී මෙ තුන් ඇවැතට පැමිණේ.

3. උබෙවනීකම් කරණු ලැබූ මහණහු අනුවැ වැටෙන මෙහෙණ තුන්යළ තෙක් සමනුභාසනකම් කළ කල්හි එය නොහරින්නී කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : උබෙවනීකම් කරණු ලැබූ මහණහු අනුවැ වැටෙන මෙහෙණ තුන්යළ තෙක් සමනුභාසන කම් කළ කල්හි එය අත්නොහරින්නී තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම වදනින් ථුලැසිහු වෙති. කම්වදන් අවසන්හි පරිජි ඇවැත් වෙ. උබෙවනී කම් කරණු ලැබූ මහණහු අනුවැ වැටෙන මෙහෙණ තුන්යළ තෙක් සමනුභාසනකම් කළ කල්හි එය නො හරින්නී මෙ තුන් ඇවැතට පැමිණේ.

4. අෂ්ටම වස්තුව සම්පූර්ණ කරන්නී කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : අෂ්ටම වස්තුව සම්පූර්ණ කරන්නී තුන් ඇවැතකට පැමිණෙයි : පුරුෂයකු විසින් මෙනම් තැනට එවයි කියන ලද්දී යේ නම් දුකුළා ඇවැත් වෙයි. පුරුෂයක්හුගේ අත්පසට පැමිණි කල්හි ථුලැසි ඇවැත් වෙයි, කය එළවීම් සඞ්ඛ්‍යාත අෂ්ටම වස්තුව සම්පූර්ණ කෙරේ නම් පරිජි ඇවැත් වෙ. අෂ්ටම වස්තුව සම්පූර්ණ කරණ මෙහෙණ මෙ තුන් ඇවැතට පැමිණේ.

**පරිජි නිමි.**

## 2.2

## සඞ්ඝාදිශේෂ කාණ්ඩය

1. විවාද කරණ මෙහෙණ අධිකරණ කරන්නී තුන් ඇවැතකට පැමිණෙයි : එකක්හට සැළ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, දෙවැන්නක් හට සැළ කෙරේ නම් ථුලැසි ඇවැත් වෙයි. අධිකරණය අවසන්හි සඟවෙසෙස් ඇවැත් වෙ.



Free Distribution www.aathaapi.org

2. චොරිං වුට්ඨාපෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

3. එකා ගාමන්තරං ගච්ඡන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ගච්ඡති ආපත්ති දුක්කටස්ස. පඨමං පාදං පරික්ඛෙපං අතික්කාමෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං අතික්කාමෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

4 සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

5. අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිගණ්හාති, ආපත්ති ථුල්ලච්චයස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති[1], ආපත්ති දුක්කටස්ස.

6. "කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා, තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වා"ති උය්‍යොජෙන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති ථුල්ලච්චයස්ස භොජනපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

7. කුපිතා භික්ඛුනී යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී තිස්සො අපත්තියො ආපජ්ජති : ඤත්තියා දුක්කටං ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

8. කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

9. සංසට්ඨා භික්ඛුනියො යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජන්තියො තිස්සො ආපත්තියො ආපජ්ජන්ති : ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

10. "සංසට්ඨාවය්‍යෙ තුම්හෙ විහරථ. මා තුම්හෙ නානා විහරිත්ථා"ති උය්‍යොජෙන්තී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්තී තිස්සො ආපත්තියො ආපජ්ජති : ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයං, කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

සඞ්ඝාදිසෙසා නිට්ඨිතා.

---

1. පටිග්ගණ්හාති-සීමු.2

2. සෙරක උපසපන් කරණ මෙහෙණ තුන් ඇවතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

3. එකලාව අන් ගමකට යන්නී තුන් ඇවැතකට පැමිණෙයි : යේ නම් දුකුළා ඇවැත් වෙයි, පළමු පියවර පරික්ෂෙපය ඉක්මවා නම් ථුලැසි ඇවැත් වෙයි, දෙවන පියවර ඉක්මවා නම් සඟවෙසෙස් ඇවැත් වේ.

4. සමඟ සඟහු විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් උඛෙඛනීකම් කළ මෙහෙණකට කාරකසඞඝයා නො පිළිවිස ගණයාගේ අදහස නො දැන ඔසාරණකම් කරන්නී තුන් ඇවතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම් වදන් අවසන්හි සඟ වෙසෙස් ඇවැත් වේ.

5. මෙවුන්දම් රායෙන් තෙත් වූ මෙහෙණ මෙවුන්දම් රායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අතින් කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ සියතින් පිළිගෙණ වළඳන්නී තුන් ඇවැතකට පැමිණෙයි : " කන්නෙමි වළඳන්නෙමි "යි පිළිගණී නම් ථුලැසි ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි සඟ වෙසෙස් ඇවැත් වෙයි. දිය හා දැහැටි පිළිගණී නම් දුකුළා ඇවැත් වේ.

6. ආයඝාව, තෙල පුරුෂ පුද්ගල තෙමේ මෙවුන්රාගයෙන් තෙත් වූයේ හෝ නො තෙත් වූයේ හෝ තිට කුමක් කෙරේද, යම් හෙයකින් තෝ මෙවුන්රාගයෙන් නො තෙත් වූයෙහි ද එබැවින් ආයඝාව, තෙල පුරුෂ පුද්ගල තෙමේ තිට යම් කැයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ දේ නම් තෝ එය සියතින් පිළිගෙණ කව හෝ වළඳව හෝ යි මෙහෙයවන්නී තුන් ඇවැතකට පැමිණෙයි. ඇය ගේ වචනයෙන් " කන්නෙමි වළඳන්නෙමි "යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි ථුලැසි ඇවැත් වෙයි, වළඳා අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

7. කිපියාවූ මෙහෙණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (වරද) නො හරින්නී තුන් ඇවැතකට පැමිණෙ : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

8. කිසියම් අධිකරණයෙක්හි පැරදුවූ මෙහෙණ තුන්යළතෙක් සමනුභාසනකම් කරණ කල්හි (වරද) නො හරින්නී තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

9. ගිහි මිනිසුන් හා එක්වූ තුන් යළ තාක් සමනුභාසනකම් කරණ කල්හි (වරද) නො හරනාවූ මෙහෙණහු තුන් ඇවැතකට පැමිණෙති : ඤත්තියෙන් දුකුළා වෙයි. දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

10. ආයඝාවෙනි, තෙපි ගිහි මිනිසුන් හා එක්ව ම වාසය කරවූ, තෙපි වෙන්ව නො වසවූ" කියා මෙහෙයවන මෙහෙණ තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (වරද) නො හරින්නී තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

සඟවෙසෙස් නිමි.

## 2.3

## නිස්සග්ගිය කණ්ඩො

1. පත්තසන්නිචයං කරොන්තො එකං ආපත්තිං ආපජ්ජති : නිස්සග්ගියං පාචිත්තියං.

2. අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : භාජාපෙති, පයොගෙ දුක්කටං, භාජාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

3. භික්ඛුනියා සද්ධිං චීවරං පරිවත්තෙත්වා අච්ඡින්දන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : අච්ඡින්දති පයොගෙ දුක්කටං. අච්ඡින්නෙ නිස්සග්ගියං පාචිත්තියං

4. අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : විඤ්ඤාපෙති පයොගෙ දුක්කටං. විඤ්ඤාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

5. අඤ්ඤං චෙතාපෙත්වා අඤ්ඤං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

6. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන අඤ්ඤං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

7. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන සඞ්ඝිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තො වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති, පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

8. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන අඤ්ඤං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

9. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන මහාජනිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

10. අඤ්ඤදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤුද්දිසිකෙන පුග්ගලිකෙන සඤ්ඤාචිකෙන අඤ්ඤං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

11. අතිරෙකචතුක්කංසපරමං ගරුපාපුරණං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

12. අතිරෙකඅඩ්ඪතෙය්‍යකංසපරමං ලහුපාපුරණං චෙතාපෙන්තො ද්වෙ ආපත්තියො ආපජ්ජති : චෙතාපෙති පයොගෙ දුක්කටං. චෙතාපිතෙ නිස්සග්ගියං පාචිත්තියං.

නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා.

Free Distribution www.aathaapi.org

## 2.3

## තිසසගගිය කාණ්ඩය

1. (නො ඉටා නො විකපා) පාත්‍ර රැස්කොට තබන මෙමෙහෙණ එක්ම නිසඟිපචිති ඇවතට පැමිණේ.

2. අකාලචීවරයක් කාලචීවරය යි ඉටා බෙදවන මෙමෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි: බෙදවා නම් පියෝහි දුකුළා වෙයි, බෙදවූ කල්හි නිසඟි පචිති වේ.

3. මෙහෙණක හා සමග සිවුරක් පෙරළිකොට ගෙණ (පසුව) අසිදගන්නා මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : අසිද ගණි නම් පියෝහි දුකුළා වෙයි, අසිද ගත්කල්හි නිසඟි පචිති වේ.

4. අනෙකක් විනවා අනෙකක් විනවන මෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවාගත් කල්හි නිසඟි පචිති වේ.

5. අනෙකක් දන්වා (එය තබා) අනෙකක් දන්වන මෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි : දන්වා නම් පියෝහි දුකුළා වෙයි, දන්වූ කල්හි නිසඟි පචිති වේ.

6. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් අනෙකක් විනවන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවා ගත් කල්හි නිසඟි පචිති වේ.

අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් සඟසතු පිරිකරින් තමා ඉල්ලා ගත් දූයින් අනෙකක් විනවන මෙමෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවාගත් කල්හි නිසඟි පචිති වේ.

8. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් අනෙකක් විනවන මෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවා ගත් කල්හි නිසඟි පචිති වේ.

9. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් ගණසතු පිරිකරින් තමා ඉල්ලා ගත් දූයින් අනෙකක් විනවන මෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවා ගත් කල්හි නිසඟි පචිති වේ.

10. අනෙකක්හු පිණිස දුන් අනෙකක්හු උදෙසා දුන් පුඟුල් සතු පිරිකරින් තමා ඉල්ලා ගත් දූයින් අනෙකක් විනවන මෙහෙණ දෙ ඇවතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවාගත් කල්හි නිසඟි පචිති වේ.

11. සොළොස් කහවණුවකට වඩා අගනා (ශීත කාලයෙහි පොරෝණා) ගරු පාපුරණයක් විනවන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවාගත් කල්හි නිසඟි පචිති වේ.

12. කහවණු දසයකට වඩා අගනා (උෂ්ණ කාලයෙහි පොරෝණා) ලුහු පාපුරණයක් විනවන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : විනවා නම් පියෝහි දුකුළා වෙයි, විනවාගත් කල්හි නිසඟි පචිති වේ.

නිසඟි පචිති නිමි.

## 2.4

## පාචිත්තිය කණ්ඩො

### 4.1

1. ලසුණං ඛාදන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමීති පටිග්ගණ්හාති[1] ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

2. සම්බාධෙ ලොමං සංහරාපෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: සංහරාපෙති පයොගෙ දුක්කටං. සංහරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

3 තලඝාතකං කරොන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: කරොති, පයොගෙ දුක්කටං. කතෙ ආපත්ති පාචිත්තියස්ස.

4. ජතුමට්ඨකං ආදියන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ආදියති, පයොගෙ දුක්කටං. ආදියිතෙ[2] ආපත්ති පාචිත්තියස්ස.

5. අතිරෙකද්වඞ්ගුලපබ්බපරමං උදකසුද්ධිකං ආදියන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ආදියති, පයොගෙ දුක්කටං. ආදිතෙත ආපත්ති පාචිත්තියස්ස.

6. භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා උපතිට්ඨන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා තිට්ඨති ආපත්ති දුක්කටස්ස.

7. ආමකධඤ්ඤං විඤ්ඤාපෙත්වා භුඤ්ජන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

8. උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා තිරොකුට්ටෙ වා තිරොපාකාරෙ වා ඡඩ්ඩෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඡඩ්ඩෙති පයොගෙ දුක්කටං, ඡඩ්ඩිතෙ ආපත්ති පාචිත්තියස්ස.

9. උච්චාරං වා පස්සාවං වා සඞ්කාරං වා විඝාසං වා හරිතෙ ඡඩ්ඩෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඡඩ්ඩෙති පයොගෙ දුක්කටං. ඡඩ්ඩිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. නච්චං වා ගීතං වා වාදිතං වා දස්සනාය ගච්ඡන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ගච්ඡති, ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතා පස්සති වා සුණාති වා ආපත්ති පාචිත්තියස්ස.

ලසුණවග්ගො පඨමො.

---

1. පටිග්ගණ්හාති - සීමු 1, 2 මජසං.

# 2.4

## පාචිත්තිය කාණ්ඩය

### 4.1

1. අමු සුදුලූනු අනුභව කරණ මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : " අනුභව කරන්නෙමි "යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

2. සම්බාධ ස්ථානයෙහි ලොම් බැහැර කරවන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : බැහැර කරවා නම් පියෝහි දුකුළාවෙයි, බැහැර කරවූ කල්හි පචිති ඇවැත් වේ.

3. තලඝාතනය කරණ මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, කළ කල්හි පචිති ඇවැත් වේ.

4. ජතුමට්ටකය (ලභමට) ගන්නා මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණී නම් පියෝහි දුකුළා වෙයි, ගත් කල්හි පචිති ඇවැත් වේ.

5. අයිරා දඟුල් පුරුකකට වඩා උදකශුද්ධිය ගන්නා මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : ගණී නම් පියෝහි දුකුළා වෙයි, ගත් කල්හි පචිති ඇවැත් වේ.

6. වළඳන මහණක්හට පැනින් හෝ විජිනියෙන් හෝ උවැටන් කරමින් සිටින මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : අත්පසෙහි සිටී නම් පචිති ඇවැත් වෙයි, අත්පස හැර සිටී නම් දුකුළා ඇවැත් වේ.

7. අමු ධාන්‍ය විනවා වළඳන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : වළඳන්නෙමියි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

8. මල හෝ මූ හෝ කෙළ හෝ කසළ හෝ ඉඳුල් හෝ භිත්තියෙන් පිටත හෝ පවුරෙන් පිටත හෝ දමන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : දමා නම් පියෝහි දුකුළා වෙයි, දමූ කල්හි පචිති ඇවැත් වේ.

9. මල හෝ මූ හෝ කෙළ හෝ කසළ හෝ ඉඳුල් හෝ නිල් තණ බිමෙක දමන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : දමා නම් පියෝහි දුකුළා වෙයි, දමූ කල්හි පචිති ඇවැත් වේ.

10. නටනු හෝ ගයනු හෝ වයනු හෝ දක්නා පිණිස යන මෙහෙණ දෙ ඇවැතකට පැමිණෙයි : යේ නම් දුකුළා ඇවැත් වෙයි, යම් තැනෙක සිටියා බලා නම් හෝ අසා නම් හෝ පචිති ඇවැත් වේ.

පළමුවන ලසුණ වර්ග යි.

4.2

1. රත්තන්ධකාරෙ අප්පදීපෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා තිට්ඨති ආපත්ති දුක්කටස්ස.

2. පටිච්ඡන්නෙ ඔකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා තිට්ඨති ආපත්ති දුක්කටස්ස.

3. අජ්ඣොකාසෙ පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා තිට්ඨති ආපත්ති දුක්කටස්ස.

4. රථියා වා බ්‍යූහෙ වා සිඞ්ඝාටකෙ වා පුරිසෙන සද්ධිං එකෙනෙකා සන්තිට්ඨන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: හත්ථපාසෙ තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. හත්ථපාසං විජහිත්වා තිට්ඨති ආපත්ති දුක්කටස්ස

5. පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා ආසනෙ නිසීදිත්වා සාමිකෙ අනාපුච්ඡා පක්කමන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: පඨමං පාදං අනොවස්සකං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස. දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

6. පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා ආසනෙ නිසීදන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: නිසීදති පයොගෙ දුක්කටං. නිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

7. විකාලෙ කුලානි උපසඞ්කමිත්වා සාමිකෙ අනාපුච්ඡා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා අභිනිසීදන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: අභිනිසීදති පයොගෙ දුක්කටං, අභිනිසින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

8. දුග්ගහිතෙන දූපධාරිතෙන පරං උජ්ඣාපෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: උජ්ඣාපෙති පයොගෙ දුක්කටං. උජ්ඣාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

9. අත්තානං වා පරං වා නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: අභිසපති පයොගෙ දුක්කටං. අභිසපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

10. අත්තානං වධිත්වා වධිත්වා රොදන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: වධති රොදති ආපත්ති පාචිත්තියස්ස. වධති න රොදති ආපත්ති දුක්කටස්ස,

රත්තන්ධකාරවග්ගො දුතියො.

4.2

1. පහන් නැති රෑ අඳුරෙහි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ වෙත සිටිනා මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : අත්පසෙහි සිටී නම් පචිති ඇවැත් වෙයි, අත්පස හැර සිටී නම් දුකුළා ඇවැත් වේ.

2. පිළිසන් පියෙසෙක්හි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා ව වෙත සිටිනා මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : අත්පසෙහි සිටී නම් පචිති ඇවැත් වෙයි, අත්පස හැර සිටී නම් දුකුළා ඇවැත් වේ.

3. එළිමහනෙහි එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ වෙත සිටිනා මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : අත්පසෙහි සිටී නම් පචිති ඇවැත් වෙයි, අත්පස හැර සිටී නම් දුකුළා ඇවැත් වේ.

4. වීථියෙහි හෝ විනිවිද නො ගිය කුඩා වීථියෙහි හෝ සතර මංසන්ධියෙහි හෝ එකලා මිනිස් පිරිමියක්හු හා එකලා වැ වෙත සිටිනා මෙහෙණ ෙද ඇවතකට පැමිණෙයි : අත්පසෙහි සිටී නම් පචිති ඇවැත් වෙයි, අත්පස හැර සිටී නම් දුකුළා ඇවැත් වේ.

5. පෙරබත්හි කුලයන් කරා එළඹ ආසනයෙහි හිඳ හිමියන් නො පිළිවිස බැහැර යන මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : පළමු පියවර අඟුව ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවන පියවර ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

6. පසුබත්හි කුලයන් කරා එළඹ හිමියන් නො පිළිවිස ආසනයෙහි හිඳිනා මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : හිඳී නම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

7. විකාලයෙහි කුලයන්ට එළඹ හිමියන් නො පිළිවිස ශය්‍යාවක් අතුට හෝ අතුරුවා හෝ හිඳිනා මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : හිඳී නම් පියෝහි දුකුළා වෙයි, හුන් කල්හි පචිති ඇවැත් වේ.

8. නපුරු කොට ගැණීමෙන් නපුරු කොට දකීමෙන් මෙරමාහට අවමන් කරණ මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : අවමන් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, අවමන් කළ කල්හි පචිති ඇවැත් වේ.

9. තමාට හෝ අන් උපසපන් මෙහෙණකට හෝ නිරයෙන් හෝ බඹසරින් හෝ සාපකරණ මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : සාප කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, සාප කළ කල්හි පචිති ඇවැත් වේ.

10. තමන් වෙර පැහැර පැහැරැ හඬන මෙහෙණ ෙද ඇවැතකට පැමිණෙයි : පහරා නම් හඬා නම් පචිති ඇවැත් වෙයි, පහරා නම් නො හඬා නම් දුකුළා ඇවැත් වේ.

දෙවන රත්තන්ධකාර වර්ග යි.

## 4.3

1. නග්ගා නහායන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: නහායති පයොගෙ දුක්කටං. නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

2. පමාණාතික්කන්තං උදකසාටිකං කාරාපෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: කාරාපෙති පයොගෙ දුක්කටං. කාරාපිතෙ ආපත්ති පාචිත්තියස්ස.

3. භික්ඛුනියා චීවරං විසිබ්බෙත්වා වා විසිබ්බාපෙත්වා වා නෙව සිබ්බෙන්තී න සිබ්බාපනාය උස්සුක්කං කරෙන්තී එකං ආපත්තිං ආපජ්ජති: පාචිත්තියං.

4. පඤ්චාහිකං සඞ්ඝාටිචාරං[1] අතික්කාමෙන්තී එකං ආපත්තිං ආපජ්ජති: පාචිත්තියං.

5. චීවරසඞ්කමනීයං ධාරෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: ධාරෙති පයොගෙ දුක්කටං. ධාරිතෙ ආපත්ති පාචිත්තියස්ස.

6. ගණස්ස චීවරලාභං අන්තරායං කරෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: කරෙති පයොගෙ දුක්කටං. කතෙ ආපත්ති පාචිත්තියස්ස.

7. ධම්මිකං චීවරවිභඞ්ගං පටිබාහන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: පටිබාහති පයොගෙ දුක්කටං. පටිබාහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

8. අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සමණචීවරං දෙන්තී ද්වෙ ආපත්තියො ආපජ්ජති: දෙති පයොගෙ දුක්කටං. දින්නෙ ආපත්ති පාචිත්තියස්ස.

8. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි කිපුණු නො සතුටු සිත් ඇති මෙහෙණහට එය නො හැරීම් හෙතුයෙන් සිදුවන සඟවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදී පණවන ලදී. කවරක ඇරැබ ද යත් : චණ්ඩකාලී භික්ෂුණිය ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : චණ්ඩකාලී භික්ෂුණී කිපියා නො සතුටු සිත් ඇත්තී, "බුදුන් ප්‍රතික්ෂෙප කරමි, ධර්මය ප්‍රතික්ෂෙප කරමි, සඞ්ඝයා ප්‍රතික්ෂෙප කරමි, ශික්ෂාව ප්‍රතික්ෂෙප කරමි "යි මෙසේ කිවූ යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

9. කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතාය භික්ඛුනියා යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: චණ්ඩකාළිං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: චණ්ඩකාළී භික්ඛුනී කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා කුපිතා අනත්තමනා එවං අවච: 'ඡන්දගාමිනියො ච භික්ඛුනියො. දොසගාමිනියො ච භික්ඛුනියො. මොහගාමිනියො ච භික්ඛුනියො. භයගාමිනියො ච භික්ඛුනියො'ති, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: ධුරනික්ඛෙපෙ -පෙ-.

10. සංසට්ඨානං භික්ඛුනීනං යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: සම්බහුලා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: සම්බහුලා භික්ඛුනියො සංසට්ඨා විහරිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: ධුරනික්ඛෙපෙ -පෙ-.

11. “සංසට්ඨා වය්‍යෙ තුම්හෙ විහරථ. මා තුම්හෙ නානා විහරථා”ති උය්‍යොජෙන්තියා යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා සඞ්ඝාදිසෙසො කත්ථ පඤ්ඤත්තොති: සාවත්ථියං පඤ්ඤත්තො. කං ආරබ්භාති: ථුල්ලනන්දං භික්ඛුනිං ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ථුල්ලනන්දා භික්ඛුනී 'සංසට්ඨාවය්‍යෙ තුම්හෙ විහරථ. මා තුම්හෙ නානා විහරිත්ථා''ති උය්‍යොජෙසි, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨාති: ධුරනික්ඛෙපෙ -පෙ-.

12. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා පාටිදෙසනීයං කත්ථ පඤ්ඤත්තන්ති: සාවත්ථියං පඤ්ඤත්තං. කං ආරබ්භාති: ඡබ්බග්ගියා භික්ඛුනියො ආරබ්භ. කිස්මිං වත්ථුස්මින්ති: ඡබ්බග්ගියා භික්ඛුනියො දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජිංසු, තස්මිං වත්ථුස්මිං. එකා පඤ්ඤත්ති. එකා අනුපඤ්ඤත්ති. ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨාති -පෙ-.

කත්ථපඤ්ඤත්තිවාරො නිට්ඨිතො පඨමො.

---

Free Distribution www.aathaapi.org

9. කිසියම් අධිකරණයෙක්හි පරදවන ලද මෙහෙණහට තුන්යළ තෙක් සමනුභාසන කම් කරණ කල්හි එය නො හැරීම් හේතුයෙන් සිදුවන සඟවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ ද යත් : චණ්ඩකාලී භික්ෂුණිය ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : චණ්ඩකාලී භික්ෂුණී කිසියම් අධිකරණයෙක්හි පරදවන ලද්දී කිපියා නො සතුටුසිත් ඇත්තී " භික්ෂුණීහු ඡන්දයෙන් අගතියට ගියෝ යැ, ද්වෙෂයෙන් අගතියට ගියෝ යැ, මොහයෙන් අගතියට ගියෝ යැ, බියෙන් අගතියට ගියෝ යැ "යි මෙසේ කිවු යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

10. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි ගිහියන් හා එක්වූ මෙහෙණන් හට වරද නො හැරීම් හේතුයෙන් සිදුවන සඟවෙසෙස කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ ද යත් : බොහෝ මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : බොහෝ මෙහෙණහු ගිහියන් හා එක්ව විසූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකෙකි. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

11. " ආර්‍ය්‍යාවෙනි, තෙපි (ගිහියන් හා) එක්ව මැ වසවූ, තෙපි වෙන්ව නොවසවූ " කියා මෙහෙයවන මෙහෙණහට තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි ඒ වරද නො හැරීම් හෙතුයෙන් සිදුවන සඟවෙසෙස කොතැන්හි පණවන ලදද යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ ද යත් : ථුල්ලනන්දා භික්ෂුණිය ඇරැබ ය. කිනම් වස්තුයෙකැ යත් : ථුල්ලනන්දා භික්ෂුණී " ආර්‍ය්‍යාවෙනි, තෙපි (ගිහියන් හා) එක්වමැ වසවූ, තෙපි වෙන්ව නො වසවූ " කියා මෙහෙය වූ යැ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි : ධුරනික්ෂෙපයෙහි යැ. . . .

12. දිහි විනවා වැළඳීම් හේතුයෙන් සිදුවන පිළිදෙස්නී ඇවැත කොතැන්හි පණවන ලද ද යත් : සැවැතෙහිදි පණවන ලදි. කවරක ඇරැබ ද යත් : සවග මෙහෙණන් ඇරැබ ය. කිනම් වස්තුයෙක්හි ද යත් : සවග මෙහෙණහු දිහි විනවා වැළඳූහ. ඒ වස්තුයෙහි යැ. පඤ්ඤත්ති එකකි. අනුපඤ්ඤත්ති එකකි. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් සමුට්ඨාන සතරෙකින් නඟියි : . . .

පළමුවන කත්ථ පඤ්ඤත්තිවාරය නිමි.

# 10. කතාපත්තිවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: කායසංසග්ගං සාදියනපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ගහණං සාදියති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු කායෙන කායං ආමසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. කායෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස. අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං. කායසංසග්ගං සාදියනපච්චයා ඉමං පඤ්ච ආපත්තියො ආපජ්ජති.

2. වජ්ජපටිච්ඡාදනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: වජ්ජ පටිච්ඡාදනපච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං[1] පටිච්ඡාදෙති, ආපත්ති පාරාජිකස්ස. වෙමතිකා පටිච්ඡාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛු සඞ්ඝාදිසෙසං පටිච්ඡාදෙති, ආපත්ති පාචිත්තියස්ස. ආචාරවිපත්තිං පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස වජ්ජපටිච්ඡාදනපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

3. යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති, ඤත්තියා දුක්කටං, ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති පාරාජිකස්ස: භෙදකානුවත්තිකා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පාපිකාය දිට්ඨියා යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති, ආපත්ති පාචිත්තියස්ස. යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

4. අට්ඨමං වත්ථුං පරිපූරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති අට්ඨමං වත්ථුං පරිපූරණපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: පුරිසෙන "ඉත්ථන්නාම ගහනං ආගච්ඡා"ති වුත්තා ගච්ඡති ආපත්ති දුක්කටස්ස. පුරිසස්ස හත්ථපාසං ඔක්කන්තමත්තෙ ආපත්ති ථුල්ලච්චයස්ස. අට්ඨමං වත්ථුං පරිපූරෙති, ආපත්ති පාරාජිකස්ස. අට්ඨමං වත්ථුං පරිපූරණ පච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

පාරාජිකං නිට්ඨිතං.

---

1. ධම්මං අජ්ඣාපනං ස්‍යා.



Free Distribution www.aathaapi.org

# 10. කථාපත්තිවාරය

1. කායසංසර්ගය ඉවසීම හේතුයෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත්: කායසංසර්ගය ඉවසීම හේතුවෙන් පස් ඇවැතකට පැමිණෙයි: කායසංසර්ගරාගයෙන් තෙත් වූ මෙහෙණක් කායසංසර්ගරාගයෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අකුඇටයෙන් යට දණ මඩලින් උඩ ගැනීම ඉවසා නම් පරිජි ඇවැත් වෙයි, මහණෙක් කයින් කය ස්පර්ශ කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි. කයින් කය පිළිබැඳියක් ස්පර්ශ කෙරේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, කය පිළිබැඳියෙකින් කය පිළිබැඳියක් ස්පර්ශ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙහි පචිති ඇවැත් වෙ. කායසංසර්ගය ඉවසීම හේතුයෙන් මේ පස් ඇවතට පැමිණේ.

2. වරද සැඟවීම හේතුයෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත්: වරද සැඟවීම හේතුවෙන් සිවු ඇවැතකට පැමිණෙයි: මෙහෙණක් දන දන පරිජි ඇවැතක් වසා නම් පරිජි ඇවැත් වෙයි, විමති ඇතියා වසා නම් ථුල්ලැසි ඇවැත් වෙයි, මහණෙක් සඟ වෙසෙසක් සඟවා නම් පචිති ඇවැත් වෙයි, ආචාර විපත්තියක් සඟවා නම් දුකුළා ඇවැත් වෙ. වරද සැඟවීම හේතුවෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

3. තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම හෙතුයෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත්: තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම හෙතුවෙන් පස් ඇවැතකට පැමිණෙයි: උක්ඛෙපනීකම්කරණ ලද්හු අනු වැ වැටෙන මෙහෙණ තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හරි නම් ඤත්තියෙන් දුකුළා වෙයි, දෙ කම්වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි පරිජි ඇවැත් වෙයි, භෙදකයනට අනුවැ වැටෙන මෙහෙණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නොහරි නම් සඟවෙසෙස් ඇවැත් වෙයි. ලාමක දෘෂ්ටියෙන් යුත් මෙහෙණහට තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නොහරී නම් පචිති ඇවැත් වෙ. තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම හෙතුවෙන් මේ පස් ඇවැතට පැමිණේ.

4. අෂ්ටම වස්තුව පිරවීම හේතුයෙන් කෙතෙක් ඇවතුන්ට පැමිණේ ද යත්: අෂ්ටම වස්තුව පිරවීම හෙතුවෙන් තුන් ඇවැතකට පැමිණෙයි: පිරිමියක්හු විසින් "මෙනම් තැනට යව "යි කියන ලද්දී යේ නම් දුකුළා ඇවැත් වෙයි, පිරිමියක්හුගේ අත්පසට එන් කල්හි ථුල්ලැසි ඇවැත් වෙයි, කය එළවීම සඞ්ඛ්‍යාත අෂ්ටම වස්තුව පුරවා නම් පරිජි ඇවැත් වෙ. අෂ්ටම වස්තුව පිරවීම හෙතුයෙන් මේ තුන් ඇවතට පැමිණේ

පරිජි නිමි.



21—සිපී 17881 (7/76)

Free Distribution
www.aathaapi.org

## සඞ්ඝාදිසෙසකණ්ඩං

1. උස්සයවාදිකා භික්ඛුනී අට්ටකරණපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: එකස්ස ආරොචෙති, ආපත්ති දුක්කටස්ස. දුතියස්ස ආරොචෙති, ආපත්ති ථුල්ලච්චයස්ස, අට්ටපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

2. චොරිං වුට්ඨාපනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

3. එකා ගාමන්තරං ගමනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ගච්ඡති, ආපත්ති දුක්කටස්ස. පඨමං පාදං පරික්ඛෙපං අතික්කාමෙති ආපත්ති ථුල්ලච්චයස්ස. දුතියං පාදං අතික්කාමෙති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

4. සමග්ගෙන සඞ්ඝෙන උක්ඛිත්තං භික්ඛුනිං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරණපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

5. අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති, ආපත්ති ථුල්ලච්චයස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. උදකදන්තපොණං පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස.

6. "කිං තෙ අය්‍යෙ එසො පුරිසපුග්ගලො කරිස්සති අවස්සුතො වා අනවස්සුතො වා යතො ත්වං අනවස්සුතා, ඉඞ්ඝය්‍යෙ යං තෙ එසො පුරිසපුග්ගලො දෙති ඛාදනීයං වා භොජනීයං වා, තං ත්වං සහත්ථා පටිග්ගහෙත්වා ඛාද වා භුඤ්ජ වා" ති උය්‍යොජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: තස්සා වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති ථුල්ලච්චයස්ස. භොජනපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

7. කුපිතා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචා පරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

8. කිස්මිඤ්චිදෙව අධිකරණෙ පච්චාකතා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

9. සංසට්ඨා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචාපරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

## සඞ්ඝාදිශේෂ කාණ්ඩාදිය

1. විවාද කරණ මෙහෙණ අධිකරණ කිරීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : එකක්හට ඇරොජා නම් දුකුළා ඇවැත් වෙයි, දෙවැන්නකුට ඇරොජා නම් ථුල්ලැසි ඇවැත් වෙයි, අධිකරණය නිමිකල්හි සඟවෙසෙස් ඇවැත් වේ.

2. සෙරෙක උපසපන් කරවීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම්වදනින් ථුල්ලැසිහු වෙති. කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

3. එකලා වැ අන් ගමකට යෑම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : යේ නම් දුකුළා ඇවැත් වෙයි, පළමු පියවර පරික්ෂෙපය ඉක්මවා නම් ථුල්ලැසි ඇවැත් වෙයි, දෙවන පියවර ඉක්මවා නම් සඟවෙසෙස් ඇවැත් වේ.

4. සමගසඟුන් විසින් ධර්මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් උක්ඛෙපනීකම් කළ මෙහෙණක කාරක සඞ්ඝයා නො පිළිවිස (කාරක) ගණයාගේ අදහස් නො දැන ඇතුළත් කර ගැණීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම් වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

5. මෙවුන්දම්රායෙන් තෙත් වූ මෙහෙණක් මෙවුන්දම්රායෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අතින් කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ සියතින් පිළිගෙණ වැළඳීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : " කන්නෙමි, වළඳන්නෙමි " යි පිළිගණී නම් ථුල්ලැසි ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි සඟවෙසෙස් ඇවැත් වෙයි, දිය දැහැටි පිළිගණී නම් දුකුළා ඇවැත් වේ.

6. ආයෳාව, තෙල පුරුෂපුද්ගල තෙමේ මෙවුන්දම්රායෙන් තෙත් වූයේ හෝ නො තෙත් වූයේ හෝ තොපට කුමක් කෙරේ ද, යම්හෙයෙකින් තෙපි මෙවුන්දම්රායෙන් නො තෙත් වහු ද, එබැවින් ආයෳාව, තෙල පුරුෂපුද්ගල තෙමේ යම් කැයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ තොපට දේ ද, තෙපි එය සියතින් පිළිගෙණ කව හෝ වළඳව හෝ කියා මෙහෙයවීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඇයගේ වචනයෙන් " කන්නෙමි වළඳන්නෙමි " යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි ථුල්ලැසි ඇවැත් වෙයි, වළඳා නිමි කල්හි සඟවෙසෙස් ඇවැත් වේ.

7. කිපියා වූ මෙහෙණක් තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙ කම්වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

8. කිසියම් අධිකරණයෙක්හි පරදවන ලද මෙහෙණක් තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම්වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

9. ගිහියන් හා එක් වූ මෙහෙණක් තුන්යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙ කම්වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ.

10. "සංසට්ඨාවය්‍යො තුම්හෙ විහරථ. මා තුම්හෙ නානා විහරිත්ථා"ති උය්‍යොජෙන්ති යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජනපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා. කම්මවාචා පරියොසානෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස -පෙ-

දසසඞ්ඝාදිසෙසා නිට්ඨිතා.

යථා හෙට්ඨා තථා විත්ථාරෙතබ්බා,

පච්චයමෙව නානාකරණං.

---

11. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ද්වෙ ආපත්තියො ආපජ්ජති: ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

කතාපත්තිවාරො නිට්ඨිතො දුතියො.

---

10. "ආයුෂ්මාවෙනි, තෙපි ගිහියන් හා එක්ව මැ වසව, තෙපි වෙන්ව නො වසව," කියා මෙහෙයවන මෙහෙණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි වරද නො හැරීම් හේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : ඤත්තියෙන් දුකුළා වෙයි, දෙ කම්වදනින් ථුල්ලැසිහු වෙති, කම්වදන් අවසන්හි සඟවෙසෙස් ඇවැත් වේ. . . .

දස සඟවෙසෙස් නිමි.

යට කී සෙයින් විස්තර කටයුතු යැ, හේතුව පමණෙක් මැ වෙනසි.

---

11. දිහි විනවා වැළඳීම හේතුවෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : දිහි විනවා වැළඳීම හෙතුයෙන් දෙ ඇවැතකට පැමිණෙයි : "වළඳන්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලායෙහි පරහලායෙහි පිළිදෙස්නී ඇවැත් වේ. දිහි විනවා වැළඳීම හේතුයෙන් මේ දෙ ඇවතට පැමිණේ.

දෙවන කථාපත්තිවාරය නිමි.

---

## 11. විපත්තිවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං -පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජන්ති: ආචාරවිපත්තිං.

විපත්තිවාරො නිට්ඨිතො තතියො.

---

## 12. සඞ්ගහවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන -පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතිහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො සත්තන්නං ආපත්තික්ඛන්ධානං ද්වීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන සියා දුක්කටාපත්තික්ඛන්ධෙන.

සඞ්ගහවාරො නිට්ඨිතො චතුත්ථො.

---



Free Distribution www.aathaapi.org

# 11. විපත්තිවාරය

1. කායසංසර්ගය ඉවසීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවු වැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද යත්: කායසංසර්ගය ඉවසීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීල විපත්තිය ද කිසිවිටෙක ආචාර විපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. . . .

2. දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද යත් : දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් එක් මැ ආචාර විපත්තිය බෙජෙත්.

තුන්වන විපත්තිවාරය නිමි.

---

# 12. සඞ්ග්‍රහවාරය

1. කායසංසර්ගය ඉවසීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද්හු ද යත් : කායසංසර්ගය ඉවසීම් හෙතුයෙන් සිදුවන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසි විටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි පස් ආපත්තිස්කන්ධයෙකින් සඞ්ග්‍රහ කරණ ලද්හු ය. . . .

2. දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද්හු ද යත් : දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාටිදෙසනීයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි දෙ ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලද්හු ය.

සිවුවන සඞ්ග්‍රහවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

## 13. සමුට්ඨානවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො-පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: සියා කායතො සමුට්ඨහන්ති, න වාචතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති, න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති.

**සමුට්ඨානවාරො නිට්ඨිතො පඤ්චමො.**

---

## 14. අධිකරණවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං -පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං.

**අධිකරණවාරො නිට්ඨිතො ඡට්ඨො.**

---



Free Distribution www.aathaapi.org

# 13. සමුට්ඨානවාරය

1. කායසංසර්ගය ඉවසීම හෙතුයෙන් සිදුවන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨාන යන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද යත්: කායසංසර්ගය ඉවසීම හෙතුයෙන් සිදුවන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති: කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්. . . .

2. දිහි විනවා වැළඳීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද යත්: දිහි විනවා වැළඳීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් සිවුසමුට්ඨානයෙකින් නගිත්. කිසිවිටෙක කයින් නගිත්, වචනයෙන් නො නගිත්, සිතින් නො නගිත්. කිසි විටෙක කයින් ද වචනයෙන් ද නගිත්, සිතින් නො නගිත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නගිත්, වචනයෙන් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්.

පස්වැනි සමුට්ඨානවාරය නිමි.

---

# 14. අධිකරණවාරය

1. කායසංසර්ගය ඉවසීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද යත්: කායසංසර්ගය ඉවසීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් අපත්තාධිකරණ යි. . . .

2. දිහි විනවා වැළඳීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද යත්: දිහි විනවා වැළඳීම හේතුයෙන් සිදුවන ඇවැත්හු සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි.

සවැනි අධිකරණවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

## 15. සමථවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති: කායසංසග්ගං සාදියනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච, තිණවත්ථාරකෙන ච -පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ආපත්තියො සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

සමථවාරො නිට්ඨිතො සත්තමො.

---



Free Distribution www.aathaapi.org

# 15. සමථවාරය

1. කායසංසර්ගය ඉවසීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් : කායසංසර්ගය ඉවසීම් හෙතුයෙන් සිදුවන ඇවැත්හු ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්. . . .

2. දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් : දිහි විනවා වැළදීම් හේතුයෙන් සිදුවන ඇවැත්හු සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් සමථයෙන් සන්හිඳෙත්.

සත්වැනි සමථවාරය නිමි.

---



Free Distribution www.aathaapi.org

# 16. සමුච්චයවාරො

1. කායසංසග්ගං සාදියනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: කායසංසග්ගං සාදියනපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: අවස්සුතා භික්ඛුනී අවස්සුතස්ස පුරිසපුග්ගලස්ස අධක්ඛකං උබ්භජාණුමණ්ඩලං ගහණං සාදියති ආපත්තිපාරාජිකස්ස. භික්ඛු කායෙන කායං ආමසති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. කායෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති ථුල්ලච්චයස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති, ආපත්ති දුක්කටස්ස. අඞ්ගුලිපතොදකෙ පාචිත්තියං. කායසංසග්ගං සාදියන-පච්චයා ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛා විනයෙන ච, පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච-පෙ-.

2. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා කති ආපත්තියො ආපජ්ජති: දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජනපච්චයා ද්වෙ ආපත්තියො ආපජ්ජති: භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති, ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස. දධිං විඤ්ඤාපෙත්වා භුඤ්ජන-පච්චයා ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණානං, සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:



Free Distribution www.aathaapi.org

# 16. සමුච්චයවාරය

1. කායසංසර්ගය ඉවසීම් හේතුවෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් කායසංසර්ගය ඉවසීම් හේතුවෙන් පස් ඇවැතකට පැමිණේ. කයසංසර්ගරාගයෙන් තෙත් වූ මෙහෙණ කායසංසර්ගරාගයෙන් තෙත් වූ මිනිස් පිරිමියක්හුගේ අකුඇටයෙන් යට දණමඩලින් උඩ ගැණීම ඉවසා නම් පරිජි ඇවැත් වෙයි, මහණෙක් කයින් කය ස්පර්ශ කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, කයින් කය පිළිබැදියක් ස්පර්ශ කෙරේ නම් ථුල්ලැසි ඇවැත් වෙයි, කයපිළිබැදියෙකින් කයපිළිබැදියක් ස්පර්ශ කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, ඇඟිල්ලෙන් ගිරති කැවීමෙහි පචිති ඇවැත් වේ. කායසංසර්ගය ඉවසීම් හේතුවෙන් මේ පස් ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද, සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසි විටෙක ආචාරවිපත්තිය දුයි විපත් දෙකක් බෙජෙත්. සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිශේෂාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දුයි පස් ආපත්තිස්කන්ධයෙකින් සඞ්ග්‍රහ කරණ ලදහු ය. සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිත්. කයින් ද සිතින් ද නගිත්, වචනයෙන් නො නගිත්. සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණයි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දුයි තුන් ශමථයෙන් සන්හිඳෙත්. . . .

2. දිහි විනවා වැළදීම් හේතුවෙන් කෙතෙක් ඇවතට පැමිණේ ද යත් : දිහි විනවා වැළදීම් හේතුවෙන් දෙ ඇවැතකට පැමිණෙයි : "වළඳන්නෙමි" යි පිළිගණී නම් දුකුළා ඇවැත් වෙයි, පරභලායෙහි පරභලායෙහි පිළිදෙස්නී ඇවැත් වේ. දිහි විනවා වැළදීම් හෙතුවෙන් මේ දෙ ඇවතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද, සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත්ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :



Free Distribution www.aathaapi.org

තා ආපත්තියො චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජන්ති: ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ද්වීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන ඡන්නං ආපත්තිසමුට්ඨානානං චතූහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති. සියා කායතො සමුට්ඨහන්ති න වාචතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති, න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන චාති.

සමුච්චයවාරෙ නිට්ඨිතො අට්ඨමො.

---

අට්ඨ පච්චයවාරා නිට්ඨිතා.

---

තෙසං උද්දානං:

කතිවාරෙ ච විපත්තිවාරෙ ච සඞ්ගහවාරෙ
සමුට්ඨානවාරෙ චෙව අධිකරණවාරෙ ච,
සමථවාරෙ ච සමුච්චයවාරෙ ච ඉමෙ සත්ත වාරා
ආදිතො පඤ්ඤත්තිවාරෙන සහ අට්ඨ වාරා හොන්ති.

---

භික්ඛුනිවිභඞ්ගෙ සොළස මහාවාරා නිට්ඨිතා.

---

නිට්ඨිතො ච භික්ඛුනී විභඞ්ගො.

---

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් එක් ම ආචාර විපත්තිය බෙජෙත් සප්තාපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාටිදෙසනීයාපත්තිස්කන්ධයෙන් ද. කිසිවිටෙක දුෂ්කෘතාපත්තිස්කන්ධයෙන් දැයි, දෙ ආපත්තිස්කන්ධයෙකින් සඞ්ග්‍රහ කරණ ලදහු ය. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් සිවු සමුට්ඨානයෙකින් නගිති : කිසිවිටෙක කයින් නගිති, වචනයෙන් නො නඟිති, සිතින් නො නගිත්, කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නගිති, සිතින් නො නගිත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවින යෙන් ද, තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

අටවැනි සමුච්චයවාරය නිමි.

---

අෂ්ට ප්‍රත්‍යය වාරයෝ නිමියහ.

---

ඒ වාරයන්ගේ උද්දානය :

කතාපත්තිවාරය ද, විපත්තිවාරය ද, සංගහවාරය ද, සමුට්ඨානවාරය ද, අධිකරණ වාරය ද, සමථවාරය ද, සමුච්චයවාරය ද, යන මේ සප්ත වාරයෝ ආදියෙහි දක්වන ලද කත්ථපඤ්ඤත්තවාරය සමග (පච්චයවාරයෙහි) මහාවාරයෝ අටදෙනෙක් වෙත්.

---

භික්ඛුනී විභඞ්ගයෙහි සොළොස් මහාවාරයෝ නිමියහ.

---

## භික්ඛුනී විභඞ්ගය ද නිමියේ යි.

---

# සමුට්ඨානසීසසඞ්ඛෙපො

සමුට්ඨානස්සුද්දානං:

1. අනිච්චා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'නත්තා ච සඞ්ඛතා,
නිබ්බානඤ්චෙව පඤ්ඤත්ති අනත්තා ඉති නිච්ඡයා.

2. බුද්ධචන්දෙ අනුප්පන්නෙ බුද්ධාදිච්චෙ අනුග්ගතෙ,
තෙසං සභාගධම්මානං නාමමත්තං න ඤායති.

3. දුක්කරං විවිධං කත්වා පූරයිත්වාන පාරමී,
උප්පජ්ජන්ති මහාවීරා චක්ඛුභූතා සබ්‍රහ්මකෙ.

4. තෙ දෙසයන්ති සද්ධම්මං දුක්ඛහානිං සුඛාවහං,
අඞ්ගීරසො සක්‍යමුනි සබ්බභූතානුකම්පකො.

5. සබ්බසත්තුත්තමො සීහො පිටකෙ තීණි දෙසයි,
සුත්තන්තං අභිධම්මඤ්ච විනයඤ්ච මහාගුණං

6. එවං නීයති සද්ධම්මො විනයො යදි තිට්ඨති,
උභතො ච විභඞ්ගානි ඛන්ධකා යා ච මාතිකා.

7. මාලාසුත්තගුණෙනෙව පරිවාරෙන ගන්ථිතා,
තස්සෙව පරිවාරස්ස සමුට්ඨානං නයතො[1] කතං.

8. සම්භෙදං නිදානඤ්චඤ්ඤං සුත්තෙ දිස්සන්ති උපරි,
තස්මා සික්ඛෙ පරිවාරං ධම්මකාමො සුපෙසලොති.

## තෙරසසමුට්ඨානානි

9. විභඞ්ගෙ ද්වීසු පඤ්ඤත්තං උද්දිසන්ති උපොසථෙ,
පවක්ඛාමි සමුට්ඨානං යථාඤායං සුණාථ මෙ.

10. පාරාජිකං යං පඨමං දුතියඤ්ච තතො පරං,
සඤ්චරිත්තානුභාසඤ්ච[1] අතිරෙකඤ්ච චීවරං.

11. ලොමානි පදසො ධම්මො භූතං සංවිධානෙන ච,
ථෙය්‍යදෙසනචොරිං ච අනනුඤ්ඤාතාය තෙරස

12. තෙරසෙතෙ සමුට්ඨානනයා විඤ්ඤූහි චින්තිතා,
එකෙකස්මිං සමුට්ඨානෙ සදිසා ඉධ දිස්සරෙ.

---

1. සඤ්චරිත්තානු භාසනඤ්ච. ම ඡ.සං.
2. නියතො, සි.මු. ම.ඡ.සං.



Free Distribution www.aathaapi.org

# සමුට්ඨාන ශීර්ෂසංක්ෂේපය

## සමුට්ඨානය පිළිබඳ නාමාවලිය

1. සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍යයහ, දුඃඛයහ, අනාත්මයහ, සංස්කෘතයහ යි ද නිර්වාණය හා ප්‍රඥප්තිය අනාත්මයයි ද නිශ්චිතය හ.

2. බුද්ධ නමැති චන්ද්‍රයා නූපන් කල්හි බුද්ධ නමැති සූර්‍ය්‍යයා නො නැඟි කල්හි අනිත්‍යාදියෙන් සභාග වූ ඒ සඞ්ඛත ධර්මයන් ගේ නාමමාත්‍ර යෙකුදු නොදන්නා ලැබේ.

3. නානාවිධ දුෂ්කර ක්‍රියා කොට පැරුම් පුරා (දෙවි) බඹුන් සහිත ලෙව්හි චක්ෂුර් භූත වූ මහාවීරයෝ උපදිත්.

4. ඒ මහාවීරවූ බුදුවරු දුක් නසන සුව එළවන සද්ධර්මය දෙසත්. (එහෙයින්) සියලඟින් නික්මෙන කාන්ති ඇති ශාක්‍යමුනීන්ද්‍ර වූ හැමසතන් වෙත පතළ කුලුණැති,

5. සර්වසත්ත්වෝත්තම මුනිශ්‍රෙෂ්ඨයන් වහන්සේ මහඅනුසස් ඇති සූත්‍රපිටකය ද අභිධර්මය ද විනය දැයි ත්‍රිපිටකය දෙසූහ.

6. ඉදින් විනය පාලිය පවතී නම් මෙසේ ඇති කල්හි ප්‍රතිපත්ති ප්‍රතිවේධ සද්ධර්මය එළවනු ලැබෙයි, උභය විභඞ්ගයෝ ද ඛන්ධකයෝ ද යම් උභය ප්‍රාතිමොක්ෂයෙක් වේ නම් හෙද,

7. හුයෙකින් ගෙතු මල්දමක් සෙයින් පරිවාරයෙන් ගොතන ලදහ. ඒ පරිවාරයා ගේ ම සමුට්ඨානය ද නය විසින් කරන ලදි.

8. එයින් අන්‍ය වූ සමුට්ඨාන සම්භේදය ද නිදානය ද මතු සූත්‍රයෙහි ම පෙණෙයි, එබැවින් විනයධර්මාභිලාෂී ප්‍රියශීල භික්ෂුතෙම පරිවාරය පුහුණු කරන්නේ යි.

## ත්‍රයෝදශ සමුට්ඨානයෝ

9. උභය විභඞ්ගයෙහි පණවනලද යම් සිකපද සමූහයක් පෙහෙවස් දිනයෙහි උදෙසත් ද, ඒ සිකපද සමූහයා ගේ ආපත්ති සමුට්ඨාන යුක්ති පරිද්දෙන් කියන්නෙමි. ඒ මා කියන වදන් අසවු.

10. යම් ප්‍රථම පාරාජික සමුට්ඨානයෙක් වේ නම් එය ද ඉන් මත්තෙහි ද්විතීය පාරාජිකසමුට්ඨානය ද සඤ්චරිත්තය ද සමනුභාසනය ද කඨිනය ද,

11. එළක ලොමය ද පදසොධම්මය ද භූතාරොචනය ද අද්ධානගමනය ද ථෙය්‍යසත්ථය ද ධම්මදෙසනා ද චොරිවුට්ඨාපනය ද අනනුඤ්ඤාතය දැයි තෙළෙසෙකි.

12. මේ තෙළෙස් සමුට්ඨාන ක්‍රමයෝ නුවණැත්තන් විසින් සිතන ලද්දහ, එක් එක් සමුට්ඨානයෙහි (ඇතුළත්වන අන්‍යවූ) සමසමුට්ඨානයෝ ද මේ උභයවිභඞ්ගයේ පෙණෙත්.



22—ඎ 17881 (7/77)

Free Distribution www.aathaapi.org

## පඨමපාරාජික සමුට්ඨානං

13. මෙථුනං සුක්කසංසග්ගො අනියතා පඨමිකා,
පුබ්බූපපරිපාචිතා රහො භික්ඛුනියා සහ.

14. සභොජනෙ[2] රහො චෙව අඞ්ගුලී උදකෙ හසං,
පහාරෙ උග්ගිරෙ ද්වෙ ච තෙපඤ්ඤාසා ච සෙඛියා

15. අධක්ඛකගාමවස්සුතා තලමට්ඨඤ්ච සුද්ධිකා,
වස්සං වුත්ථා ච ඔවාදං නානුබන්ධෙ පවත්තිනිං.

16. ඡසත්තති ඉමා සික්ඛා කායමානසිකා කතා,
සබ්බෙ එකසමුට්ඨානා පඨමං පාරාජිකං යථා.

**පඨමපාරාජිකසමුට්ඨානං නිට්ඨිතං.**

## දුතියපාරාජික සමුට්ඨානං

17. අදින්නං විග්ගහුත්තරිං දුට්ඨුල්ලං අත්තකාමතා,[1]
අමූලා අඤ්ඤභාගියා අනියතා දුතියිකා.

18. අච්ඡින්දෙ පරිණාමනෙ මුසා ඔමස පෙසුනා,
දුට්ඨුල්ලා පඨවිං ඛණෙ භූතං අඤ්ඤය උජ්ඣපෙ.

19. නික්කඩ්ඪනං සිඤ්චනඤ්ච ආමිසහෙතු භුත්තාවී,
එහි අනාදරී භිංසා අපනිධෙ ච ජීවිතං.

20. ජානං සප්පාණකං කම්මං ඌනෙන සංවාසනාසනා,
සහධම්මිකං විලෙඛා ච මොහො අමූලකෙන ච.

21. කුක්කුච්චං ධම්මිකං චීවරං[3] පරිණාමෙය්‍ය පුග්ගලෙ,
කිං තෙ අකාලං අච්ඡින්දෙ දුග්ගහීත[4] නිරයෙන ච.

22. ගණං විභඞ්ගං දුබ්බලං කඨිනාඵාසු පස්සයං,
අක්කොසචණ්ඩි මච්ඡරී ගබ්භිනී ච පායන්තියා.

23. ද්වෙ වස්සං සික්ඛා සඞ්ඝෙන තයො චෙව ගිහිගතා,
කුමාරීභූතා තිස්සො ච ඌනද්වාදස සම්මතා.

24. අලං තාව සොකාවස්සං ඡන්දා අනුවස්සා ච ද්වෙ,
සික්ඛාපදා සත්තතිමෙ සමුට්ඨානා තිකා කතා.

25. කායචිත්තෙන න වාචා චිත්තං න කායිකං,
තීහි වාරෙහි ජායන්ති පාරාජිකං දුතියං යථා.

**දුතිය පාරාජිකසමුට්ඨානං නිට්ඨිතං.**

---

1. අත්තකාමිනං සී.මු.
2. ද්වෙ ම.ඡ.සං.
3. කුක්කුච්චං ධම්මිකං චීවරං දත්වා ම.ඡ.සං. කුක්කුච්චං.
4. දුග්ගහී ම.ඡ.සං. (ධම්මිකං දත්වා සය්‍යා.)

Free Distribution www.aathaapi.org

## ප්‍රථම පාරාජික සමුට්ඨානය

13. මෛථුනය ද සුක්කවිස්සට්ඨිය ද කායසංසර්ගය ද පළමුවන අනියතය ද පුබ්බූපහතය ද (භික්ෂුණී) පරිපාචිතය ද භික්ෂුණියක සමග රහොනිසජ්ජනය ද,

14. සභොජනය ද රහොනිසජ්ජා දෙක ද අඞ්ගුලිපතොදය ද උදකහස්සධම්මය ද පහාරදානය ද තලසත්තිඋග්ගිරණය ද තෙපණස් සේඛියාවෝ ද,

15. අධක්ඛකය ද ගාමන්තරගමනය ද අවස්සුතය ද තලඝාතය ද ජතුමට්ඨය ද උදකසුද්ධිය ද වස්සංවුත්ථය ද ඔවාද අගමනය ද නානුබන්ධපවත්තිනිය දැයි,

16. මේ සැත්තෑ සිඛයෝ කායචිත්තසමුට්ඨානිකයෝ කරණලදහ. (මේ) සියලු සිකපදයෝ ප්‍රථම පාරාජිකය මෙන් එක් සමුට්ඨානයක් ඇත්තෝ වෙත්.

**පඨම පාරාජික සමුට්ඨානය නිමි.**

## ද්වීතිය පාරාජික සමුට්ඨානය

17. අදත්තාදානය ද මනුස්සවිග්ගහය ද උත්තරිමනුස්සධම්මය ද දුට්ඨුල්ලය ද අත්තකාමපාරිචරියාව ද අමූලය ද අඤ්ඤභාගිය ද දෙවන අනියතය ද,

18. අච්ඡින්දනය ද පරිණාමනය ද මුසාවාදය ද ඔමසවාදය ද (භික්ඛු) පෙසුඤ්ඤය ද උදුට්ඨුල්ලාපත්තිආරොචනය ද පඨවිඛණනය ද භූතගාමය ද අඤ්ඤවාදකය ද උජ්ඣාපනය ද,

19. නික්කඩ්ඪනය ද සිඤ්චනය ද ආමිසහේතුව ද භුත්තාවි (පවාරණ)ය ද ඒහාවුසො ගාමං වා යනු ද අනාදරිය ද භිංසාපනකය ද අපනිධානය ද ජීවිතවොරොපනය ද,

20. ජානං සප්පාණකං යනු ද (උක්කොටන) කම්මය ද ඌනවීසතිවස්සය ද සංවාසය ද නාසනය ද සහධම්මිකය ද විලෙඛය ද මොහනකය ද අමූලකය ද,

21. කුක්කුච්චය ද ධම්මිකය ද චීවරය ද පුග්ගලපරිණාමනය ද 'කිංතෙ' යනු ද අකාලචීවරය ද චීවර අච්ඡින්දනය ද දුග්ගහිතය ද (නිරයාදීන්) අභිසපනය ද,

22. ගණචීවරන්තරාය ද චීවරවිභඞ්ගය ද දුබ්බලචීවරය ද කඨිනුද්ධාරය ද අඵාසුකරණය ද උපස්සය ද අක්කොසනය ද චණ්ඩීකෘතාය ද මච්ඡරිය ද ගබ්භිනී වුට්ඨාපනය ද පායන්ති වුට්ඨාපනය ද,

23. 'ද්වෙ වස්සං' යනු ද 'සඞ්ඝෙන අසම්මතං' යනු ද ගිහිගත තෙසිඛය ද කුමාරිභූත තෙසිඛය ද ඌන ද්වාදසවුට්ඨාපනය ද (පරිපුණ්ණද්වාදස) අසම්මත වුට්ඨාපනය ද,

24. 'අලං තාව' යනු ද 'සොකාවස්සං' යනු ද ඡන්දදානය ද අනුවස්සවුට්ඨාපනය ද ද්වෙවුට්ඨාපනය දැයි, මේ හැත්තෑ සිකපදයෝ තිකසමුට්ඨානභ යි කරණ ලද හ.

25. කයින් ද සිතින් ද නැගෙති, වචනයෙන් නො නැගෙත්, වචනයෙන් ද සිතින් ද නැගෙති, කයින් නො නැගෙත්, මෙසේ දෙවන පරිජිය මෙන් තිදොරින් උපදිත්.

**දුතිය පාරාජික සමුට්ඨානය නිමි.**

## සඤ්චරිත්ත සමුට්ඨානං

26. සඤ්චරී කුටි විහාරෙ ධොවනඤ්ච පටිග්ගහො,
විඤ්ඤත්තුත්තරි අභිහට්ඨුං උභින්නං දූතකෙන ච.

27. කොසිය සුද්ධ ද්වෙභාගා ඡබ්බස්සානි නිසීදනං,
රිඤ්චන්ති රූපිකා චෙව උභො නානප්පකාරකා.

28. ඌනබන්ධන වස්සිකා සුත්තං විකප්පනෙන ච,
ද්වාර දාන සිබ්බනී ච පූවපච්චය ජොති ච.

29. රතනං සූචි මඤ්චො ච තූලං නිසීදනං කණ්ඩු ච,
වස්සිකා ච සුගතෙන විඤ්ඤත්ති අඤ්ඤං චෙතාපනා

30. ද්වෙ සඞ්ඝිකා මහාජනී ද්වෙ පුග්ගලා ලහුකා ගරු,
ද්වෙ විඝාසා සාටිකා ච සමණචීවරෙන ච.

31. සමපඤ්ඤාසිමෙ ධම්මා ඡහි ඨානෙහි ජායරෙ,
කායතො න චිත්තා වාචතො න කායමනා.

32. කායවාචා න චිත්තතො[1] කායචිත්තා න වාචතො,
වාචාචිත්තා න කායෙන තීහි ද්වාරෙහි[2] ජායරෙ,
ඡ සමුට්ඨානිකා චෙතෙ සඤ්චරිත්තෙන සාදිසා.

සඤ්චරිත්තසමුට්ඨානං නිට්ඨිතං.

## සමනුභාසන සමුට්ඨානං

33 භෙදානුවත්තදුබ්බච දූස දුට්ඨුල්ල දිට්ඨි ච,
ඡන්දං උජ්ජග්ඝිකා ද්වෙ ච ද්වෙ ච සද්දා න බ්‍යාහරෙ.

34. ඡමා නීචාසනෙ ඨානං පච්ඡතො උප්පථෙන ච,
වජ්ජානුවත්තිගහණා ඔසාරෙ පච්චාචික්ඛනා.

35. කිස්මිං සංසට්ඨා ද්වෙ වධි විසිබ්බෙ දුක්ඛිතාය ච,
පුන සංසට්ඨා න වූපසමෙ ආරාමඤ්ච පවාරණා.

36. අන්වද්ධමාසං සහජීවි ද්වෙ චීවරං අනුබන්ධනා,
සත්තතිංස ඉමෙ ධම්මා කායවාචාය චිත්තතො,
සබ්බෙ එකසමුට්ඨානා සමනුභාසනා යථා.

සමනුභාසනසමුට්ඨානං නිට්ඨිතං.

---

1. චිත්තා ම.ඡ.සං.  2. තීහි ඨානෙහි ස්‍යා.

## සඤ්චරිත්ත සමුට්ඨානය

26. සඤ්චරිත්තය ද කුටිකාරය ද විහාරකාරය ද (චීවර) ධොවනය ද (චීවර) පටිග්ගහනය ද අඤ්ඤාතකවිඤ්ඤත්තිය ද තතුත්තරිසාදියනය ද උපක්ඛට දෙසිඛය ද රාජසිඛය ද,

27. කොසිය මිස්සකය ද සුද්ධකාලකය ද ද්වෙභාගය ද ජබ්බස්සය ද නිසීදන (සන්ථත) යද එළකලොම ධොවාපනය ද රූපිය පටිග්ගහණය ද (රූපියවොහාර කයවික්කය) නානාප්‍රකාර දෙසිඛය ද,

28. ඌනපඤ්චබන්ධනය ද වස්සිකසාටිකය ද සුත්තවිඤ්ඤාපනය ද විකප්පාපජ්ජනිය ද ද්වාරකොස—චීවරදාන—චීවර සිබ්බන තෙසිඛය ද පුවපවාරණ පච්චය පවාරණ—ජොතිසමාදහන තෙසිඛය ද,

29. රතනය ද සූචිඝරය ද මඤ්චකාරාපනය ද තුල නිසීදන කණ්ඩු පටිච්ඡාදන තෙසිඛය ද වස්සිකසාටික සුගතචීවර දෙ සිඛය ද විඤ්ඤත්තිය ද අඤ්ඤචෙතාපනය ද,

30. සඞ්ඝික දෙ සිඛය ද මහාජනික දෙසිඛය ද පුග්ගල ලහුක ගරුක තෙ සිඛය ද විසාස දෙසිඛය ද උදකසාටිකා සමණචීවර දෙසිඛය ද,

31. මේ සමපණස් සිකපදයෝ සතැනකින් උපදිති: කයින් උපදිති, වචනයෙන් සිතින් නූපදිත්, වචනයෙන් උපදිති, කයින් සිතින් නූපදිත්.

32. කයින් ද වචනයෙන් ද උපදිති, සිතින් නූපදිත්, කයින් ද සිතින් ද උපදිති වචනයෙන් නූපදිත්, වචනයෙන් ද සිතින් ද උපදිති, කයින් නූපදිත්, (කාවිසිමුනි) තිදොරින් උපදිත්. මොහු සඤ්චරිත්ත සිකපදය හා සමවූවෝ සමුට්ඨාන සයක් ඇත්තෝ වෙත්.

සඤ්චරිත්ත සමුට්ඨානය නිමි.

## සමානුභාසන සමුට්ඨානය

33. භෙදානුවත්තක දුබ්බච කුලදූසක දුට්ඨුල්ලපටිච්ඡාදන දිට්ඨිඅප්පටි නිස්සජ්ජන පස් සිඛ ද ඡන්දය ද උජ්ජග්ඝික දෙ සිඛය ද අප්පසද්ද දෙ සිඛය ද නබ්‍යාහරණය ද,

34. ඡමා නිවාසන ඨාන තෙසිඛය ද, පච්ඡතො ගමන උප්පථගමන දෙසිඛය ද වජ්ජපටිච්ඡාදන උක්ඛිත්තානුවත්තන හත්ථගහන තෙසිඛය ද ඔසරණය ද ප්‍රත්‍යාඛ්‍යානය ද,

35. කිස්මිඤ්චිදෙව සිඛය ද සංසට්ඨ දෙ සිඛය ද රොදනය ද විසිබ්බන දුක්ඛිත දෙ සිඛය ද (පුන) සංසට්ඨ නවූපසම දෙසිඛය ද ආරාම පවාරණ දෙ සිඛය ද,

36. අන්වද්ධ මාසය ද සහජීවී දෙසිඛය ද චීවරය ද ද්වෙවස්සානුබන්ධනය දැයි මේ සත්තිස් සිකපදයෝ කය වචන සිතින් උපදිත් නුයි සියල්ලෝ සමනුභාසනය මෙන් එක සමුට්ඨානයක් ඇත්තෝ වෙත්.

සමනුභාසන සමුට්ඨානය නිමි.

## කඨින සමුට්ඨානං

37. උබ්භතං කඨිනං තීණි පඨමං පත්තභෙසජ්ජං,
අච්චෙකං චාපි සාසඞ්කං පක්කමන්තෙන වා දුවෙ.

38. උපස්සයං පරම්පරං අනතිරිත්තං නිමන්තනං,
විකප්පං රඤ්ඤො විකාලෙ වොසාසාරඤ්ඤකෙන ච.

39. උස්සයා සන්නිචයඤ්ච පුරෙ පච්ඡා විකාලෙ ච,
පඤ්චාහිකා සඞ්කමනී දුවෙ ආවසථෙන ච.

40. පසාඛෙ ආසනෙ චෙව තිංස එකූනකා ඉමෙ,
කායවාචා න චිත්තා තීහි ද්වාරෙහි ජායරෙ,
ද්වෙ සමුට්ඨානිකා සබ්බෙ කඨිනෙන සහා සමා

කඨිනසමුට්ඨානං නිට්ඨිතං

## එළකලොම සමුට්ඨානං

41. එළකලොමා ද්වෙ සෙය්‍යං ආහච්ච පිණ්ඩභොජනං,
ගණ විකාල සන්නිධි දන්තපොණෙන වෙලකා.

42. උය්‍යුත්තං සෙනං උය්‍යොධි සුරා ඔරෙන න්හායනා,
දුබ්බණ්ණෙ ද්වෙ දෙසනීයා[1] ලසුණුපතිට්ඨෙ නච්චනා.

43. නහානං අත්ථරණං සෙය්‍යා අන්තො රට්ඨෙ තථා බහි,
අන්තොවස්සං චිත්තාගාරං ආසන්දිං සුත්තකන්තනා.

44. වෙය්‍යාවච්චං සහත්ථා ච අභික්ඛුකාවාසෙන ච,
ඡත්තං යානඤ්ච සඞ්ඝාණිං අලඞ්කාරං ගන්ධවාසිතං.

45. භික්ඛුනී සික්ඛමානා ච සාමණෙරී ගිහිනියා,
අසංකච්චිකා ආපත්ති චත්තාරීසා චතුත්තරි.

46. කායෙන න වාචා චිත්තෙන කායචිත්තෙන න වාචතො,
ද්වෙ සමුට්ඨානිකා සබ්බෙ සමා එළකලොමිකා.

එළකලොමසමුට්ඨානං නිට්ඨිතං.

---

1 දෙසනිකා ම.ඡ.සං.

Free Distribution www.aathaapi.org

## කඨින සමුට්ඨානය

37. උබ්භතකඨින තෙසිඛය ද පඨමපත්ත භෙසජ්ජ දෙසිඛය ද අච්චෙකචීවරය ද සාසඞ්කය ද (සෙනාසන) නපක්කම දෙ සිඛය ද,

38. භික්ඛුනුපස්සය ද පරම්පරභෝජනය ද අනතිරිත්තය ද නිමන්තණය ද විකප්පනය ද අන්තෙපුර සිඛය ද විකාලෙ ගාමප්පවෙසනය ද වොසාසමාන සිඛය ද ආරඤ්ඤක සිඛය ද,

39. උස්සයවාදිකා පත්තසන්නිචය දෙ සිඛය ද පුරෙභත්ත පච්ඡාභත්ත විකාල (කුලුපසඞ්කමන) තෙ සිඛය ද පඤ්චාහික සඞ්කාචීචාර චීවරසඞ්කමනීය දෙ සිඛය ද ආවස්ථ දෙ සිඛය ද,

40. පසාඛ සිඛය ද (නො පිළිවිස අස්නෙහි හිඳීම) ආසනසිඛය දැයි මේ එකුන්තිස් සිකපදයෝ කය වචන දෙකින් උපදිත්. සිතින් නූපදිති, තිදොරින් උපදිත්.

**කඨින සමුට්ඨානය නිමි.**

## ඒළකලෝම සමුට්ඨානය

41. ඒළකලෝමය ද සහසෙය්‍යා දෙ සිඛය ද ආහච්චපාද ආවස්ථ පිණ්ඩ භෝජන දෙ සිඛය ද ගණභෝජන විකාලභෝජන සන්නිධිකාර තෙ සිඛය ද දන්තපොණ සිඛය ද අචෙලක සිඛය ද,

42. උය්‍යුත්ත සේනා දෙ සිඛය ද උය්‍යොධිකය ද සුරාපාන නහාන දෙ සිඛයා, දුබ්බණ්ණ කරණය ද පාටිදෙසනීක දෙසිඛය ද ලසුණ උපතිට්ඨන නච්චන තෙසිඛය ද,

43. නහාන අත්ථරණ තුවට්ටසයන තෙ සිඛය ද එසේ ම අන්තොරට්ඨ තිරෙ රට්ඨ දෙ සිඛය ද අන්තොවස්ස චිත්තාගාර දෙසිඛය ද ආසන්දි සුක්තකන්තන දෙ සිඛය ද

44. වෙය්‍යාවච්ච සහත්ථ දෙ සිඛය ද අභික්ඛුකාවාසය ද ඡත්තූපාහන යාන සඞ්ඝාණි තෙ සිඛය ද ඉත්ථාලඞ්කාර ගන්ධවුණ්ණ වාසිත යන තෙසිඛය ද,

45. භික්ඛුනී සික්ඛමානා සාමණෙරී ගිහිනි (උම්මද්දන) සිවුසිඛය ද අසංකච්චික සිඛය දැයි සිවුසාළිස් සිකපදයෝ

46. කයින් නගිති, වචනයෙන් සිතින් නො නගිත්, කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්, සියල්ලෝ ඒළකලෝමකසිඛය සමාන වූවෝ ද්විසමුට්ඨානික වෙත්.

**එළකලොම සමුට්ඨානය නිමි.**

## පදසොධම්ම සමුට්ඨානං

47. පදඤ්ඤත්‍ර අසම්මතා අස්සඞ්ගතෙන ච,
තිරච්ඡානවිජ්ජා ද්වෙ වුත්තා අනොකාසෙ ච පුච්ඡනා.

48. සත්ත සික්ඛාපදා එතෙ වාචා න කායචිත්තතො,
වාචා චිත්තෙන ජායන්ති න තු කායෙන ජායරෙ,
ද්වෙ සමුට්ඨානිකා සබ්බෙ පදසොධම්මසාදිසා.

පදසොධම්මසමුට්ඨානං නිට්ඨිතං.

## අද්ධාන සමුට්ඨානං

49. අද්ධානං නාවං පණීතං මාතුගාමෙන සංහරෙ,
ධඤ්ඤං නිමන්තිතා චෙව අට්ඨ ච පාටිදෙසනී.

50. සික්ඛා පණ්ණරසා එතෙ කායා න වාචා න මනා,
කායවාචාහි ජායන්ති න තෙ චිත්තෙන ජායරෙ

51. කායචිත්තෙන ජායන්ති න තෙ ජායන්ති වාචතො,
කායවාචාහි චිත්තෙන සමුට්ඨානා චතුබ්බිධා,
පඤ්ඤත්තා බුද්ධඤාණෙන අද්ධානෙන සහා සමා.[1]

අද්ධානසමුට්ඨානං නිට්ඨිතං.

## ථෙය්‍යසත්ථ සමුට්ඨානං

52. ථෙය්‍යසත්ථං උපස්සුති සූපං විඤ්ඤාපනෙන ච,
රත්ති ඡන්නඤ්ච ඔකාසං එතෙ බ්‍යූහෙන සත්තමා.

53. කාය චිත්තෙන ජායන්ති න තෙ ජායන්ති වාචතො,
තීහි ද්වාරෙහි ජායන්ති ද්වෙ සමුට්ඨානිකා ඉමෙ,
ථෙය්‍යසත්ථසමුට්ඨානා දෙසිතාදිච්චබන්ධුනා.

ථෙය්‍යසත්ථසමුට්ඨානං නිට්ඨිතං.

## ධම්මදෙසනා සමුට්ඨානං

54. ඡත්තපාණිස්ස සද්ධම්මං න දෙසෙන්ති තථාගතා,
තථෙව[2] දණ්ඩපාණිස්ස සත්ථආයුධපාණිනං.

55. පාදුකුපාහනා යානං සෙය්‍ය පල්ලත්ථිකාය ච,
වෙඨිතො ගුණ්ඨිතො චෙව එකාදස මනුනතා.

56. වාචා චිත්තෙන ජායන්ති න තෙ ජායන්ති කායතො,
සබ්බෙ එකසමුට්ඨානා සමකා ධම්මදෙසනෙ.

ධම්මදෙසනාසමුට්ඨානං නිට්ඨිතං.

---

1. සමානයා ස්‍යා. 2. එවමෙව - ම.ඡ.සං.

# පදසොධම්ම සමුට්ඨානය

47. පදසොධම්ම අඤ්ඤත්‍ර විඤ්ඤුපුරිස අසම්මත යන තෙසිඛය ද එසේ ම අත්ථඞ්ගතසූරිය සිඛය ද තිරච්ඡාන විජ්ජා දෙසිඛය ද අනොකාස පඤ්හපුච්ඡන සිඛය ද,

48. මේ සත් සිකපදයෝ වචනයෙන් උපදිති, කයින් සිතින් නූපදිත්. වචනයෙන් හා සිතින් උපදිති, කයින් නො ම උපදිත්. (මේ) සියල්ලෝ පදසොධම්මසිඛය හා සමාන වූවෝ ද්විසමුට්ඨානික වෙත්.

පදසොධම්ම සමුට්ඨානය නිමි.

# අද්ධාන සමුට්ඨානය

49. අද්ධාන නාවාභිරුහන පණීතභොජන තෙසිඛය ද මාතුගාමසංවිධානය ද ලොමසංහරණය ද ධඤ්ඤ විඤ්ඤාපන නිමන්තන දෙ සිඛය ද මෙහෙණින්හට (පැණවූ) පාටිදෙසනීය සිඛ අටදයි,

50. මේ පසළොස් සිකපදයෝ කයින් උපදිති, වචනයෙන් ද සිතින් ද නූපදිත්, කයින් හා වචනයෙන් උපදිති, ඔහු සිතින් නූපදිත්.

51. කයින් හා සිතින් උපදිති, ඔහු වචනයෙන් නූපදිති, කය වචන සිත යන තිදෙරින් උපදිත්. මේ සිවුවැදෑරුම් සමුට්ඨානයෝ අද්ධාන සිකපදය හා සමකොට බුදුනුවණින් පණවන ලදහ.

අද්ධාන සමුට්ඨානය නිමි.

# ථෙය්‍යසත්ථ සමුට්ඨානය

52. ථෙය්‍යසත්ථය ද උපස්සුති විඤ්ඤාපන දෙසිඛය ද රත්තන්ධකාරය ද පටිච්ඡන්නය ද අබ්භොකාසය ද බ්‍යූහසිඛය සමග මේ සිකපදයෝ සත්දෙන,

53. කයින් හා සිතින් උපදිති, ඔහු වචනයෙන් නූපදිත්. කය වචන සිත යන තිදෙරින් උපදිත්, ථෙය්‍යසත්ථසමුට්ඨානය ඇති මේ සිකපදයෝ හිරුගොත් ඇති මුනිඳුන් විසින් ද්විසමුට්ඨානිකහයි වදරණ ලදහ.

ථෙය්‍ය සත්ථසමුට්ඨානය නිමි.

# ධම්මදේසන සමුට්ඨානය

54. තථාගතවරයෝ කුඩගත් අත් ඇත්තහුට දහම් නො දෙසත්. එසේ ම දඬුගත් අත් ඇත්තහුට ද සැත්ගත් අත් ඇත්තහුට ද අවිගත් අත් ඇත්තහුට ද,

55. මිරිවැඩි වහන් යාන යහන් නැගිටියහුට ද අකවටු අවුළුවා හුන්නහුට ද හිස්වෙළුම් ඇත්තහුට ද හිස්වැසුවහුට ද (දහම් නො දෙසත්) මේ නො අඩු එකොළොස් සිකපදයෝ,

56. වචනයෙන් හා සිතින් උපදිති, ඔහු කයින් නූපදිත්, (මේ) සියල්ලෝ ධම්ම දෙසන සමුට්ඨානය හා සමවූවාහු එකසමුට්ඨානිකයෝ වෙත්.

ධම්මදේසන සමුට්ඨානය නිමි.

## භූතාරොචන සමුට්ඨානං

57. භූතං කායෙන ජායති න වාචාය[1] න චිත්තතො,
වාචතො ච සමුට්ඨාති න කායා න ච චිත්තතො

58. කායවාචාය ජායති න ච ජායති චිත්තතො,
භූතාරොචනකා නාම තීහි ඨානෙහි ජායති.

භූතාරොචනසමුට්ඨානං නිට්ඨිතං.

## චොරිවුට්ඨාපන සමුට්ඨානං

59. චොරිං[2] වාචාය චිත්තෙන න තු ජායති කායතො,
ජායති තීහි ද්වාරෙහි චොරිවුට්ඨාපනං ඉදං,
අකතං ද්විසමුට්ඨානං ධම්මරාජෙන භාසිතං.

චොරිවුට්ඨාපනසමුට්ඨානං නිට්ඨිතං.

## අනනුඤ්ඤාත සමුට්ඨානං

60. අනනුඤ්ඤාතං වාචාය න කායා න ච චිත්තතො,
ජායති කායවාචාය න තං ජායති චිත්තතො.

61. ජායති වාචා චිත්තෙන න තං ජායති කායතො,
ජායති තීහි ද්වාරෙහි අකතං චතුට්ඨානිකං.

අනනුඤ්ඤාතසමුට්ඨානං නිට්ඨිතං.

62. සමුට්ඨානං හි සඞ්ඛෙපං දස තීණි සුදෙසිතං,
අසම්මොහකරං ඨානං නෙත්තිධම්මානුලොමිකං,
ධාරයන්තො ඉමං විඤ්ඤූ සමුට්ඨානෙ න මුය්හතීති

සමුට්ඨානසීසසඞ්ඛෙපො නිට්ඨිතො.

---

1. න වාචා - ම.ඡ.සං. 2. චොරි - ම.ඡ.සං.

Free Distribution www.aathaapi.org

## භූතාරෝචන සමුට්ඨානය

57. භූතාරෝචනය කයින් උපදියි, වචනයෙන් ද සිතින් ද නූපදී, වචනයෙන් ද නඟියි, කයින් හා සිතින් නො නඟී.

58. කයින් හා වචනයෙන් උපදියි, සිතින් නූපදී. භූතාරෝචනක නම් සිඛය තුන් තැනෙකින් උපදී.

භූතාරෝචන සමුට්ඨානය නිමි.

## චොරිවුට්ඨාපන සමුට්ඨානය

59. චොරිවුට්ඨාපනය වචනයෙන් හා සිතින් උපදියි, කයින් නූපදී. තිදෙරින් උපදී. මේ චොරිවුට්ඨාපන සිඛය අමිශ්‍ර වූ ද්විසමුට්ඨානිකයැයි ධර්මරාජයන් විසින් වදරණ ලදී.

චොරිවුට්ඨාපන සමුට්ඨානය නිමි.

## අනනුඥාත සමුට්ඨානය

60. අනනුඥාතය වචනයෙන් නූපදියි, කයින් හා සිතින් නූපදී, කයින් හා වචනයෙන් උපදියි, එය සිතින් නූපදී.

61. වචනයෙන් හා සිතින් උපදියි, එය කයින් නූපදී. තිදෙරින් උපදී, (එහෙයින් මෙය) අමිශ්‍ර වූ චතුසමුට්ඨානයෙකි.

අනනුඥාත සමුට්ඨානය නිමි.

62. සමුට්ඨානසංක්ෂේපය තෙළෙසකැයි මැනැවින් වදරණ ලදී. විනයපාළියට අනුලොම් වූ නුමුළා බව කරණ මේ කාරණය දරන නුවණැත්තේ සමුට්ඨානයෙහි මුළා නො වන්නේයි.

සමුට්ඨාන ශීර්ෂ සංක්ෂේපය නිමියේ යි.

---

# අන්තරපෙය්‍යාලෙ

## කතිපුච්ඡාවාරො

කති ආපත්තියො, කති ආපත්තික්ඛන්ධා, කති විනීතවත්ථූනි, කති අගාරවා, කති ගාරවා, කති විනීතවත්ථූනි, කති විපත්තියො, කති ආපත්තිසමුට්ඨානා, කති විවාදමූලානි, කති අනුවාදමූලානි, කති සාරාණීයා ධම්මා, කති භෙදකරවත්ථූනි, කති අධිකරණානි, කති සමථා:

පඤ්ච ආපත්තියො, පඤ්ච ආපත්තික්ඛන්ධා, පඤ්ච විනීතවත්ථූනි, සත්ත ආපත්තියො, සත්ත ආපත්තික්ඛන්ධා, සත්ත විනීත වත්ථූනි, ඡ අගාරවා, ඡ ගාරවා, ඡ විනීතවත්ථූනි, චතස්සො විපත්තියො, ඡ ආපත්තිසමුට්ඨානා, ඡ විවාදමූලානි, ඡ අනුවාදමූලානි, ඡ සාරාණීයා ධම්මා, අට්ඨාරස භෙදකරවත්ථූනි, චත්තාරි අධිකරණානි, සත්තසමථා

1. තත්ථ කතමා පඤ්ච ආපත්තියො: පාරාජිකාපත්ති, සඞ්ඝාදිසෙසාපත්ති, පාචිත්තියාපත්ති, පාටිදෙසනීයාපත්ති, දුක්කටාපත්ති. ඉමා පඤ්ච ආපත්තියො.

2. තත්ථ කතමෙ පඤ්ච ආපත්තික්ඛන්ධා: පාරාජිකාපත්තික්ඛන්ධො, සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, පාචිත්තියාපත්තික්ඛන්ධො, පාටිදෙසනීයාපත්තික්ඛන්ධො, දුක්කටාපත්තික්ඛන්ධො. ඉමෙ පඤ්ච ආපත්තික්ඛන්ධා.

3. තත්ථ කතමානි පඤ්ච විනීතවත්ථූනි: පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො, ඉමානි පඤ්ච විනීතවත්ථූනි.

4. තත්ථ කතමා සත්ත ආපත්තියො: පාරාජිකාපත්ති, සඞ්ඝාදිසෙසාපත්ති, ථුල්ලච්චයාපත්ති, පාචිත්තියාපත්ති, පාටිදෙසනීයාපත්ති, දුක්කටාපත්ති, දුබ්භාසිතාපත්ති. ඉමා සත්ත ආපත්තියො.

5. තත්ථ කතමෙ සත්ත ආපත්තික්ඛන්ධා: පාරාජිකාපත්තික්ඛන්ධො, සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධො, ථුල්ලච්චයාපත්තික්ඛන්ධො, පාචිත්තියාපත්තික්ඛන්ධො, පාටිදෙසනීයාපත්තික්ඛන්ධො, දුක්කටාපත්තික්ඛන්ධො, දුබ්භාසිතාපත්තික්ඛන්ධො. ඉමෙ සත්ත ආපත්තික්ඛන්ධා.

6. තත්ථ කතමානි සත්ත විනීතවත්ථූනි: සත්තහි ආපත්තික්ඛන්ධෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කාමො සෙතුඝාතො. ඉමානි සත්ත විනීතවත්ථූනි.

7. තත්ථ කතමෙ ඡ අගාරවා: බුද්ධෙ අගාරවො, ධම්මෙ අගාරවො, සඞ්ඝෙ අගාරවො, සික්ඛාය අගාරවො, අප්පමාදෙ අගාරවො, පටිසන්ථාරෙ අගාරවො. ඉමෙ ඡ අගාරවා.



Free Distribution www.aathaapi.org

# අනන්තරපෙය්‍යාලය

## කතිපුච්ඡාවාරය

ආපත්තීහු කෙතෙක් ද, ආපත්තිස්කන්ධයෝ කෙතෙක් ද, විනීත වස්තූහු කෙතෙක් ද, අගෞරවයෝ කෙතෙක් ද, ගෞරවයෝ කෙතෙක් ද, විනීත වස්තූහු කෙතෙක් ද, විපත්තීහු කෙතෙක් ද, ආපත්ති සමුට්ඨානයෝ කෙතෙක් ද, විවාද මූලයෝ කෙතෙක් ද, අනුවාදමූලයෝ කෙතෙක් ද, සාරාණීය ධර්මයෝ කෙතෙක් ද, භෙදකර වස්තූහු කෙතෙක් ද, අධිකරණයෝ කෙතෙක් ද, ශමථයෝ කෙතෙක් ද යත් :

ආපත්තීහු පස්දෙනෙකි, ආපත්තිස්කන්ධයෝ පස්දෙනෙකි, විනීත වස්තූහු පස්දෙනෙකි, ආපත්තීහු සත්දෙනෙකි, ආපත්තිස්කන්ධයෝ සත්දෙනෙකි, විනීතවස්තූහු සත් දෙනෙකි. අගෞරවයෝ සදෙනෙකි, ගෞරවයෝ සදෙනෙකි, විනීතවස්තූහු සදෙනෙකි, විපත්තීහු සිවු දෙනෙකි, ආපත්ති සමුට්ඨානයෝ සදෙනෙකි, විවාදමූලයෝ සදෙනෙකි, අනුවාදමූලයෝ සදෙනෙකි, සාරාණීය ධර්මයෝ සදෙනෙකි, භෙදකර වස්තූහු අටළොස් දෙනෙකි, අධිකරණයෝ සිවුදෙනෙකි, ශමථයෝ සත් දෙනෙකි.

1. එහි පස්වැදෑරුම් ආපත්තීහු කවරහ යත් : පාරාජිකාපත්ති යැ, සඞ්ඝාදිසෙස පත්ති යැ, පාචිත්තියාපත්ති යැ, පාටිදෙශ නීයාපත්ති යැ, දුෂ්කෘතාපත්ති යැයි මොහු පස් වැදෑරුම් ආපත්තීහුයි.

2. එහි පස්වැදෑරුම් ආපත්තිස්කන්ධයෝ කවරහ යත් : පාරාජිකාපත්තිස්කන්ධ යැ, සඞ්ඝාදිසෙසපත්තිස්කන්ධ යැ, පාචිත්තියාපත්තිස්කන්ධ යැ, පාටිදෙසනීයාපත්ති ස්කන්ධ යැ, දුක්කටාපත්තිස්කන්ධ යැයි මොහු පස්වැදෑරුම් ආපත්තිස්කන්ධයෝයි.

3. එහි පස්වැදෑරුම් විනීත වස්තූහු කවරහ යත් : පස් වැදෑරුම් ආපත්තිස්කන්ධයන් ගෙන් දුරුවීම යැ තොරවීම යැ වෙන් වෙන් වශයෙන් වැළැකීම යැ විරමණ යැ අක්‍රිය යැ අකරණ යැ නො පැමිණීම යැ සීමා නොයික්මවීම යැ ඇවැත්කඳු නැසීම යැ යි මොහු පස්දෙන විනීතවස්තූහුයි.

4. එහි සත්වැදෑරුම් ආපත්තීහු කවරහ යත් : පාරාජිකාපත්ති යැ, සඞ්ඝාදිසෙසා පත්ති යැ, ථුල්ලච්චයාපත්ති යැ, පාචිත්තියාපත්ති යැ, පාටිදෙසනීයාපත්ති යැ, දුක්කටා පත්ති යැ, දුබ්භාසිතාපත්ති යැ යි මොහු සත්දෙන ආපත්තීහුයි.

5. එහි සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයෝ කවරහ යත් : පාරාජිකාපත්තිස්කන්ධ යැ, සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධ යැ, ථුල්ලච්චයාපත්තිස්කන්ධ යැ, පාචිත්තියාපත්තිස් කන්ධ යැ, පාටිදෙසානීයාපත්තිස්කන්ධ යැ, දුක්කටාපත්තිස්කන්ධ යැ, දුබ්භාසිතාපත්තිස් කන්ධ යැ යි මොහු සත්දෙන ආපත්තිස්කන්ධයෝයි.

6. එහි සත්වැදෑරුම් විනීතවස්තූහු කවරහ යත් : සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් ගෙන් දුරුවීම යැ තොරවීම යැ වෙන් වෙන් වශයෙන් වැළැකීම යැ විරමණ යැ අක්‍රියා යැ අකරණ යැ නො පැමිණීම යැ සීමා නොයික්මවීම යැ ඇවැත්කඳු නැසීම යැයි මොහු සත් දෙන විනීත වස්තූහු යි.

7. එහි සවැදෑරුම් අගෞරවයෝ කවරහ යත් : බුදුන් කෙරෙහි අගෞරව යැ දහම්හි අගෞරව යැ සඟුන් කෙරෙහි අගෞරව යැ ශික්ෂායෙහි අගෞරව යැ අප්‍රමාදයෙහි අගෞරව යැ පිළිසඳරෙහි අගෞරව යැ යි මොහු සදෙන අගෞරවයෝ යි.



Free Distribution www.aathaapi.org

8. තත්‍ථ කතමෙ ඡ ගාරවා: බුද්ධෙ ගාරවො, ධම්මෙ ගාරවො, සඞ්ඝෙ ගාරවො, සික්ඛාය ගාරවො, අප්පමාදෙ ගාරවො, පටිසන්‍ථාරෙ ගාරවො. ඉමෙ ඡ ගාරවා.

9. තත්‍ථ කතමානි ඡ විනීතවත්‍ථූනි: ඡහි අගාරවෙහි ආරති විරති පටිවිරති වෙරමණී අකිරියා අකරණං අනජ්ඣාපත්ති වෙලාඅනතික්කමො සෙතුඝාතො. ඉමානි ඡ විනීතවත්‍ථූනි.

10. තත්‍ථ කතමා චතස්සො විපත්තියො: සීලවිපත්ති, ආචාරවිපත්ති, දිට්ඨිවිපත්ති, ආජීවවිපත්ති. ඉමා චතස්සො විපත්තියො.

11. තත්‍ථ කතමෙ ඡ ආපත්තිසමුට්ඨානා: අත්‍ථාපත්ති කායතො සමුට්ඨාති, න වාචතො න චිත්තතො. අත්‍ථාපත්ති වාචතො සමුට්ඨාති, න කායතො න චිත්තතො, අත්‍ථාපත්ති කායතො ච වාචතො ච සමුට්ඨාති න චිත්තතො, අත්‍ථාපත්ති කායතො ච චිත්තතො ච සමුට්ඨාති, න වාචතො. අත්‍ථාපත්ති වාචතො ච චිත්තතො ච සමුට්ඨාති, න කායතො. අත්‍ථාපත්ති කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති. ඉමෙ ඡ ආපත්තිසමුට්ඨානා

12. තත්‍ථ කතමානි ඡ විවාදමූලානි: ඉධ භික්ඛු කොධනො හොති උපනාහී, යො සො භික්ඛු කොධනො හොති උපනාහි, සො සත්‍ථරිපි අගාරවො විහරති අප්පතිස්සවො, ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සවො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සවො, සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො භික්ඛු සත්‍ථරි අගාරවො විහරති අප්පතිස්සවො, ධම්මෙ-පෙ-සඞ්ඝෙ-පෙ-සික්ඛාය න පරිපූරකාරී සො සඞ්ඝෙ විවාදං ජනෙති, යො හොති විවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්‍ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං. එවරූපං චෙ තුම්හෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ එවරූපං චෙ තුම්හෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති

පුනචපරං භික්ඛු මක්ඛී හොති පලාසී-පෙ-ඉස්සුකී හොති මච්ඡරී-පෙ-සඨො හොති මායාවී-පෙ- පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී-පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, යො සො භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, සො සත්‍ථරිපි අගාරවො විහරති අප්පතිස්සවො. ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සවො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සවො, සික්ඛායපි න පරිපූරකාරී හොති, යො සො භික්ඛු සත්‍ථරි අගාරවො විහරති අප්පතිස්සවො, -ධම්මෙ-පෙ-සඞ්ඝෙ-පෙ-සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ විවාදං

8. එහි සවැදෑරුම් ගෞරවයෝ කවරහ යත් : බුදුන් කෙරෙහි ගෞරව යැ දහම්හි ගෞරව යැ සඟුන් කෙරෙහි ගෞරව යැ ශික්ෂායෙහි ගෞරව යැ අප්‍රමාදයෙහි ගෞරව යැ පිළිසඳරෙහි ගෞරව යැ යි මොහු සදෙන ගෞරවයෝ යි.

9. එහි සවැදෑරුම් විනීතවස්තූහු කවරහ යත් : සවැදෑරුම් අගෞරවයන් ගෙන් දුරුවීම යැ තොරවීම යැ වෙන් වෙන් වශයෙන් වැළකීම යැ විරමණ යැ අක්‍රිය යැ අකරණ යැ නො පැමිණීම යැ සීමා නොයික්මවීම යැ ඇවැත්කඳු නැසීම යැයි මොහු සදෙන විනීත වස්තූහු යි

10. එහි සිවුවැදෑරුම් විපත්තීහු කවරහ යත් : සීලවිපත්ති යැ ආචාරවිපත්ති යැ දිට්ඨිවිපත්ති යැ ආජීවවිපත්ති යැ යි මොහු සිවු විපත්තීහු යි.

11. එහි සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයෝ කවරහ යත් : කයින් නගින ඇවැතෙක් ඇත, එය වචනයෙන් නො නගියි, සිතින් නො නඟී. වචනයෙන් නඟින ඇවතෙක් නැත, එය කයින් නො නඟියි, සිතින් නො නඟී. කයින් ද වචනයෙන් ද නගින ඇවැතෙක් ඇත, එය සිතින් නො නඟී. කයින් ද සිතින් ද නගින ඇවැතෙක් ඇත, එය වචනයෙන් නො නඟී. වචනයෙන් ද සිතින් ද නගින ඇවැතෙක් ඇත, එය කයින් නො නඟී. කයින් ද වචනයෙන් ද සිතින් ද නඟින ඇවැතෙක් ඇතැයි මොහු සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයෝයි.

12. එහි සවැදෑරුම් විවාදමූලයෝ කවරහ යත් : මේ ශාසනයෙහි මහණ කිපෙන සුලුවූයේ බද්ධ වෛර ඇත්තේ වෙයි. යම් ඒ මහණෙක් කිපෙන සුලුවූයේ බද්ධ වෛර ඇත්තේ ද, ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි, ධර්මය කෙරෙහිද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි, සඞ්ඝයා කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි, ශික්ෂාව ද සම්පූර්ණ කරන්නෙක් නො වෙයි, යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසේ ද, ධර්මය කෙරෙහි . . . සඞ්ඝයා කෙරෙහි . . . ශික්ෂාව සම්පූර්ණ කරන්නෙක් නො වේ ද, ඒ මහණ සඞ්ඝයා කෙරෙහි විවාද උපදවයි. යම් ඒ විවාදයෙක් බොහෝ ජනයාට අහිත පිණිස බොහෝ ජනයාට නො සුව පිණිස බොහෝ ජනයාට අවැඩ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේද, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් වූ කරුණක් සිය සතන්හි හෝ පිටතැ හෝ දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ විවාදයට මුල් වූ කරුණ පහ කිරීම පිණිස වෑයම් කරවු. ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල්වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ නො දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ විවාදයට මුල් වූ කරුණ මත්තෙහි නො පැවැත්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ විවාදමූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ ලාමක වූ විවාදමූලයාගේ මත්තෙහි නො පැවැත්ම වේ.

නැවත ද අනෙකෙක් වෙයි. මහණෙ ගුණමකු වූයේ යුහග්‍රාහී වෙයි. . . . ඊර්ෂා කරණසුලු වූයේ මසුරුබව් ඇත්තේ වෙයි. කපටි වූයේ මායා ඇත්තේ වෙයි. ලාමක අදහස් ඇත්තේ මිසදිටු ඇත්තේ වෙයි. ස්වකීය දෘෂ්ටිය ම ආමර්ෂණය කරන්නේ දැඩි වැ ගන්නා සුලු වූයේ (වරද) බැහැරලීමෙහි දුෂ්කර වූයේ වෙයි. යම් ඒ මහණෙක් ස්වකීය දෘෂ්ටිය ම ආමර්ෂණය කරන්නේ දැඩි වැ ගන්නා සුලු වූයේ (වරද) බැහැරලීමෙහි දුෂ්කර වූයේ වේ ද, ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ධර්මය කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. සඞ්ඝයා කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ශික්ෂාව ද සම්පූර්ණ කරන්නෙක් නො වෙයි. යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසේ ද, ධර්මය කෙරෙහි . . . සඞ්ඝයා කෙරෙහි . . . ශික්ෂාව සම්පූර්ණ කරන්නෙක් නොවේ ද, ඒ මහණ සඞ්ඝයා කෙරෙහි විවාද උපදවයි. යම් විවාදයෙක් බොහෝ

ජනෙති, යො හොති විවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙවමනුස්සානං, එවරූපං චෙ තුම්හෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස විවාදමූලකස්ස පහානාය වායමෙය්‍යාථ, එවරූපං චෙ තුම්හෙ විවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස පහානං හොති, එවමෙතස්ස පාපකස්ස විවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති, ඉමානි ඡ විවාදමූලානි

18. තත්ථ කතමානි ඡ අනුවාදමූලානි: ඉධ භික්ඛු කොධනො හොති උපනාහී, යො සො භික්ඛු කොධනො හොති උපනාහී, සො සත්ථරිපි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො, සික්ඛායපි න පරිපූරකාරී හොති. යො සො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය න පරිපූරකාරී සො සඞ්ඝෙ අනුවාදං ජනෙති, යො හොති අනුවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙව-මනුස්සානං. එවරූපං චෙ තුම්හෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස පහානං හොති, එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති.

පුනචපරං භික්ඛු මක්ඛී හොති පළාසී -පෙ- ඉස්සුකී හොති මච්ඡරී -පෙ- සඨො හොති මායාවී -පෙ- පාපිච්ඡො හොති මිච්ඡාදිට්ඨී -පෙ- සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, යො සො භික්ඛු සන්දිට්ඨිපරාමාසී හොති ආධානගාහී දුප්පටිනිස්සග්ගී, සො සත්ථරිපි අගාරවො විහරති අප්පතිස්සො, ධම්මෙපි අගාරවො විහරති අප්පතිස්සො, සඞ්ඝෙපි අගාරවො විහරති අප්පතිස්සො. සික්ඛායපි න පරිපූරකාරී හොති, යො සො භික්ඛු සත්ථරි අගාරවො විහරති අප්පතිස්සො. ධම්මෙ -පෙ- සඞ්ඝෙ -පෙ- සික්ඛාය න පරිපූරකාරී, සො සඞ්ඝෙ අනුවාදං ජනෙති, යො හොති අනුවාදො බහුජනඅහිතාය බහුජනඅසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛාය දෙව මනුස්සානං. එවරූපං චෙ තුම්හෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස පහානාය වායමෙය්‍යාථ. එවරූපං චෙ තුම්හෙ අනුවාදමූලං අජ්ඣත්තං වා බහිද්ධා වා න සමනුපස්සෙය්‍යාථ, තත්‍ර තුම්හෙ තස්සෙව පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවාය පටිපජ්ජෙය්‍යාථ. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස පහානං හොති. එවමෙතස්ස පාපකස්ස අනුවාදමූලස්ස ආයතිං අනවස්සවො හොති. ඉමානි ඡ අනුවාදමූලානි.

ජනයාහට අහිත පිණිස බොහෝ ජනයාහට නො සුව පිණිස බොහෝ ජනයාහට අවැඩ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ ද, ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ විවාදයට මුල් වූ කරුණ පහ කිරීම පිණිස වැයම් කරවු. ඉදින් තෙපි මෙබඳු විවාදයට මුල් වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ නො දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ එම විවාදයට මුල්වූ කරුණ මත්තෙහි නො පැවැත්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ විවාද මූලයාගේ පහකිරීම වෙයි. මෙසේ මේ ලාමක වූ විවාද මූලයාගේ මත්තෙහි නො පැවැත්ම වේ. මොහු සවැදෑරුම් විවාද මූලයෝයි.

13 එහි සවැදෑරුම් අනුවාදමූලයෝ කවරහ යත් : මේ ශාසනයෙහි මහණ කිපෙන සුලු වූයේ බද්ධවෛර ඇත්තේ වෙයි. යම් ඒ මහණෙක් කිපෙනසුලු වූයේ බද්ධවෛර ඇත්තේ වේ ද, ඒ මහණ ශාස්තෲන් වහන්සේ කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ධර්මය කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. සඞ්ඝයා කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ශික්ෂාව ද සම්පූර්ණ කරන්නෙක් නො වෙයි. යම් ඒ මහණෙක් ශාස්තෲන් වහන්සේ කෙරෙහි ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසේ ද, ධර්මය කෙරෙහි . . . සඞ්ඝයා කෙරෙහි . . . ශික්ෂාව සම්පූර්ණ කරන්නෙක් නොවේ ද, ඒ මහණ සඞ්ඝයා කෙරෙහි අනුවාදය උපදවයි, යම් අනුවාදයෙක් බොහෝ ජනයාහට අහිත පිණිස බොහෝ ජනයාහට නො සුව පිණිස බොහෝ ජනයාහට අවැඩ පිණිස දෙව්මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ ද, ඉදින් තෙපි මෙබඳු අනුවාදයට මුල් වූ කරුණක් සිය සතන්හි හෝ පිටතැ හෝ දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ එම අනුවාදයට මුල් වූ කරුණ පහ කිරීම පිණිස වැයම් කරවු. ඉදින් තෙපි මෙබඳු අනුවාදයට මුල්වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ නො දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ අනුවාදයට මුල් වූ කරුණ මත්තෙහි නො පැවැත්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ අනුවාද මූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ ලාමක වූ අනුවාද මූලයාගේ මත්තෙහි නො පැවැත්ම වේ.

නැවැත ද අනෙකක් වෙයි. මහණ ගුණමකු වූයේ යුගග්‍රාහී වෙයි. . . , ඊර්ෂ්‍යා කරණ සුලු වූයේ මසුරුබැව් ඇත්තේ වෙයි. කපටි වූයේ මායා ඇත්තේ වෙයි. ලාමක අදහස් ඇත්තේ මිථ්‍යාදෘෂ්ටි ඇත්තේ වෙයි. ස්වකීය දෘෂ්ටිය ම ආමර්ෂණය කරන්නේ දැඩි වැ ගන්නාසුලු වූයේ (වරද) බැහැරලීමෙහි දුෂ්කර වූයේ වෙයි. යම් ඒ මහණෙක් ස්වකීය දෘෂ්ටිය ම ආමර්ෂණය කරන්නේ දැඩි වැ ගන්නා සුලු වූයේ (වරද) බැහැරලීමෙහි දුෂ්කර වූයේ වේ ද, ඒ මහණ ශාස්තෲන් කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ධර්මය කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. සඞ්ඝයා කෙරෙහි ද ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසෙයි. ශික්ෂාව ද සම්පූර්ණ කරන්නේ නො වේ. යම් ඒ මහණෙක් ශාස්තෲන් කෙරෙහි ගෞරව රහිත වැ යටහත් පැවැතුම් නැති වැ වෙසේ ද, ධර්මය කෙරෙහි .... සඞ්ඝයා කෙරෙහි . . . ශික්ෂාව සම්පූර්ණ කරන්නෙක් නො වේ ද, ඒ මහණ සඞ්ඝයා කෙරෙහි අනුවාදය උපදවයි, යම් අනුවාදයෙක් බොහෝ ජනයාහට අහිත පිණිස බොහෝ ජනයාහට නො සුව පිණිස බොහෝ ජනයාහට අවැඩ පිණිස දෙව් මිනිසුන්ට අහිත පිණිස දුක් පිණිස වේ ද, ඉදින් තෙපි මෙබඳු අනුවාදයට මුල් වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ අනුවාදයට මුල් වූ කරුණ පහ කිරීම පිණිස වැයම් කරවු. ඉදින් තෙපි මෙබඳු අනුවාදයට මුල්වූ කරුණක් සියසතන්හි හෝ පිටතැ හෝ නො දක්නහු නම් එහිලා තෙපි ලාමක වූ ඒ අනුවාදයට මුල්වූ කරුණ මත්තෙහි නො පැවැත්ම පිණිස පිළිපදිවු. මෙසේ මේ ලාමක වූ අනුවාදමූලයාගේ ප්‍රහාණය වෙයි. මෙසේ මේ ලාමක වූ අනුවාද මූලයාගේ මත්තෙහි නො පැවැත්ම වේ. මොහු සවැදෑරුම් අනුවාද මූලයෝයි.

23—ඕ 17881 (7/75)

14. තත්‍ථ කතමෙ ඡ සාරාණීයා ධම්මා: ඉධ භික්ඛුනො මෙත්තං කායකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරිසු ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං භික්ඛුනො මෙත්තං වචීකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං භික්ඛුනො මෙත්තං මනොකම්මං පච්චුපට්ඨිතං හොති සබ්‍රහ්මචාරීසු ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං භික්ඛු යෙ තෙ ලාභා ධම්මිකා ධම්මලද්ධා අන්තමසො පත්තපරියාපන්නමත්තම්පි, තථාරූපෙහි ලාභෙහි අප්පටිවිභත්තභොගී හොති සීලවන්තෙහි සබ්‍රහ්මචාරීහි සාධාරණභොගී, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං භික්ඛු යානි තානි සීලානි අඛණ්ඩානි අච්ඡිද්දානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤුප්පසත්ථානි අපරාමට්ඨානි සමාධිසංවත්තනිකානි, තථාරූපෙසු සීලෙසු සීලසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකීභාවාය සංවත්තති.

පුනචපරං භික්ඛු යායං දිට්ඨි අරියා නිය්‍යානිකා නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය, තථාරූපාය දිට්ඨියා දිට්ඨිසාමඤ්ඤගතො විහරති සබ්‍රහ්මචාරීහි ආවි චෙව රහො ච, අයම්පි ධම්මො සාරාණීයො පියකරණො ගරුකරණො සඞ්ගහාය අවිවාදාය සාමග්ගියා එකී භාවාය සංවත්තති, ඉමෙ ඡ සාරාණීයා ධම්මා.

15. තත්‍ථ කතමානි අට්ඨාරස භෙදකරවත්ථූනි: ඉධ භික්ඛු අධම්මං ධම්මොති දීපෙති, ධම්මං අධම්මොති දීපෙති, අවිනයං විනයොති දීපෙති, විනයං අවිනයොති දීපෙති, අභාසිතං අලපිතං තථාගතෙන භාසිතං ලපිතං තථාගතෙනාති දීපෙති, භාසිතං ලපිතං තථාගතෙන අභාසිතං අලපිතං තථාගතෙනාති දීපෙති, අනාචිණ්ණං තථාගතෙන ආචිණ්ණං තථාගතෙනාති දීපෙති, ආචිණ්ණං තථාගතෙන අනාචිණ්ණං

14. එහි සවැදෑරුම් සාරාණීයධර්මයෝ කවරහ යත් : මේ ශාසනයෙහි මහණක්හුගේ මෛත්‍රී කායකර්මය සබ්‍රම්සරුන් කෙරෙහි හමුයෙහි ද නො හමුයෙහි ද එළඹ සිටියේ වෙයි. මේ මෛත්‍රීකායකර්මසඞ්ඛ්‍යාත ධර්මය ද සිහිකටයුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ. (සබ්‍රම්සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතුබව පිණිස විවාද නො කිරීම පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී.

නැවත ද අනෙකෙක් වෙයි. මහණක්හුගේ මෛත්‍රී වාක්කර්මය සබ්‍රම්සරුන් කෙරෙහි හමුයෙහි ද නො හමුයෙහි ද එළඹ සිටියේ වෙයි. මේ මෛත්‍රී වාක්කර්ම සඞ්ඛ්‍යාත ධර්මය ද සිහිකටයුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ (සබ්‍රම්සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතු බව පිණිස විවාද නො කිරීම පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී.

නැවත ද අනෙකෙක් වෙයි. මහණක්හුගේ මෛත්‍රීමනඃකර්මය සබ්‍රම්සරුන් කෙරෙහි හමුයෙහි ද නො හමුයෙහි ද එළඹ සිටියේ වෙයි. මේ මෛත්‍රීමනඃකර්මසඞ්ඛ්‍යාත සිහිකට යුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ (සබ්‍රම් සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතු බව පිණිස විවාද නො කිරීම පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී.

නැවත ද අනෙකෙක් වෙයි. මහණ දැහැමි වූ දැහැමින් ලද්දවූ යම් ඒ ලාභයෝ වෙත් නම් යටත් පිරිසෙයින් පාත්‍රගත වූ පමණකුත් වේ ද, එබඳු ලාභයන් සිල්වත් සබ්‍රම්සරුන් හා සාධාරණ පරිභෝග ඇත්තේ පටිවිභත්තභොගී නො වූයේ වෙයි. මේ ධර්මය ද සිහි කට යුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ. (සබ්‍රම්සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතු බව පිණිස විවාද නො කරණු පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී.

නැවත ද අනෙකෙක් වෙයි. මහණ නො කඩ වූ නො සිදුරු වූ නො සබල වූ නො කැලල් වූ නිදහස් වූ නුවණැත්තන් විසින් පසස්නා ලද (තෘෂ්ණා දෘෂ්ටීන්) නො පහස්නා ලද, සමාධිය එළවන්නා වූ යම් ඒ ශීලයෝ වෙත් ද, එබඳු ශීලයන්හි පිරිපුන් සිල්වතුන් හා සමබවට පැමිණියේ හමුයෙහි ද නො හමුයෙහි ද සබ්‍රම්සරුන් හා වෙසෙයි. මේ ධර්මය ද සිහිකටයුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ. (සබ්‍රම්සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතු බව පිණිස විවාද නො කිරීම පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී.

නැවත ද අනෙකෙක් වෙයි. මහණ යම් මේ (මාර්ග සම්ප්‍රයුක්ත) දෘෂ්ටියෙක් නිදෙස් ද නෛර්‍ය්‍යාණික ද නිවණට පමුණුවන්නී ද, ඒ අනුශාසනය කළහුගේ මොනවට දුක් නැසීම පවතී ද, එබඳු වූ දෘෂ්ටියෙන් සමබවට පැමිණියේ හමුයෙහි ද නො හමුයෙහි ද සබ්‍රම්සරුන් හා වෙසෙයි. මේ ධර්මය ද සිහිකටයුත්තේ යැ. ප්‍රියයකු කරන්නේ යැ. ගරුකටයුත්තකු කරන්නේ යැ. (සබ්‍රම්සරුන් විසින්) සඞ්ග්‍රහ කටයුතු බව පිණිස විවාද නො කිරීම පිණිස කායසාමග්‍රිය පිණිස එකභබව පිණිස පවතී. මොහු සවැදෑරුම් සාරණීය ධර්මයෝ යි.

15. එහි අටළොස් භේදකරවස්තුහු කවරහ යත් : මේ ශාසනයෙහි මහණ අධර්මය ධර්මයැයි ප්‍රකාශ කරයි. ධර්මය අධර්මයැයි ප්‍රකාශ කරයි. අවිනය විනයැයි ප්‍රකාශ කරයි. විනය අවිනයැයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් නො වදරණ ලද්ද ප්‍රකාශ නො කරණ ලද්ද තථාගතයන් විසින් වදරණ ලද යැ පවසන ලදයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් වදරණ ලද්ද පවසන ලද්ද තථාගතයන් විසින් නො වදරණ ලද යැ නො පවසන ලදැයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් නො පුරුදු

තථාගතෙනාති දීපෙති, අපඤ්ඤත්තං තථාගතෙන පඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, පඤ්ඤත්තං තථාගතෙන අපඤ්ඤත්තං තථාගතෙනාති දීපෙති, ආපත්තිං අනාපත්තීති දීපෙති, අනාපත්තිං ආපත්තීති දීපෙති, ලහුකං ආපත්තිං ගරුකාපත්තීති දීපෙති, ගරුකං ආපත්තිං ලහුකාපත්තීති දීපෙති, සාවසෙසං ආපත්තිං අනවසෙසාපත්තීති දීපෙති, අනවසෙසං ආපත්තිං සාවසෙසාපත්තීති දීපෙති, දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලාපත්තීති දීපෙති, අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලාපත්තීති දීපෙති, ඉමානි අට්ඨාරස භෙදකරවත්ථූනි.

16. තත්ථ කතමානි චත්තාරි අධිකරණානි : විවාදාධිකරණං, අනුවාදාධිකරණං, ආපත්තාධිකරණං, කිච්චාධිකරණං, ඉමානි චත්තාරි අධිකරණානි.

17. තත්ථ කතමෙ සත්ත සමථා : සම්මුඛාවිනයො, සතිවිනයො, අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, යෙභුය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකො, ඉමෙ සත්ත සමථා.

කතිපුච්ඡාවාරො නිට්ඨිතො.

---

තස්සුද්දානං :

1. ආපත්ති ආපත්තික්ඛන්ධා-විනීතා සත්තධා පුන,
විනීතාගාරවා චෙව-ගාරවා මූලමෙව ච.

2. පුන විනීතා විපත්ති-සමුට්ඨානා විවාදනා,
අනුවාද සාරණීයා-භෙදාධිකරණෙන ච,
සත්තෙව සමථා වුත්තා-පද සත්තරසා ඉමෙති.

---

## ජ ආපත්තිසමුට්ඨානවාරො

1. පඨමෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති : න හීති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. පාචිත්තියං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. දුක්කටං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති : න හීති වත්තබ්බං.

2. දුතියෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති : න හීති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. පාචිත්තියං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති : න හීති වත්තබ්බං. දුක්කටං ආපජ්ජෙය්‍යාති : සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති : න හීති වත්තබ්බං.

කරණ ලද්ද තථාගතයන් විසින් පුරුදු කරණ ලදැයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් පුරුදු කරණ ලද්ද තථාගතයන් විසින් නො පුරුදු කරණ ලදැයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් නො පණවන ලද්ද තථාගතයන් විසින් පණවන ලදැයි ප්‍රකාශ කරයි. තථාගතයන් විසින් පණවන ලද්ද තථාගතයන් විසින් නො පණවන ලදැයි ප්‍රකාශ කරයි. ඇවැත නො ඇවැතැ යි ප්‍රකාශ කරයි. නො ඇවැත ඇවැතැයි ප්‍රකාශ කරයි. ලුහු ඇවැත ගරු ඇවැතැයි ප්‍රකාශ කරයි. ගරු ඇවැත ලුහු ඇවැතැයි ප්‍රකාශ කරයි. සාවසෙස ඇවැත අනවසෙස ඇවැතැයි ප්‍රකාශ කරයි. අනවසෙස ඇවැත සාවසෙස ඇවැතැයි ප්‍රකාශ කරයි. තුළුල් ඇවැත නො තුළුල් ඇවැතැයි ප්‍රකාශ කරයි. නො තුළුල් ඇවැත තුළුල් ඇවැතැයි ප්‍රකාශ කරයි. මොහු අටළොස් භෙදකර වස්තූහු යැ.

16. එහි සිවුවැදෑරුම් අධිකරණයෝ කවරහ යත් : විවාදාධිකරණ යැ අනුවාදාධිකරණ යැ ආපත්තාධිකරණ යැ කිච්චාධිකරණ යැ. මොහු සිවුවැදෑරුම් අධිකරණයෝ යි.

17. එහි සත්වැදෑරුම් ශමථයෝ කවරහ යත් : සම්මුඛාවිනය යැ සතිවිනය ය අමූළ්හවිනය යැ පටිඤ්ඤාතකරණ යැ යෙභුය්‍යසිකා යැ තස්සපාපියාසිකා යැ තිණවත්ථාරක යැ. මොහු සත්වැදෑරුම් ශමථයෝ යි.

කතිපුච්ඡාවාරය නිමි.

---

එහි නාමාවලිය :

1. ආපත්ති යැ, ආපත්තිස්කන්ධ යැ, විනීත යැ, යළි සත්පරිදි වූ ආපත්ති යැ, ආපත්තිස්කන්ධ යැ, විනීත යැ, අගාරව යැ, ගාරව යැ, විවාදමූල යැ.

2. යළි විනීත යැ, විපත්ති යැ, සමුට්ඨාන යැ, විවාද මූල යැ, භෙද අධිකරණයන් සමග අනුවාද යැ, සාරණීය යැ, සත්තසමථයැ යි මේ පදයෝ සතළොසෙක් වදරණ ලදහ.

---

## ෂඩාපත්ති සමුත්ථානවාරය

1. පළමුවන ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : නැතැයි කියයුතුයැ. සඝාදිසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පචිතියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයි. පිළිදෙස්නියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : නැතැයි කියයුතු යි.

2. දෙවන ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : නැතැයි කියයුතුයැ. සඝාදිසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතු යැ. පචිතියට පැමිණේ ද යත් : වියහැක්කැ යැයි කියයුතුයැ. පිළිදෙස්නියට පැමිණේ ද යත් : නැතැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : නැතැයි කියයුතු යි.

3. තතියෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති: න හීති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. පාචිත්තියං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුක්කටං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති: න හීති වත්තබ්බං.

4. චතුත්ථෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං පාචිත්තියං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුක්කටං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති: න හීති වත්තබ්බං.

5. පඤ්චමෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. පාචිත්තියං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති: න හීති වත්තබ්බං. දුක්කටං. ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං.

6 ඡට්ඨෙන ආපත්තිසමුට්ඨානෙන පාරාජිකං ආපජ්ජෙය්‍යාති සියාති වත්තබ්බං. සඞ්ඝාදිසෙසං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. ථුල්ලච්චයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං පාචිත්තියං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. පාටිදෙසනීයං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුක්කටං ආපජ්ජෙය්‍යාති: සියාති වත්තබ්බං. දුබ්භාසිතං ආපජ්ජෙය්‍යාති: න හීති වත්තබ්බං.

ඡ ආපත්තිසමුට්ඨානවාරෙ හිට්ඨිමතො පඨමං.

---

## කථාපත්තිවාරෝ

1. පඨමෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති: පඨමෙන ආපත්තියමුට්ඨානෙන පඤ්ච ආපත්තියො ආපජ්ජති: භික්ඛු කප්පියසඤ්ඤී සඤ්ඤාචිකාය කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස, තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. භික්ඛු කප්පියසඤ්ඤී විකාලෙ භොජනං භුඤ්ජති, ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු කප්පියසඤ්ඤී අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජති, ආපත්ති පාටිදෙසනීයස්ස. පඨමෙන ආපත්තිසමුට්ඨානෙන ඉමා පඤ්චආපත්තියො ආපජ්ජති.

3. තුන්වන ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : නැතැයි කියයුතුයැ. සඝවෙසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලැසියට පැමිණේ ද, යත් : විය හැක්කැයි කියයුතුයැ. පචිතියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පිළිදෙස්නියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : නැතැයි කියයුතු යි.

4. සතරවන ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. සඝවෙසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලැසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පචිතියට පැමිණේ ද යත : විය හැක්කැයි කියයුතුයැ. පිළිදෙස්නියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : නැතැයි කියයුතු යි.

5. පස්වන ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. සඝවෙසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලැසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පචිතියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පිළිදෙස්නියට පැමිණේ ද යත් : නැතැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතු යි.

6. සවැනි ආපත්තිසමුට්ඨානයෙන් පරිජියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැං සඝවෙසෙසට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. ථුල්ලැසියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පචිතියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. පිළිදෙස්නියට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුකුළාවට පැමිණේ ද යත් : විය හැක්කැයි කියයුතුයැ. දුබැසියට පැමිණේ ද යත් : නැතැයි කියයුතු යි.

ප්‍රථම ෂඩාපත්තිසමුත්ථානවාරය නිමි.

---

## කථාපත්තිවාරය

1. පළමුවන ආපත්තිසමුට්ඨානයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : පළමුවන ආපත්තිසමුට්ඨානයෙන් පස් ඇවැතකට පැමිණෙයි : මහණ කැපැයි හැඟීම් ඇති වැ තමා අල්වා ගත් උපකරණයෙන් නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්ම වූ උවදුරු සහිත උපචාර රහිත වූ කුටියක් කෙරේ ද, පියෝහි දුකුළා වෙයි, එක් පිඩක් නො පත් කල්හි ථුල්ලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත් කල්හි සඝවෙසෙස් ඇවැත් වෙයි, මහණ කැපැයි හැඟීම් ඇති වැ නො කල්හි බොජුන් වළඳා නම් පචිති ඇවැත් වෙයි, මහණ කැපැයි හැඟීම් ඇතිවැ ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කෑයුතු දයක් හෝ බුදිය යුතු දයක් හෝ සියතින් පිළිගෙණ වළඳා නම් පිළිදෙස්නි ඇවැත් වේ. පළමුවන ආපත්තිසමුට්ඨානයෙන් මේ ඇවැත්පසට පැමිණේ.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: චතුන්නං අධිකරණානං කතමං අධිකරණං: සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං සියා ආචාරවිපත්තිං සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො සමුට්ඨහන්ති, න වාචතො න චිත්තතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං, සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

2. දුතියෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති: දුතියෙන ආපත්තිසමුට්ඨානෙන චතස්සො ආපත්තියො ආපජ්ජති: කප්පියසඤ්ඤී සමාදිසති "කුටිං මෙ කරෙථා"ති, තස්ස කුටිං කරෙන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස, භික්ඛු කප්පියසඤ්ඤී අනුපසම්පන්නං පදසොධම්මං වාචෙති, ආපත්ති පාචිත්තියස්ස. දුතියෙන ආපත්තිසමුට්ඨානෙන ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: වාචතො සමුට්ඨහන්ති න කායතො, න චිත්තතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

3. තතියෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති: තතියෙන ආපත්තිසමුට්ඨානෙන පඤ්ච ආපත්තියො ආපජ්ජති: භික්ඛු කප්පියසඤ්ඤී සංවිදහිත්වා කුටිං කරෙති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස, තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. භික්ඛු කප්පියසඤ්ඤී. පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති, ආපත්ති පාචිත්තියස්ස භික්ඛු කප්පියසඤ්ඤී භික්ඛුනියා වොසාසන්තියා න නිවාරෙත්වා භුඤ්ජති, ආපත්ති පාටිදෙසනීයස්ස. තතියෙන ආපත්තිසමුට්ඨානෙන ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද, සවැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඬ්ග්‍රහකරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක සඞ්ඝාදිශේෂාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාටිදේසනීයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි පඤ්චාපත්තිස්කන්ධයෙන් සඬ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : කයින් නගිති, වචනයෙන් නො නගිති, සිතින් නො නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

2. දෙවන ආපත්තිසමුට්ඨානයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : දෙවන ආපත්තිසමුට්ඨානයෙන් සිවු ඇවැතකට පැමිණේයි: මහණ කැපැයි හැඟීම් ඇති වැ " මට කුටියක් කරව " යි කියා ද, ඒ මහණහට නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්මවූ උවදුරු සහිත වූ උපචාර රහිත කුටියක් කරත් නම් පියෝහි දුකුළා වෙයි, එක් පිඬක් නො පත් කල්හි ථුලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත් කල්හි සඟවෙසෙස් ඇවැත් වෙයි, මහණ කැපැයි හැඟීම් ඇති වැ අනුපසපනක්හට පදවශයෙන් ධර්මය කියවා නම් පචිති ඇවැත් වේ. දෙවන ආපත්තිසමුට්ඨානයෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද, . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි චතුරාපත්තිස්කන්ධයෙන් සඬ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : වචනයෙන් නගිති. කයින් නො නගිති, සිතින් නො නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණය. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්

3. තුන්වන ආපත්තිසමුට්ඨානයෙන් කිහි ඇවැතකට පැමිණේ ද යත් : තුන්වන ආපත්තිසමුට්ඨානයෙන් පස් ඇවතකට පැමිණෙයි: මහණ කැපැයි හැඟීම් ඇති වැ සංවිධාන කොට නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්මවූ උවදුරු සහිත උපචාර රහිත වූ කුටියක් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, එක් පිඩක් නොපත් කල්හි ථුලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත්කල්හි සඟවෙසෙස් ඇවැත් වෙයි, මහණ හැඟීම් ඇති වැ පිණි බොජුන් තමා පිණිස විනවා වළඳානම් පචිති ඇවැත් වෙයි; මහණ කැපැයි හැඟීම් ඇතිවැ අණවන මෙහෙණ නො වළක්වා වළඳානම් පිළිදෙස්නී ඇවැත් වේ. තුන්වන ආපත්තිසමුට්ඨානයෙන් මේ පස් ඇවැතට පැමිණේ.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති -පෙ- සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන, ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච සමුට්ඨහන්ති, න චිත්තතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියං සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

4. චතුත්ථෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති. චතුත්ථෙන ආපත්තිසමුට්ඨානෙන ඡ ආපත්තියො ආපජ්ජති: භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවති ආපත්ති පාරාජිකස්ස, භික්ඛු අකප්පියසඤ්ඤී සඤ්ඤාචිකාය කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං. එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී විකාලෙ භොජනං භුඤ්ජති, ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා භුඤ්ජති, ආපත්ති පාටිදෙසනීයස්ස. චතුත්ථෙන ආපත්තිසමුට්ඨානෙන ඉමා ඡ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: -පෙ- සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ඡහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො. චතුන්නං අධිකරණානං. ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

5. පඤ්චමෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති: පඤ්චමෙන ආපත්තිසමුට්ඨානෙන ඡ ආපත්තියො ආපජ්ජති: භික්ඛු පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී සමාදිසති "කුටිං මෙ කරොථා"ති තස්ස කුටිං කරොන්ති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං, එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස. තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස.

Free Distribution www.aathaapi.org

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත්තීන් අතුරෙන් කෙතෙක් විපත්තීන් බෙජෙත් ද. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්සිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක සඞ්ඝාදිසේසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාටිදෙසනීයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි පඤ්චාපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : කයින් ද වචනයෙන් ද නගිති, සිතින් නො නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසි විටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

4. සතරවන ආපත්තිසමුට්ඨානයෙන් කිහි ඇවැතකට පැමිණේ ද යත් : සතරවන ආපත්තිසමුට්ඨානයෙන් ස ඇවැතකට පැමිණෙයි : මහණ මෛථුන්දම් සේවනය කෙරේනම් පරිජි ඇවැත් වෙයි, මහණ නො කැපැයි හැඟීම් ඇති වැ තමා ඉල්වාගත් උපකරණයෙන් නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්ම වූ උවදුරු සහිත උපචාර රහිත වූ කුටියක් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, එක් පිඩක් නොපත් කල්හි ථුලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත් කල්හි සඟවෙසෙස් ඇවැත් වෙයි, මහණ නො කැපැයි හැඟීම් ඇතිවැ නො කල්හි බොජුන් වළඳානම් පචිති ඇවැත් වෙයි, මහණ කොකැපැයි හැඟීම් ඇති වැ ඇතුළුගමට පිවිසි නො නෑ මෙහෙණක අතින් කෑ යුතු දෑයක් හෝ බිදිය යුතු දෑයක් හෝ සියතින් පිළිගෙණ වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වේ. සතරවන ආපත්තිසමුට්ඨානයෙන් මේ සඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාටිදෙසනීයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි ෂඩාපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟිති : කයින් ද සිතින් ද නඟිති, වචනයෙන් නො නඟිත්, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

5. පස්වන ආපත්තිසමුට්ඨානයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : පස්වන ආපත්තිසමුට්ඨානයෙන් ස ඇවැතකට පැමිණෙයි : මහණ ලාමක අදහස් ඇත්තේ ලාමක අදහසින් මඩනාලද්දේ (තමා කෙරෙහි) නැත්තා වූ අවිද්‍යමාන වූ උතුරු මිනිස්ධම් මතු කොට ප්‍රකාශ කෙරේ නම් පරිජි ඇවැත් වෙයි, මහණ නො කැපැයි හැඟීම් ඇති වැ '' මට කුටියක් කරව '' යි අණ කෙරේ ද, ඒ මහණහට නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්ම වූ උවදුරු සහිත උපචාර රහිත වූ කුටියක් කෙරේ නම් පියෝහි දුකුළා වෙයි, එක් පිඩක් නො පත් කල්හි ථුලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත්කල්හි සඟවෙසෙස් ඇවැත් වෙයි.

භික්ඛු අකප්පියසඤ්ඤී අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙති, ආපත්ති පාචිත්තියස්ස. න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා හීනෙන හීනං වදෙති, ආපත්ති දුබ්භාසිතස්ස. පඤ්චමෙන ආපත්තිසමුට්ඨානෙන ඉමා ඡ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ඡහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන, සියා දුක්කටාපත්තික්ඛන්ධෙන, සියා දුබ්භාසිතාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න කායතො. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

6. ඡට්ඨෙන ආපත්තිසමුට්ඨානෙන කති ආපත්තියො ආපජ්ජති: ඡට්ඨෙන ආපත්තිසමුට්ඨානෙන ඡ ආපත්තියො ආපජ්ජති: භික්ඛු සංවිදහිත්වා භණ්ඩං අවහරති, ආපත්ති පාරාජිකස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී සංවිදහිත්වා කුටිං කරොති අදෙසිතවත්ථුකං පමාණාතික්කන්තං සාරම්භං අපරික්කමනං, පයොගෙ දුක්කටං, එකං පිණ්ඩං අනාගතෙ ආපත්ති ථුල්ලච්චයස්ස, තස්මිං පිණ්ඩෙ ආගතෙ ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති, ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු අකප්පියසඤ්ඤී භික්ඛුනියා වොසාසන්තියා න නිවාරෙත්වා භුඤ්ජති, ආපත්ති පාටිදෙසනීයස්ස. ඡට්ඨෙන ආපත්ති සමුට්ඨානෙන ඉමා ඡ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා. ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති, සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ඡහි ආයත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන චාති.

ඡ ආපත්තිසමුට්ඨානානං කතාපත්තිවාරෙ නිට්ඨිතො දුතියො.

---

Free Distribution www.aathaapi.org

මහණ නො කැපැයි හැඟීම් ඇති වැ අනුපසපනක්හට පෙළදහම කියවා නම් පචිති ඇවැත් වෙයි, ද්වේශයෙන් ආක්‍රොශ නො කරණු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මතු කරණු කැමැත්තේ කෙළිසිනා කැමැත්තෙන් හීන ජාතිවාදයෙන් හීනජාතිකයකුට කියා නම් දුබැසි ඇවැත් වේ. පස්වන ආපත්තිසමුට්ඨාන යෙන් මේ සඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද. . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාර විපත්තිය දෑයි විපත් දෙකක් බෙජෙත්. සත් වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසි විටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුබ්භාසිතාපත්තිස්කන්ධයෙන් දෑයි ෂඩාපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : වචනයෙන් ද සිතින් ද නගිති, කයින් නො නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දෑයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

6. සවැනි ආපත්තිසමුට්ඨානයෙන් කෙතෙක් ඇවැතකට පැමිණේ ද යත් : සවැනි ආපත්තිසමුට්ඨානයෙන් ස ඇවැතකට පැමිණෙයි : මහණ සංවිධාන කොට භාණ්ඩ සොරකම් කෙරේ නම් පරිජිඇවැත් වෙයි, මහණ නො කැපැයි හැඟීම් ඇති වැ සංවිධාන කොට නො දෙසන ලද කුටිවාස්තු ඇති පමණ ඉක්ම වූ උඩදුරු සහිත උපචාර රහිත වූ කුටියක් කෙරේ ද පියෝහි දුකුළා වෙයි, එක් පිඩක් හො පත් කල්හි ථුලැසි ඇවැත් වෙයි, ඒ පිඩ පත් කල්හි සඟවෙසෙස් ඇවැත් වෙයි, මහණ නො කැපැයි හැඟීම් ඇතිවැ පිණි බොජුන් තමා පිණිස පිනවා වළඳා නම් පචිති ඇවැත් වෙයි, මහණ තෙමේ නො කැපැයි හැඟීම් ඇති වැ (බොජුන්හල) අණවන මෙහෙණ නො වළක්වා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වේ. සවැනි ආපත්තිසමුට්ඨානයෙන් මේ ස ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දෑයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධ යෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස් කන්ධයෙන් ද කිසිවිටෙක පාටිදෙසනීයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටා පත්තිස්කන්ධයෙන් දෑයි ෂඩාපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දෑයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

**ෂඩාපත්තිසමුත්ථානය පිළිබඳ වූ දෙවන කථාපත්තිවාරය නිමි.**

---

## 3. ආපත්තිසමුට්ඨානගාථා

1. සමුට්ඨානා කායිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

2. සමුට්ඨානා කායිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා පඤ්ච
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

3. සමුට්ඨානා වාචසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

4. සමුට්ඨානා වාචසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා චතස්සො
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

5. සමුට්ඨානා කායිකා වාචසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

6. සමුට්ඨානා කායිකා වාචසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙක දස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා පඤ්ච
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

7. සමුට්ඨානා කායිකා මානසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

8. සමුට්ඨානා කායිකා මානසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා ඡ
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

9. සමුට්ඨානා වාචසිකා මානසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රූහි විභඞ්ගකොවිද.

## 3. ආපත්ති සමුට්ඨාන ගාථා

1. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායසමුට්ඨාන කෙනෙක් වදරණ ලදහු ද, එයින් නැගී ඇවැත්හු කෙතෙක් දැයි ඔබ විචාරමි. එය කියනු මැනැවි.

2. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශීවූ මුනීන්ද්‍රයන් විසින් යම් කාය සමුට්ඨාන කෙනෙක් වදරණ ලදහු ද, එයින් නැගී ඇවැත්හු (දුකුළා, ථුල්ලැසි, සඟවෙසෙස්, පචිති, පිළිදෙස්නී) යි පසෙකි. තොපට මෙය කියමි.

3. විභඞ්ගකොවිද, විවෙකදර්ශීවූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් වාචසිකසමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ වාචසිකසමුට්ඨානයෙන් නැංගාවූ ඇවැත්හු කෙතෙක් දැයි තොප විචාරමි. එය කියනු මැනැව.

4. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් වාචසික සමුට්ඨානයෙක් වදරණ ලද ද ඒ වාචසිකසමුට්ඨානයෙන් නැංගාවූ ඇවැත්හු (දුකුළා, ථුල්ලැසි, සඟවෙසෙස්, පචිති යි) සිව් දෙනෙකි. තොපට මෙය කියමි.

5. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායිකවාචසිකසමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායිකවාචසිකසමුට්ඨානයෙන් නැංගාවූ ඇවැත්හු කෙතෙක් දැයි තොප විචාරමි. එය කියනු මැනැව.

6. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායිකවාචසිකසමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායිකවාචසිකසමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු (දුකුළා, ථුල්ලැසි, සඟවෙසෙස්, පචිති, පිළිදෙස්නීයි) පසෙකි. තොපට මෙය කියමි.

7. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු කෙතෙක් දැයි තොප විචාරමි. එය කියනු මැනැව.

8. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු (පරිජි, දුකුළා, ථුල්ලැසි, සඟවෙසෙස්, පචිති, පිළි දෙස්නී යි) සදෙනෙකි. තොපට මෙය කියමි.

9. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීද්‍රයන් විසින් යම් වාචසික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ වාචසික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු කෙතෙක් දැයි තොප විචාරමි. එය කියනු මැනැව.

10. සමුට්ඨානා වාචසිකා මානසිකා අනන්තදස්සිනා,
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා ඡ
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිද.

11. සමුට්ඨානා කායිකා වාචසිකා මානසිකා අනන්තදස්සිනා,
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා කති
පුච්ඡාමි තං බ්‍රෑහි විභඞ්ගකොවිද.

12. සමුට්ඨානා කායිකා වාචසිකා මානසිකා අනන්තදස්සිනා
අක්ඛාතා ලොකහිතෙන විවෙකදස්සිනා,
ආපත්තියො තෙන සමුට්ඨිතා ඡ
එතං තෙ අක්ඛාමි විභඞ්ගකොවිදාති.

ආපත්ති සමුට්ඨානගාථා නිට්ඨිතා තතියා

---

## 4. විපත්ති පච්චයවාරො

1. සීලවිපත්තිපච්චයා කති ආපත්තියො ආපජ්ජති: සීලවිපත්ති-පච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං පටිච්ඡාදෙති, ආපත්ති පාරාජිකස්ස. වෙමතිකා පටිච්ඡාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛු සඞ්ඝාදිසෙසං පටිච්ඡාදෙති, ආපත්ති පාචිත්තියස්ස. අත්තනො දුට්ඨුල්ලං පටිච්ඡාදෙති, ආපත්ති දුක්කටස්ස. සීලවිපත්තිපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, -පෙ- සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මන්ති:

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාත-කරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

2. ආචාරවිපත්තිපච්චයා කති ආපත්තියො ආපජ්ජති: ආචාර-විපත්තිපච්චයා එකං ආපත්තිං ආපජ්ජති: ආචාරවිපත්තිං පටිච්ඡාදෙති, ආපත්ති දුක්කටස්ස. ආචාරවිපත්තිපච්චයා ඉමං එකං ආපත්තිං ආපජ්ජති.

සා ආපත්ති චතුන්නං විපත්තීනං කති විපත්තියො භජති-පෙ-සත්තන්නං සමථානං කතිහි සමථෙහි සම්මති:

Free Distribution www.aathaapi.org

10. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් වාචසික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ වාචසික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු (පරිජි, දුකුළා, ථුලැසි, සඟවෙසෙස්, පචිති, දුබැසි යී) සයෙකි. තොපට මෙය කියමි.

11. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායික වාචසික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායික වාචසික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු කෙතෙක් දැයි තොප විචාරමි. එය කියනු මැනැව.

12. විභඞ්ගකොවිද, විවෙකදර්ශී වූ සත්ත්වහිතවිධායක වූ අනන්තදර්ශී වූ මුනීන්ද්‍රයන් විසින් යම් කායික වාචසික මානසික සමුට්ඨානයෙක් වදරණ ලද ද, ඒ කායික වාචසික මානසික සමුට්ඨානයෙන් නැංගා වූ ඇවැත්හු (පරිජි, දුකුළා, ථුලැසි, සඟවෙසෙස්, පචිති, පිළිදෙස්නී යී) සදෙනෙකි. තොපට මෙය කියමි.

තෙවන ආපත්ති සමුට්ඨාන ගාථා නිමි.

---

## 4. විපත්ති පච්චයවාරය

1. ශීලවිපත්ති හේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත්: ශීලවිපත්ති හේතුයෙන් සිවු ඇවැතකට පැමිණෙයි: මෙහෙණ දන දන පරිජි ඇවැතක් සඟවා නම් පරිජි ඇවැත් වෙයි, විමති ඇත්තී සඟවා නම් ථුලැසි ඇවැත් වෙයි, මහණ සඟවෙසෙසක් සඟවා නම් පචිති ඇවැත් වෙයි, තමාගේ තුළුල් ඇවැතක් සඟවා නම් දුකුළා ඇවැත් වේ. ශීලවිපත්ති හෙතුවෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවු වැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත්:

ඒ ඇවැත්හු සිවු වැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස් කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටා පත්තිස්කන්ධයෙන් දැයි චතුරාපත්ති ස්කන්ධයෙන් සඞ්ග්‍රහකරණ ලද්හු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති: කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවු වැදෑරුම්අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසි විටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසි විටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

2. ආචාර විපත්තිහේතුයෙන් කෙතෙක් ඇවැතුන්ට පැමිණේ ද යත්: ආචාර විපත්තිහේතුයෙන් එක් ඇවැතකට පැමිණෙයි: ආචාරවිපත්තිය පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වේ. ආචාර විපත්තිහේතුයෙන් මේ එක් ඇවැතට පැමිණේ.

ඒ ඇවැත සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජේ ද, . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත්:

24—ඕ පී 17881 (7/75)

Free Distribution www.aathaapi.org

සා ආපත්ති චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජති: ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං එකේන ආපත්තික්ඛන්ධේන සඞ්ගහිතා: දුක්කටාපත්තික්ඛන්ධේන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකේන සමුට්ඨානේන සමුට්ඨාති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨාති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

3. දිට්ඨිවිපත්තිපච්චයා කති ආපත්තියො ආපජ්ජති: දිට්ඨිවිපත්තිපච්චයා ද්වෙ ආපත්තියො ආපජ්ජති: පාපිකාය දිට්ඨියා යාව තතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති, ඤත්තියා දුක්කටං. කම්මවාචාපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස. දිට්ඨිවිපත්තිපච්චයා ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජන්ති: ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ද්වීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකේන සමුට්ඨානේන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

4. ආජීවවිපත්තිපච්චයා කති ආපත්තියො ආපජ්ජති: ආජීවවිපත්තිපච්චයා ඡ ආපත්තියො ආපජ්ජති: ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරිමනුස්සධම්මං උල්ලපති, ආපත්ති පාරාජිකස්ස. ආජීවහෙතු ආජීවකාරණා සඤ්චරිත්තං සමාපජ්ජති, ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. ආජීවහෙතු ආජීවකාරණා යො තෙ විහාරෙ වසති, සො භික්ඛු අරහාති භණති. පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛු පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති, ආපත්ති පාචිත්තියස්ස. ආජීවහෙතු ආජීවකාරණා භික්ඛුනී පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති, ආපත්ති පාටිදෙසනීයස්ස. ආජීවහෙතු ආජීවකාරණා සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස. ආජීවවිපත්තිපච්චයා ඉමා ඡ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති. -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං ඡහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන, සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන.

ඒ ඇවැත සිවුවැදෑරුම් විපත් අතුරෙන් ආචාර විපත්තිසඞ්ඛ්‍යාත එක් විපතක් බෙජේ. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් දුක්කටාපත්තිස්කන්ධසඞ්ඛාත එක් ආපත්තිස්කන්ධයෙකින් සඞ්ග්‍රහ කරණ ලද. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නඟියි: කයින් ද වචනයෙන් ද සිතින් ද නඟී. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් අපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසි විටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණ යෙන් ද කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳේ.

3. දිට්ඨිවිපත්තිහේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත්: දිට්ඨිවිපත්ති හේතුයෙන් දෙ ඇවැතකට පැමිණෙයි: ලාමක දෘෂ්ටිහෙතුයෙන් තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (එය) නො හරී නම් ඤත්තියෙන් දුකුළා වෙයි, කම්වදන් අවසන්හි පචිති ඇවැත් වේ. දිට්ඨිවිපත්තිහෙතුයෙන් මේ දෙ ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත්:

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් ආචාරවිපත්තිසඞ්ඛ්‍යාත එක් විපතක් බෙජෙත්. සත් වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාචිත්තියාපත් තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි දෙ ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨාන යෙකින් නඟිති: කයින් ද වචනයෙන් ද සිතින් ද නඟිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛා විනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාර කයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

4. ආජීව විපත්තිහේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත්: ආජීවවිපත්ති හේතුයෙන් සඇවැතකට පැමිණෙයි: දිවිපැවැත්ම හේතුකොට දිවිපැවැත්ම කරුණු කොට ලාමක අදහස් ඇත්තේ ලාමක අදහසින් මඩනා ලද්දේ (තමන් කෙරෙහි) නැති අවිද්‍යමාන වූ උතුරු මිනිස්ධම් මතුකොට ප්‍රකාශ කෙරේ නම් පරිජී ඇවැත් වෙයි, දිවි පැවැත්ම හෙතු කොට දිවිපැවැත්ම කරුණු කොට (ස්ත්‍රීපුරුෂයන් අතර) හැසිරීමට පැමිණේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, දිවිපැවැත්ම හේතු කොට දිවිපැවැත්ම කරුණු කොට '' යම් මහණෙක් තොපගේ වෙහෙරෙහි වෙසේ නම් ඒ මහණ රහත් '' යි කියා නම් දන්නහුට ථුල්ලැසි ඇවැත් වෙයි, දිවිපැවැත්ම හේතුකොට දිවිපැවැත්ම කරුණු කොට මහණ පිණී බොජුන් තමා පිණිස විනවා වළඳා නම් පචිති ඇවැත් වෙයි, දිවිපැවැත්ම හේතුකොට දිවිපැවැත්ම කරුණු කොට මෙහෙණ පිණී බොජුන් තමා පිණිස විනවා වළඳා නම් පිළිදෙස්නී ඇවැත් වෙයි, දිවිපැවැත්ම හෙතු කොට දිවිපැවැත්ම කරුණු කොට නො ගිලන් වැ සූපයක් හෝ බතක් හෝ තමා පිණිස විනවා වළඳා නම් දුකුළා ඇවැත් වේ. ආජීවවිපත්තිහේතුවෙන් මේ සඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත්ද . . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත්:

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාර විපත්තිය දැ යි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්ති ස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයා පත්තිස්කන්ධයෙන් ද,

සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා පාටිදෙසනීයාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං ඡහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: සියා කායතො සමුට්ඨහන්ති, න වාචතො න චිත්තතො. සියා වාචතො සමුට්ඨහන්ති, න කායතො න චිත්තතො. සියා කායතො ච වාචතො ච සමුට්ඨහන්ති, න චිත්තතො. සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති න වාචතො, සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න කායතො, සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

**විපත්තිපච්චයවාරෙ නිට්ඨිතො චතුත්ථො.**

---

## 5. අධිකරණ පච්චයවාරො

1. විවාදාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: විවාදාධිකරණපච්චයා ද්වෙ ආපත්තියො ආපජ්ජති: උපසම්පන්නං ඔමසති, ආපත්ති පාචිත්තියස්ස. අනුපසම්පන්නං ඔමසති, ආපත්ති දුක්කටස්ස. විවාදාධිකරණපච්චයා ඉමා ද්වෙ ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං එකං විපත්තිං භජන්ති: ආචාර විපත්තිං, සත්තන්නං ආපත්තික්ඛන්ධානං ද්වීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන, ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

2. අනුවාදාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: අනුවාදාධිකරණපච්චයා තිස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුං අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙති ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙති ආපත්ති පාචිත්තියස්ස. අමූලකාය ආචාරවිපත්තියා අනුද්ධංසෙති ආපත්ති දුක්කටස්ස. අනුවාදාධිකරණපච්චයා ඉමා තිස්සො ආපත්තියො ආපජ්ජති.

කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාටිදෙසනීයපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දූ යි ෂඩාපත්තිස්කන්ධයෙන් සංග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් ෂට්සමුත්ථානයෙන් නගිති : කිසිවිටෙක කයින් නගිති, වචනයෙන් නො නගිති, සිතින් නො නගිත්. කිසිවිටෙක වචනයෙන් නගිති, කයින් නො නගිති, සිතින් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද නගිති, සිතින් නො නගිත්. කිසිවිටෙක කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගිති, කයින් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන්ද යි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

සතරවන විපත්තිපච්චයවාරය නිමි.

---

## 5. අධිකරණ පච්චයවාරය

1. විවාදධිකරණ හේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : විවාදධිකරණ හේතුයෙන් දෙ ඇවැතකට පැමිණෙයි : උපසපනක්හට (ජාත්‍යාදියෙන්) ගටා බෙණේ නම් පචිති ඇවැත් වෙයි, අනුපසපනක්හට ගටා බෙණේ නම් දුකුළා ඇවැත් වේ. විවාධිකරණ හේතුයෙන් මේ දෙඇවැතට පැමිණේ.

ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, . . . සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් ආචාරවිපත්තිසඞ්ඛ්‍යාත එක් විපතක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දූයි දෙ ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් තුන් සමුට්ඨානයෙකින් නගිති : කිසිවිටෙක කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්. කිසිවිටෙක වචනයෙන් ද සිතින් ද නගිති, කයින් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දූයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

අනුවාදධිකරණහේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : අනුවාදධිකරණහේතුයෙන් තුන් ඇවැතකට පැමිණෙයි : මහණක්හට අමූලිකපාරාජිකාපත්තියෙන් චෝදනා කෙරේ නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, අමූලක සඞ්ඝාදිසෙසාපත්තියෙන් චෝදනා කෙරේ නම් පචිති ඇවැත් වෙයි, අමූලක ආචාරවිපත්තියෙන් චොදනා කෙරේ නම් දුකුළා ඇවැත් වේ. අනුවාදධිකරණහේතුයෙන් මේ තුන් ඇවැතට පැමිණේ.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති: -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං. සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං තීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං තීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති: සියා කායතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න වාචතො. සියා වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති, න කායතො. සියා කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

3. ආපත්තාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: ආපත්තාධිකරණපච්චයා චතස්සො ආපත්තියො ආපජ්ජති: භික්ඛුනී ජානං පාරාජිකං ධම්මං පටිච්ඡාදෙති, ආපත්ති පාරාජිකස්ස. වෙමතිකා පටිච්ඡාදෙති, ආපත්ති ථුල්ලච්චයස්ස. භික්ඛු සඞ්ඝාදිසෙසං පටිච්ඡාදෙති ආපත්ති පාචිත්තියස්ස. ආචාරවිපත්තිං පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස. ආපත්තාධිකරණපච්චයා ඉමා චතස්සො ආපත්තියො ආපජ්ජති.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං, සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං චතූහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන. සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

4. කිච්චාධිකරණපච්චයා කති ආපත්තියො ආපජ්ජති: කිච්චාධිකරණපච්චයා පඤ්ච ආපත්තියො ආපජ්ජති: උක්ඛිත්තානුවත්තිකා භික්ඛුනී යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජති, ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි ථුල්ලච්චයා, කම්මවාචාපරියොසානෙ ආපත්ති පාරාජිකස්ස. භෙදකානුවත්තකා භික්ඛූ යාවතතියං සමනුභාසනාය නප්පටිනිස්සජ්ජන්ති. ආපත්ති සඞ්ඝාදිසෙසස්ස. පාපිකාය දිට්ඨියා යාවතතියං සමනුභාසනාය න පටිනිස්සජ්ජති, ආපත්ති පාචිත්තියස්ස. කිච්චාධිකරණපච්චයා ඉමා පඤ්ච ආපත්තියො ආපජ්ජති.

ඒ ඇවැත්හු සිවු වැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද,... සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දූයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක සඞඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දූයි තුන් ආපත්තිස්කන්ධයෙන් සඞග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් තුන් සමුට්ඨාන යෙකින් නගිති : කිසිවිටෙක කයින් ද සිතින් ද නගිති, වචනයෙන් නො නගිත්. කිසි විටෙක වචනයෙන් ද සිතින් ද නගිති, කයින් නො නගිත්. කිසිවිටෙක කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණ යෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දූයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

3. ආපත්තාධිකරණහේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : ආපත්තාධි කරණ හේතුයෙන් සිවු ඇවැතකට පැමිණෙයි : මෙහෙණ දූන දූන පරිජි ඇවැත සඟවා නම් පරිජි ඇවැත් වෙයි, විමති ඇති වැ සඟවා නම් ථුලැසි ඇවැත් වෙයි, මහණ සඟවෙසෙසක් සඟවා නම් පචිති ඇවැත් වෙයි, ආචාර විපත්තිය සඟවා නම් දුකුළා ඇවැත් වේ. අපත්තාධිකරණහේතුයෙන් මේ සිවු ඇවැතට පැමිණේ.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද,... සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දූයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දූයි චතුරාපත්තිස්කන්ධයෙන් සඞග්‍රහකරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති: කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්, සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවින යෙන් ද තිණවත්ථාරකයෙන් දූයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

4. කිච්චාධිකරණහේතුයෙන් කෙතෙක් ඇවැතට පැමිණේ ද යත් : කිච්චාධි කරණහේතුයෙන් පස් ඇවැතකට පැමිණෙයි : උබෙවුනීකම් කරණු ලැබූවනට අනු වැ වැටෙන මෙහෙණ තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (එය) නො හරී නම් ඤත්තියෙන් දුකුළා වෙයි, දෙකම්වදනින් ථුලැසීහු වෙති, කම්වදන් අවසන්හි පරිජි ඇවැත් වෙයි, සඞඝභෙදකයා අනු වැ වැටෙන භික්ෂූහු තුන් යළතෙක් සමනුභාසන කම් කරණ කල්හි (එය) නො හරිත් නම් සඟවෙසෙස් ඇවැත් වෙයි, ලාමක දෘෂ්ටිය ඇතිකල්හි තුන් යළ තෙක් සමනුභාසනකම් කරණ කල්හි (එය) නො හරිත් නම් පචිති ඇවැත් වේ. කිච්චාධිකරණ හෙතුයෙන් මේ පස් ඇවැතට පැමිණේ.

තා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති. -පෙ- සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති

තා ආපත්තියො චතුන්නං විපත්තීනං ද්වෙ විපත්තියො භජන්ති: සියා සීලවිපත්තිං. සියා ආචාරවිපත්තිං. සත්තන්නං ආපත්තික්ඛන්ධානං පඤ්චහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා: සියා පාරාජිකාපත්තික්ඛන්ධෙන. සියා සඞ්ඝාදිසෙසාපත්තික්ඛන්ධෙන. සියා ථුල්ලච්චයාපත්තික්ඛන්ධෙන, සියා පාචිත්තියාපත්තික්ඛන්ධෙන. සියා දුක්කටාපත්තික්ඛන්ධෙන. ඡන්නං ආපත්තිසමුට්ඨානානං එකෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති: කායතො ච වාචතො ච චිත්තතො ච සමුට්ඨහන්ති. චතුන්නං අධිකරණානං ආපත්තාධිකරණං. සත්තන්නං සමථානං තීහි සමථෙහි සම්මන්ති: සියා සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච. සියා සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

ඨපෙත්වා සත්ත ආපත්තියො සත්තාපත්තික්ඛන්ධෙ අවසෙසා ආපත්තියො චතුන්නං විපත්තීනං කති විපත්තියො භජන්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං කතීහි ආපත්තික්ඛන්ධෙහි සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං කතීහි සමුට්ඨානෙහි සමුට්ඨහන්ති, චතුන්නං අධිකරණානං කතමං අධිකරණං, සත්තන්නං සමථානං කතීහි සමථෙහි සම්මන්ති.

ඨපෙත්වා සත්ත ආපත්තියො සත්තාපත්තික්ඛන්ධෙ අවසෙසා ආපත්තියො චතුන්නං විපත්තීනං න කතමං විපත්තිං භජන්ති, සත්තන්නං ආපත්තික්ඛන්ධානං න කතමෙන ආපත්තික්ඛන්ධෙන සඞ්ගහිතා, ඡන්නං ආපත්තිසමුට්ඨානානං න කතමෙන සමුට්ඨානෙන සමුට්ඨහන්ති, චතුන්නං අධිකරණානං න කතමං අධිකරණං, සත්තන්නං සමථානං න කතමෙන සමථෙන සම්මන්ති. තං කිස්ස හෙතු: ඨපෙත්වා සත්තාපත්තික්ඛන්ධෙ නත්ථඤ්ඤාපත්තියොති.

අධිකරණපච්චයවාරො නිට්ඨිතො පඤ්චමො.

---

## අනන්තරපෙය්‍යාලො[1] නිට්ඨිතො

---

තස්සුද්දානං:

කති පුච්ඡා, සමුට්ඨානා - කතාපත්ති තථෙව ච,
සමුට්ඨානා විපත්ති ච - තථාධිකරණෙන චාති.

---

1. අනන්තරපෙය්‍යාලං - සීමු.

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, . . . සවැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

ඒ ඇවැත්හු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසිවිටෙක ශීලවිපත්තිය ද කිසිවිටෙක ආචාරවිපත්තිය දැයි විපත් දෙකක් බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසිවිටෙක පාරාජිකාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක සඞ්ඝාදිසෙසාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක ථුල්ලච්චයාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක පාචිත්තියාපත්තිස්කන්ධයෙන් ද කිසිවිටෙක දුක්කටාපත්තිස්කන්ධයෙන් දැයි පඤ්චාපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් එක් සමුට්ඨානයෙකින් නගිති : කයින් ද වචනයෙන් ද සිතින් ද නගිත්. සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් ආපත්තාධිකරණ යි. සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද, කිසිවිටෙක සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳෙත්.

සප්තාපත්තීන් ද සප්තාපත්තිස්කන්ධයන් ද තබා සෙසු ආපත්තීහු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කෙතෙක් විපත් බෙජෙත් ද, සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කෙතෙක් ආපත්තිස්කන්ධයෙන් සඞ්ග්‍රහ කරණ ලදහු ද, සවැදෑරුම් ආපත්ති සමුට්ඨානයන් අතුරෙන් කෙතෙක් සමුට්ඨානයෙන් නගිත් ද, සිවුවැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිනම් අධිකරණයෙක් ද, සත්වැදෑරුම් ශමථයන් අතුරෙන් කෙතෙක් ශමථයෙන් සන්හිඳෙත් ද යත් :

සප්තාපත්තීන් ද සප්තාපත්තිස්කන්ධයන් ද තබා සෙසු ආපත්තීහු සිවුවැදෑරුම් විපත් අතුරෙන් කිසි විපතක් නො බෙජෙත්. සත්වැදෑරුම් ආපත්තිස්කන්ධයන් අතුරෙන් කිසි ආපත්තිස්කන්ධයෙකින් සඞ්ග්‍රහ නො කරණලදහු යැ. සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයන් අතුරෙන් කිසි සමුට්ඨානයෙකින් නො නගිත්. සිවු වැදෑරුම් අධිකරණයන් අතුරෙන් කිසි අධිකරණයෙක් නො වෙයි. සත් වැදෑරුම් ශමථයන් අතුරෙන් කිසි ශමථයෙකින් නො සන්හිඳෙත්. කවර හෙයිනැ යත් : සප්තාපත්තීන් ද සප්තාපත්තිස්කන්ධයන් ද තබා අන් ඇවැත් නැති බැවිනි.

**පස්වන අධිකරණ පච්චයවාරය නිමි.**

---

**අන්තර පෙය්‍යාලය නිමි.**

---

**එහි නාමාවලිය**

කතිපුච්ඡා යැ, ආපත්තිසමුට්ඨාන යැ, කතාපත්ති යැ, එසේ මැ සමුට්ඨානගාථා යැ එසේ මැ අධිකරණ ය ද සමග විපත්තිවාර යැයි.

# සමථභෙදෙ

## 6. පරියායවාරො

1. විවාදාධිකරණස්ස කිං පුබ්බඞ්ගමං, කති ඨානානි, කති වත්ථූනි, කති භූමියො, කති හෙතූ, කති මූලානි, කතිහාකාරෙහි විවදති, විවාදාධිකරණං කතිහි සමථෙහි සම්මති.

2. අනුවාදාධිකරණස්ස කිං පුබ්බඞ්ගමං, කති ඨානානි, කති වත්ථූනි, කති භූමියො, කති හෙතූ, කති මූලානි, කතිහාකාරෙහි අනුවදති, අනුවාදාධිකරණං කතිහි සමථෙහි සම්මති.

3. ආපත්තාධිකරණස්ස කිං පුබ්බඞ්ගමං කති ඨානානි, කති වත්ථූනි, කති භූමියො, කති හෙතූ, කති මූලානි, කතිහාකාරෙහි ආපත්තිං ආපජ්ජති, ආපත්තාධිකරණං කතිහි සමථෙහි සම්මති.

4. කිච්චාධිකරණස්ස කිං පුබ්බඞ්ගමං, කති ඨානානි, කති වත්ථූනි, කති භූමියො, කති හෙතූ, කති මූලානි, කතිහාකාරෙහි කිච්චං ජායති, කිච්චාධිකරණං කතිහි සමථෙහි සම්මති :

1. විවාදාධිකරණස්ස කිං පුබ්බඞ්ගමන්ති : ලොභො පුබ්බඞ්ගමො, දොසො පුබ්බඞ්ගමො, මොහො පුබ්බඞ්ගමො. අලොභො පුබ්බඞ්ගමො, අදොසො පුබ්බඞ්ගමො. අමොහො පුබ්බඞ්ගමො. කති ඨානානීති : අට්ඨාරස භෙදකරවත්ථූනි ඨානානි. කති වත්ථූනීති : අට්ඨාරස භෙදකර වත්ථූනි වත්ථූනි. කති භූමියොති : අට්ඨාරස භෙදකරවත්ථූනි භූමියො. කති හෙතූති : නව හෙතූ : තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ. කති මූලානීති : ද්වාදස මූලානි. කතිහාකාරෙහි විවදතීති : ද්වීහාකාරෙහි විවදති : ධම්මදිට්ඨි වා, අධම්මදිට්ඨි වා. විවාදාධිකරණං කතිහි සමථෙහි සම්මතීති; විවාදාධිකරණං ද්වීහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච.

2. අනුවාදාධිකරණස්ස කිං පුබ්බඞ්ගමන්ති : ලොභො පුබ්බඞ්ගමො දොසො පුබ්බඞ්ගමො. මොහො පුබ්බඞ්ගමො. අලොභො පුබ්බඞ්ගමො අදොසො පුබ්බඞ්ගමො. අමොහො පුබ්බඞ්ගමො. කති ඨානානීති : චතස්සො විපත්තියො ඨානානි, කති වත්ථූනීති : චතස්සො විපත්තියො වත්ථූනි. කති භූමියොති : චතස්සො විපත්තියො භූමියො, කති හෙතූති : නව හෙතූ : තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකත හෙතූ. කති මූලානීති : චුද්දස මූලානි. කතිහාකාරෙහි අනුවදතීති : ද්වීහාකාරෙහි අනුවදති : වත්ථුතො වා ආපත්තිතො වා. අනුවාදාධිකරණං කතිහි සමථෙහි සම්මතීති : අනුවාදාධිකරණං චතූහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච අමූළ්හවිනයෙන ච තස්සපාපිය්‍යසිකාය ච.



Free Distribution www.aathaapi.org

# ශමථ භේදය

## 6. පරියායවාරය

1. විවාදධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද, ස්ථානයෝ කෙතෙක් ද, වස්තුහු කෙතෙක් ද, භූමීහු කෙතෙක් ද, හෙතුහු කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද, කෙතෙක් අයුරින් විවාද කෙරෙත් ද, විවාදධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද ?

2. අනුවාදධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද, ස්ථානයෝ කෙතෙක් ද, වස්තුහු කෙතෙක් ද, භූමීහු කෙතෙක් ද, හෙතුහු කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද, කෙතෙක් අයුරින් චෝදනා කෙරේ ද, අනුවාදධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද ?

3. ආපත්තාධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද, ස්ථානයෝ කෙතෙක් ද, වස්තුහු කෙතෙක් ද, භූමීහු කෙතෙක් ද, හෙතුහු කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද, කෙතෙක් අයුරින් ඇවැතට පැමිණේ ද, ආපත්තාධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද ?

4. කිච්චාධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද, ස්ථානයෝ කෙතෙක් ද, වස්තුහු කෙතෙක් ද, භූමීහු කෙතෙක් ද, හෙතුහු කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද, කෙතෙක් අයුරින් කෘත්‍යය හටගණී ද, කිච්චාධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද ?

1. විවාදධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද යත් : ලෝභය පූර්වඞ්ගම වෙයි, ද්වේෂය පූර්වඞ්ගම වෙයි, මෝහය පූර්වඞ්ගම වෙයි, අලෝභය පූර්වඞ්ගම වෙයි, අද්වේෂය පූර්වඞ්ගම වෙයි, අමොහය පූර්වඞ්ගම වේ. ස්ථානයෝ කෙතෙක යත් : අටළොස් භේදකර වස්තුහු ස්ථාන වෙත්. වස්තුහු කෙතෙක යත් : අටළොස් භේදකරවස්තුහු වස්තු වෙත්. භූමීහු කෙතෙක යත් : අටළොස් භෙදකරවස්තුහු භූමි වෙත්. හේතුහු කෙතෙක යත් : හේතුහු නව දෙනෙකැ : කුශලහෙතු තිදෙන යැ, අකුශලහෙතු තිදෙන යැ, අව්‍යාකෘත හේතු තිදෙන යි. මූලයෝ කෙතෙක යත් : මූලයෝ දෙළොසෙකි. කෙතෙක් අයුරින් විවාද කෙරේද යත් : දෙ අයුරෙකින් විවාද කෙරෙයි : ධර්මදෘෂ්ටියෙන් හෝ අධර්මදෘෂ්ටියෙන් හෝ යි. විවාදධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : සම්මුඛාවිනයෙන් ද යෙභුය්‍යසිකායෙන් දූයි දෙශමථයෙන් විවාදධිකරණය සන්හිඳේ.

2. අනුවාදධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද යත් : ලෝභය පූර්වඞ්ගම වෙයි, ද්වේෂය පූර්වඞ්ගම වෙයි, මොහය පූර්වඞ්ගම වෙයි, අලෝභය පූර්වඞ්ගම වෙයි, අද්වේෂය පූර්වඞ්ගම වෙයි, අමොහය පූර්වඞ්ගම වේ. ස්ථානයෝ කෙතෙක යත් : (ශීල—ආචාර—දෘෂ්ටි—ආජීව යන) සිවුවැදෑරුම් විපත්තීහු ස්ථාන වෙත්. වස්තුහු කෙතෙක යත් : සිවුවැදෑරුම් විපත්තීහු වස්තු වෙත්. භූමීහු කෙතෙක යත් : සිවු වැදෑරුම් විපත්තීහු භූමි වෙත්. හේතුහු කෙතෙක යත් : හෙතුහු නවදෙනෙකැ : කුශල හෙතු තිදෙන යැ අකුශලහේතු තිදෙන යැ අව්‍යාකෘතහේතු තිදෙනැයි. මූලයෝ කෙතෙක යත් : මූලයෝ තුදුසෙකි. කෙතෙක් අයුරෙකින් චෝදනා කෙරේ ද යත් : දෙ අයුරෙකින් චෝදනා කෙරෙයි : වස්තු වශයෙන් හෝ ආපත්ති වශයෙන් හෝ යි. අනුවාදධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : සම්මුඛා විනයෙන් ද සතිවිනයෙන් ද අමූළ්හ විනයෙන් ද තස්සපාපියසිකායෙන් දූයි සිවු ශමථයෙන් අනුවාදධිකරණය සන්හිඳේ.



Free Distribution www.aathaapi.org

3. ආපත්තාධිකරණස්ස කිං පුබ්බඞ්ගමන්ති: ලොභො පුබ්බඞ්ගමො. දොසො පුබ්බඞ්ගමො. මොහො පුබ්බඞ්ගමො. අලොභො පුබ්බඞ්ගමො, අදොසො පුබ්බඞ්ගමො. අමොහො පුබ්බඞ්ගමො. කති ඨානානීති: සත්තාපත්තික්ඛන්ධා ඨානානි. කති වත්ථූනීති: සත්තාපත්තික්ඛන්ධා වත්ථූනි. කති භූමියොති: සත්තාපත්තික්ඛන්ධා භූමියො. කති හෙතූති: නව හෙතූ[1] තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ. කති මූලානීති: ඡ ආපත්තිසමුට්ඨානානි මූලානි. කතිහාකාරෙහි ආපත්තිං ආපජ්ජතීති: ඡහාකාරෙහි ආපත්තිං ආපජ්ජති: අලජ්ජිතා, අඤ්ඤාණතා, කුක්කුච්චාපකතතා, අකප්පියෙ කප්පියසඤ්ඤිතා, කප්පියෙ අකප්පියසඤ්ඤිතා, සති සම්මොසා. ආපත්තාධිකරණං කතීහි සමථෙහි සම්මතීති: ආපත්තාධිකරණං තීහි සමථෙහි සම්මති: සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච, සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච.

4. කිච්චාධිකරණස්ස කිං පුබ්බඞ්ගමන්ති: ලොභො පුබ්බඞ්ගමො, දොසො පුබ්බඞ්ගමො, මොහො පුබ්බඞ්ගමො, අලොභො පුබ්බඞ්ගමො, අදොසො පුබ්බඞ්ගමො, අමොහො පුබ්බඞ්ගමො. කති ඨානානීති: චත්තාරි කම්මානි ඨානානි. කති වත්ථූනීති: චත්තාරි කම්මානි වත්ථූනි. කති භූමියොති: චත්තාරි කම්මානි භූමියො. කති හෙතූති: නව හෙතූ තයො කුසලහෙතූ, තයො අකුසලහෙතූ, තයො අබ්‍යාකතහෙතූ. කති මූලානීති: එකං මූලං සඞ්ඝො. කතීහාකාරෙහි කිච්චං ජායතීති: ද්වීහාකාරෙහි කිච්චං ජායති: ඤත්තිතො වා, අපලොකනතො වා. කිච්චාධිකරණං කතීහි සමථෙහි සම්මතීති: කිච්චාධිකරණං එකෙන සමථෙන සම්මති: සම්මුඛාවිනයෙන.

**කති සමථා: සත්ත සමථා:** සම්මුඛාවිනයො, සතිවිනයො, අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා, තිණවත්ථාරකො.

ඉමෙ සත්ත සමථා. සියා ඉමෙ සත්ත සමථා දස සමථා හොන්ති. දස සමථා සත්ත සමථා හොන්ති. වත්ථුවසෙන පරියායෙන සියාති.

කථඤ්ච සියා: විවාදාධිකරණස්ස ද්වෙ සමථා. අනුවාදාධිකරණස්ස චත්තාරො සමථා, ආපත්තාධිකරණස්ස තයො සමථා, කිච්චාධිකරණස්ස එකො සමථො. එවං ඉමෙ සත්ත සමථා දසසමථා හොන්ති. දස සමථා සත්ත සමථා හොන්ති වත්ථුවසෙන පරියායෙන.

**පරියායවාරො නිට්ඨිතො ඡට්ඨො.**

---

1. කතිහෙතූති ඡහෙතූ - ම.ඡ.සං.

Free Distribution www.aathaapi.org

3. ආපත්තාධිකරණයට කුමක් පූර්වඞ්ගම වේද යත් : ලෝභය පූර්වඞ්ගම වෙයි ද්වේෂය පූර්වඞ්ගම වෙයි, මෝහය පූර්වඞ්ගම වෙයි, අලෝභය පූර්වඞ්ගම වෙයි, අද්වේෂය පූර්වඞ්ගම වෙයි, අමෝහය පූර්වඞ්ගම වේ. ස්ථානයෝ කෙතෙක යත් : සප්තආපත්ති ස්කන්ධයෝ ස්ථාන වෙති, වස්තූහු කෙතෙක යත් : සප්තආපත්තිස්කන්ධයෝ වස්තු වෙති. භූමීහු කෙතෙක යත් : සප්තආපත්තිස්කන්ධයෝ භූමී වෙති. හෙතූහු කෙතෙක යත් : හෙතූහු නවදෙනෙකැ : කුශල හෙතු තිදෙන යැ අකුශලහෙතු තිදෙන ය අව්‍යාකෘතහෙතු තිදෙන යි. මූලයෝ කෙතෙක යත් : සවැදෑරුම් ආපත්තිසමුට්ඨානයෝ මූල වෙති. කෙතෙක් අයුරෙකින් ඇවැතට පැමිණේ ද යත් : අලජ්ජීබව යැ නො දැනීම්බව යැ කුකුස් පියවි කොට ඇතිබව යැ නො කැපයෙහි කැපැයි හැඟීම් ඇතිබව යැ කැපයෙහි නො කැපැයි හැඟීම් ඇතිබව යැ සිහිමුළාබවැයි ස අයුරකින් ඇවැතට පැමිණේ. ආපත්තාධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද සම්මුඛා විනයෙන් ද තිණවත්ථාරකයෙන් දැයි තුන් ශමථයෙන් සන්හිඳේ.

4. කිච්චාධිකරණයට කුමක් පූර්වඞ්ගම වේ ද යත් : ලොභය පූර්වඞ්ගම වෙයි, ද්වේෂය පූර්වඞ්ගම වෙයි, මොහය පූර්වඞ්ගම වෙයි, අලොභය පූර්වඞ්ගම වෙයි, අද්වේෂය පූර්වඞ්ගම වෙයි, අමොහය පූර්වඞ්ගම වේ. ස්ථානයෝ කෙතෙක යත් : සිවුවැදෑරුම් කර්මයෝ ස්ථාන වෙති. වස්තූහු කෙතෙක යත් : සිවුවැදෑරුම් කර්මයෝ වස්තු වෙති. භූමීහු කෙතෙක යත් : සිවුවැදෑරුම් කර්මයෝ භූමී වෙති. හෙතූහු කෙතෙක යත් : හෙතූහු නවදෙනෙකැ : කුශල හේතු තිදෙන යැ අකුශල හේතු තිදෙන යැ අව්‍යාකෘතහෙතු තිදෙන යි. මූලයෝ කෙතෙක යත් : එක් මූලෙකැ : සඞ්ඝ තෙමේ යැ, කෙතෙක් අයුරෙකින් කෘත්‍යය හටගණී ද යත් : දෙ අයුරෙකින් කෘත්‍යය හටගණියි : ඤත්තියෙන් හෝ අපලොකනයෙන් හෝ යි. කිච්චාධිකරණය කෙතෙක් ශමථයෙන් සන්හිඳේ ද යත් : සම්මුඛාවිනය නම් එක් ශමථයෙන් කිච්චාධිකරණය සන්හිඳේ.

ශමථයෝ කෙතෙක යත් : ශමථයෝ සත් දෙනෙකි. සම්මුඛාවිනය යැ සති විනය යැ අමූළ්හවිනය යැ පටිඤ්ඤාතකරණ යැ යෙභුය්‍යසිකා යැ තස්සපාපිය්‍යසිකා යැ තිණවත්ථාරක යැ. මොහු සප්ත ශමථයෝ යි.

කිසිවිටෙක මේ සප්ත ශමථයෝ දශ ශමථයෝ වෙති. කිසිවිටෙක වස්තු වශයෙන් ද පර්‍ය්‍යාය වශයෙන් ද දශ ශමථයෝ සප්ත ශමථයෝ වෙත්.

කෙසේ වන්නේ ද යත් : විවාදධිකරණය පිළිබඳ ශමථයෝ දෙදෙනෙකැ, අනුවාදධිකරණය පිළිබඳ ශමථයෝ සිවුදෙනෙකැ, ආපත්තාධිකරණය පිළිබඳ ශමථයෝ තිදෙනෙකැ, කිච්චාධිකරණය පිළිබඳ එක් ශමථයෙකි. මෙසේ මේ සප්ත ශමථයෝ වස්තු වශයෙන් හා පර්‍ය්‍යාය වශයෙන් දශ ශමථයෝ වෙති, දශ ශමථයෝ සප්ත ශමථයෝ වෙත්.

සචන අධිකරණ පරියාය වාරය නිමි.

## 7. සාධාරණවාරෝ

කති සමථා විවාදාධිකරණස්ස සාධාරණා, කති සමථා විවාදාධිකරණස්ස අසාධාරණා. කති සමථා අනුවාදාධිකරණස්ස සාධාරණා, කති සමථා අනුවාදාධිකරණස්ස අසාධාරණා. කති සමථා අපත්තාධිකරණස්ස සාධාරණා, කති සමථා ආපත්තාධිකරණස්ස අසාධාරණා. කති සමථා කිච්චාධිකරණස්ස සාධාරණා, කති සමථා කිච්චාධිකරණස්ස අසාධාරණා.

1. ද්වෙ සමථා විවාදාධිකරණස්ස සාධාරණා : සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා. පඤ්ච සමථා විවාදාධිකරණස්ස අසාධාරණා : සතිවිනයො අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකො.

2. චත්තාරො සමථා අනුවාදාධිකරණස්ස සාධාරණා : සම්මුඛාවිනයො, සතිවිනයො, අමූළ්හවිනයො, තස්සපාපිය්‍යසිකා. තයො සමථා අනුවාදාධිකරණස්ස අසාධාරණා : යෙභුය්‍යසිකා පටිඤ්ඤාතකරණං, තිණවත්ථාරකො.

3. තයො සමථා ආපත්තාධිකරණස්ස සාධාරණා : සම්මුඛාවිනයො, පටිඤ්ඤාතකරණං, තිණවත්ථාරකො. චත්තාරො සමථා ආපත්තාධිකරණස්ස අසාධාරණා, යෙභුය්‍යසිකා, සතිවිනයො, අමූළ්හවිනයො, තස්සපාපිය්‍යසිකා.

4. එකො සමථො කිච්චාධිකරණස්ස සාධාරණො : සම්මුඛාවිනයො, ඡ සමථා කිච්චාධිකරණස්ස අසාධාරණා : යෙභුය්‍යසිකා, සතිවිනයො, අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකො.

සාධාරණවාරෝ නිට්ඨිතො සත්තමො.

---

## 8. තබ්භාගියවාරෝ

කති සමථා විවාදාධිකරණස්ස තබ්භාගියා, කති සමථා විවාදාධි කරණස්ස අඤ්ඤභාගියා. කති සමථා අනුවාදාධිකරණස්ස තබ්භාගියා, කති සමථා අනුවාදාධිකරණස්ස අඤ්ඤභාගියා. කති සමථා ආපත්තාධිකරණස්ස තබ්භාගියා, කති සමථා ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියා. කති සමථා කිච්චාධිකරණස්ස තබ්භාගියා, කති සමථා කිච්චාධිකරණස්ස අඤ්ඤභාගියා :

1. ද්වෙ සමථා විවාදාධිකරණස්ස තබ්භාගියා : සම්මුඛාවිනයො, යෙභුය්‍යසිකා. පඤ්ච සමථා විවාදාධිකරණස්ස අඤ්ඤභාගියා : සතිවිනයො, අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකො.

2. චත්තාරො සමථා අනුවාදාධිකරණස්ස තබ්භාගියා : සම්මුඛාවිනයො, සතිවිනයො, අමූළ්හවිනයො, තස්සපාපිය්‍යසිකා, තයො සමථා අනුවාදාධිකරණස්ස අඤ්ඤභාගියා : යෙභුය්‍යසිකා, පටිඤ්ඤාතකරණං, තිණවත්ථාරකො

Free Distribution www.aathaapi.org

## 7. සාධාරණවාරය

කෙතෙක් ශමථයෝ විවාදධිකරණයට සාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ විවාදධිකරණයට අසාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ අනුවාදධිකරණයට සාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ අනුවාදධිකරණයට අසාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ ආපත්තාධිකරණයට සාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ ආපත්තාධි කරණයට අසාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ කිච්චාධිකරණයට සාධාරණ වෙත් ද, කෙතෙක් ශමථයෝ කිච්චාධිකරණයට අසාධාරණ වෙත් ද යත් :

1. දෙ ශමථයෝ විවාදධිකරණයට සාධාරණ වෙති : සම්මුඛාවිනය යැ යෙභුය්‍ය සිකා යැ. පස් ශමථයෝ විවාදධිකරණයට අසාධාරණ වෙති : සතිවිනය යැ අමූළ්හ විනය යැ පටිඤ්ඤාතකරණ යැ තස්සපාපියාසිකා යැ තිණවත්ථාරක යි.

2. සිවු ශමථයෝ අනුවාදධිකරණයට සාධාරණ වෙති : සම්මුඛාවිනය යැ සති විනය යැ අමූළ්හවිනය යැ තස්සපාපියාසිකා යි. තුන් ශමථයෝ අනුවාදධිකරණයට අසාධාරණ වෙති : යෙභුය්‍යසිකා යැ පටිඤ්ඤාතකරිණ යැ තිණවත්ථාරක යි.

3. තුන් ශමථයෝ ආපත්තාධිකරණයට සාධාරණ වෙති : සම්මුඛාවිනය යැ පටිඤ්ඤාතකරණ යැ තිණවත්ථාරක යැ. සිවු ශමථයෝ ආපත්තධිකරණයට අසාධාරණ වෙති : යෙභුය්‍යසිකා යැ සතිවිනය යැ අමූළ්හවිනය යැ තස්සපාපියාසිකා යි.

4. එක් ශමථයෙක් කිච්චාධිකරණයට සාධාරණ වෙයි : සම්මුඛාවිනය යි. ෂට සමථයෝ කිච්චාධිකරණයට අසාධාරණ වෙති : යෙභුය්‍යසිකා යැ සතිවිනය යැ අමූළ්හ විනය යැ පටිඤ්ඤාතකරණ යැ තස්සපාපියාසිකා යැ තිණවත්ථාරක යි.

**සත්වන සාධාරණ වාරය නිමි.**

---

## 8. තබ්භාගියවාරය

කෙතෙක් ශමථයෝ විවාදධිකරණයට තද්භාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ විවාදධිකරණයට අන්‍යභාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ අනුවාදධිකරණයට තද්භාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ අනුවාදධිකරණයට අන්‍යභාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ ආපත්තාධිකරණයට තද්භාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ ආපත්තාධිකරණයට අන්‍යභාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ කිච්චාධිකරණයට තද්භාගීය වෙත් ද, කෙතෙක් ශමථයෝ කිච්චාධිකරණයට අන්‍යභාගීය වෙත් ද යත් :

1. දෙ ශමථයෝ විවාදධිකරණයට තද්භාගීය වෙති : සම්මුඛාවිනය යැ, යෙභුය්‍යසිකා යි. පස් ශමථයෝ විවාදධිකරණයට අන්‍යභාගීය වෙති : සතිවිනය යැ අමූළ්හවිනය යැ පටිඤ්ඤාතකරණ යැ තස්සපාපියාසිකා යැ තිණවත්ථාරක යි.

2. සිවු ශමථයෝ අනුවාදධිකරණයට තද්භාගීය වෙති. සම්මුඛාවිනය යැ සතිවිනය යැ අමූළ්හවිනය යැ තස්සපාපියාසිකා යි. තුන් ශමථයෝ අනුවාදධිකරණයට අන්‍යභාගීය වෙති : යෙභුය්‍යසිකා යැ පටිඤ්ඤාතකරණ යැ තිණවත්ථාරක යි.

3. තයො සමථා අපත්තාධිකරණස්ස තබ්භාගියා : සම්මුඛාවිනයො, පටිඤ්ඤාතකරණං, තිණවත්ථාරකො. චත්තාරො සමථා ආපත්තාධිකරණස්ස අඤ්ඤභාගියා : යෙභුය්‍යසිකා, සතිවිනයො, අමූළ්හවිනයො තස්සපාපිය්‍යසිකා.

4. එකො සමථො කිච්චාධිකරණස්ස තබ්භාගියො : සම්මුඛාවිනයො. ඡ සමථා කිච්චාධිකරණස්ස අඤ්ඤභාගියා : යෙභුය්‍යසිකා සතිවිනයො, අමූළ්හවිනයො, පටිඤ්ඤාතකරණං, තස්සපාපිය්‍යසිකා, තිණවත්ථාරකො.

තබ්භාගියවාරො නිට්ඨිතො අට්ඨමො.

## 9. සමථා සමථස්ස සාධාරණවාරො

සමථා සමථස්ස සාධාරණා, සමථා සමථස්ස අසාධාරණා, සියා සමථා සමථස්ස සාධාරණා, සියා සමථා සමථස්ස අසාධාරණා.

කථං සියා සමථා සමථස්ස සාධාරණා, කථං සියා සමථා සමථස්ස අසාධාරණා :

1. යෙභුය්‍යසිකා සම්මුඛාවිනයස්ස සාධාරණා, සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස අසාධාරණා.

2. සතිවිනයො සම්මුඛාවිනයස්ස සාධාරණො, අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය අසාධාරණො.

3. අමූළ්හවිනයො සම්මුඛාවිනයස්ස සාධාරණො, පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අසාධාරණො.

4. පටිඤ්ඤාතකරණං සම්මුඛාවිනයස්ස සාධාරණං තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස අසාධාරණං.

5. තස්සපාපිය්‍යසිකා සම්මුඛාවිනයස්ස සාධාරණා, තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස අසාධාරණා.

6. තිණවත්ථාරකො සම්මුඛාවිනයස්ස සාධාරණො, යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය අසාධාරණො; එවං සියා සමථා සමථස්ස සාධාරණා එවං සියා සමථා සමථස්ස අසාධාරණා.

සමථා සමථස්ස සාධාරණවාරො නිට්ඨිතො නවමො.

3. තුන් ශමථයෝ ආපත්තාධිකරණයට තද්භාගීය වෙති : සම්මුඛාවිනය යැ පටිඤ්ඤාතකරණ යැ තිණවත්ථාරක යි. සිවු ශමථයෝ ආපත්තාධිකරණයට අන්‍යභාගීය වෙති : යෙභුය්‍යසිකා යැ සතිවිනය යැ අමූළ්හවිනය යැ තස්සපාපිය්‍යසිකා යි.

4. එක් ශමථයෙක් කිච්චාධිකරණයට තද්භාගීය වෙයි : සම්මුඛාවිනය යි. ෂට් ශමථයෝ කිච්චාධිකරණයට අන්‍යභාගීය වෙති : යෙභුය්‍යසිකා යැ සතිවිනය යැ අමූළ්හවිනය යැ පටිඤ්ඤාතකරණ යැ තස්සපාපිය්‍යසිකා යැ තිණවත්ථාරක යි.

අටවන තබ්භාගියවාරය නිමි.

---

## 9. සමථ සමථයට සාධාරණවාරය

ශමථයෝ ශමථයට සාධාරණයහ, ශමථයෝ ශමථයට අසාධාරණයහ. කිසිවිටෙක ශමථයෝ ශමථයට සාධාරණ වෙති, කිසිවිටෙක ශමථයෝ ශමථයට අසාධාරණ වෙත්.

කිසිවිටෙක ශමථයෝ ශමථයට කෙසේ සාධාරණ වෙත් ද, කිසිවිටෙක ශමථයෝ ශමථයට කෙසේ අසාධාරණ වෙත් ද යත් :

1. යෙභුය්‍යසිකාව සම්මුඛාවිනයට සාධාරණ වෙයි, සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපිය්‍ය සිකාවට තිණවත්ථාරකයට අසාධාරණ වේ.

2. සතිවිනය සම්මුඛාවිනයට සාධාරණ වෙයි, අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපිය්‍යසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට අසාධාරණ වේ.

3. අමූළ්හවිනය සම්මුඛාවිනයට සාධාරණ වෙයි, පටිඤ්ඤාතකරණයට තස්සපාපිය්‍යසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අසාධාරණ වේ.

4. පටිඤ්ඤාතකරණය සම්මුඛාවිනයට සාධාරණ වෙයි, තස්සපාපිය්‍යසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට අසාධාරණ වේ.

5. තස්සපාපිය්‍යසිකාව සම්මුඛාවිනයට සාධාරණ වෙයි, තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට අසාධාරණ වේ.

6. තිණවත්ථාරකය සම්මුඛාවිනයට සාධාරණ වෙයි, යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපිය්‍යසිකාවට අසාධාරණ වේ. මෙසේ කිසිවිටෙක ශමථයෝ ශමථයට සාධාරණ වෙති, මෙසේ කිසිවිටෙක ශමථයෝ ශමථයට අසාධාරණ වෙත්.

නවවන සමථ සමථයට සාධාරණවාරය නිමි.

---

25—ශ8 17881 (7/75)

Free Distribution www.aathaapi.org

## 10. සමථා සමථස්ස තබ්භාගියවාරෝ

සමථා සමථස්ස තබ්භාගියා. සමථා සමථස්ස අඤ්ඤභාගියා සියා සමථා සමථස්ස තබ්භාගියා. සියා සමථා සමථස්ස අඤ්ඤභාගියා.

කථං සියා සමථා සමථස්ස තබ්භාගියා, කථං සියා සමථා සමථස්ස අඤ්ඤභාගියා :

1. යෙභුය්‍යසිකා සම්මුඛාවිනයස්ස තබ්භාගියා, සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස අඤ්ඤභාගියා.

2. සතිවිනයො සම්මුඛාවිනයස්ස තබ්භාගියො. අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය අඤ්ඤභාගියො.

3. අමූළ්හවිනයො සම්මුඛාවිනයස්ස තබ්භාගියො, පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අඤ්ඤභාගියො.

4 පටිඤ්ඤාතකරණං සම්මුඛාවිනයස්ස තබ්භාගියං, තස්සපාපිය්‍යසිකාය තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස අඤ්ඤභාගියං.

5. තස්සපාපිය්‍යසිකා සම්මුඛාවිනයස්ස තබ්භාගියා, තිණවත්ථාරකස්ස යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය අඤ්ඤභාගියා.

6. තිණවත්ථාරකො සම්මුඛාවිනයස්ස තබ්භාගියො, යෙභුය්‍යසිකාය සතිවිනයස්ස අමූළ්හවිනයස්ස පටිඤ්ඤාතකරණස්ස තස්සපාපිය්‍යසිකාය අඤ්ඤභාගියො. එවං සියා සමථා සමථස්ස තබ්භාගියා. එවං සියා සමථා සමථස්ස අඤ්ඤභාගියා.

**සමථා සමථස්ස තබ්භාගියවාරො නිට්ඨිතො දසමො.**

---

## 11. සමථසම්මුඛාවිනයවාරෝ

සමථො සම්මුඛාවිනයො. සම්මුඛාවිනයො සමථො. සමථො යෙභුය්‍යසිකා, යෙභුය්‍යසිකා සමථො. සමථො සතිවිනයො. සතිවිනයො සමථො. සමථො අමූළ්හවිනයො. අමූළ්හවිනයො සමථො. සමථො පටිඤ්ඤාතකරණං පටිඤ්ඤාතකරණං සමථො. සමථො තස්සපාපිය්‍යසිකා, තස්සපාපිය්‍යසිකා සමථො. සමථො තිණවත්ථාරකො, තිණවත්ථාරකො සමථො.

1. යෙභුය්‍යසිකා සතිවිනයො අමූළ්හවිනයො පටිඤ්ඤාතකරණං තස්සපාපිය්‍යසිකා තිණවත්ථාරකො ඉමෙ සමථා සමථා. නො සම්මුඛාවිනයො. සම්මුඛාවිනයො සමථො චෙව සම්මුඛාවිනයො ච.

9. සතිවිනයො අමූළ්හවිතියො පටිඤ්ඤාතකරණං තස්සපාපිය්‍යසිකා තිණවත්ථාරකො සම්මුඛාවිනයො ඉමෙ සමථා සමථා, නො යෙභුය්‍යසිකා. යෙභුය්‍යසිකා සමථො චෙව යෙභුය්‍යසිකා ච.

Free Distribution www.aathaapi.org

## 10. සමථ සමථයට තද්භාගියවාරය

ශමථයෝ ශමථයට තද්භාගීය වෙති, ශමථයෝ ශමථයට අන්‍යභාගීය වෙත්. කිසිවිටෙක ශමථයෝ ශමථයට තද්භාගීය වෙති, කිසිවිටෙක ශමථයෝ ශමථයට අන්‍යභාගීය වෙත්.

කිසිවිටෙක ශමථයෝ ශමථයට කෙසේ තද්භාගීය වෙත් ද, කිසිවිටෙක ශමථයෝ ශමථයට කෙසේ අන්‍යභාගීය වෙත් ද යත්:

1. යෙභුය්‍යසිකාව සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපියාසිකාවට තිණවත්ථාරකයට අන්‍යභාගීය වේ.

2. සතිවිනය සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපියාසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට අන්‍යභාගීය වේ.

3. අමූළ්හවිනය සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, පටිඤ්ඤාතකරණයට තස්සපාපියාසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අන්‍යභාගීය වේ.

4. පටිඤ්ඤාතකරණය සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, තස්සපාපියාසිකාවට තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට අන්‍යභාගීය වේ.

5. තස්සපාපියාසිකාවට සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, තිණවත්ථාරකයට යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට අන්‍යභාගීය වේ.

6. තිණවත්ථාරකය සම්මුඛාවිනයට තද්භාගීය වෙයි, යෙභුය්‍යසිකාවට සතිවිනයට අමූළ්හවිනයට පටිඤ්ඤාතකරණයට තස්සපාපියාසිකාවට අන්‍යභාගීය වේ. මෙසේ කිසිවිටෙක ශමථයෝ ශමථයට තද්භාගීය වෙති, මෙසේ කිසිවිටෙක ශමථයෝ ශමථයට අන්‍යභාගීය වෙත්.

දසවන සමථ සමථයට තද්භාගීයවාරය නිමි.

---

## 11. සමථසම්මුඛාවිනයවාරය

ශමථය සම්මුඛාවිනය වෙයි, සම්මුඛාවිනය ශමථය වෙයි. ශමථය යෙභුය්‍යසිකාව වෙයි, යෙභුය්‍යසිකාව ශමථය වෙයි. ශමථය සතිවිනය වෙයි, සතිවිනය ශමථය වෙයි. ශමථය අමූළ්හවිනය වෙයි, අමූළ්හවිනය ශමථය වෙයි. ශමථය පටිඤ්ඤාතකරණය වෙයි, පටිඤ්ඤාතකරණය ශමථය වෙයි. ශමථය තස්සපාපියාසිකාව වෙයි, තස්සපාපියාසිකාව ශමථය වෙයි. ශමථය තිණවත්ථාරකය වෙයි, තිණවත්ථාරකය ශමථය වේ.

1. යෙභුය්‍යසිකාව සතිවිනය අමූළ්හවිනය පටිඤ්ඤාතකරණය තස්සපාපියාසිකාව තිණවත්ථාරකය යන මේ ශමථයෝ ශමථ වෙති, සම්මුඛාවිනය නො වෙයි. සම්මුඛාවිනය ශමථය ද සම්මුඛාවිනය ද වේ.

2. සතිවිනය අමූළ්හවිනය පටිඤ්ඤාතකරණය තස්සපාපියාසිකාව තිණවත්ථාරකය සම්මුඛාවිනය යන මේ ශමථයෝ ශමථ වෙති, යෙභුය්‍යසිකාව නො වෙයි. යෙභුය්‍යසිකාව ශමථය ද යෙභුය්‍යසිකා ද වේ.

3. අමූළ්හවිනයො පටිඤ්ඤාතකරණං තස්සපාපියසිකා තිණවත්ථාරකො සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා ඉමෙ සමථා සමථා, නො සතිවිනයො. සතිවිනයො සමථො චෙව සතිවිනයො ච.

4. පටිඤ්ඤාතකරණං තස්සපාපියසිකා තිණවත්ථාරකො සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා සතිවිනයො ඉමෙ සමථා සමථා. නො අමූළ්හවිනයො. අමූළ්හවිනයො සමථො චෙව අමූළ්හවිනයො ච.

5. තස්සපාපියසිකා තිණවත්ථාරකො සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා සතිවිනයො අමූළ්හවිනයො ඉමෙ සමථා සමථා, නො පටිඤ්ඤාතකරණං. පටිඤ්ඤාතකරණං සමථො චෙව පටිඤ්ඤාතකරණඤ්ච.

6. තිණවත්ථාරකො සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා සතිවිනයො අමූළ්හවිනයො පටිඤ්ඤාතකරණං ඉමෙ සමථා සමථා, නො තස්සපාපියසිකා. තස්සපාපියසිකා සමථො චෙව තස්සපාපියසිකා ච.

7. සම්මුඛාවිනයො යෙභුය්‍යසිකා සතිවිනයො අමූළ්හවිනයො පටිඤ්ඤාතකරණං තස්සපාපියසිකා ඉමෙ සමථා සමථා, නො තිණවත්ථාරකො. තිණවත්ථාරකො සමථො චෙව තිණවත්ථාරකො ච.

සමථසම්මුඛාවිනයවාරෙ නිට්ඨිතො එකාදසමො.

---

## 12. විනයවාරො

විනයො සම්මුඛාවිනයො. සම්මුඛාවිනයො විනයො. විනයො යෙභුය්‍යසිකා. යෙභුය්‍යසිකා විනයො. විනයො සතිවිනයො, සතිවිනයො විනයො. විනයො අමූළ්හවිනයො, අමූළ්හවිනයො විනයො. විනයො පටිඤ්ඤාතකරණං. පටිඤ්ඤාතකරණං විනයො. විනයො තස්සපාපියසිකා. තස්සපාපියසිකා විනයො. විනයො තිණවත්ථාරකො. තිණවත්ථාරකො විනයො.

1. විනයො සියා සම්මුඛාවිනයො. සියා න සම්මුඛාවිනයො. සම්මුඛාවිනයො විනයො චෙව සම්මුඛාවිනයො ච.

2, විනයො සියා යෙභුය්‍යසිකා. සියා න යෙභුය්‍යසිකා. යෙභුය්‍යසිකා විනයො චෙව යෙභුය්‍යසිකා ච.

3. විනයො සියා සතිවිනයො. සියා න සතිවිනයො. සතිවිනයො විනයො චෙව සතිවිනයො ච.

4. විනයො සියා අමූළ්හවිනයො. සියා න අමූළ්හවිනයො. අමූළ්හවිනයො විනසො චෙව අමූළ්හවිනයො ච.

5. විනයො සියා පටිඤ්ඤාතකරණං. සියා න පටිඤ්ඤාතකරණං, පටිඤ්ඤාතකරණං විනයො චෙව පටිඤ්ඤාතකරණඤ්ච.

3. අමූළ්හවිනය පටිඤ්ඤාතකරණය තස්සපාපියාසිකාව තිණවත්ථාරකය සම්මුඛා විනය යෙභුයාසිකාව යන මේ ශමථයෝ ශමථ වෙති, සතිවිනය නො වෙයි. සතිවිනය ශමථය ද සතිවිනය ද වේ.

4. පටිඤ්ඤාතකරණය තස්සපාපියාසිකාව තිණවත්ථාරකය සම්මුඛාවිනය යෙභුයාසිකාව සතිවිනය යන මේ ශමථයෝ ශමථ වෙති, අමූළ්හවිනය නො වෙයි. අමූළ්හවිනය ශමථය ද අමූළ්හවිනය ද වේ.

5. තස්සපාපියාසිකාව තිණවත්ථාරකය සම්මුඛාවිනය යෙභුයාසිකාව සතිවිනය අමූළ්හවිනය යන මේ ශමථයෝ ශමථ වෙති, පටිඤ්ඤාතකරණය නො වෙයි. පටිඤ්ඤාතකරණය ශමථය ද පටිඤ්ඤාතකරණය ද වේ.

6. තිණවත්ථාරකය සම්මුඛාවිනය යෙභුයාසිකාව සතිවිනය අමූළ්හවිනය පටිඤ්ඤාතකරණය යන මේ ශමථයෝ ශමථ වෙති, තස්සපාපියාසිකාව නො වෙයි. තස්සපාපියාසිකාව ශමථය ද තස්සපාපියාසිකා ද වේ.

7. සම්මුඛාවිනය යෙභුයාසිකාව සතිවිනය අමූළ්හවිනය පටිඤ්ඤාතකරණය තස්ස පාපියාසිකාව යන මේ ශමථයෝ ශමථ වෙති, තිණවත්ථාරකය නො වෙයි. තිණවත්ථාරකය ශමථය ද තිණවත්ථාරකය ද වේ.

එකොළොස්වන සමථ සම්මුඛා විනය වාරය නිමි.

---

## 12. විනයවාරය

විනය සම්මුඛාවිනය වෙයි, සම්මුඛාවිනය විනය වෙයි. විනය යෙභුයාසිකා. වෙයි, යෙභුයාසිකාව විනය වෙයි. විනය සතිවිනය වෙයි, සතිවිනය විනය වෙයි. විනය අමූළ්හවිනය වෙයි, අමූළ්හවිනය විනය වෙයි. විනය පටිඤ්ඤාතකරණය වෙයි, පටිඤ්ඤාතකරණය විනය වෙයි. විනය තස්සපාපියාසිකාව වෙයි, තස්සපාපියාසිකාව විනය වෙයි. විනය තිණවත්ථාරකය වෙයි, තිණවත්ථාරකය විනය වේ.

1. විනය කිසිවිටෙක සම්මුඛාවිනය වෙයි, කිසිවිටෙක සම්මුඛාවිනය නො වෙයි. සම්මුඛාවිනය විනය ද සම්මුඛාවිනය ද වේ.

2. විනය කිසිවිටෙක යෙභුයාසිකාව වෙයි, කිසිවිටෙක යෙභුයාසිකාව නො වෙයි. යෙභුයාසිකාව විනය ද යෙභුයාසිකා ද වේ.

3. විනය කිසිවිටෙක සතිවිනය වෙයි, කිසිවිටෙක සතිවිනය නො වෙයි. සති විනය විනය ද සතිවිනය ද වේ.

4. විනය කිසිවිටෙක අමූළ්හවිනය වෙයි, කිසිවිටෙක අමූළ්හවිනය නො වෙයි අමූළ්හවිනය විනය ද අමූළ්හවිනය ද වේ.

5. විනය කිසිවිටෙක පටිඤ්ඤාතකරණය වෙයි, කිසිවිටෙක පටිඤ්ඤාතකරණය නො වෙයි. පටිඤ්ඤාතකරණය විනය ද පටිඤ්ඤතකරණය ද වේ.

6. විනයො සියා තස්සපාපිය්‍යසිකා සියා න තස්සපාපිය්‍යසිකා. තස්සපාපිය්‍යසිකා විනයො චෙව තස්සපාපිය්‍යසිකා ච.

7. විනයො සියා තිණවත්ථාරකො. සියා න තිණවත්ථාරකො. තිණවත්ථාරකො විනයො චෙව තිණවත්ථාරකො ච

**විනයවාරො නිට්ඨිතො ද්වාදසමො.**

---

## 13. කුසලවාරො

සම්මුඛාවිනයො කුසලො අකුසලො අබ්‍යාකතො. යෙභුය්‍යසිකා කුසලා අකුසලා අබ්‍යාකතා. සතිවිනයො කුසලො අකුසලො අබ්‍යාකතො. අමූළ්හවිනයො කුසලො අකුසලො අබ්‍යාකතො, පටිඤ්ඤාතකරණං කුසලං අකුසලං අබ්‍යාකතං, තස්සපාපිය්‍යසිකා කුසලා අකුසලා අබ්‍යාකතා. තිණවත්ථාරකො කුසලො අකුසලො අබ්‍යාකතො.

1. සම්මුඛාවිනයො සියා කුසලො සියා අබ්‍යාකතො. නත්ථි සම්මුඛා විනයො අකුසලො.

2. යෙභුය්‍යසිකා සියා කුසලා. සියා අකුසලා. සියා අබ්‍යාකතා.

3. සතිවිනයො සියා කුසලො. සියා අකුසලො. සියා අබ්‍යාකතො.

4. අමූළ්හවිනයො සියා කුසලො. සියා අකුසලො. සියා අබ්‍යාකතො.

5. පටිඤ්ඤාතකරණං සියා කුසලං. සියා අකුසලං. සියා අබ්‍යාකතං.

6. තස්සපාපිය්‍යසිකා සියා කුසලා. සියා අකුසලා. සියා අබ්‍යාකතා.

7. තිණවත්ථාරකො සියා කුසලො. සියා අකුසලො. සියා අබ්‍යාකතො.

විවාදාධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං. අනුවාදාධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං. ආපත්තාධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං. කිච්චාධිකරණං කුසලං අකුසලං අබ්‍යාකතං :

1. විවාදාධිකරණං සියා කුසලං. සියා අකුසලං. සියා අබ්‍යාකතං.

2. අනුවාදාධිකරණං සියා කුසලං. සියා අකුසලං. සියා අබ්‍යාකතං.

3. ආපත්තාධිකරණං සියා අකුසලං. සියා අබ්‍යාකතං. නත්ථි ආපත්තාධිකරණං කුසලං.

4. කිච්චාධිකරණං සියා කුසලං. සියා අකුසලං. සියා අබ්‍යාකතං.

**කුසලවාරො නිට්ඨිතො තෙරසමො.**

---

6. විනය කිසිවිටෙක තස්සපාපියාසිකාව වෙයි, කිසිවිටෙක තස්සපාපියාසිකාව නොවෙයි. තස්සපාපියාසිකාව විනය ද තස්සපාපියාසිකා ද වේ.

7. විනය කිසිවිටෙක තිණවත්ථාරකය වෙයි, කිසිවිටෙක තිණවත්ථාරකය නො වෙයි. තිණවත්ථාරකය විනය ද තිණවත්ථාරකය ද වේ.

දොළොස්වන විනයවාරය නිමි.

---

## 13. කුශලවාරය

සම්මුඛාවිනයය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, යෙභුය්‍යසිකාව කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, සතිවිනය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, අමූළ්හවිනය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, පටිඤ්ඤාතකරණය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, තස්සපාපියාසිකාව කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, තිණවත්ථාරකය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද යත් :

1. සම්මුඛාවිනය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වෙයි, අකුශල වූ සම්මුඛාවිනයයෙක් නැති.

2. යෙභුය්‍යසිකාව කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

3. සතිවිනය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

4. අමූළ්හවිනය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

5. පටිඤ්ඤාතකරණය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසි විටෙක අව්‍යාකෘත වේ.

6. තස්සපාපියාසිකාව කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

7. තිණවත්ථාරකය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

විවාදධිකරණය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, අනුවාදධිකරණය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, ආපත්තාධිකරණය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද, කිච්චාධි කරණය කුශල ද අකුශල ද අව්‍යාකෘත ද යත් :

1. විවාදධිකරණය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

2. අනුවාදධිකරණය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසි විටෙක අව්‍යාකෘත වේ.

3. ආපත්තාධිකරණය කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ. කුශල වූ ආපත්තාධිකරණයෙක් නැති.

4. කිච්චාධිකරණය කිසිවිටෙක කුශල වෙයි, කිසිවිටෙක අකුශල වෙයි, කිසිවිටෙක අව්‍යාකෘත වේ.

තෙළෙස්වන කුශලවාරය නිමි.

---

## 14. යත්ථවාරෝ

1. යත්ථ යෙභුය්‍යසිකා ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති.

2. යත්ථ සතිවිනයො ලබ්භති. තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති.

3. යත්ථ අමූළ්හවිනයො ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති.

4. යත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති.

5. යත්ථ තස්සපාපියසිකා ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සති-විනයො ලබ්භති, න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාත-කරණං ලබ්භති.

6. යත්ථ තස්සපාපියසිකා ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හ-විනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්ස-පාපියසිකා ලබ්භති.

7. යත්ථ යෙභුය්‍යසිකා, තත්ථ සම්මුඛාවිනයො. යත්ථ සම්මුඛාවිනයො තත්ථ යෙභුය්‍යසිකා. න තත්ථ සතිවිනයො. න තත්ථ අමූළ්හවිනයො. න තත්ථ පටිඤ්ඤාතකරණං. න තත්ථ තස්සපාපියසිකා. න තත්ථ තිණවත්ථාරකො.

8. යත්ථ සතිවිනයො, තත්ථ සම්මුඛාවිනයො. යත්ථ සම්මුඛාවිනයො තත්ථ සතිවිනයො. න තත්ථ අමූළ්හවිනයො. න තත්ථ පටිඤ්ඤාත-කරණං. න තත්ථ තස්සපාපියසිකා. න තත්ථ තිණවත්ථාරකො. න තත්ථ යෙභුය්‍යසිකා. (සම්මුඛාවිනයං කාතුනමූලං-පෙ-.)

## 14. යත්ථවාරය

1. යම් තැනෙක යෙභුය්‍යසිකාව ලැබේ ද එහි සම්මුඛාවිනය ලැබෙයි යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි යෙභුය්‍යසිකාව ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්ස පාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබේ.

2. යම් තැනෙක සතිවිනය ලැබේ ද එහි සම්මුඛවිනය ලැබෙයි, යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි සතිවිනය ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණ වත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබේ.

3. යම් තැනෙක අමුළ්හවිනය ලැබේ ද එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි අමූළ්හවිනය ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබේ.

4. යම් තැනෙක පටිඤ්ඤාතකරණය ලැබේ ද එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි පටිඤ්ඤාතකරණය ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබේ.

5. යම් තැනෙක තස්සපාපියාසිකාව ලැබේ ද එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි තස්සපාපියාසිකාව ලැබෙයි. එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි,. එහි අමුළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබේ.

6. යම් තැනෙක තිණවත්ථාරකය ලැබේ ද එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක සම්මුඛාවිනය ලැබේ ද එහි තිණවත්ථාරකය ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබේ.

7. යම් තැනෙක යෙභුය්‍යසිකාව වේ ද එහි සම්මුඛාවිනය වෙයි. යම් තැනෙක සම්මුඛාවිනය වේ ද එහි යෙභුය්‍යසිකාව වෙයි, එහි සතිවිනය නොවෙයි, එහි අමූළ්හ විනය නො වෙයි, එහි පටිඤ්ඤාතකරණය නො වෙයි. එහි තස්සපියාසිකාව නොවෙයි, එහි තිණවත්ථාරකය නො වේ.

8. යම් තැනෙක සතිවිනය වේ ද එහි සම්මුඛාවිනය වෙයි. යම් තැනෙක සම්මුඛා විනය වේ ද එහි සතිවිනය වෙයි, එහි අමූළ්හ විනය නො වෙයි, එහි පටිඤ්ඤාතකරණය නො වෙයි, එහි තස්සපාපියාසිකාව නො වෙයි, එහි තිණවත්ථාරකය නො වෙයි, එහි යෙභුය්‍යසිකාව නො වෙයි, (සම්මුඛාවිනය මුල්කොට . . .)

9. යත්ථ තිණවත්ථාරකො, තත්ථ සම්මුඛාවිනයො යත්ථ සම්මුඛාවිනයො, තත්ථ තිණවත්ථාරකො. න තත්ථ යෙභුය්‍යසිකා. න තත්ථ සතිවිනයො. න තත්ථ අමූළ්හවිනයො. න තත්ථ පටිඤ්ඤාතකරණං න තත්ථ තස්සපාපියසිකා.

එකකපෙය්‍යාලං.

යත්ථවාරො නිට්ඨිතො චුද්දසමො.

---

## 15. සමථවාරො

1. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච අධිකරණං වූපසම්මති, යත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. තත්ථ සම්මුඛාවිනයො ලබ්භති, යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති.

2. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ සතිවිනයො ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලම්භති, න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති.

3. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච අමූළ්හවිනයෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ අමූළ්හවිනයො ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති.

4. යස්මිං සමයෙ සම්මුඛවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති.

5. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච තස්සපාපියසිකාය ච අධිකරණං වූපසම්මති, යත්ථ තස්සපාපියසිකා ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛාවිනයො ලබ්භති, තත්ථ තස්සපාපියසිකා ලබ්භති. න තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති.

7. යම් තැනෙක තිණවත්ථාරකය වේ ද එහි සම්මුඛාවිනය වෙයි. යම් තැනෙක සම්මුඛාවිනය වේ ද එහි තිණවත්ථාරකය වෙයි, එහි යෙභුය්‍යසිකාව නො වෙයි. එහි සතිවිනය නො වෙයි, එහි අමූළ්හවිනය නො වෙයි, එහි පටිඤ්ඤාතකරණය නො වෙයි, එහි තස්සපාපියාසිකාව නො වේ.

චක්කපෙය්‍යාල යි

කුසලවත යත්ථවාරය නිමි.

---

## 15. සමථවාරය

1. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද යෙභුය්‍යසිකායෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි යෙභුය්‍යසිකාව ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි යෙභුය්‍යසිකාව ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබේ.

2. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද සතිවිනයෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි සතිවිනය ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි සතිවිනය ලැබෙයි. එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබේ.

3. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද අමූළ්හවිනයෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි අමූළ්හවිනය ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි අමූළ්හවිනය ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබේ.

4. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද පටිඤ්ඤාතකරණයෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි පටිඤ්ඤාතකරණය ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි පටිඤ්ඤාතකරණය ලැබෙයි. එහි තස්සපාපියාසිකාව නො ලැබෙයි, එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබේ.

5. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද තස්සපාපියාසිකාවෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි තස්සපාපියාසිකාව ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි තස්සපාපියාසිකාව ලැබෙයි. එහි තිණවත්ථාරකය නො ලැබෙයි, එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබේ.

6. යස්මිං සමයෙ සම්මුඛාවිනයෙන ච තිණවත්ථාරකෙන ච අධිකරණං වූපසම්මති, යත්ථ තිණවත්ථාරකො ලබ්භති, තත්ථ සම්මුඛාවිනයො ලබ්භති. යත්ථ සම්මුඛා විනයො ලබ්භති, තත්ථ තිණවත්ථාරකො ලබ්භති. න තත්ථ යෙභුය්‍යසිකා ලබ්භති. න තත්ථ සතිවිනයො ලබ්භති. න තත්ථ අමූළ්හවිනයො ලබ්භති. න තත්ථ පටිඤ්ඤාතකරණං ලබ්භති. න තත්ථ තස්සපාපිය්‍යසිකා ලබ්භති.

සමථවාරෙ නිට්ඨිතො පණ්ණරසමො.

---

## 16. සංසට්ඨවාරො

අධිකරණන්ති වා සමථාති වා ඉමෙ ධම්මා සංසට්ඨා උදාහු විසංසට්ඨා, ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුන්ති :-

අධිකරණන්ති වා සමථාති වා ඉමෙ ධම්මා විසංසට්ඨා, නො සංසට්ඨා. ලබ්භා ච පනිමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුන්ති, සො මා හෙවන්තිස්ස වචනීයො. අධිකරණන්ති වා සමථාති වා ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා. න ච ලබ්භා[1] ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. තං කිස්ස හෙතු : නනු වුත්තං භගවතා "චත්තාරිමානි භික්ඛවෙ අධිකරණානි, සත්ත සමථා. අධිකරණා සමථෙහි සම්මන්ති. සමථා අධිකරණෙහි සම්මන්තී"ති. එවං ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා නො ච ලබ්භා ඉමෙසං ධම්මානං විනිබ්භුජිත්වා විනිබ්භුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුන්ති.

සංසට්ඨවාරෙ නිට්ඨිතො සොළසමො.

---

## 17. සම්මතිවාරො

විවාදාධිකරණං කතීහි සමථෙහි සම්මති, අනුවාදාධිකරණං කතීහි සමථෙහි සම්මති, ආපත්තාධිකරණං කතීහි සමථෙහි සම්මති, කිච්චාධිකරණං කතීහි සමථෙහි සම්මති :

1. විවාදාධිකරණං ද්වීහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච යෙභුය්‍යසිකාය ච.

2. අනුවාදාධිකරණං චතූහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච සතිවිනයෙන ච අමූළ්හවිනයෙන ච තස්සපාපිය්‍යසිකාය ච.

3. ආපත්තාධිකරණං තීහි සමථෙහි සම්මති : සම්මුඛාවිනයෙන ච පටිඤ්ඤාතකරණෙන ච තිණවත්ථාරකෙන ච.

4. කිච්චාධිකරණං එකෙන සමථෙන සම්මති : සම්මුඛාවිනයෙන.

---

1. නො ච ලබ්භා - ම.ඡ.සං.

6. යම් කලෙක්හි සම්මුඛාවිනයෙන් ද තිණවත්ථාරකයෙන් ද අධිකරණය සන්හිඳේ නම් යම් තැනෙක්හි තිණවත්ථාරකය ලැබේ නම් එහි සම්මුඛාවිනය ලැබෙයි. යම් තැනෙක්හි සම්මුඛාවිනය ලැබේ නම් එහි තිණවත්ථාරකය ලැබෙයි. එහි යෙභුය්‍යසිකාව නො ලැබෙයි, එහි සතිවිනය නො ලැබෙයි, එහි අමූළ්හවිනය නො ලැබෙයි, එහි පටිඤ්ඤාතකරණය නො ලැබෙයි, එහි තස්සපාපියාසිකාව නො ලැබේ.

පසළොස්වන සමථවාරය නිමි.

---

## 16. සංසට්ඨවාරය

අධිකරණයැ යි හෝ ශමථයැ යි හෝ මේ ධර්මයෝ මිශ්‍ර වූවෝ ද නොහොත් අමිශ්‍ර වූවෝ ද, බෙදලමින් මේ ධර්මයන්ගේ නානාත්වය පණවන්නට ලැබේ ද යත් :

